ඉරිදා
2022 ජනවාරි 30
කාණ්ඩය 11
11 වැනි කලාපය
රු. 80/-
පිටු 64

# මව්බිම

## වතිකානය ලංකාවට ඇස ගසයි

13 පිටුවට බිඟුන් මේනක ගමගේ

## හෘද රෝගී දරුවන් 1,500කට ජීවිතය දෙන රිජ්වේ දොස්තර සටන

12 පිටුවට

## රවි-ශනිගේ මකර නැටුමෙන් දේශපාලන පිටිය ඇවිළෙයි

තරුපති



# ඉදිකිරීම් කර්මාන්තයටත් හෙනහුරා ලබයි

බිඟුන් මේනක ගමගේ
02 පිටුවට

සිමෙන්ති-ටයිල් මාෆියාව පිටුපස ප්‍රබල ව්‍යාපාරිකයෝ දෙදෙනෙක්

බලගතු දේශපාලකයකුගේ හයියක්

## 2021 ඉතිහාසගත අපනයන ආදායමක්



13 පිටුවට

## කැනඩා-ඇමෙරිකා බෝඩරේ සීතලට ගල් වූ ඉන්දීය පවුල



කාංචනා විජයබණ්ඩාර
02 පිටුවට

# ශිෂ්‍යත්ව අවනඩුව ගැන අධ්‍යාපන ලේකම් කතා කරයි

**ජේ.ටී. ද සිල්වා**

පහ වසර ශිෂ්‍යත්ව විභාගය පැවැති අවස්ථාවේ විභාග මධ්‍යස්ථාන තුනකින් තමා වෙත වාර්තා වූ සිද්ධීන් සම්බන්ධයෙන්, අදාළ කලාප අධ්‍යක්ෂ කාර්යාල මඟින්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ විභාග දෙපාර්තමේන්තුව මඟින් ස්වාධීන පරීක්ෂණ තුනක් මේ වන විට සිදු කෙරෙමින් පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා 'ඉරිදා මව්බිම'ට පැවැසීය.

02 පිටුවට

## කුඩු ඔත්තුකරුවෝ අනතුරේ



දසුන් රාජපක්ෂ
02 පිටුවට

## ආණ්ඩුවට බැරි නම් අපි කරනවා

ධාරා විජයවර්ධන
2 පිටුවට



## තත්පරයකට ෆේස් මාස්ක් 50,000ක් පරිසරයට

2 පිටුවට සවනි ශේශාධි

## කැලණිතිස්සට නැප්තා නැතිව කෝටි 60ක පාඩුවක්

චාමර අමරසූරිය
02 පිටුවට

## රාජපක්ෂලාට විතරක් බැනලා වැඩක් නෑ



එම්.එෆ්. ෆාරුක්
13 පිටුවට

## රාජ්‍ය අනුග්‍රහයෙන් මහවැලි ගඟ වළපල්ලට

13 පිටුවට ධාරා විජයවර්ධන

බූස්ටර් එන්නත නොගත්තොත් කොවිඩ් මාරයාගෙන් ගැලවිල්ලක් නෑ

දෙවැනි මාත්‍රාවෙන් මාස 3ක් ගත වූ වහාම බූස්ටර් එන්නත ලබා ගන්න

දෙවැනි මාත්‍රාවෙන් පසු ආසාදිතයකු බවට පත්වුවහොත් එදින සිට මාසයකට පසු බූස්ටර් එන්නත ලබා ගන්න

ඕනෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයකින් වැඩිදුර තොරතුරු දැන ගත හැකිය

## අලුත් බද්ද ගැන හෙළිදරව්වක්



අනුරාධා හේරත්
02 පිටුවට

රජයේ පොලී රහිත ණය ක්‍රමය ඔස්සේ ඔබටත්
IT සහ BUSINESS උපාධි
නටාෂා : 076 6 550 550 දිනූෂා : 076 4 770 096
ESOFT METRO CAMPUS
අධ්‍යාපන අමාත්‍යාංශය

VISION CARE
OPTICAL SERVICES
වසර දෙකක් ඇතුළත වෘත්තීය සුදුසුකම් ලත්
දෘෂ්ටිමිතික වෘතීයවේදියකු වන්න
විෂන් කෙයා ඇකඩමිය සමඟ සම්බන්ධ වන්න
Ayanthi 076 042 7542 academy@visioncaresl.com
Thusini 076 621 0239 thusini@visioncaresl.com
Vidya 076 631 1313 vidya@visioncaresl.com
ඔබේ කාලය හා මුදල් බුද්ධිමත්ව ආයෝජනය කරන්න
විෂන් කෙයා ඇකඩමි, 4 වන මහල, අංක 505, යූනියන් පෙදෙස, කොළඹ 02.
www.vcacademy.lk

1>>

## ඉදිකිරීම්...

සිමෙන්ති, ටයිල්, වානේ ඇතුළුව ඉදිකිරීම්වලට අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟය පසුපස විදේශ විනිමය අර්බුදයට අමතරව මහා පරිමාණ කළු ව්‍යාපාරික කල්ලියක් සිටින බවට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවෝ සහ ප්‍රවීණ ඉන්ජිනේරුවෝ චෝදනා කරති.

විදේශ විනිමය අර්බුදය නිසා කිසියම් ප්‍රමාණයකින් අමුද්‍රව්‍ය හිඟයක් ඇතත් වෙළෙඳපොළේ මේ වනවිට නිර්මාණය වී ඇති හිඟය ඊට වඩා විශාල වූ කෘත්‍රිම හිඟයක් යැයි ඔවුහු පවසති.

මෙම තත්ත්වය මත සිය ඉදිකිරීම් කර්මාන්තය තවදුරටත් පවත්වා ගැනීමට අපහසු යැයි කියමින් මහා පරිමාණ කර්මාන්තකරුවන් කිහිපදෙනකු හා රජය පිළිගත් ආයතන කිහිපයක්ද ඒකාබද්ධව අමුද්‍රව්‍ය ආනයනයට රජයේ ඉහළම දේශපාලකයකුගෙන් පසුගිය දිනෙක අවසර ඉල්ලා ඇත.

එහෙත් එම ඉල්ලීමට අදාළ දේශපාලන බලධාරියා එකඟ වී නැති අතර ඊට හේතු වශයෙන් ඔහු ඉදිරිපත් කර ඇත්තේ රටේ දළ ජාතික නිෂ්පාදිතයට එම කර්මාන්තකරුවන්ගෙන් ලැබෙන දායකත්වය ප්‍රමාණවත් නොවීම යැයි එක් සමාගමක ජ්‍යෙෂ්ඨ ඉන්ජිනේරුවෙක් 'මව්බිම'ට කීය.

අදාළ ඉහළ දේශපාලන බලධාරියා මෙම තීරණයට එළැඹීමට නිර්ණායක හැටියට භාවිත කර ඇත්තේ රජයේ ලියාපදිංචි ඉදිකිරීම්කරුවන්ගේ සංඛ්‍යාව යැයි කී හෙතෙම එය මුළුමනින්ම වැරැදි පදනමක් යැයිද කීය.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිටින රජයේ ලියාපදිංචි නොවූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව ඉතා ඉහළ අගයක් ගැනීම ඊට හේතුව යැයිද එම ජ්‍යෙෂ්ඨ ඉන්ජිනේරුවා කීය.

මෙම සැබෑ අර්බුදය ගැන විපක්ෂයේ දේශපාලකයන්ට පවා නිවැරැදි දත්ත නැතැයි පැවසූ ඔහු මේ නිසා ඔවුන්ගේ විවේචනයද සිමෙන්ති හිඟය ගැන කතා කිරීමට පමණක් සීමා වී ඇතැයි චෝදනා කළේය.

මේ අතර වෙළෙඳපොළේ පවතින සිමෙන්ති හිඟයට හේතුව ඉදිරියේදී වෙළෙඳපොළට පැමිණීමට නියමිත නිෂ්පාදන සමාගමක් නිසා බවට විශාල සැකයක් මතුව ඇතැයි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රබලයෙක් 'මව්බිම'ට පැවැසීය.

මේ වසර ආරම්භයේදී රුපියල් දහසට අඩුවෙන් තිබූ සිමෙන්ති කොට්ටයක මිල මේ වනවිට කිසිදු පාලනයකින් තොරව රුපියල් දෙදහස දක්වා ඉහළ යන්නට ඉඩ දී ආණ්ඩුව එම අලුත් නිෂ්පාදනය වෙළෙඳපොළට හඳුන්වා දෙන විටම ඉහළ මිලකට විකිණීමට අවශ්‍ය පසුබිම සකසමින් ඇතැයි ඔහු චෝදනා කළේය.

සිමෙන්ති හිඟය හා කළු කඩ ගැන ජනමාධ්‍යයෙන් කොතෙක් වාර්තා කළද පාරිභෝගික අධිකාරියෙන් අවශ්‍ය වැටලීම් නොකර මුනිවත රකින ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ ඒ නිසා යැයිද ඔහු කීය.

ටයිල් හා ඇලුමිනියම් ක්ෂේත්‍රයේද මීට සමාන තත්ත්වයක් මතුව ඇතැයි එම ව්‍යාපාරිකයා කීය.

මෙම කර්මාන්ත අංශවල ඒකාධිකාරියක් ඇතැයිද එම ඒකාධිකාරි කර්මාන්තකරුවන්ගෙන් වැඩි මිලට නිෂ්පාදන තොග වශයෙන් මිලට ගැනීමට කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට සිදුව ඇතැයිද ඔහු කීය.

ටයිල් තොගයක් ඇණවුම් කර මාස හයක් පමණ පොරොත්තු ලේඛනයේ සිටීමට අකැමැති සාමාන්‍ය ජනයා රුපියල් 460ක් පමණ වන ටයිල් කැටයක් රුපියල් 1,500ක් වැනි කළු කඩ මිල ගණන්වලට අදාළ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් ගන්නා තත්ත්වයට අසරණ වී ඇතැයිද ඔහු වැඩිදුරටත් සඳහන් කළේය.

මෙසේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින දැවැන්ත කඩාවැටීම හමුවේ සාමාන්‍ය ජනතාවට අමතරව කර්මාන්තකරුවන් මෙන්ම ඉන්ජිනේරුවන්, ගෘහනිර්මාණ ශිල්පීන්, ප්‍රමාණ සමීක්ෂකයන්, පුහුණු කම්කරුවන් හා ඉන්ජිනේරු පීඨවල සරසවි සිසුන් ඇතුළුව ලක්ෂ ගණනක පිරිසක් ආර්ථික මෙන්ම වෘත්තීයමය වශයෙන්ද අසරණ වී ඇතැයි ඉන්ජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙක් 'මව්බිම'ට පැවැසීය.

එහෙත් මෙකී අර්බුදය ගැන රජයේ බලධාරීන්ට තබා දේශපාලන කණ්ඩායම්වලටවත් නිසි තක්සේරුවක් හෝ අධ්‍යයනයක් තවම නැතැයි එකී ප්‍රවීණ ඉන්ජිනේරුවා වැඩිදුරටත් සඳහන් කළේය.

## තත්පරයකට...

ලෝක බැංකු දත්ත අනුව ගතවන සෑම තත්පරයකදීම භාවිත කළ මුව ආවරණ (Face Mask) පනස් දාහක් පරිසරයට එක්වන බව පරිසරවේදී සුපුන් ලහිරු ප්‍රකාශ් පැවැසීය.

එම සංඛ්‍යා දත්ත හෙළි කරන අයුරින් ලෝකය පුරාම ගතවන සෑම මිනිත්තුවකදීම මුව ආවරණ ලක්ෂ තිහක් පරිසරයට මුදා හැරෙන බවද හෙතෙම කීය.

මාසයකට මුව ආවරණ බිලියන එකසිය විසි නවයක් පරිසරයට මුදා හැරෙන බවද ඔහු පැවැසීය.

අක්‍රමවත් අයුරින් පරිසරයට මුදා හැරෙන මුව ආවරණ බිලියන 1.56ක් වසරකට මුහුදට එක්වන බව හෙළි වී ඇතැයිද හෙතෙම සඳහන් කළේය.

එය දළ වශයෙන් ගණන් බැලූ විට හොඳින් වැඩුණු නිල් තල් මසුන් හැට දෙදෙනකුගේ ශරීර ප්‍රමාණයට සමාන වන බවද ඔහු කීය.

වසංගත ආරම්භ වූ පසු මුහුදට එක් වන සායනික අපද්‍රව්‍ය ප්‍රමාණය සියයට 87කින් ඉහළ ගොස් ඇතැයි ලෝක බැංකු සංඛ්‍යා දත්ත ඔස්සේ හෙළි වන බවද සුපුන් ලහිරු ප්‍රකාශ් පැවැසීය.

ලොව පුරා මුව ආවරණ භාවිත කරන බහුතරයක් පාහේ ඒවා පාවිච්චියෙන් පසු විධිමත් අයුරින් බැහැර නොකරන බව හෙළි වී ඇති බවද හෙතෙම සඳහන් කළේය.

අවිධිමත් ලෙස මුව ආවරණ බැහැර කිරීම් නිසා සතුන්ගේ ක්‍රියාකාරකම් හා චර්යාවන්ට බාධාවක් පමුණුවනවා පමණක් නොව ඔවුන්ගේ ජීවිතවලට පවා හානි ගෙන දෙන බවද සුපුන් ලහිරු ප්‍රකාශ් පැවැසීය.

එක් වරක් පමණක් භාවිත කොට ඉවත් කෙරෙන මුව ආවරණ නිපදවන පොලිප්‍රොපිලීන් දහනය වූ ඉන් නිකුත් වන දුම ආඝ්‍රාණයෙන් පෙණහලුවලට හානි ගෙන දෙන රෝග ඇතිවන බවද ඔහු කීය.

## ජීවිතයක් යදිමි.

57 හැවිරිදි වැන්දඹුවක් වූ මව පහත සඳහන් රුධිර කාණ්ඩවලින් වකුගඩුවක් සොයයි: O+O- (ඉතා මැනවින් O+) සහ වයස අවුරුදු 30 - 60 අතර විය යුතුයි. හැකි ඉක්මනින් බද්ධ කළ යුතු බවට විශේෂඥ වෛද්‍යවරුන් නිර්දේශ කර ඇත.

පින් කැමති දායකයකු වේ නම් 0771631937/ 0773333433 අංකයට අමතන්න. සියලු වෛද්‍ය හා බෙහෙත් සඳහා වන වියදම් දැරීමට අප කැමැත්තෙමු.

## හයවන වර්ෂ පූර්ණ සිහිකිරීමයි



ඇහැලියගොඩ පනාවල පාරේ "විජේකමල් නිවසෙහි"

"විජේකමල් ජෙම්ස්" අධිපතිව විසූ සාමවිනිසුරු

### ඩබ්. ජිනදාස විජේසිංහ මැතිතුමා

අප අතරින් සමුගෙන හය වසරක් සපිරෙන

2022 ජනවාරි මස 29 වන දින

ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද, කථිකාචාර්ය, ශාස්ත්‍රපති,

රාජකීය පණ්ඩිත පූජ්‍යපාද බලංගොඩ රාධ හිමියන්ගේ

සුමධුර ධර්ම දේශනාවක් සහ 30 වන දින දහවල්

25 නමක් විෂයයෙහි සංඝගත දක්ෂිණාවක් පැවැත්වේ.

මෙපින් බලයෙන් අජරාමර අමාමහ නිවන් සම්පත් ලැබේවායි

ප්‍රාර්ථනා කරන්නේ

බිරිඳ කමලා විජේසිංහ ඇතුලු

දූ දරු, මුණුපුරු මිනිපිරියන්

## අලුත් බද්ද...

ආණ්ඩුව හිතුවක්කාරී ලෙස ක්‍රියාවට නැංවීමට යන නව විශේෂ භාණ්ඩ හා සේවා බදු පනතින් රටේ රාජ්‍ය ආයතන විශාල ගණනක් කඩාවැටීමේ අවදානමට පත්ව ඇති බව දූෂණ විරෝධී හඬ කැඳවුම්කරු, ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත සමරසිංහ ඉරිදා 'මව්බිම'ට අනාවරණය කළේය.

සරලව කිවහොත් රටේ බදු ආදායම් අහිමි වීමක් සිදුවන බව ඔහු සඳහන් කළේය.

විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත හරහා දැනට ක්‍රියාත්මක රටේ සියලු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ 40%ක්, සුරාබදු ආදායම් දෙපාර්තමේන්තුවේ 100%ක් රේගුවේ 80%ක් ආකාරයට බදු එකතු කිරීමට නියමිත අතර දැනටමත් බදු එකතු කිරීමේ ක්‍රියාවලිය සිදුවන ගුවන්තොටුපොළ, මෝටර් රථ දෙපාර්තමේන්තුව, ටෙලිකොම් වැනි ආයතනද මෙම පනතට ඇතුළත් බව ඒ මහතා පැවැසීය.

මෙම පනත හරහා ඉහත කී ආයතන ඇතුළු ආයතන 8ක බදු මේ නව ආයතනය හරහා එකතු කිරීමට නියමිත බැවින් මේ තුළින් අපැහැදිලි බදු යාන්ත්‍රණයක් සැකසීම හා රාජ්‍ය යාන්ත්‍රණය කඩාවැටීම අනිවාර්යයෙන්ම සිදුවන බව සමරසිංහ මහතා පෙන්වා දුන්නේය.

විශේෂයෙන්ම මේ පනත කාගේ වුවමනාවටද සහ ගෙන එන්නේ ඇයිද යන්න රටට පැහැදිලි කර නැති බවද ඔහු පැවැසීය.

මෙම පනත වහාම හකුළා ගැනීමට ආණ්ඩුව කටයුතු කළ යුතු අතර මෙමඟින් සම්පූර්ණයෙන්ම රටේ රාජ්‍ය ආයතන කඩා වැටීමට ඉඩකඩ සැලසෙන බවද සමරසිංහ මහතා වැඩිදුරටත් කීය.

## ශිෂ්‍යත්ව අවනඩුව ගැන...

වාර්තා වී ඇති සිද්ධීන්වලදී ළමයින්ට කිසියම් අසාධාරණයක් සිදුවී ඇති බවට පරීක්ෂණයේදී සනාථ වුවහොත් ඒ සම්බන්ධයෙන් සාධාරණය ඉටුවනු ඇතැයිද අධ්‍යාපන ලේකම්වරයා පැවැසීය.

ඉදිරියේදී පැවැත්වෙන ජාතික විභාගවලදී, සිසුන්ට මුහුණපෑමට සිදුවන අපහසුතාවන් මඟහැරවීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගනිමින් විභාග ශාලා තුළ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන බව අධ්‍යාපන ලේකම්, මහාචාර්ය කපිල පෙරේරා පැවැසීය.

පසුගියදා පහ වසර ශිෂ්‍යත්ව විභාගය පැවැති අවස්ථාවේ, ඇතැම් විභාග ශාලාවලින් වාර්තා වූ සිද්ධීන් සැලකිල්ලට ගෙන මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බව ලේකම්වරයා සඳහන් කළේය.

විභාග ශාලාධිපති, විභාග ශාලා පරීක්ෂකවරු සහ සිසුන් පැමිණෙන වේලාව, ප්‍රශ්න පත්‍ර බෙදා දීම ආරම්භ කෙරෙන වේලාව සහ පිළිතුරු පත්‍ර එකතු කරගනු ලබන වේලාව ආදිය පිළිබඳ නිවැරැදි දත්ත එක්රැස් කිරීම මෙම නව වැඩසටහන යටතේ සිදුකෙරෙන බවද මහාචාර්ය කපිල පෙරේරා පැවැසීය.

## ආණ්ඩුවට බැරි නම්...

වර්තමාන ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්නට සැලසුමක් ඉදිරිපත් කරන්නට රජය අපොහොසත් වුවහොත් තමන් ඇතුළු පක්ෂ දහය එක්ව විසඳුමක් ඉදිරිපත් කර ජනගත කරන බව පිවිතුරු හෙළ උරුමයේ නායක බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල මහතා 'මව්බිම' ට පැවැසීය.

පවතින අර්බුදයෙන් ගොඩ එන්නට නම් අර්බුදයක් ඇති බව රජය පළමුවෙන් පිළිගත යුතු බවත් එහි දිග පළල විග්‍රහ කළ යුතු බවත් කී අමාත්‍යවරයා ඉන් පසු ඒ සඳහා විසඳුමක් ඉදිරිපත් කළ යුතු බවත් කීවේය.

එසේ ඉදිරිපත් කරන විසඳුම ක්‍රියාත්මක කරන තුරු ආණ්ඩුව යම් කැප කිරීමක් කළ යුතු බවත් හෙතෙම කියා සිටියේය.

ආණ්ඩුව එසේ ඉදිරිපත් කරන විසඳුම් වෙනුවෙන් කැපවීම් කරන අතරතුර දේශපාලනඥයන්ද සිය කැපවීම ක්‍රියාවෙන් පෙන්වා දිය යුතු බවත් ඉදිරි මාසයක කාලය තුළ මෙම ක්‍රියාවලිය සිදුවිය යුතු බවත් ඔහු සඳහන් කළේය.

මෙකී යෝජනාව ආණ්ඩුවට ඉදිරිපත් කරන බවත් මාසයක් තුළ එය සිදුනොවූව හොත් තමන් ඇතුළු පක්ෂ දහය එක්ව ඉදිරිපත් කරන විසඳුම ජනගත කරන බවත් ගම්මන්පිල මහතා තවදුරටත් කියා සිටියේය.

## කුඩු ඔත්තුකරුවෝ...

පොලිසියට තොරතුරු ලබාදෙන මූලාශ්‍රවල අනන්‍යතාවන් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතට පත්වීම නිසා තොරතුරු ලබාදෙන සාමාන්‍ය පුරවැසියන්ගේ ජීවිත විශාල අවදානමකට ලක්ව ඇතැයි පොලිසියේ විශ්වාසවන්ත ආරංචි මාර්ගවලින් ඉරිදා 'මව්බිම'ට වාර්තා වේ.

පානදුර කේතුමතී කාන්තා රෝහලේ ගිලන් රථ රියැදුරකුට පුද්ගලයන් සිවු දෙනකු වෙඩි තැබීමට ගත් උත්සාහයෙන් පසුව තොරතුරු ලබාදෙන ඇතැම් පුද්ගලයන් ඒ සඳහා මැළිකමක් දක්වන බව එම ආරංචි මාර්ගවලින් පැවසෙයි.

ගිලන් රථ රියැදුරුට වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් ඉරිදා 'මව්බිම' කළ විමසීමකදී අදහස් දැක්වූ ජ්‍යෙෂ්ඨ පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා එම සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සඳහා කළුතර අපරාධ කොට්ඨාසයට අයත් විශේෂ පොලිස් විමර්ශන ඒකක හතරක් පත් කළ බව සඳහන් කළේය.

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සමඟ සබඳතා පවත්වන ඇතැම් පොලිස් නිලධාරීන් ඔත්තු ලබාදෙන්නන් පිළිබඳ එම ජාවාරම්කරුවන්ට තොරතුරු සපයන අවස්ථා තිබෙන බව අජිත් රෝහණ මහතා පැවැසීය.

පොලිසිය වෙත තොරතුරු ලබාදෙන ඇතැම් පුද්ගලයන් සිය අනන්‍යතාව ප්‍රවර්ධනය කරගැනීමට තමන් එම තොරතුරු ලබාදුන් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම තුළින්ද මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඔවුන් ගැන දැනගෙන ජීවිතවලට අනතුරු සිදු කරන බවද ඒ මහතා වැඩිදුරටත් කීය.

## කැනඩා - ඇමෙරිකා...

කැනඩා - ඇමෙරිකා දේශ සීමාව ආසන්නයේදී අධික ශීතල හේතුවෙන් මිය-ගොස් සිටි ඉන්දීය ජාතිකයන් සිවුදෙනකුගෙන් යුත් පවුලක් හඳුනාගෙන ඇති බව ඉන්දීය මාධ්‍ය සඳහන් කර තිබේ.

කැනඩා - ඇමෙරිකානු දේශ සීමාවේ සිට මීටර් 12ක් පමණ දුරින් පිහිටි එමර්සන් ප්‍රදේශය අසලදී මැනිටෝබා රාජකීය කැනේඩියානු මවුන්ටඩ් පොලිසිය විසින් මෙම ඉන්දීය ජාතික පවුලේ සාමාජිකයන්ගේ මළ සිරුරු සොයාගනු ලැබ තිබේ.

එම පවුල කාලාන්තරයක් තිස්සේ රට පුරා සංක්‍රමණය කර ඇති අතර ඔවුන් සිවුදෙනාගේ මරණය මිනිස් ජාවාරම් සැලැස්මකට සම්බන්ධ බව කැනේඩියානු බලධාරීන් පවසා ඇත.

මෙලෙස මිය ගොස් ඇත්තේ, එකම පවුලේ 39 හැවිරිදි ජග්දීෂ් පටෙල් නම් පියා, වෛෂයිල්බෙන් පටෙල් නම් 37 හැවිරිදි මව, විහන්ගි සහ ධර්ක්මික් යන වයස අවුරුදු 11ක් හා 3ක දරුවන් දෙදෙනෙකි.

මින් පෙර බලධාරීන් පවසා ඇත්තේ එම පවුලට වැඩිහිටි පිරිමියකු, වැඩිහිටි ගැහැනු ළමයකු, නව යොවුන් වියේ පිරිමියකු සහ ළදරුවකු සිටින බවය.

එහෙත් මේ වන විට අනාවරණය වී ඇත්තේ ඝාතනයට ලක්වූවන් අතර යොවුන් වියේ පසුවන තරුණයකු නොව තරුණියක් සිටින බව යැයි ඉන්දීය මාධ්‍ය වාර්තා කර ඇත.

මිය ගිය අයගේ අනන්‍යතාව කැනේඩියානු බලධාරීන් විසින් තහවුරු කරනු ලැබ ඇති අතර මරණ පරීක්ෂණ ජනවාරි 26 වැනි දින අවසන් කර ඇත.

මැනිටෝබාහි ප්‍රධාන වෛද්‍ය පරීක්ෂක කාර්යාලය මරණයට හේතුව අධික ශීතලට නිරාවරණය වීම බවට තහවුරු කර ඇති බව රාජකීය කැනේඩියානු මවුන්ටඩ් පොලිසිය පසුගියදා (27දා) ප්‍රකාශ කර තිබේ.

කැනඩාවේ ඔටාවාහි පිහිටි ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කර ඇත්තේ මිය ගිය සිවුදෙනාගේ අනන්‍යතාව හඳුනාගෙන ඇති අතර ඔවුන්ගේ පවුලේ අනෙකුත් සාමාජිකයන්ට මෙම සිදුවීම සම්බන්ධයෙන් දන්වා ඇති බවය.

පටෙල් පවුල 2022 ජනවාරි 12 වැනිදා ටොරොන්ටෝ වෙත පැමිණ ඇති අතර එතැන් සිට ජනවාරි 18 වැනිදා එමර්සන් වෙත ගමන් කර ඇති බව රාජකීය කැනේඩියානු මවුන්ටඩ් පොලිසිය තහවුරු කර ඇත.

එමර්සන්හි කැනඩා-ඇමෙරිකා දේශ සීමාව අසල කිසිදු වාහනයක් සොයා ගැනීමට නොහැකි වී ඇති අතර ඔවුන් සිය ගමනාන්තය දක්වා පයින්ම ගමන් කර තිබිණි.

පටෙල් පවුල පා ගමනින් ඇමෙරිකාවට යෑමට උත්සාහ කළ රාත්‍රියේදී උෂ්ණත්වය -35c (-31F) දක්වා පහත වැටී තිබූ බව විදෙස් මාධ්‍ය සඳහන් කර තිබේ.

ජනවාරි 19 සවස දේශ සීමා නියෝජිතයන් විසින් තවත් ඉන්දියානු ජාතිකයන් හත් දෙනකුගෙන් යුත් කණ්ඩායමක් හඳුනාගනු ලැබ ඇති නමුත් මෙම සිදුවීම එයට සම්බන්ධද? යන්න එම පොලිසිය සඳහන් කර නොමැති බව විදෙස් මාධ්‍ය පවසා තිබේ.

මෙම කණ්ඩායම සමඟ 47 හැවිරිදි ෆ්ලොරිඩාවේ පදිංචිකරුවකු වන ස්ටීව් ෂැන්ඩ්ට මිනිස් ජාවාරම සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇත.

විදෙස් මාධ්‍ය සඳහන් කරන්නේ, පටෙල් පවුල සොයාගෙන ඇති දින රාත්‍රියේම ඔහු 15 දෙනකුගෙන් යුත් පිරිසක් සහිත වෑන් රථයක් දේශසීමා හරහා පදවාගෙන යමින් සිටියදී පොලිසිය ඔහු හසු කරගෙන ඇති බවය.

ඔහුගේ මෝටර් රථයේ ඔහු සමඟ ඉන්දියානු ජාතිකයන් දෙදෙනකුද සිට ඇති බව වාර්තා වේ.

කැනඩාවේ අධික ශීත කාලගුණය තුළ පටෙල් පවුල අඳුරේ පයින් ගමන් කළේ මන්දැයි තවදුරටත් ප්‍රශ්නයක් පවතී.

පටෙල් පවුලට කැනඩාවේ හෝ ඇමෙරිකාවේ ඥාති පවුලක් සිටියාද? යන්න මෙතෙක් හඳුනාගෙන නොමැති අතර ඇමෙරිකාව හා ඉන්දියාව සමඟ සම්බන්ධීකරණය කරමින් පටෙල් පවුල කැනඩාවට ගමන් කළේ කෙසේද? යන්න පිළිබඳව පුළුල් පරීක්ෂණයක් දියත් කර ඇති බව විදෙස් මාධ්‍ය වාර්තා කර තිබේ.

විමර්ශනය සඳහා කැනේඩියානු බලධාරීන්ට උපකාර කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ඉන්දීය කොන්සියුලර් නිලධාරියකුගේ නායකත්වයෙන් යුත් විශේෂ කණ්ඩායමක් මැනිටෝබා වෙත යවා ඇත.

## කැලණිතිස්සට...

කැලණිතිස්ස සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරයට අවශ්‍ය නැප්තා ඉන්ධන තොග නොමැති වීම හේතුවෙන් එම බලාගාරය ඩීසල්වලින් බලගන්වා ක්‍රියාත්මක කිරීම මත රජයට මසකට රුපියල් කෝටි 60ක පමණ පාඩුවක් සිදුවන බව ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රකාශකයෙක් "ඉරිදා මව්බිම"ට අනාවරණය කළේය.

නැප්තා ඉන්ධනයෙන් බලගැන්වීමට හැකි මෙරට එකම බලාගාරය මෙය වන අතර සපුගස්කන්ද තෙල් පිරිපහදුව වසා දැමීමත් සහ පවතින විදුලි අර්බුදය හමුවේ මෙම බලාගාරය ඩීසල්වලින් බලගැන්වීමට මේ වන විට සිදුව ඇති බවද එම ප්‍රකාශකයා පැවැසීය.

මෙගාවොට් 165ක ධාරිතාවයෙන් යුත් මෙම බලාගාරය නැප්තාවලින් බලගැන්වීම සඳහා සකස් කොට ඇත්තේ නැප්තා පාවිච්චි කිරීම ඉන්ධනවලට වඩා ලාභ නිසා බවද ප්‍රකාශකයා කියා සිටියේය.

විදුලි බලාගාර සඳහා අවශ්‍ය ඉන්ධන තොග හිඟවීමත් සමඟ ඇතිවූ විදුලි අර්බුදය හමුවේ ඩීසල්වලින් මෙම බලාගාරය මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර මේ නිසා එක් විදුලි ඒකකයකින් අවම රුපියල් 5ක පමණ අලාභයක් විඳීමට සිදුව ඇති බවද තතු දත් ආරංචි මාර්ගයන් සඳහන් කළේය.

ඒ අනුව මෙම බලාගාරය ඩීසල් ඔස්සේ ක්‍රියාත්මක කිරීම මත දිනකට රුපියල් කෝටි දෙකක පමණ පාඩුවක් වන බවද එම ආරංචි මාර්ගයන් පැවසීය.

එසේම විදුලිබල අමාත්‍යාංශ ප්‍රකාශකයකු කියා සිටින්නේ මෙම බලාගාරය සඳහා අවශ්‍ය නැප්තා සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙන් මීට ඉහතදී ද ලබා ගත්තද එම ඉන්ධන තොග මෙම බලාගාරයේ මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් නොවන බවයි.

නැප්තා ඉන්ධන සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙන් ලබාගැනීම නිසා මෙම අර්බුදකාරී තත්ත්වය මේ වන විට සිදුව ඇති බවත් නැප්තා ඉන්ධන තොගද ආනයනය කොට විදුලිබල මණ්ඩලයට ලබා දෙන්නේ නම් කැලණිතිස්ස සංයුක්ත චක්‍රීය බලාගාරය හරහා රටට වැඩි වාසි අත්පත් කර ගත හැකි බවද ප්‍රකාශකයා වැඩිදුරටත් පැවැසීය.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන තෙල්, වරාය, විදුලිය ඒකාබද්ධ වෘත්තීය සමිති බලවේගයේ කැඳවුම්කරු හා මාධ්‍ය ප්‍රකාශක ආනන්ද පාලිත කියා සිටියේ සපුගස්කන්ද පිරිපහදුව වසා දමන විට නිෂ්පාදනය කොට තිබූ නැප්තා මෙට්‍රික් ටොන් 35,000කට වැඩි නෞකාවක් සියයට 50ක පමණ අඩු මිලකට විදේශීය සමාගමක් වෙත විකුණා ඇති බවට තොරතුරු වාර්තා වන බවය. දැව්තෙල් නෞකාවක්ද එලෙස අඩු මුදලට විකුණා ඇති බවත් මෙම විකිණීම් දෙසැම්බර් මාසයේ පමණ සිදු වූ බවද ඔහු කියා සිටියේය.

පිරිපහදු ඉන්ධන වෙනත් රටවලට අලෙවි කරන්නේ ඉන්ධන අතිරික්තයක් තිබියදී පමණක් බවත් නමුත් මෙරට දැඩි ඉන්ධන අර්බුදයක් තිබියදී සහ ඉන්ධන ගබඩා පහසුකම් ඇති තරම් තිබියදී මෙලෙස ඉන්ධන අලෙවි කළේ මන්දැයි යන්න ප්‍රශ්නාර්ථයක් බවද හෙතෙම පැවැසීය.

මෙම නැප්තා තොගය ගබඩා කොට තිබුණා නම් එය කැලණිතිස්ස චක්‍රීය බලාගාරය වෙත ලබා දී මාස කිහිපයක් අර්බුදයකින් තොරව අඩු මිලට විදුලිය උත්පාදනය කිරීමට හැකි වන බවද හෙතෙම කියා සිටියේය.

මෙම හිතුවක්කාරී අලෙවිය නිසා එම බලාගාරය අද වන විට ඩීසල්වලින් පාඩුපිට ගෙන යෑමට රජයට සිදුව ඇති බවද හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.



## දවසේ පද 4

මහින්දානන්ද දිගු කලකට පස්සේ
ගොවිජන දුක සොයන්නයි වෙලකට බැස්සේ
වී මිල හාල් මිල හඳ ළඟටම ඉස්සේ
ගොවි ජනතාව තවමත් කඳුළැලි වැස්සේ

විදුර අබේනායක

# වන අලියකුගෙන් දියණිය බේරා ගත් තඹුත්තේගම මවු සෙනෙහස

## හොඬවැලෙන් වීසි කළා: පාගලා මරන්න හැදුවා





**කොහොමද දැන් ඔයාට?**

**දුව:** කකුල් දෙකම හීරිලා. ලොකු තුවාල මුකුත්ම නැහැ කියලා කිව්වා. ඒත් අලියා මාව උස්සලා විසි කරපු පාරට මුළු ඇඟම රිදෙනවා.

**ඉස්කෝලේ යන්නේ නැතුව එදා දුව ආච්චිලාගේ ගෙදර ගියේ ඇයි?**

**අම්මා:** එදා ඉස්කෝලේ යන්න තමා ලෑස්ති වෙලා හිටියේ. උදේ 6.30ට විතර ඇති. අපේ අම්මලාගේ ගෙදරට අලියෙක් ඇවිත් කියලා ආරංචි වුණා. අපේ ගෙවල් කිට්ටුවම තමා අම්මලාගේ ගෙදරත් තියෙන්නේ. එහෙට අලියෙක් ආවා කිව්වාම අපි බය වුණා. අම්මට මොකක් හරි කරදරයක් වෙලාද කියලා බලන්න අපි දෙන්නම දුවගෙන වගේ එහෙට ගියා.

**බය හිතුණේ නැද්ද අම්මා එක්ක එහෙට යන්න?**

**දුව:** අම්මත් හිටිය නිසා බයක් දැනුණේ නෑ. ඊටත් ආච්චිලගේ ගෙදරට අලියෙක් ඇවිත් කිව්වම බය හිතුණා.

**කලින් මෙහෙම අලි ඇවිත් තියනවද?**

**දුව:** මීට කලින් අපේ ගමට අලි ඇවිල්ලා ඉන්නවා දැකලා නැහැ. ඒත් පෙරහැරේ අලි ඉන්නවා දැකලා තියෙනවා.

**අම්මත් එක්ක ගිහින් ඇයි තනියම ආවේ?**

**දුව:** මං ඉස්කෝලේ යන්න ලෑස්ති වෙලා ඉන්නකොට තමා අලියෙක් ඇවිත් කියලා කිව්වේ. අම්මට කිව්වම අම්මා මාවත් එක්කන් එහේ ගියා නේ. අපි එහෙට ගිහින් ටික වෙලාවක් හිටියා. ඒත් මට ඉස්කෝලේ යන්න පරක්කු වෙන නිසා අම්මා එහෙ ඉද්දි අම්මටත් කියලා මං හෙමින් සැරේ ගෙදර ඇවිත් ඉස්කෝලේ යන්න හැදුවේ.

**එතකොට අලියා?**

**දුව :** මං අලියෙක් ඉන්නවා දැක්කේ නැහැ. ඇත්තටම මට මගේ ඉස්සරහා අලියෙක්ගේ රූපයක් පෙනුණේ නැහැ. මං එක පාරට දැක්කේ කළු ගලක් මගේ ඉස්සරහා තියෙනවා වගේ විතරයි.

**එක පාරට කොහෙන්ද අලියෙක් මතු වෙලා තියෙන්නේ?**

**අම්මා:** දුවට ඉස්කෝලේ යන්න පරක්කු වෙනවා කියලා අපි දෙන්නා ආපු පාර දිගේම එයා ආයෙත් ගෙදර ගියා. ඒ යද්දී තමා එක පාරට අතුරු පාරක ඉඳලා අලියෙක් කඩා පැනලා තියෙන්නේ.

**මීට කලිනුත් මෙහෙම වෙලා තියෙනවද?**

**අම්මා :** අනේ දෙවියනේ, මීට කලින් කවදාවත් මෙහෙම දෙයක් වෙලා නැහැ. මං දෙවියන්ගෙන් ඉල්ලන්නේ කවදාවත් කිසිම අම්මා කෙනෙක්ට මේ වගේ දෙයක් වෙන්න එපා. ඇහැකටවත් දකින්න ලැබෙන්න එපා. ඒක උහුලන්න පුළුවන් දුකක් නෙවේ.

**එකපාරටම කොහොමද මෙහෙම දෙයක් වුණේ ?**

**අම්මා:** අතුරු පාරේ ආව අලියා එකපාරටම දුවගේ ඇඟ වටේ හොඬවැල යවලා කරකවලා වගේ උස්සලා ගත්තා. මහා ලොකු කාලයක් තිබ්බේ නැහැ කිසිම දෙයක් හිතා ගන්නවත්. කරන්නේ මොනවද කියලවත් මතක නැහැ. මට සිහියක් තිබ්බේ නැහැ. කෑ ගහගෙන දුව ඉන්න පැත්තට දුවගෙන ගියා. ඒ යද්දිත් අලියා හොඬවැලෙන් කරකවල අරගෙන අපේ අම්මලාගේ වත්තේම කම්බි පොටවල් දෙක තුනක් ඇදලා තිබ්බ වැට උඩට විසි කළා.

**ඒ වෙලේ කරන දෙයක් ගැන හිතා ගන්න පුළුවන් වුණාද?**

**අම්මා:** අලියා මගෙ කෙල්ලව හොඬවැලෙන් අල්ලලා විසි කරලා බිම වැටිලා ඉද්දි මම කෙල්ල වැටිලා හිටපු තැනට කෑ ගහගෙන දුවලා ගියේ අසිහියෙන් වගේ. ඒ වෙද්දී ආයෙත් අලියා මගෙ කෙල්ලව පාගන්න එන්න හැදුවේ. මට ඒ අලියා ගැන භයානකකමක් දැනුණේ නෑ. මම නිකන් හිතුවෙ බුරාගෙන හපන්න එන බල්ලෙක්ව මම මෙල්ල කරන්න උත්සාහ කළා වගේ හැඟීමක්. ඒක අම්මලාගෙ තියෙන දරු කැක්කුමත් එක්ක ආපු දෙයක් මහත්තයෝ.

**අලියා එද්දී දුවන්න හිතුණේ නැද්ද?**

**දුව:** ඇත්තටම මට ඒ වෙලාවෙ සිදුවීම තවමත් හීනයක් වගෙයි. හරියටම අලියා මගෙ ඇඟ දිහාට හොඬවැල දික් කරපු එකවත් මට හරියටම හිතට එන්නෙ නෑ.

**අලියා දුවව පාගන්න එද්දී කොහොමද බේරා ගත්තෙ?**

**අම්මා:** බිම වැටිලා හිටිය දුව ළඟට ගිහින් එයාව නැගිට්ටවන්න හැදුවා. ඒත් එයාට සිහියක් තිබ්බේ නැහැ. අලියා ආයෙත් දුව පාගන්න එද්දී මං කෑ ගහගෙනම බිම දිගේ දුවව ඇදලා අරගත්තා. කම්බි වැට යටින්ම ඇදල අරන් අම්මලාගේ ඉඩම ඇතුළට ගත්තා.

**එදා ඔයාව බේරගත්ත අම්මා ගැන මොනවද හිතෙන්නේ?**

**දුව:** මම මේ ලෝකෙ යළි යළි ඉපදෙනවා නම් මගෙ රත්තරං අම්මගෙ බඩෙන්ම ඉපදෙන්න කියලයි මම ප්‍රාර්ථනා කරන්නේ.

■ සවනි ශේෂාධි
තලාව - අනුර







# රාජයෝග නැතුව දේශපාලනයේදී රජ වෙන්න පුළුවන් ද?






## රාජයෝග නැතුව රජ වුණත් වැඩි දුර යන්න බෑ

**තාම උත්පත්තිය ලබන විට හිස කෙළින් නැඟෙනහිර ක්ෂිතිජයෙන් උදාවන රාශිය වන ලග්නය ජීවිතය කවරාකාරයෙන් සිදුවේද යන්න නිවේදනය කරයි.**

මෙම ලග්නගත ස්වභාවය අනුව ජන්මියාගේ හැසිරීම් රටාව, පැවැත්ම, ඔහු කුමන ක්ෂේත්‍රයට යොමුවේද යන්න, ශරීර සෞඛ්‍ය කෙබඳුද, උගත්ද, නූගත්ද, ආයුෂ කෙබඳුද වැනි කරුණු රාශියක් නිවේදනය කරයි.

විශේෂයෙන්ම කේන්ද්‍රයේ පවතින රාජ යෝග බලය සැලකිල්ලට ගත යුතුමය. ලග්නයෙන් මෙන්ම සඳුගෙන් රාජ යෝග බලය යෙදේ. එසේම ගුරු බලවත් වීම ගුරු හංස යෝගය, බුධ බලවත් වීම භද්‍ර යෝගය, සෙනසුරු බලවත් වීම සස යෝගය, කුජ බලවත් වීම රුචක යෝගය, සිකුරු බලවත් වීම මාලව්‍ය යෝගය. මෙම යෝග නිර්මාණය වන්නේ කේන්ද්‍රස්ථානවල ඒ ග්‍රහයන් බලවත්ව පිහිටීම තුළය.

මීට අමතරව ඕනෑම කේන්ද්‍රයක 4 සහ 10 අධිපති කිසියම් ආකාරයකින් යෝගවීම අමාත්‍ය රාජ යෝගය. 9 සහ 10 අධිපතියන් යෝග වීම ධර්ම කර්මාධිපති රාජ යෝගය. 6 සහ 8, 12 අධිපතියන් කවරාකාරයෙන් හෝ එම ස්ථානවල සිටීම තුළ විපරීත රාජ යෝගය. සුබ ග්‍රහයන් ස්ථාන මාරු කර නීච රාශිගතව සිටීම තුළ නීච භංග රාජ යෝගය, පරිවර්තන යෝග බලය, රවි දෙපස ශුභයන් සිටීම වෙශි, වොශි, උභයචාරි රාජ යෝග බලය නිර්මාණය වේ.

රාජ යෝග තිබුණු පළියට මෙම යෝග ක්‍රියාත්මක නොවේ. මෙම යෝග බලවත් කරනවා වගේම හීන කරන යෝගද පවතී. යහපත් ආකාරයෙන් ක්‍රියාත්මක වීමට නම් සුබ දෘෂ්ටි ලැබ ස්ථාන බලය ග්‍රහයා ගමන් කර අංශකය බලවත්ව තිබිය යුතුය.

රජ වීමට නම් රාජ යෝග තිබිය යුතුමය. එසේ නොවුණහොත් වැඩි කලක් යන්න පෙර රජකම අතහැරීමට සිදුවේ. රජු ධාර්මිකව මහජනතාවගේ සුබ සිද්ධියට හේතුවන අයුරින් රට පාලනය කිරීම තුළ රජුගේ පැවැත්ම පවතී. රාජ යෝග තිබුණ පළියට රජ නොවේ. නමුත් පුද්ගලයා ගමන් කරන ක්ෂේත්‍රය තුළ ඔහුට ඉහළටම යෑමට රාජ යෝග බලය ක්‍රියාත්මක විය යුතුමය.

නිදසුනක් හැටියට හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාගේ කේන්ද්‍ර සටහන සැලකිල්ලට ගැනීමේදී මනා ලෙස රාජ යෝග ක්‍රියාත්මක වූ අයුරු පැහැදිලි වේ.

සාමාන්‍ය පවුලක උපන් එතුමාට මේෂ ලග්නය හිමිවිය. එහි අධිපති කුජ 11 වැන්නේ තැන්පත්ය. 11 අධිපති සෙනසුරු බලවත්ව 7 වැන්නේ සෙනසුරු උච්ච බලයෙන් සිටීමත් ඒ තුළින් 'සස' යෝග බලයත්, පර්වත නම් රාජ යෝග බලය පැවැතීම, දිග්බලව සිටීම, වර්ගෝත්තම බලය තුළ මෙම යෝග බලය මහා බලවත් යෝගයක් බවට පත්විය. මේ තුළින් රටේ ඉහළම පුටුවට යෑමට වාසනාව ලැබිණි. ජනතා ප්‍රසාදය නොඅඩුව ලැබීම, පොඩි මිනිසාගේ ආදර ගෞරවය ලැබීම වැනි ගෞරව ලැබීමට භාග්‍ය රාජ යෝග බලය ක්‍රියාත්මක වීම තුළින් පැහැදිලි වේ.

යම් ආකාරයකින් මෙම යෝග බලය ක්‍රියාත්මක කළ කුජ සෙනසුරු වෙනත් ආකාරයකින් තැන්පත්ව තිබුණා නම් මෙම රාජ යෝග බලය මේ ආකාරයෙන් ක්‍රියාත්මක නොවී එතුමා අමාත්‍යවරයෙක් වීමට ඉඩ තිබිණි. මෙම පැහැදිලි කිරීම අනුව රාජ යෝග ක්‍රියාත්මක වීමට කේන්ද්‍ර සටහනේ බලය උපරිම තිබිය යුතුය. අසුබ දෘෂ්ටි ලැබ යහපත් අයුරින් නොතිබීම රාජ යෝග බලය හීන කරයි.

**■ සාම විනිසුරු දේශබන්ධු එස්. ජේ. සමරකෝන්**



## රාජයෝග නැත්නම් කරළියේ රඟන්න බෑ

**වර්තමානයේ අප රටේ රජවරු නොමැත. අවසන් රජු වූයේ නායක්කර් වංශික ශ්‍රී වික්‍රම රාජසිංහයන්ය. ඔහුගෙන් පසු රාජකීයයන්ගේ වංශකතාව නිමාවට පත්වූ අතර ඉක්බිති අප රටේ රජකම් කරන්නට පටන් ගත්තේ දේශපාලන නායකයන්ය. සමහර දේශපාලන නායකයන් හැසිරුණේ රජවරුන්ටත් නොදෙවැනි අයුරිණි. අපි ඒ බව 1947න් පසුව දුටුවෙමු.**

පළමු පාර්ලිමේන්තුවේ අගමැති ධුරය දරන ලද්දේ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිඳුන්ය. එතුමාට එදා රජකු ලෙස කටයුතු කිරීමට අවස්ථාව උදාකර දෙනු ලැබුවේ එතුමාගේ මිථුන ලග්න කේන්ද්‍රයේ ලග්නාධිපතියා වූ බුධ ස්වක්ෂේත්‍රව, මූල ත්‍රිකෝණව හා උච්ච බලයෙන් කන්‍යාව වූ සතර වැන්නේ පිහිටීමෙනි.

අප රට දේශපාලනයේ රාජයෝග බලය ක්‍රියාත්මක වූ ප්‍රබල චරිතයක් ලෙස ඩඩ්ලි සේනානායකගේ නාමයද ඉතිහාසයට එක්ව ඇත. එතුමාගේ කන්‍යා ලග්න කේන්ද්‍රයේ ලග්නාධිපති හා දසවැන්න අධිපති බුධ, නව වැන්නේ බලවත්ව තැන්පත් වීම රාජයෝග උදාකරවීමකි. දෙවැන්නාධිපති සිකුරු එකොළොස් වැන්න වූ අයස්ථානයේ පිහිටීමද බලවත්ය.

එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමන්ගේ කුම්භ ලග්න කේන්ද්‍රයේ ලග්නාධිපති ශනි දසවැන්නේය. නවය අධිපති සිකුරුද දස වැන්නේ තැන්පත්ව ඇති අතර කේන්ද්‍රස්ථාන අධිපතියකු සහ ත්‍රිකෝණ ස්ථාන අධිපතියකු දසවැන්නේ එක් වීමෙන් රාජයෝගය නිර්මාණය වී ඇත.

ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කන්‍යා ලග්න කේන්ද්‍රයට අනුව සිකුරු ස්වක්ෂේත්‍ර බලයෙන් දෙවැන්නේ තැන්පත්ව ඇති අතර පුණ්‍යස්ථානය වූ නවවැන්නේ අධිපතීත්වයද දරයි. හතර, හත අධිපති සුරගුරු හෙවත් ගුරු ග්‍රහයා දසවැන්න වූ මිථුන රාශියේ තැන්පත්ව ඇත. එකොළොස්වැන්න අධිපති සඳු, බුධ සමඟ යෝගව දොළොස් වැන්නේ පිහිටා තිබේ. රවි ලග්නගත වීමද රාජයෝග බලය ගෙන දීමකි.

ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ මේෂ ලග්න කේන්ද්‍රය පිළිබඳව විමසා බැලීමේදී මෙතුමාගේ කේන්ද්‍රයේ ලග්නාධිපති සහ අටවැන්න අධිපති කුජ, එකොළොස්වැන්න වූ කුම්භ රාශියේ යෙදී ඇත. පස්වැන්න අධිපති රවි සහ සත්වැන්න අධිපති සිකුරු වික්‍රමස්ථානය වූ තුන්වැන්නේ යෝගව සිටී. එමෙන්ම එකොළොස්වැන්න වූ කුම්භයේ යෙදුණු කුජ, චන්ද්‍ර, කේතු හා යුරේනස්ගේ එකතුව මෙතුමාගේ චරිතය පිළිබඳව බොහෝ දේ පෙන්නුම් කරන ලදී.

කටක ලග්නයෙන් උපත ලද චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ දසවැන්න අධිපතියා වූ කුජ, ස්වක්ෂේත්‍ර වෙමින් දසවැන්නේම හතර අධිපති සිකුරු සමඟ යෝගව ඇත. ලග්නාධිපති සඳු ග්‍රහයා සත්වැන්නේ තැන්පත් වීමද, නව වැන්නාධිපති ගුරු දෙවැන්නේ යෙදීමද, තුන්වැන්නාධිපති බුධ සමක්ෂේත්‍ර බලයෙන් දෙවැන්නේ පිහිටීමද මෙතුමියට රාජයෝග බලය උදාකරවීමකි.

පෙළපත කුමක් වුවත් නායකයකු වන්නට රාජයෝග අත්‍යවශ්‍ය වේ. එපමණක්ද නොව රාජයෝගයන් හි බලය එකිනෙකට වෙනස් වන අතර එවැනි ඉතා බලවත් රාජයෝග පිහිටා තිබුණද සමහර අවස්ථාවලදී රාජයෝග භංග වන අවස්ථාද කේන්ද්‍රවල සටහන් වේ.

රාජයෝග තිබුණද ඒවා ක්‍රියාත්මක වනුයේ එම ජන්මියාගේ ලග්නයට ශුභ දශා ක්‍රියාත්මක වන විටදීය. නරක අශුභ දශා පැවැති අවස්ථාවලදී රාජයෝග යටපත් කරමින් අශුභ හා මාරක ක්‍රියාත්මක වනු ඇත.

ප්‍රාදේශීය සභාවෙන් පළාත් සභා මන්ත්‍රීවරයකු වීමටත්, පළාත් සභාවෙන් පාර්ලිමේන්තු මැති ඇමැති කෙනකු වී රටේ ප්‍රධාන පුරවැසියා බවට පත්වීමටත් රාජයෝග තිබිය යුතුමය. රාජයෝග නොමැතිව දේශපාලන කරළියේ රඟන්නට කිසිවකුටවත් දෛවය ඉඩ දෙන්නේ නැති බව අවිවාදයෙන් පැවැසිය හැකිය.

**■ පාරම්පරික ජ්‍යොතිෂවේදී කොටදෙණියාවේ ඩග්ලස් ගුණවර්ධන**



## රාජයෝග වගේම රජ වෙන්න තවත් සුදුසුකම් ඕනෑ

**රාජයෝග ඇතිව උපන් තැනැත්තා සමාජය තුළ ප්‍රධානත්වයක් දරන අතර රටේ රජ වීමට නම් රාජයෝගය තිබිය යුතුමය. නමුත් රාජයෝග ඇති සියල්ලෝම රජ වෙන්නේද නැත.**

ජ්‍යොතිෂයට අනුව රාජයෝග ගණනාවක් ඇති නමුත් වර්තමාන දේශපාලනය තුළ රාජයෝගවලට වඩා ධනය, බලය උපයෝගි කරගෙන රජ වීමට උත්සාහ දරන අය අනන්තවත් ඇති බවද දැකගත හැකිය. රාජයෝග නොසලකමින් රජ වුණ අයත්, රජ වීමට උත්සාහ දරන අයත් සිටින බවද අමුතුවෙන් කිව යුතු නැත. රටක රජ වීමට ප්‍රබල රාජයෝග වගේම රජකුට අවශ්‍ය සුදුසුකම් ගණනාවක් තිබීම වැදගත්ය. ඉතිහාසය තුළ අප රටේ රජ වූ රජවරුන් සැබෑ රජවරුන් වූ අතර ඔවුන් රජ පුටුවට වාඩි වීමට ප්‍රථම ජන්ම පත්‍රය පරීක්ෂා කර රාජයෝග තිබේද යන්න සොයා බලමින් තීරණය කළ අවස්ථා තිබේ. රජකුට අවශ්‍ය සුදුසුකම් අතර මනා දේහ ලක්ෂණ, එඩිතරකම, රාජයෝග රණශූරත්වය, බෞද්ධාගමිකයකු වීම, කුල ගෝත්‍රය, ප්‍රඥාවන්ත වීම මූලික සුදුසුකම් විය. එවැනි අංග සම්පූර්ණ රජකු රජ වූ කල රටේ අටුකොටු පිරී සෞභාග්‍ය රටක් ගොඩනැගුණේ ඔවුන් සොබාදහමට අනුව රජපුටුවට පත් වූ නිසාය.

සොබාදහමට පිටුපාමින් රාජයෝග නැති අයකු රජ වූ කල රට තුළ දියුණුවක් දැකිය නොහැකිය.

1948 ආරම්භ වූ නිදහස් ලංකාව තුළ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වූ ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල, බණ්ඩාරනායක මහත්වරු අප රටේ දේශපාලන ක්ෂේත්‍රයේ මුල් යුගයේ බිහි වූ ප්‍රබල නායකයන්ය. බණ්ඩාරනායක මහතාගේ උපන් කේන්ද්‍රය තුළ ප්‍රබල රාජ යෝගයක් තිබූ අතර එය සත්කීර්ති යෝගයයි. කුම්භ ලග්න වූ එතුමාගේ දහවැන්න තුළ චන්ද්‍රයා නීචවද සෙනසුරු සතුරුවද, සිකුරු සමඟ යෝග වුවත් ප්‍රබල රාජ යෝගය උදා වූයේ මේ අයුරින්ය.

දහවැන්නේ සිටින චන්ද්‍රයාට ත්‍රිකෝණගතව චන්ද්‍රයා සිටි රාශියේ අධිපතියා සිටිමින් ලග්නාධිපති කර්මස්ථානයක වන දහවැන්න තුළ සිටීමත් නිසා මෙම ප්‍රබල රාජ යෝගය උදාව තිබිණි.

හිටපු ජනාධිපතිවරු අතරින් ආර්. ප්‍රේමදාස, මහින්ද රාජපක්ෂ, ජේ.ආර්. ජයවර්ධන යන අයගේ උපන් කේන්ද්‍රය තුළ ප්‍රබල රාජයෝග තිබූ නිසා රටේ නායකත්වයට පත්විය. සස යෝගය තිබූ ප්‍රේමදාස මහතා පොඩි තැනක සිට දුක දරාගෙන ඉහළට පැමිණි නායකයෙකි. මහින්ද මහතාගේ චන්ද්‍රාධි යෝගය රජකමට හේතු විය. ජේ.ආර්. ජයවර්ධනට කන්‍යා ලග්නය වී විපරීත රාජයෝගය වෙශි වොශි උභයචාරි යෝගය වැනි ප්‍රබල රාජ යෝග පිහිටා තිබිණි.

රාජයෝග පිහිටන්නේ යමකු පෙර ආත්ම භවයේදී කළ කුසලකර්ම මතය. වර්තමාන දේශපාලන ක්ෂේත්‍රය තුළ කාගේත් කතා බහට ලක්වෙන ප්‍රබල චරිතයක් වූ රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රබල රාජයෝග තිබුණත් එතුමාට රටේ රජ්ජුරුවන් වීමට අවස්ථාව උදා වූයේ නැත. රාජයෝග තිබුණත් අසුබ ග්‍රහයන්ගේ දෘෂ්ටියෙන් රාජයෝග ඇති කරන ග්‍රහයන් පීඩනයට ලක් වූ කල රජකම අහිමි කරයි. සජිත් ප්‍රේමදාස මහතාගේද උපන් කේන්ද්‍රය තුළ ප්‍රබල රාජයෝග පවතී. එතුමාගේ ග්‍රහචාරය බලවත් වන්නේ 2023 ජනවාරිවලින් පසුවයි.

දේශපාලනයේ ඉහළ තනතුරු දැරීමට උපතේදී ප්‍රබල රාජයෝග බලපෑම හේතු වන බව කිව හැකිය. අප රටේ හෙළ රජවරුන් දීර්ඝ කාලයක් රට පාලනය කිරීමෙන් පසුව රාජ පුටුවෙන් බැස ගියේ රටට, ජාතියට, ආගමට විශාල මෙහෙවරක් කරමින්ය. අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා සුවිශේෂී සේවයක් කළ ඔවුන් දේවත්වයෙන් පිදිය යුතුය. නමුත් වර්තමානයේ අප රටේ බිහි වෙන රජවරුන් රජ පුටුවෙන් බැස යන්නේ ඒ අයුරින්ම යුතුකම් ඉටු කරලාද යන්න සිතා බැලීම ඔබට භාරයි.

**■ ජ්‍යොතිෂවේදී සරත්චන්ද්‍ර බෝතලාගේ**



## රාජයෝග නැති පාලකයන් යටතේ ජනතාව පීඩාවට පත්වෙනවා

**සියලු සැප සම්පත්වලින් සම්පූර්ණ වූ පුද්ගලයා සතුටින් ජීවත්වන අතර එවැන්නෝ රජුන් හා සමාන බව පැරණි ආචාර්යවරුන්ගේ මතයයි. ලාංකික ජනතාවට උරුම වූ වටිනා ජ්‍යොතිෂ ග්‍රන්ථයක් වූ අනවමදර්ශී සංඝරාජ හිමියන් විසින් රචිත "දෛවඥ කාමධේනු" ග්‍රන්ථයට අනුව රාජ වංශයක උපත ලැබූ අයකුගේ කේන්ද්‍රයෙහි උච්ච බලයෙන් යුක්ත ග්‍රහයන් තිදෙනෙක් සිටීම රාජ්‍යත්වයට පත්වන යෝගයකි. රාජ වංශයක උපත නොලැබුවත් ත්‍රිකෝණ රාශිවල උච්ච හෝ ස්වක්ෂේත්‍ර බලයෙන් ග්‍රහයන් සිටීමද ජනතා නායකයෙක් වීමට හේතුවේ. එමෙන්ම පංච මහා පුරුෂ යෝගයකින් යම් අයෙක් උත්පත්තිය ලබා ඇතොත් එවැන්නෝ කීර්තිමත් රාජ්‍ය නායකයන් බවට පත්වේ.**


ලංකාවේ දේශපාලන ඉතිහාසයට අනුව ජාතියේ පියා යනුවෙන් විරුදාවලි ලත් ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා පංච මහා පුරුෂ රාජ යෝගයකින් උපන් අයෙකි. වෘශ්චික ලග්නයෙන් උපන් මෙතුමාගේ ලග්නාධිපති කුජ ග්‍රහයා ස්වක්ෂේත්‍ර බලයෙන් ලග්නගත වීම නිසා රුචක යෝගය උදාවී තිබිණි. එකොළොස්වැන්න අධිපති බුධ ග්‍රහයා ස්වක්ෂේත්‍රව ආත්ම කාරක ග්‍රහයා වී රාහු සමඟ යෝගවීමෙන් ජනතා ප්‍රසාදය ලැබීමට හේතුවිය. ලග්නාධිපති කුජ සතුරු ස්ථානය වූ හය වැනි භාවය අධිපති ග්‍රහයාද වෙමින් රාජයෝගයක් සහිතව ලග්නයේ බලවත් වීම නිසා අධිරාජ්‍යවාදීන්ගෙන් රට බේරා ගැනීමට නායකත්වය දුන් අතර එතුමන් විසින් ජනපද ව්‍යාපාර පිහිටුවමින් දැවැන්ත කෘෂිකර්මාන්ත සංවර්ධනයක් ආරම්භ කරන ලදී.

1956 වර්ෂයේ සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු පංච මහා බලවේගයක් මෙහෙයවමින් අග්‍රාමාත්‍ය පදවියට පත් වූ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ කේන්ද්‍රයෙහි පංච මහා පුරුෂ යෝග, විපරීත රාජ යෝග, නීචභංග රාජ යෝග හෝ කේන්ද්‍රස්ථාන, ත්‍රිකෝණස්ථාන බලවත් වූ යෝග නොතිබිණි. එහෙත් කුම්භ ලග්නයෙන් උපන් මෙතුමාගේ ලග්නාධිපති වූ සෙනසුරු ආත්ම කාරක ග්‍රහයා වී කර්මස්ථානයේ යෝග කාරක සිකුරු සමඟ යෝග වීමත් රාජ්‍ය කාරක රවි ග්‍රහයා එකොළොස්වැන්නේ රාහු සමඟ යෝග වීමෙන් හිමි වූ ප්‍රසිද්ධිය මත රාජ්‍ය නායකයෙක් වීමේ වාසනාව හිමි විය. මෙතුමා බලයට පත්වීමත් සමඟම රටපුරා වර්ජන, උද්ඝෝෂණ ව්‍යාපාර බහුල වූ අතර ජාතිවාදී ප්‍රචණ්ඩ ක්‍රියා සුළු ජාතීන්ට එරෙහිව ඇති විය. වර්ගවාදය පිළිබඳ වෛරය ජනගත විය. පංච මහා බලවේගයම විරුද්ධව සිටියේය. එවැනි පසුබිමක් තුළ සතුරු ප්‍රහාරයකින් මෙතුමා මරණයට පත්වූයේ කුජ ග්‍රහයා නීච වී සතුරු ස්ථානය වූ හයවැන්නේ සිටීමෙනි.

ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය රාජ යෝග සහිතව උපන් නායිකාවකි. පංච මහා පුරුෂ රාජ යෝගයක් උදා කරමින් උපන් මෙතුමියගේ කේන්ද්‍රයේ හත් වැනි භාවයේ ස්වක්ෂේත්‍ර ගුරුගෙන් ගුරු හංස යෝගයත් අටවැන්නේ රවිගේ උච්ච බලය සහ නවවැන්නේ සිකුරු ස්වක්ෂේත්‍ර වීමත් නිසා ඉතා ප්‍රබල රාජ යෝග මෙතුමියට උදාවී තිබිණි.

ජ්‍යොතිෂ ඉගැන්වීම් අනුව ග්‍රහයන් විසින් රාජ්‍යත්වය ලබාදීමත් ග්‍රහයන් විසින් රජකමින් එළවා දැමීමත් සිදු කරති. එනිසා ලෝකය ග්‍රහයන්ගේ බලයට යටත් වූවක් බව මිනිසා දැනගත යුතුය. මෙම සිද්ධාන්තවලට අනුව පෙනීයන වැදගත් කාරණය නම් රාජ යෝග සහිතව රාජ්‍යත්වයට පත්වෙන අයගේ කාලවලදී රටටත් ජනතාවටත් යහපත් කාලයක් උදාවේ. රාජයෝග නොමැතිව රාජ්‍යත්වයට පත්වන අයගේ කාලවලදී ජනතාව බොහෝ ව්‍යසනයන්ට මුහුණ පාමින් දැඩි පීඩාවන්ට පත්වේ. ජන අරගල ඇතිවේ. මූල්‍ය අර්බුදවලට මුහුණ දීමට සිදුවේ. ජාත්‍යන්තර කීර්තිය අභියෝගයට ලක්වේ. අසහනයට පත්වන ජනතාව ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙමින් උද්ඝෝෂණවල යෙදීමට පටන් ගනී. මේ සඳහා ඕනෑ තරම් සාක්ෂි අපගේ ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් ලබා ගැනීමට අවස්ථාව තිබේ.

**■ කිව්පති ජ්‍යොතිර්වේදිනි කල්‍යාණී හේරත් මැණිකේ**



**■ තිස්ස කොරතොට**

# සිඳෙන ජල උල්පත් සහිත විඳවන රටක්

**වර්තමාන කාලය වනවිට මුළු ලෝකයම ජලය පිළිබඳව යම් යම් අර්බුදකාරී තත්ත්වයන්වලට ගොදුරු වී සිටින අතර ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර සිඳීයෑමේ අවදානමද පෙරටත් වඩා, වඩාත් ඉහළ අගයක් ගනිමින් පවතී. ජල මූලාශ්‍ර සිඳීයෑම සුළුකොට තැකිය නොහැක්කේ මිනිසාට පරිභෝජනය කළ හැකි ජලය අවම මට්ටමක තිබියදී එම අවම ප්‍රමාණයද අඩුවෙමින් යෑම මිනිස් ජීවිත කෙරෙහි දැඩි අහිතකර බලපෑමක් එල්ල කළ හැකි බැවිනි.**

ජල මූලාශ්‍ර සිඳීයෑම සඳහා දීර්ඝ කාලීන බලපෑම් මෙන්ම කෙටි කාලීන බලපෑම්ද එල්ල වී තිබේ. දිගුකාලීන බලපෑම් නිවැරැදි කිරීම සඳහා දිගු කාලයක්ම ගත වන නමුත් කෙටි කාලීන බලපෑම් වළක්වා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය. සියවස් ගණනාවක් මුළුල්ලේ විදෙස්ගත ආක්‍රමණ ආදියද එදා මෙදාතුර ජීවත් වූ පුරවැසියන් සහ පාලක පක්ෂයන්හි අත්තනෝමතික ක්‍රියාවන්ද හේතුවෙන් ලංකාවේ වන ගහනය අඩුවීම දීර්ඝ කාලීන බලපෑම් අතර ප්‍රමුඛතම සාධකය ලෙස හැඳින්විය හැකිය.

ජල හිඟය වැළැක්මට වැසි ඇතිවීම සහ භූගත ජලය සුරක්ෂිත වීම වැනි කාරණා බාධාවකින් තොරව සිදුවිය යුතු නමුත් තෙත් කලාපීය වන ගහනය ශීඝ්‍රයෙන් අඩු වී යෑම කඳුකරයේ වනාන්තර විනාශ වීම ආදිය එම ක්‍රියාවලියට බාධා පමුණුවයි.

කඳුකර ප්‍රදේශවලට ඇදහැලෙන වැසි අඩුවීම ජල හිඟය කෙරෙහි සෘජු බලපෑමක් එල්ල කරන්නේ කන්දක් ජලය රඳවා ගැනීමේදී විශාල මෙහෙයක් ඉටුකරන බැවිනි. කඳුකරයේ වන ගහනය අවම වීමෙන් වැසි ඇති වීමට බාධා එල්ලවන අතරම ඇද හැලෙන වැස්සෙන් කඳු මත පොළොවට උරාගන්නා ජලයද ඉතා ඉක්මනින් වියළී යෑම හේතුවෙන් පොළොවෙන් භූගත ජල මට්ටමද පහළට ගමන් කරයි. කන්දක් විසින් රඳවා තබාගෙන ඉතා සෙමෙන් පහත් බිම් වෙත නිකුත් කරන ජල ප්‍රමාණය අවම වීමෙන් පහත්බිම්වල ජල මූලාශ්‍රද ඉතා ඉක්මනින් සිඳී යයි.

ස්වාභාවිකව ගලා යන ජල මාර්ග විවිධ හේතූන් උදෙසා අක්‍රමවත්ව වෙනස් කිරීම ජල හිඟය නමැති අර්බුදයට තවත් එක් හේතුවකි. විවිධ කෘෂිකාර්මික කටයුතු, ජලවිදුලි උත්පාදනය ආදී මිනිස් ක්‍රියාකාරකම් වෙනුවෙන් මෙසේ ජල මාර්ග වෙනස් කිරීම තුළ එම ජල පද්ධතිය මඟින් පෝෂණය වන පොළොව තුළින් ඇදී යන දිය සීරා ආදිය සිඳී ගොස් සම්පූර්ණ පද්ධතියටම දැඩි බලපෑමක් එල්ල වේ.

තෙත්බිම්, පහත්බිම් සහ කුඹුරු ස්වාභාවික ජල ගබඩා ලෙස ක්‍රියා කරයි. ගංගාවල රැඳී ඇති වැලි තට්ටු මඟින් ද මෙම ජල ගබඩා පවත්වාගෙන යයි. මෙසේ පවතින ජල ගබඩා තුළින් ළිං සහ උල්පත් ආදියට ජලය කාන්දු කරයි.

වැවක් වැනි තැනකින් භූගත ජලයට ජල කාන්දු වීම සිදුවන්නේ ඉතා අවම ප්‍රමාණයකිනි. වැවක පතුල මඩ කිරීම හේතුවෙන් එහි ජලය පොළොවට උරා ගැනීම වළක්වයි. ගඟක පතුලේද මඩ තැන්පත් වීම සිදු වුවහොත් භූගත ජලයට දායකත්වය දැක්වීමට ගඟකට හැකියාව ලැබෙන්නේ නැත. ගඟක වැලි සුරක්ෂිත විය යුත්තේ මෙම ක්‍රියාවලියට එහි ඇති දායකත්වය අඩුවක් නොමැතිව ලබාගත හැකි නිසාය. ජල මූලාශ්‍රවල ආරක්ෂාව වෙනුවෙන් මෙම ජල ගබඩා සුරක්ෂිත කිරීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතුය.

යම්කිසි ඉදිකිරීමකදී එම භූමියෙන් 60%ක ප්‍රමාණයක ඉදි කිරීම සිදුකළත් ඉතිරි 40% ප්‍රමාණය වැසි ජලය සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ඉතිරි කළ යුතුය. වැසි ජලය උරාගන්නා හිස් අවකාශ ලෙස මෙම 40% ප්‍රමාණය පැවැතිය යුතු බව ඉදිකිරීම් ක්‍රියාවලියෙහි පවතින නිර්ණායකයකි. එසේ වුවද බොහෝවිට ඉදිකිරීම් ක්‍රියාවලීන් තුළ මෙම 40% ඉඩ ප්‍රමාණය ඉතිරි කර ඇති නමුත් නාගරික ප්‍රදේශවල කොන්ක්‍රීට්, තාර හෝ ගල් වර්ග භාවිත කරමින් එම අවකාශය වසා දැමීම හේතුවෙන් වැසි ජලය පොළොවට උරා ගැනීම සම්පූර්ණයෙන්ම පාහේ ඇනහිටී. භූගත ජලයට එක්විය යුතු ජල ප්‍රමාණය පොළොවට උරා නොගෙන බැස යෑම හේතුවෙන් ළිං උල්පත් සහ ඇළ මාර්ගවල ජලය අඩුවීම ශීඝ්‍රයෙන් සිදුවේ.

ජල අර්බුදයට බලපාන්නා වූ තවත් හේතුවක් වන්නේ ජලය දැඩි ලෙස අපවිත්‍ර වීමයි. ජල මූලාශ්‍ර සිඳී යමින් අවසානයේ ඉතිරි වන ඉතා කුඩා ජල ප්‍රමාණය ද අපවිත්‍ර වීම හේතුවෙන් පරිභෝජනයට සුදුසු නොවීම මෙම අර්බුදකාරී තත්ත්වය තවදුරටත් වැඩිදියුණු කරයි.

**[ පාලකයන්ගේ- බත් බැළයන්ගේ අමන තීන්දු**

**[ ජනතාවද වගකීම් සහගත බවින් මිදීමක්**

මේ සියලු දේ සමඟ දේශගුණ සහ කාලගුණ විපර්යාසද ජල මූලාශ්‍ර සිඳී යෑම සහ ජල අර්බුදය වැඩිදියුණු කිරීමට හේතු සාධක බවට පත් වී තිබේ. වැසි තත්ත්වය අවම වීම දිගුකාලීන නියං තත්ත්ව ඇතිවීම ආදිය සෘජු බලපෑම් එල්ල කරයි.

දිනෙන් දින ඉතාම දැඩි අර්බුදයක් බවට පත්වෙමින් යන ජල ගැටලුව විසඳා ගැනීමට වැඩි කාලයක් නොගෙන පිළියම් යෙදිය යුතුය. මිනිසුන්ට භාවිත කිරීමට සුදුසු ජල උල්පත් ශීඝ්‍රයෙන් සිඳී යෑම ඉදිරියේදී බරපතළ ගැටලු කිහිපයක්ම නිර්මාණය කිරීමට හේතු වන බව පෙනී යයි.

ජලපෝෂක සංරක්ෂණය පිළිබඳව ප්‍රතිපත්ති පවා සකස් වී ඇති නමුත් ඒවා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම ගැටලුවකි.

ජල මූලාශ්‍ර සුරක්ෂිත කරමින් මෙම ගැටලුවෙන් මිදීමට යෙදිය හැකි කෙටි කාලීන ක්‍රියාමාර්ග අතර ප්‍රමුඛතම ක්‍රියාමාර්ගය වන්නේ ජල පෝෂක සංරක්ෂණය කිරීමයි. කිසිදු ආකාරයකින් ජල පෝෂකයක් විනාශ නොකිරීමේ ප්‍රතිපත්තියකට පැමිණිය යුතුය. වෙනත් ව්‍යාපෘති සඳහා ජල පෝෂක ප්‍රදේශ කිසිසේත්ම භාවිත නොකළ යුතුය.

සංවේදී පරිසර පද්ධති සඳහා මිනිස් බලපෑම් අවම කරමින් ඒවා සුරක්ෂිත කිරීම සඳහා පරිසරය සුරැකීම සඳහා පනවා ඇති නීති ක්‍රියාත්මක කරමින් කටයුතු කළ යුතුය. එසේම ගංගාධාර, ජලාධාර, ඇළ දොළ ආදිය සඳහා වන රක්ෂිත වෙන් කිරීමද අත්‍යවශ්‍ය කටයුත්තකි. ගංගා ආශ්‍රිතව පවතින රාජ්‍ය හෝ පෞද්ගලික සියලු ඉඩම්වලට අදාළව ගංගා ප්‍රේරක කලාපයක් නම් කිරීම කඩිනම් කළ යුතුය.

2017 වසරේ නිකුත් කළ ගැසට් නිවේදනයක් මඟින්ද භූගත ජලය අවභාවිත කිරීම සිදුනොකළ යුතු බව සඳහන් කර තිබේ. භූගත ජලය සියලුදෙනාට අයත් පොදු සම්පතකි. එය පෞද්ගලික අවශ්‍යතා සඳහා අසීමිතව භාවිත කිරීමට නොහැකි ලෙස නීති සම්පාදනය වී පවතී. නමුත් ඒ පිළිබඳව ඇති අනවබෝධය හේතුවෙන් හෝ භූගත ජලය අවභාවිතය දිගින් දිගටම සිදුවේ. කෙටිකාලීන වැඩපිළිවෙළක් යටතේ භූගත ජලය අවභාවිතාව පිළිබඳව ඇති නීති පිළිබඳව සමාජය දැනුවත් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමද සිදුකළ යුතු තවත් එක් කර්තව්‍යයකි.

දීර්ඝ කාලීන විසඳුමක් ලෙස කඳුකරයේ මෙතෙක් කල් විනාශ කරන ලද වන ගහනය නැවත ප්‍රතිස්ථාපනය කිරීමට හැකි උපරිම උත්සාහයක් දැරිය යුතුය.

අතීතයේ පෙරදිග ධාන්‍යාගාරය ලෙස හැඳින්වුණු මේ පොළොවේ ඉපදුණු මිනිසුන් බීමට දිය පොදක් සොයාගත නොහැකිව අසරණ වන දිනයක් උදා නොකරන්නට සාමූහික වගකීමක් අප සෑම කෙනකු අතම තිබෙන බව අමතක නොකළ යුතුය.

**■ දිල්රූ ජයසේකර**

**විශේෂ ස්තුතිය**
**ජයන්ත විජේසිංහ**
**කැඳවුම්කරු**
**වැසි වනාන්තර සුරකිමු සංවිධානය**



C M Y K



WALK IN TRUTH
Springfield College
ගේට්වේ සමූහයට පූර්ණ අයිතිය ඇති පාසලකි
පරිපූර්ණ අධ්‍යාපනයක් සඳහාම නිර්මාණය වූ
නවතම පෞද්ගලික පාසලක් - නුගේගොඩට
වැඩි විස්තරඃ 076 497 7987
වෙබ්ඃ www.springfield.lk • ඊමේල්ඃ info@springfield.lk
ශාඛාඃ මහනුවර - ටෙලි: 081-2202244 / 4951172 • බොරැල්ල - ටෙලි: 011-2686557 / 2682554
දේශීය විෂයය මාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන්
2022 අප්‍රේල් නව බඳවා ගැනීම් සඳහා ලියාපදිංචිය දැන් සිදු කෙරේ
1 - 5 ශ්‍රේණි දක්වා
උසස් පෙළ දක්වා ශ්‍රේණි වර්ධනය වේ




Sampath FC PRIME
විදේශ මුදල් ඉතුරුම් ගිණුම්
සම්පත් FC Prime වෙතින්
ඔබේ ඇ. ඩොලර් සඳහා
33%
බෝනස් පොලියක්!
ඔබේ ඇ. ඩොලර් සඳහා ඉහළම වටිනාකමක් ලබාදෙමින් 33% ක බෝනස් පොලියක් දෙන එකම විදේශ මුදල් ඉතුරුම් ගිණුම සම්පත් FC Prime පමණයි.
සම්පත් බැංකුවේ විශ්වාසනීයත්වය සමගින් අසමසම මූල්‍ය පහසුකම් රැසක් ඔබත් අත්විඳින්න.
• සාමාන්‍ය ඉතුරුම් ගිණුමකට වඩා ඉහළම පොලියක්
• වා. ස. පො. 4.05%
සම්පත් බැංකුව
හෙට දින එළිය කරයි
0112 30 30 50
www.sampath.lk
සම්පත් බැංකුව ෆිච් රේටිංස් AA-(lka) ශ්‍රේණිගතයි.

මව්බිම

සිලෝන් නිවුස්පේපර්ස් (පෞද්:) සමාගම,
101, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07.

- දුරකතන, කර්තෘ මණ්ඩලය
011-7566511
011-7566512
- ෆැක්ස්
011-7566514
- වෙබ් අඩවිය
www.mawbima.lk
- ඊ.මේල්
news@mawbima.lk
- බෙදාහැරීම්
011-7566583
011-7566584
- ෆැක්ස්
011-7566587
- දැන්වීම්
011-7566568
011-7566572
- ෆැක්ස්
011-7566569

# ශ්‍රී ලංකාව දූෂිත රාජ්‍යයන් අතර පෙරමුණේ

ශ්‍රී ලංකාව පසුගිය වසරේ දූෂිත රාජ්‍යයන් අතර තවත් අංක කිහිපයකින් ඉදිරියට පැමිණ ඇති බව ඉකුත් සති අන්තයේ වාර්තා විය. ලෝක දූෂණ සංජානන දර්ශකය ඉදිරිපත් කරන්නේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් සාමූහිකය මඟිනි. රාජ්‍යයන් 184ක දත්ත වාර්ෂිකව ගණනය කිරීම මඟින් ඔවුහු ස්වකීය නිර්ණායක ඉදිරිපත් කරති.

දූෂණ සංජානන දර්ශකය (CPI) අනුව 2020 වර්ෂයේදී 94 වන ස්ථානයේ සිටි ශ්‍රී ලංකාව 2021 වසරේ 102 දක්වා අංක 8කින් දූෂිත රාජ්‍යයන් අතර ඉදිරියට ගොස් තිබේ. දැන් ශ්‍රී ලංකාව සිටින්නේ දූෂිත රාජ්‍යයන් විෂයෙහි සෝමාලියාව, සිරියාව, සුඩානය යන රාජ්‍යයන් හා සමාන්තරවය.

අප 102 ස්ථානයේ සිටින අතර ලෝකයේ දූෂිත රාජ්‍යයන් ලෙස මෙතෙක් හංවඩු ගැසී තිබුණු ලෙසතෝ, සර්බියාව, ටැන්සානියාව, ඉතියෝපියාව, කොලොම්බියාව ආදී රාජ්‍යයන් මේ වනවිට සිටින්නේ 96 වන ස්ථානයේය. බොහෝ රාජ්‍යයන් වසර 10ක කාලසීමාවක් දූෂණය වර්ධනය නොවී එකම තත්ත්වයේ පවත්වා ගැනීම දූෂණ සන්ධාන දර්ශකය අපට පෙන්වා දෙන විශේෂත්වයකි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ස්වකීය ඇගැයීම් සඳහා පරිශීලනය කරන්නේ රාජ්‍ය අංශයේ මූල්‍ය භාවිතාවය. ඕනෑම රාජ්‍යයක් මහජන මුදල් සම්බන්ධයෙන් අනුගමනය කරන පිළිවෙත ඔවුහු විමර්ශනය කරති.

මහජන මුදල් අවභාවිතය, මූල්‍ය තොරතුරු සැඟවීම, අල්ලස් ගැනීම, වෙන් කරනු ලැබූ මහජන මුදල් නියමිත කාර්ය පටිපාටීන්ගෙන් බැහැරව වෙනත් කටයුතු සඳහා වියදම් කිරීම, මුදල් සම්බන්ධ පාරදෘශ්‍යභාවය නැතිවීම සහ මුදල් විශුද්ධිකරණය ආදී ප්‍රමිතීන් ගණනාවක් ඔස්සේ රාජ්‍ය මුදල් පරිහරණය ඔවුන් විසින් විභාග කෙරේ.

රාජ්‍යයක දේශපාලන බලය හිමි පුද්ගලයන්ගේ ක්‍රියාකාරිත්වය මත සිදු කරන්නා වූ මූල්‍ය රෙගුලාසි බිඳ දැමීම්, ටෙන්ඩර් පටිපාටි උල්ලංඝනය, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අත්හිටුවීම ආදිය නිසා රාජ්‍යයට අයත් විය යුතු සංවර්ධනයේ ආර්ථික ප්‍රතිලාභ වෙනත් පුද්ගලයන් කරා ගලා යෑම දූෂණයේ විශේෂ ලක්ෂණයයි.

මෙම මිනුම්දඬු වර්තමාන ශ්‍රී ලංකාවේ දේශපාලන ව්‍යුහය මත, රාජ්‍ය මුදල් පරිපාලනය මත තබා මැන බැලීමට කිසිදු ශ්‍රී ලංකා පුරවැසියකුට අමුතුවෙන් කියා දිය යුතු නොවේ. ලංකාවේ ආණ්ඩු ජාතික සම්පත් කුණුකොල්ලයට විකුණා දැමුවේ ටෙන්ඩර් පරිපාටියකට අනුව නොවේ. රටේ පුරවැසියන් මැති ඇමැතිවරු හඳුන්වන්නේ කොමිස් කාක්කන් ලෙසිනි.

පසුගිය රජය හම්බන්තොට වරාය චීනයට විකිණුවේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරවය. වර්තමාන ආණ්ඩුව යුගදනවි LNG බලාගාර ගිවිසුම අස්සන් කළේද, ත්‍රිකුණාමලය තෙල් ටැංකි ඉන්දියාවට විකිණුවේද ටෙන්ඩර් පටිපාටියකින් තොරවය. ඒවා වැටෙන්නේ දූෂිත ගනුදෙනු හැටියටය.

මහජන මුදල්වලට රාජ්‍ය අංශයේ වගකීමක් නැත. කොවිඩ් වසංගතයට මුහුණ දීම පිණිස ලැබුණු ජාත්‍යන්තර ආධාර වැය වූයේ කෙසේදැයි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හෝ දැනුවත්ව නැත. තොරතුරු දැනගැනීමේ පනතක් සම්මතව තිබුණද රජය එන්නත් මිලදී ගත්තේ කෙසේදැයි, සෞඛ්‍ය උපකරණ මිලදී ගත්තේ කෙසේදැයි, මහජනතාවට දැනගැනීමට කිසිදු ඉඩක් තබා නැත.

දශක කිහිපයක සිටම ශ්‍රී ලංකාවේ බලයට එන ආණ්ඩු ප්‍රසම්පාදන ක්‍රියාවලීන් තඹයකට මායිම් කරන්නේ නැත. අත යට නොව, මේසය මත ගනුදෙනු සිදුවන බව සියල්ලෝ දනිති. මේ වනවිට ශ්‍රී ලංකාවේ විදේශ ණය ට්‍රිලියන 13කි. එම ණය මුදල්වලින් ගොඩනැගුණු ව්‍යාපෘතිවල තක්සේරු වටිනාකම ට්‍රිලියන එකකි. දූෂණේ දිග පළල හිතා ගන්නට වෙනත් අටුවා ටීකා වුවමනා නැත.

රටේ ජනතාවගෙන් සාතිශය බහුතරය දිළින්දන් බවට පත්වෙමින් සිටින අතර අතළොස්සක් අතට වත්කම් ගොඩගැසෙමින් පවතී. ජනගහනයෙන් 85%ක් වක්‍ර බදුවලින් සූරාකෑමට ලක්වන අතර සෘජු බදුවලට යටත් වන්නේ ජනගහනයෙන් සියයට 15ක් පමණි.

මේ තත්ත්වය මත රටට අනාගතයක් හෝ වර්තමානයක් නැත. මේ මගේ රට, අපේ දරුවන්ගේ රට කියා කල්පනා කොට රාජ්‍ය අංශයේ ගෞරවය රැකෙන විධිමත් මූල්‍ය පරිපාටි ඇති කර ගැනීම සඳහා ජනතාව ඉදිරියට පැමිණ පාලකයන්ට බල කරන තුරු මේ තත්ත්වය වෙනස් කළ නොහැකි වනු ඇත.

ජනතාව දූෂණයට එරෙහිව නැඟී නොසිටින තාක්කල්, ජනතාව දූෂණය ඉවසන තාක්කල් ශ්‍රී ලංකාව ලොව පළ මු පෙළේ දූෂිත රාජ්‍යයක් බවට පත්වීම වළක්වනු නොහැකිය.

# ඇත්ත කියන ආණ්ඩුවක්





රටේ ජනතාවට අලුත් නිදහසක් වුවමනා කර තිබේ. රටට සහ ජනතාවට ඇත්ත කියන ආණ්ඩු ක්‍රමයකි. මහත් වර්ණනාවෙන් මවා පෙන්වන ලද විභූතිය අනුව අසමසම රාජ්‍යයකි. වරදක් නැත. අපට ඉතිහාසයක් තිබේ. ජගත් ප්‍රජාව මවිත කරන නිමැවුම්වල හිමිකාරයෝය. අධිරාජ්‍යවාදීහු අපගේ ශක්තිය වැනසූහ. ධෛර්යය අතුගා දැමූහ. බලය තුනී කරනු සඳහා නිලධාරිවාදය, රදලවාදය භාවිත කළහ. නිදහස ලබාගත් ලාංකිකයෝ විජාතිකයන්ටත් වඩා යහමින් එකී පිළිවෙළ ඉදිරිට ගෙනයමින් සිටිති. අද වන විට අප ආර්ථිකයෙන්, සමාජ ක්‍රමයෙන් හා විනයෙන් පිරිහී ඇති රටකි.

සමාජය නැවත ගොඩනඟා ගත යුතුය. රටට අරමුණක් හා අරමුණු සාක්ෂාත් කරගන්නා වැඩපිළිවෙළක් වුවමනා කර තිබේ. දවස ගත කරන එදාවේල ආර්ථිකයක සිටින ශ්‍රී ලංකාව මෙතැනින් ගලවා ගැනීමට දියසෙන්වරු එන්නේ නැත. අප කෙරෙහි විශ්වාසයක් ඇති කරගත යුතුය. විශ්වාසය දිනාගැනීම මෙරට ආගමික, දේශපාලනික හා ජන නායකයන්ගේ වගකීමකි.

## අපට ඇති හැබෑ අර්බුදය ගැන අවධානයක්

රටට ආහාර ප්‍රශ්නයක් නැත. ලෝකයේ දර්ශක අනුව දරුවෝ හොඳ පෝෂණ මට්ටමකය. ඉතාම දියුණු බව කියන ඉන්දියාව ලෝකයේ කුසගිනි දර්ශකයේ පහළට තල්ලු වී සිටී. 2021 ලෝකයේ Hunger indexහි ඉන්දියාවේ තැන 100 ඉව දැක්වේ. කලින් වසරේ 94 වැනි තැන සිට පහළට වැටී ඇත. ආර්ථිකය දියුණු, චීනයට අභියෝග කරන, මිසයිල් අත්හදා බලන ඉන්දියාවේ දරුවෝ පෝෂණයෙන් අඩුය. උසට සමාන බරක් නැත. නිසි පෝෂණය නොලැබේ. මෙම ඉලක්කම් හෙළි කරන්නේ වාර්ෂිකව කරුණු සොයා බලන ජාත්‍යන්තරව පිළිගත් ආයතනයකි. ලංකාව මෙම ලැයිස්තුවේ 65 වැනි තැනය. ජීවන සහ සෞඛ්‍ය දර්ශක අතර ශ්‍රී ලංකාව සිටින තැන නරක එකක් නොවේ. එය රටට දැනෙන කාරණයකි. කුණු බක්කි අවුස්සා ආහාර හොයන දිළිඳුභාවයක් අපට නැත. ආහාර මිල වැඩි බව ඇත්ත කතාවකි. අත දිගහැර මිලදී ගන්නට සාමාන්‍ය ජනතාවට පුළුවන්කමක් නැත. පසුගිය මාස තුන, හතර තුළ වාර්තාගත උද්ධමනයක් වාර්තා වී තිබේ. ජනතාව කුසගින්නේ නොවේ.

රටට ඇති ප්‍රශ්නය මැදි ආදායම් ස්වභාවය බව සඳහන් කළ යුතුව ඇත. එක්තරා සමාජ මට්ටමකට දියුණු වූ අප සියලු දෙනාටම එදිනෙදා විවිධාකාර අවශ්‍යතා තිබේ. ඇඳුම් පැලඳුම්, වාසස්ථාන, යාන වාහන හෝ ඉඩ කඩම් ගැන අවධානයක් ඇත. දරුවන් යොමු කළ යුතු හොඳම පාසල ගැන විශාල තරගයක් තිබේ. සම්පත් බෙදීයෑම බරපතළ ආරවුල් ඇති කරන අතර පවතින සමාජ ක්‍රමය එයට හේතුවකි. දේශපාලන සබඳතා අනුව අවස්ථා ඇති කරන විකෘති පිළිවෙළ විශාල හානියක් කර ඇත. දේශපාලනඥයෝ පාලනය කරන ආර්ථිකයකින් දරුණු ප්‍රශ්න මතු වී තිබේ. මේවා පිළිවෙළක් කරගැනීම අපට ඇති අභියෝගයකි.

## ක්‍රමය ගැන විවේචනය උගන්වන පාඩම

දැනට පවතින දැවැන්ත විවේචනය දේශපාලනඥයන්ට පාඩමකි. ක්‍රමය පුළුල් කරන්නට ඉඩ නොදෙන ඔවුන්ගේ හරස් කැපීම් ගැන පක්ෂ භේදයෙන් තොර අරගලයක් සමාජයට ඇත. ඉහළ පෙළැන්තිය පමණක් භුක්ති විඳින වරප්‍රසාද ගැන බරපතළ ආරවුලක් තිබේ. නීති හා රෙගුලාසි පනවා එයින් පැන අවස්ථාව දිනා ගන්නා බලය හිමි සමාජය ගැන වෛරයක් ඇති බව වටහා ගත යුතුය. එක පක්ෂයක්, එක දේශපාලන චරිතයක් ගැන නොවේ. බලයට පැමිණ බලය උපයෝගී කරගෙන තමන්ගේ සහචරයන්ට පමණක් අවස්ථා හදන ක්‍රමය ගැන විශාල පිළිකුලක් ඇත. බලයේ සිටින දේශපාලනඥයන් පමණක් නොව බලයට එන්නට තතනන පක්ෂ මෙම අභ්‍යන්තරය හොඳින් වටහාගත යුතුව තිබේ. ජනතාවට ඇති පීඩනය දුප්පත්කම නොවේ. හාල් කිලෝවක මිල, පරිප්පුවල ගණන් වැඩිවීම, එළවළු මිල අහස උසට නැඟ ඇති බව ඇත්ත කතාවකි. මාළු මිල ගණන් ගැනද පොදු මහජනතාව ප්‍රශ්න කරන බව දැක්විය යුතුය. එහෙත් හැබෑ ගැටලුව එය නොවේ. ජනතාව දුප්පත් මානසිකත්වයක තබන්නට වැර දරන කපටි දේශපාලනඥයෝ එය නොදන්නවා නොවේ.

ජාත්‍යන්තර මාධ්‍ය පවා වාර්තා කරන පරිදි වාහන මිල ගණන් අහස උසට නැඟ ඇත. පාවිච්චි කළ වාහනයක මිල හිතාගත නොහැකි තැනකය. එහෙත් වෙළෙඳපොළක් තිබේ. ඉඩම් හා දේපොළ මිල ගණන් අනුව බලන කල ජනතාව දුප්පත් නැත. අධිවේගී මාර්ග ආසන්නයේ ඉඩම් මිල දෙගුණ තෙගුණ වී ඇත. රන් මිල ගැන අවධානය යොමු කළ යුතුය. ලක්ෂ ගණනින් වැඩිවී ඇති නමුත් රත්රන් වෙළෙඳාම අඩුවී නැත. බහුතරයක් දෙනා සිමෙන්ති, ටයිල් හා නානකාමර උපකරණ සොයමින් සිටිති. මෙම පිරිස ධනය නැති කොටසක්ද? දරුවන් උගන්වන්නට යවන්නේ පෞද්ගලික විශ්වවිද්‍යාලවලටය. නැත්නම් වෙනත් රටකටය. ඩොලර් නැතිකම ඔවුන් මුහුණදී ඇති ප්‍රශ්නයකි. ආණ්ඩුව ෆේල් කියන දේශපාලන පක්ෂ දැන් පවතින සමාජ අර්බුදය සමත් කරන්නේ කෙසේද යන්න ගැන සාකච්ඡා කිරීම අවශ්‍යය. නමුත් පීඩනය විඳගෙන සිටින දුප්පත් ජන කොටසක්ද සිටී.

## ආර්ථික ක්‍රමය වෙනස් කිරීමේ වුවමනාව

රටට අවශ්‍ය විවෘත ආර්ථිකයෙහි දෙවැනි පියවරකි. වසර හතළිස්පහකට කලින් විවෘත ආර්ථිකය හඳුන්වා දෙන විට රට තිබුණු තැන මෙයට නොදෙවැනිය. ණය බර නොතිබුණු බව පිළිගත යුතුය. එහෙත් ජනතාවගේ අත මිටද සරු තැනක නොතිබිණි. නිවෙසක පරිහරණය කළ බඩු භාණ්ඩ එය දක්වන මිනුම් දණ්ඩකි. ආනයන දොරටු විවෘත කළ ආණ්ඩු ඒවා ගෙන්වන ඩොලර් සොයන පියවරට උත්සුක වූයේ නැත. රට තුළ වත්කම නංවා ගත් ජන කොටස් ආනයනික දේ මිලදී ගත් අතර ඒවා සපයන්නට විදේශ විනිමය සොයන අලුත් මාවතක් සොයා නොගැනීම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ වරදකි. පරම්පරා ගණනක් වෙහෙසෙන නමුත් තේ අපනයනයෙන් රටට ලැබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන එකකි. පොල් හා රබර් අනයනයද එයට අඩුය. ඇඟලුම් අපනයනය ඇමෙරිකානු ඩොලර් බිලියන පහකි. විදේශිකයන්ට යට ඇඳුම් මහන ව්‍යාපෘති වශයෙන් අපහාස කළේ එතැනටය. රටට වැඩිම විනිමයක් එනම් ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් ලැබෙන්නේ මැදපෙරදිග ඇතුළු රටවල සේවය කරන ලාංකිකයන්ගෙන්ය. මෙම රටාව අපට ප්‍රශ්නයක් බව පෙනෙන්නේ නැද්ද? ශ්‍රී ලංකාව විදේශ විනිමය උපයන්නේ කොතැනින්ද?

සංචාරක කර්මාන්තයේ තිබුණු ඉලක්කය වසර 2025 වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන පහකි. අද එය බින්දුවට වැටී තිබේ. රටට ආයෝජන කැඳවන සියලුම ප්‍රයත්න අඩාල වී ඇත. සංචාරක කර්මාන්තය හා විදේශ ආයෝජන හැර වෙනත් තැනක් විනිමය උත්පාදනය සඳහා නැත. විදේශ විනිමය රහිත ආර්ථිකයක් තුළ මැදි ආදායම් රටක ජනතාව ඉල්ලන කිසිම දෙයක් කරන්නට දැන් බලයේ ඉන්නා ආණ්ඩුවට හෝ අනාගතයේ බලයට එන්නට සූදානම් වන ආණ්ඩුවකට නොහැකිය. මෙරට දේශපාලනඥයන් එය මතක තබා ගත යුතුය. පටු දේශප්‍රේමීත්වයක් හුවා දක්වා රටට එන්නට සිටි ආයෝජන පලවා හැරි මෙරට පිරිස් අඩුම තරමින් රටට ලැබුණු ආධාර පවා ප්‍රතික්ෂේප කරන තැනට ආකල්ප ඇති කළේය. ආයෝජන ඉදිරියේ මෙරට වෘත්තීය සමිති හා දේශපාලන කණ්ඩායම් තට්ටුමාරුවට ගෙන ගිය අරගලයෙහි කෙළවර අද අපට අත්විඳින්නට සිදුවී තිබේ. මෙම ක්‍රමය වෙනස් නොකළහොත් අනාගතය අවිනිශ්චිතය.

## මහජනතාවට ඇත්ත කියන දේශපාලනයක්

ආර්ථිකය වෙනස් කරන්නට තද තීරණ අවශ්‍යය. ඒවා කිසිසේත් පහසු ඒවා නොවේ. වෙනස් මතවාදී පිරිස් රට විකුණන, රට බෙදන බවට විලාප නඟනු ඇත. සිංගප්පූරුව වෙන්දේසි වී නැත. බංග්ලාදේශය, තායිලන්තය හෝ මැලේසියාව කොටස් කර විකිණී තිබේද? වියට්නාමය දැන් ආයෝජන එන රටකි. රටට අනන්‍ය ක්‍රමයක් හදාගෙන ආයෝජන කැඳවුවහොත් එයින් වාසිය ආර්ථිකයටය. පිටරටින් ධනය සහ තාක්ෂණය සහිත ආයෝජන අවස්ථා එපා කියන අපට අපගේ ව්‍යවසායකයන්ට අවස්ථාව දෙන පිළිවෙළක් හැදිය යුතුය. මොනවා හෝ නිපදවා අපනයනය කරන්නට අවශ්‍යය. එවැනි පියවරකින් තොරව විනිමය උපයන්නේ කෙසේද? උත්පාදනයක් රහිත, ණය ගැනීම පමණක් පදනම් කරගත් ආර්ථිකය අද රට ගෙනැවිත් තබා ඇති තැන නරකය. ඇමෙරිකානු ඩොලර් බිලියන තිස්හතක ණයක් ගෙවන්නට තිබේ. රටට ඇති විනිමය සංචිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 3.1කි. මෙම අවුරුද්ද තුළ ගෙවිය යුතු ණය හා පොලිය පමණක් ඇමරිකානු ඩොලර් බිලියන හතකි. ණය ගෙවන්නට හෝ වත්කමක් නැති රටක් ඉහළට ඔසවන්නේ කෙසේද? ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක බැඳුම්කර ගෙවන ලද ආණ්ඩුව දැන් බිලියන 300ක බැඳුම්කර ණයක් ගන්නට සූදානම්ය.

හොරකම, වංචාව, දූෂණය යනාදී වශයෙන් ගෙන යන මහා මතවාදයකින් ජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කර නැත. මහජනතාවට ඇත්ත කියන, එම සත්‍යය මත පදනම් වූ විශ්වාසවන්ත ආර්ථිකයක් අපට වුවමනා කර තිබේ. රට ගැන ඇති විශ්වාසය ආයෝජන කැඳවනු ඇත. වහාම විනිමය සංචිත උපයා ගත යුතුය. වාණිජ ණය ගැනීම නතර කළ යුතුව ඇත. වාණිජ ණයවලට ගෙවන සියයට හතක වාර්ෂික පොලිය ජාතික අපරාධයකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සියයට එකකට අඩු පොලියකට නිකුත් කරන ණය සංචිතයක් ප්‍රතික්ෂේප කරන්නේ ඇයි? එම සංචිතය සමඟ ආර්ථිකය නැවත ගොඩනඟා ගතහොත් ජපානය, යුරෝපා රටවල් හා ඇමෙරිකාව සමඟ ආයෝජන අවස්ථාවලට ඇතුළු විය හැකිය. පුළුල් රාමුවක් ගැන සාකච්ඡා කළ යුතුය. දුගී දුප්පත් භාවයෙන් ගැලවීමට ආධාර දෙන රටවල් තිබේ. එහෙත් මැදි ආදායම් මට්ටමක සිට ඉහළට නැඟෙන්නට කිසිම රටක් නොමිලේ යමක් දෙන්නේ නැත. මැදි ආදායම් ආර්ථිකය එක්තරා ආකාරයක උගුලක් බව ජාත්‍යන්තර මතයකි. එය ආර්ථික විශේෂඥයෝ පැහැදිලිව කියා තිබේ. කොවිඩ් වසංගතයෙන් ඇති කරන ලද විපාක හා සමාන්තරව මැදි ආදායම් උගුලක සිටින ශ්‍රී ලංකාව දෙකෙන් එකක් තෝරාගත යුතුය. ප්‍රතිපත්ති සකස් කර රට ඉදිරියට ගෙන ගියහොත් පොදු ජනතාව සතුටු කළ හැකිය.




ශාමින්ද වත්තේගෙදර

# හිරෝෂිමා බෝම්බෙටත් වඩා බලගතු ටොංගා දූපතේ ගිනි කඳු පිපිරීම



පසුගියදා සිදුවූ ටොංගා (Tonga) ගිනිකන්ද පුපුරායෑම දෙවැනි ලෝක යුද්ධයේ ඇමෙරිකාව හිරෝෂිමාවට එල්ල කළ පරමාණු බෝම්බයෙන් ඇති වූ පිපුරුම මෙන් සිය ගුණයක් බලවත් බව ඇමෙරිකාවේ නාසා ආයතනය කියයි.

ඇතැම් තැනක එය සඳහන් වන්නේ හිරෝෂිමාවට හෙළූ පරමාණු බෝම්බය මෙන් 1200 වාරයක් බලවත් පිපිරුමක් යනුවෙනි. එය TNT පුපුරණ ද්‍රව්‍යයේ මෙගාටොන් 4-18 දක්වා තොගයක් පිපිරීමට සමාන බව කියැවේ.

ටොංගා යනු ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් නගරයේ සිට සැතැපුම් 2000ක් ඈතින් පිහිටි දූපත් රාජ්‍යයකි. එය සමස්ත භූමි ප්‍රමාණය වර්ග සැතපුම් 290කට ආසන්න කුඩා දූපත් 170කින් පමණ සමන්විත දකුණු පැසිෆික් සාගර කලාපයේ පිහිටි දූපත් රාජ්‍යයකි.

සාගර ජලයෙන් යටවී පවතින හුංගා ටොංගා - හුංගා හා’අපායි (Hunga Tonga – Hunga Ha’apai) යනුවෙන් හැඳින්වෙන මෙම සුවිසල් ගිනිකන්ද කලක් තිස්සේ නිද්‍රාශීලීව සිට සක්‍රිය වන්නට ගත්තේ දශක දෙකකට පමණ පෙරය. මෙම සක්‍රියතාවේ ප්‍රතිඵලයක් ලෙස නව දූපත් දෙකක් 2015 වනවිට නිර්මාණය වූ අතර එම දූපත් දෙක එක් කරමින් හුංගා ටොංගා - හුංගා හා’පායි යනුවෙන් හඳුන්වනු ලැබිණි.

එහෙත් වසර දහස් ගණනකට පසුව ඉකුත් ජනවාරි 15දා එරට වේලාවෙන් සවස 5.14ට පැසිෆික් සාගරයේ පවතින මේ දැවැන්ත ගිනිකන්දේ මහා පිපුරුමක් ඇතිවිය. ඊට පෙර ජනවාරි 14 වැනිදා සිටම ගිනිකන්දේ පිපුරුම් වරින්වර ඇතිවූ අතර අළු අහසට විහිදුණි. මෙම අළුවලින් දූපත් රාජ්‍යයේ දූපත් වැසී යන්නට විය. සාගර ජලයට අළු මෙන්ම ගිනිකන්දෙන් නිකුත් වන ලාවා සිසිල් වීමෙන් සෑදෙන මැග්මා (magma)ද එක්වන්නට විය. එසේම ගිනි කඳු පුපුරායෑමේදී නිකුත් වන වායූන්ගෙන්ද වාතය දූෂණය වෙමින් තිබිණි. එහෙත් ජනවාරි 14දා ඇරඹුණු මේ විපත්තීන් එතෙකින් කෙළවර නොවීය. උච්චතම අවස්ථාව එළැඹියේ ජනවාරි 15දා සිදුවූ මහා පිපිරුමෙනි.

හුංගා ටොංගා ගිනි කන්දේ මහා පිපුරුමේ හඬ ඕස්ට්‍රේලියාවට ඇසිණි. ඒ අවට පිහිටි සෑම රාජ්‍යයකටම පිපුරුම් හඬ ඇසුණු අතර කැනඩාවේ යුකෝන් ප්‍රදේශයට පවා එම හඬ ඇසුණු බව සඳහන් වේ. මෙම මහා පිපිරුමත් සමඟම ඇතිවූ තර්ජනය වූයේ සුනාමි බියයි.

ගිනිකන්දේ සුවිසල් පිපිරුම සැටලයිට් ඡායාරූප ගත විය. ආසන්න රාජ්‍යයන් ගණනාවකට සුනාමි තත්ත්වයක් ඇති වූ අතර තවත් රාජ්‍යයන් ගණනාවකට සුනාමි අනතුරු හැඟවීම කරන ලදී.

සුනාමි තත්ත්වයන් බොහෝවිට ඇතිවන්නේ පොළොවේ හෝ මුහුදු පතුලේ ඇතිවන භූකම්පනයන් මඟිනි. මෙලෙස ගිනි කන්දක් පුපුරා යෑමෙන් හටගන්නා සුනාමි තත්ත්වයන් ඉතා දුලබ වන අතර මෙවැන්නක් වසර දෙසීයක කාලයකට පෙර පවා වාර්තා වී ඇත්තේ ගිනිකඳු සුනාමි 100කට අඩු ප්‍රමාණයකි.

මෙකී මහා පුපුරා යෑමෙන් කලින් කී හුංගා ටොංගා - හුංගා හා’අපායි යන බිම් දෙකෙන් නිමැවුණු නව භූමිය සම්පූර්ණයෙන්ම අතුරුදන් වූයේ පැරැණි දූපත් දෙකේ කැබලි පමණක් ඉතිරි කරමිනි.


මෙම පුපුරා යෑමත් සමඟම ඇති වූ සුනාමි තත්ත්වයෙන් ටොංගා රාජ්‍යයට අයත් වූ දූපත් තුනක් සම්පූර්ණයෙන්ම විනාශ විය. එම දූපත්වල පදිංචිවූවන්ගේ නිවාස මුහුදු වතුරින් සේදී ගියේය.

කෙසේ නමුත් හුංගා ටොංගා - හුංගා හා’අපායි ගිනිකන්ද පුපුරායෑමෙන් ජීවිතක්ෂයට පත්වූ අයගේ ගණන සඳහන් වන්නේ 5ක් වශයෙනි. 18 දෙනකු තුවාල ලබා ඇත. අනෙකුත් අය මේ වනවිටත් අතුරුදන්ය. සමහරවිට අතුරුදන්වූවන් නිල වශයෙන් ජීවිතක්ෂයට පත්වූවන්ගේ ගොඩට එක්ව පසු කලෙක නිවැරැදි සංඛ්‍යා නිල වශයෙන් අනාවරණය කිරීමට ඉඩ ඇත.

පිපුරුමෙන් විනාඩි 15කට පසු සුනාමි තත්ත්වය ඇතිවී ඇත. මෙහිදී පළමු රළ පහර ඉතා වේගවත් වී ඇත. ඉන් අනතුරුව තවත් විශාල රළ පහර 3ක් වෙරළට විත් ඇත. සුනාමි තත්ත්වයත් සමඟම ටොංගාහි රජු වන හය වැනි ටුපොව් (King Tupou vi) ජීවිත ආරක්ෂාව පතා රාජ මන්දිරයෙන් ඉවත් වී ඇත. ජීවිත ආරක්ෂාව පතා කඳු මුදුන් කරා ප්‍රවේශ වන ජනයා හේතුවෙන් මහාමාර්ගයන්හි තදබදයක් ඇති වී තිබේ.

ටොංගටාපු නමින් හැඳින්වෙන ටොංගා රාජ්‍යයේ ප්‍රධාන දිවයිනේ බටහිර වෙරළට ආ සුනාමි රැල්ල මීටර් 15කට එනම් අඩි 49කට වඩා උස මුහුදු රැල්ලක් බව කියැවේ. ඕස්ට්‍රේලියාවේ නැගෙනහිර වෙරළට අඩි 4යි අඟල් 2ක් උසට රැල්ල ගසා ඇත.

පිපිරුම සමඟ උඩට විහිදුණු අළු සමඟ ගල් කැට ප්‍රදේශය පුරා පතිත වී ඇත. ගිනි කඳු අළුවලින් ටොංගාහි ප්‍රධාන ගුවන්යානා ධාවන පථය වැසී ගොස් තිබූ නිසා



එම අළු ඉවත් කර ධාවන පථය පාදා ගැනීමට දින කිහිපයක් ගොස් ඇත.

එම අළු ඉවත් කළ පසු අනෙක් රටවලින් සහන රැගත් ගුවන් යානා ප්‍රවේශ වී ඇත. සුනාමි රළ පහරින් මුහුදු පතුල හරහා දමා තිබූ දුරකථන රැහැන්වලට හානි වීමෙන් ප්‍රධාන දූපතේ දුරකථන සබඳතා හා අන්තර්ජාල සම්බන්ධතා මුළුමනින්ම ඇනහිට ඇත. ඒවා යථා තත්ත්වයට පත්කරලීමට නෞකාවක් පැමිණෙනු ඇතැයි ටොංගා රාජ්‍යය බලාපොරොත්තුවෙන් පසුවේ.

ගිනි කඳු අළු සෑම අතම විසිරීමෙන් පානීය ජලය හා වාතය දූෂණය වීමේ බරපතළ ගැටලුද මතු වී තිබේ.

සුනාමි තත්ත්වය හේතුවෙන් මුළුමනින්ම විනාශ වී ඇත්තේ Nomuka, Mango සහ Fonoifua යන දූපත් තුනයි. කෙසේ නමුත් ටොංගාහි මුළු ජනගහනයෙන් 70%ක් පමණ වූ 1,00,000ක් පමණ දෙනා ජීවත් වන්නේ එම රාජ්‍යයට අයත් විශාලතම මෙන්ම ප්‍රධාන දූපත වන Tongatapuහිය. රාජ්‍යයට අයත් දූපත් 170න් බොහොමයක් ජනාවාසයෙන් තොරය. එහෙත් සුනාමි රළ පහරින් විනාශ වූ ඉහත දූපත්වල වැසියන් පදිංචිව සිට ඇත.

■ රූ කාරියවසම්


HORIZON CAMPUS

ඔබගේ අපේක්ෂාව සුදුසුකම් ලත් ගුරුවරයෙකු, ගුරු අධ්‍යාපනඥයෙකු, කථිකාචාර්යවරයකු හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කලමනාකරුයෙකු ලෙසින් අභිමානවත් වෘත්තිමය ජිවිතයකට පිවිසිමට නම්, එන්න අප හා එක්වන්න ...

අධ්‍යාපන පීඨය
Faculty of Education

- අධ්‍යාපනවේදී ගෞරව උපාධිය - (අවුරුදු 4යි)
  Bachelor of Education (Hons)
  (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් සතු ශ්‍රී ලංකාවේ එකම අධ්‍යාපනවේදී ගෞරව උපාධි පාඨමාලාව)
- මුල් ළමාවිය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය - (අවුරුදු 3යි)
  Bachelor of Education (Hons) in Early Childhood Education
- අධ්‍යාපනපති උපාධිය - (අවුරුදු 1 මාස 3 යි)
  Master of Education (MEd)

AeU asiaeuniversity



ඔබ HORIZON CAMPUS තෝරාගත යුත්තේ ඇයි ?

- දේශීය හා අන්තර්ජාතික පිළිගැනීම
- මහාචාර්යවරුන්, ආචාර්ය උපාධිධාරීන් ඇතුළු ඉහළම සුදුසුකම් සහිත අධ්‍යයන කාර්ය මණ්ඩලය
- පරිසර හිතකාමී වටපිටාවක පිහිටි සැබෑම විශ්වවිද්‍යාලය
- සහනදායි පාඨමාලා ගාස්තු / වාරික වශයෙන් ගෙවීමේ හැකියාව

ඉහල සුදුසුකම් ඇති සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ*

KCM KNOWLEDGE CITY MALABE — MEMBER OF access

KNOWLEDGE CITY MALABE (KCM)
KCM Drive, Off Millennium Road, Malabe, Sri Lanka.
www.horizoncampus.edu.lk
info@horizoncampus.edu.lk
0114 365 555

වැඩි විස්තර සඳහා අමතන්න
0716 593 593
0716 613 613

*කොන්දේසි සහිතයි

MINISTRY OF HIGHER EDUCATION APPROVED | UGC RECOGNIZED | THE ASSOCIATION OF COMMONWEALTH UNIVERSITIES | apqn member MEMBER OF THE APQN | INQAAHE | ACE American Council on Education




පරිසර හිතකාමී බව | 100% දේශීය නිෂ්පාදනයක් | දීර්ඝකාලීන ආයෝජනයක්

# සුන්දරත්වය දකින්න...

El Toro නිෂ්පාදන අලුතෙන් හදන ඔබේ නිවසට හෝ ගොඩනැගිල්ලකට භාවිතා කිරීම ම අලුත් සුන්දරත්වයක්. ස්වාභාවිකත්වයට කැමති ඔබට El Toro ස්වාභාවික වර්ණ පෙළ තෝරාගැනීමෙන් ස්වාභාවික සුන්දරත්වයක් දැකිය හැකියි. නවීනත්වයට කැමති ඔබට El Toro නවීන මෝස්තර හා රටාවන් තෝරාගැනීමෙන් නවීන සුන්දරත්වයක් දැකිය හැකියි. ඒ වගේම දැව භාවිතයක් නොවන නිසා ඉතිරිවන ගහකොළ ඔස්සේ ඔබට පරිසරයේ සුන්දරත්වය දැකිය හැකියි. ඒ සුන්දරත්වය දකින්න. El Toro ම ගන්න.

දුර හිතන හෙට දකින



EL TORO
දුර හිතන හෙට දකින

+94 117 661 661 +94 112 674 212 www.eltoro.lk


C M Y K




# හොලිවුඩ් නළුවත් කඩුළු සලන ලංකාවේ අලින්ගෙ දුක් කන්ද

**ලෝක ප්‍රකට හොලිවුඩ් චිත්‍රපට නළු ලියනාඩෝ ඩිකැප්රියෝ ලංකාව පාලනය කරන බීරි අලින්ට ඇසෙන්නට නිරපරාදේ මියයන ලංකාවේ අලි සම්පත ගැන කතා කර තිබේ. අසාධාරණ ලෙස මියයන ලංකාවේ අලි සම්පත ගැන ලියනාඩෝ කතා කරන තුරුම නිහඬව සිටීම ගැන අප ලැජ්ජා විය යුතුය. පසුගිය 27 වැනිදා ලියනාඩෝ සිය instagram ගිණුමේ සඳහන් කර තිබුණේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය අනුභවයෙන් මියයන ශ්‍රී ලංකාවේ අලි ඇතුන් පිළිබඳවය.**

ලියනාඩෝගේ කඳුළු කිඹුල් කඳුළු නොවේ. ඔහු සංවේදී වූයේ ලොව පුරා මාධ්‍ය ලංකාවේ අලි සම්පත පත්ව ඇති ඉරණම සම්බන්ධයෙන් දිගින් දිගට පළ කළ වාර්තා කියවීම නිසාය. ඔහුගේ හදවත රිදුම්දී තිබුණේ නැගෙනහිර පළාතේ අම්පාර පල්ලක්කාඩු කසළ රඳවනය තුළ මිය ගොස් සිටි අලියකුගේ ඡායාරූපය දැකීමෙනි.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය අනුභවයෙන් ලංකාවේ අලි ඇතුන් මියයන පුවත මෙයට පෙරද ලියනාඩෝ දැක තිබිණි. ලියනාඩෝ පමණක් නොව ලෝකයම එය දැක තිබිණි. නොදැක තිබුණේ ශ්‍රී ලංකාවේ රට කරවන ඇත්තන්ය. වනජීවීන්ගේ ආරක්ෂාව පිළිබඳ වගකීම් පැවරී ඇති වනජීවී රැකවරණය අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළ, කැලෑ නැවත වගා කිරීම, වන සම්පත් කළමනාකරණය පිළිබඳ රාජ්‍ය ඇමැති විමලවීර දිසානායක ලංකාවේ අලි කුණු කනවා දැක තිබුණේ නැත.

මෙහිලා පවතින විශේෂත්වය වන්නේ වනජීවී රැකවරණය භාර රාජ්‍ය ඇමැතිවරයා නියෝජනය කරන දිස්ත්‍රික්කය වූ අම්පාරේ ලංකාවේ ලොකුම කුණු කන්ද වූ පල්ලික්කාඩු කුණු කන්ද පිහිටා තිබීමය. පල්ලික්කාඩු කුණු කන්දේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ආහාරයට ගැනීම නිසා අලි ඇතුන් මියගිය බව ඇමැතිවරයා නොදැන සිටියාට ඇමෙරිකාවේ හොලිවුඩ් නළුවකු වූ ලියනාඩෝ දැක තිබුණේය.

ඔහු මේ සිදුවීමෙන් කම්පා වී ලංකාවේ අලින්ගේ ජීවිත බේරා දෙන්නැයි සතුන්ට ආදරය කරන ලෝක ප්‍රජාවගෙන් ඉල්ලා සිටියේය. වනජීවී ඇමැති මහජන මුදලින් වැටුප් ලබන්නේ වනජීවීන් ආරක්ෂා කරන බවට ප්‍රතිඥා දීමෙනි. මහජනතාව ඔවුන්ට වගකීම් භාරදී බලා සිටින්නේ ඔවුන් එම වගකීම හරියාකාරව ඉටු කරනු ඇත කියාය. නමුත් හොලිවුඩ් නළුවකු ඇඟිල්ලෙන් ඇන පෙන්වන තුරු අපේ රටේ වන ජීවී ඇමැතිට හෝ රාජ්‍ය ඇමැතිට කුණු කන්ද පෙනුණේ නැත. අලි කුණු කන බව පෙනුණේ නැත. අලි කුණු කා මිය යන බව පෙනුණේ නැත.

ශ්‍රී ලංකාවේ සංචාරක විෂය භාර කිසිවකු කුණු කන අලි හා කුණු කා මැරුණු අලි දැක තිබුණේ නැත. සෞභාග්‍යයේ දැක්මට අනුව අලි අගල් කපන ඇමැති අවුරුදු දෙකක් තිස්සේ අගල් කැපුවා දැයි අපි නොදනිමු.

අලි සම්පත රැක ගැනීමට තිබෙන හොඳම ක්‍රමය අලි අගල් කැපීම බවට ආණ්ඩුවට කැකිල්ලේ උපදෙස් දුන් විශේෂඥයෙන් කවරහු දැයි දැන ගැනීමට රටම කැමැත්තෙන් සිටිති. ගමේ නගරයේ කසළ ප්ලාස්ටික් අපද්‍රව්‍ය රක්ෂිත වනාන්තර මැද්දේ ගොඩගහගන්නට උපදෙස් දුන්නු කවරහු දැයි අපට සිතාගත නොහැකිය. අලින් පමණක් නොව අනෙකුත් වන සතුන්ද මෙම අපද්‍රව්‍ය නිසා අකල් මරණයට පත් වන බව ඔවුන්ට වටහා ගත නොහැක්කේ මන්දැයි අපට නොතේරේ.

සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව බොහෝ පුරසාරම් දොඩන රාජ්‍ය ආයතන ගණනාවක් තිබේ. අලි ඇතුන්, වන සතුන් වඳ වී ගිය පසු සංචාරකයන්ට පෙන්වන්නේ අහවල් කෙන්ගෙඩිය දැයි අපි නො දනිමු.

ශ්‍රී ලංකාවේ විවෘත කසළ රඳවනයක ඇති ප්ලාස්ටික් අපද්‍රව්‍ය කලාපීය අලි ඇතුන් මරා දමන බව පරිසරවේදීන් සහ පශු වෛද්‍යවරුන් අනතුරු හඟවන බව "ඇසෝසියේටඩ් ප්‍රෙස්" පුවත්පත සටහන් කර තිබිණි. කොළඹ අගනුවරට නැගෙනහිරින් කිලෝමීටර් 210ක පමණ දුරින් අම්පාර දිස්ත්‍රික්කයේ පල්ලික්කාඩු ගම්මානයේ කුණු කන්දක් ප්ලාස්ටික් ආහාරයට ගැනීමෙන් අලි ඇතුන් 20ක් පමණ පසුගිය වසර 8 තුළ මිය ගොස් ඇතැයි එහි සඳහන් විය.

එම පුවත වැඩිදුරටත් අනාවරණය කර තිබුණේ අලි ඇතුන් ශ්‍රී ලංකාවේ ගෞරවයට පාත්‍ර වන නමුත් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති බවය.

රටේ පළමු අලි ඇතුන් සංගණනයට අනුව ඔවුන්ගේ සංඛ්‍යාව 19 සියවසේදී 14,000ක් වූ අතර 2011 වන විට 6,000 දක්වා අඩු වී ඇති බව ඇසෝසියේටඩ් ප්‍රෙස් සඳහන් කර තිබිණි.



ලියනාඩෝ ඩිකැප්රියෝ ජනප්‍රිය වීම සඳහා සිල්ලර කරුණු ඉදිරිපත් කරන්නකු නොවී. ඔහු රංගනයට අමතරව විවේචනාත්මක සමාජ ගැටලු සම්බන්ධයෙන් සිය හඬ අවදි කරන්නෙකි. ඔහු 2015 වසරේ "The Revenan" චිත්‍රපටය සඳහා ඔස්කාර් සම්මාන ලබා ගනිද්දී වේදිකාව මත සිටම දේශගුණික විපර්යාසයන් වළක්වා ගැනීම සඳහා පරිසරය ආරක්ෂා කිරීමේ වැදගත්කම ගැන කතා කළේය. ඔහු සිය instagram post මාලාවට තේමාව ලෙස ඇතුළත් කර තිබෙන්නේ ලෝකයේ වඳවීයෑමේ තර්ජනයට මුහුණදී සිටින අලි සම්පත ආරක්ෂා කර ගැනීම පිළිබඳවය.

අප්‍රිකානු මහද්වීපයේ රාජ්‍යයන්හි ඇත්දළ ලබා ගැනීම සඳහා අලි ඇතුන් දඩයම් කිරීම නිසා විශාල දළ ඇති අලි ඇතුන් දැක ගැනීම දුෂ්කර වී ඇත. වනසත්ත්ව සංරක්ෂණ සංවිධානවලින් ඔවුන් ඉල්ලා සිටින්නේ අලි ඇතුන් බේරා ගැනීමට උදවු කරන්න කියාය.

ලියනාඩෝ ඩිකැප්රියෝගේ සමාජ මාධ්‍ය වේදිකාව instagram අනුගාමිකයන් මිලියන 30කට අධිකය. ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ පාලන සමයේ ඇමෙරිකාවේ ජාතික ස්මාරක විකිණීමට ගත් තීරණයට ඔහු විරුද්ධ විය. එය නැවැත්වීම සඳහා සංරක්ෂණ නීති දැඩි කළ යුතු බවට ඔහු හඬ නැඟීය. නීති විරෝධී ජාවාරම් නිසා විශේෂයෙන් වඳවී යෑමේ තර්ජනයට ගොදුරු වී ඇති වන සතුන් ආරක්ෂා කරන ලෙස ඔහු ජනතාවගෙන් ඉල්ලා සිටියේය.


නමුත් මෙහිදී අප දුටු නරකම තත්ත්වය නම් ලියනාඩෝ ඩිකැප්රියෝගේ instagram ගිණුමට ප්‍රතිචාර දක්වමින් බොහෝ ශ්‍රී ලාංකිකයන් පළකර තිබූ අදහස්ය. 'ඔහු ඔහුගේ වැඩක් බලා ගත්තා වේ අපි අපේ වැඩ බලාගන්නම්' යනුවෙන් සමහරු අදහස් දක්වා තිබිණි. තවත් සමහරුන් පවසා තිබුණේ අලි ඇතුන් බලනවාට වඩා අපට තවත් බොහෝ ප්‍රශ්න තිබෙන බවය. ශ්‍රී ලංකාවේ සමහර තරුණ ජනයා සිටින්නේ රට කාබාසිනියා කරන්නන්ගේ පැත්තේය.

අම්පාර නගරයට නැගෙනහිරින් පිහිටි පල්ලික්කාඩු කුණු කන්ද වනජීවී ආරක්ෂණ කලාප ආසන්නයේ පිහිටුවා ඇති රටේ විශාලම කසළ රඳවන ස්ථානය බවට පත්ව තිබේ. අලි ඇතුන් දුසිම් ගණනක් දිනපතා වනාන්තරයෙන් පිටතට පැමිණ කසළ කන්ද කරා ගමන් කරති. අද එය ප්‍රදේශයේ ඉතාම සුලභ දර්ශනයකි. අලි ඇතුන් ආහාර කැබලි සමඟ ප්ලාස්ටික් පරිභෝජනය කරන අතර එමඟින් ඔවුන් ක්‍රමයෙන් මියයන බව වනජීවී නිලධාරීහු පවසති. 2019 ශ්‍රී ලංකාවේ අලි ඇතුන් මරණ 360කි. එම මරණ ප්‍රධාන වශයෙන් මානව ක්‍රියාකාරකම් නිසා සිදුවූ ඒවා බව පරිසර කණ්ඩායම් වාර්තා කරති. අලි ඇතුන් 200කට වඩා වැඩි සංඛ්‍යාවක් සැරිසරන මෙවැනි ප්‍රදේශයක අලිමංකඩක් මැද මෙවැනි කුණු කන්දක් නිර්මාණය කිරීම ඉතාම වැරදි තීරණයකි. වඩාත් හාස්‍යජනක සිදුවීම වී තිබෙන්නේ ශ්‍රී ලංකාවේ වනජීවී ආරක්ෂාව භාර රාජ්‍ය ඇමැතිවරයා සිටින්නේද අම්පාර දිස්ත්‍රික්කයේ වීමය.

වන සංරක්ෂණ ඇමැතිවරයා දැනුවත්ව නොසිටියාට ලංකාවේ රක්ෂිත වනාන්තර රාශියකම කුණු කඳු ගොඩ ගසා තිබේ. දැනටත් දිනපතා කුණුගොඩ ගසමින් සිටී. හබරණ, දඹුල්ල, පොළොන්නරුව, කතරගම කුණු කඳු මෙරටට පැමිණෙන ලෝක වනසත්ත්ව ලෝලීන්ගේ නෙත ගැටේ. ඔවුන් කම්පාවට පත්ව ලංකාවේ පාලකයන්ගේ හැටි තරාතිරම ලෝකයට කියා දෙති.

අපේ කසළ ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන් තිබෙන්නේ අය-වැය කතාවල සහ දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශනවලය. මහපොළොවේ එවැනි කිසිවක් නැත. ඒ මොනවා වුවත් අපේ රට ලෝකෙන් උතුම් රටය. ඉන්දියන් සාගරයේ මුතු ඇටයයි. අඩ සියවසක් තිස්සේ කියන මේ කතාව අපම කියා ගන්නවා මිස ලෝකයේ වෙනත් කිසිවකු කියන්නේ නැත. අඩු තරමින් ලියනාඩෝ ඩිකැප්රියෝ ඇඟිල්ලෙන් ඇන පෙන්වා දුන්නාට පසුවවත් පල්ලික්කාඩු කුණු කන්ද සම්බන්ධයෙන් වනජීවී ඇමැතිවරයා පියවරක් ගනීද නැද්ද යන්න ගැන අපි උනන්දුවෙන් බලා සිටිමු.

■ උදේනි සමන් කුමාර



# උගුරට හොරා ආණ්ඩුව බෙහෙත් කන විදුලි අවුලේ කරුමයක මහත

**කපන්නේ නැහැයි කීවාට රටේ බොහෝ තැන්වල නොදන්වාම විදුලිය කැපෙමින් පවතී. හෙට අනිද්දා වන විට ඔය වාගෙම පැය දෙක තුන තැන තැන විදුලිය කැපෙන්නට ඉඩකඩ වැඩිය. රටේ තොටේ කතා බහ ඔය වගේය. ඒ නිසා අර්බුදයක් නැතැයි කවුරුත් කියන්නට උත්සාහ ගත්තද දැනටමත් එයින් බැටකන මිනිසුන් බොහෝය.**

අර්බුදයේ ඇතුළත කතාව කටුකය. එය අයිසින් තවරා හැදූ කේක් ගෙඩියක් මෙන් මතුපිටින් දක්වන්නට හැදුවත් ජනතාව තේරුම් ගෙන අවසන්ය. ඛනිජ තෙල් ඇමැති එකක් කියන විට විදුලිබල ඇමැති තවත් එකක් කියා පත්තර පිටු පුරවනවා ඇර මේ නාටකයේ ජවනිකා නිමක් නැත.

"එදා ඉඳලා සිරිත තමයි තෙල් ඕනෑ වෙලාවට තෙල් සංස්ථාව තෙල් ලබාදෙන එක. තෙල් දුන්නොත් තමයි බලාගාර පණ ගන්වලා විදුලිය දෙන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා තෙල් ඕනේ" විදුලිබල ඇමැති ජනතාවගේ පැත්තට හැරිලා එහෙව් කතාවක් කියද්දී ඊට උත්තර බඳිමින් වගේ ඛනිජ තෙල් ඇමැති කියන්නේ " ඩොලර් මුදා හරිනවනම් තෙල් ගේන්න පුළුවන්. දැන් තියෙන තෙල් ටිකත් මුදා හැරියොත් රථවාහන ගමනාගමනයට තෙල් නැතිවේවි, තෙල් දෙන්න බෑ" කියලාය. මේ දෙගොල්ලගේ කතා ඉවරෙකුත් නැත. විසඳුමක් ලැබෙන පාටකුත් නැත. කවුරු කවුරුත් අර්බුදයට හේතුව ගැන කතා කරන්නේත් නැත.

මේ අතර රට පුරා දැනෙන්න විදුලිය කැපෙන්න පටන් ගන්න (නිල නොවන කැපිල්ලට අමතරව) ඔන්න මෙන්න කියා තිබියදී ජනාධිපතිවරයා මැදිහත් වී තෙල් ඇමැතියි, විදුලි ඇමැතියි කැඳවා කතා කර විදුලිය නිෂ්පාදනයට අවශ්‍ය ඩීසල් සහ දැවිතෙල් ගෙන්වා ගන්න මුදල් දෙන බව මුදල් ඇමැති කියා තිබෙන නිසා විදුලිය නොකපන්නැයි උපදෙස් ලබාදී තිබේ.

කවුරු උපදෙස් දුන්නද ඊට එහා වැඩ සිදුවන බවක් පෙනෙන්නේ රට පුරා තැන තැන කැපෙන, බිඳ වැටෙන විදුලි සැපයුම ගැන කතා ජනතාව විටින් විට කතා කොට අපටද දන්වන නිසාය. විෂය භාර ඇමැතිවරුත් නොවෙයි නම් මුදල් ඇමැති හෝ ජනාධිපතිත් නොවේ නම් මෙහෙව් තීන්දු ගන්නේ, රට පාලනය කරන්නේ වෙන කොහෙවත් සිටින උදවියදැයි ජනතාව අහන්නේ නිකමට නොවේ.

විදුලිබල මණ්ඩලය පාර්ශ්වයෙන් නිතර කියන්නෙම "විදුලි අර්බුදය තවදුරටත් පවතිනවා. නමුත් එය මනා ලෙස කළමනාකරණය කර ගනිමින් සිටිනවා"ය කියලාය. එහෙත් ඩොලර් නොමැති වීමෙන් මුහුදේ නැංගුරම්ලා ඇති ඩීසල් හා පෙට්රල් නැව් දෙක කඩිනමින් නිදහස් කර නොගතහොත් විදුලිය උත්පාදනය කරන්නේ කොහොමදැයි කවුරුත් කියන්නේ නැත. මහ බැංකු අධිපති කබ්රාල් කියා තිබෙන්නේ "එහෙම මුදා ගන්න ඕනේ නම් කල් ඇතිව කියන්න" කියලාය. ජනතාව කියන්නේ" කල් ඇතිව කියන්නේ මොකටද ඕවා වෙන්නේ කොහොමද කියලා දන්නේ නැද්ද? ඊට සූදානම් වෙලා ඉන්න ඕනේ නැද්ද? කට ළඟට එනකම් බලා ඉන්නවද? මොනවද මේ කතා" කියලාය.

තාවකාලිකව ඩොලර් සපයා දී මේ අර්බුදය ගොඩින් බේරා ගන්නට හැකි නම් එය හොඳය. එහෙත් තවමත් අර්බුදයේ මුල සොයාගෙන නැති තරම්ය. ඩීසල්වලින් බලාගාර දුවන්න යෑම මේ අර්බුදය තව තවත් ඉදිරියට ඇදගෙන යෑමක් වන්නේ රටේ විදේශ සංචිත හිඟය බරපතළ නිසාය. ඒ හැමදාමත් හිඟා කන්නට බැරිය. එය උපද්දවා ගන්නා තීන්දු තීරණ රටේ මහ පොළොවේ පැළ කරන්නට කාලයක් ගතවනවාද ඇත.

මේ අතර පවතින තත්ත්වය තුළ ජල විදුලිය කළමනාකරණය කිරීමට විධිමත් වැඩපිළ වෙළක් කඩිනමින් ක්‍රියාත්මක නොකළොත් ඉදිරියේදී දිනකට පැය පහක් හයක් වුව විදුලිය කප්පාදු කිරීමට සිදුවිය හැකි බවට විදුලිබල ඉන්ජිනේරු සංගමය සඳහන් කරයි.

ඉන්ධන බලාගාර හා ගල් අඟුරු බලාගාර සම්පූර්ණයෙන්ම විදුලිය නිෂ්පාදනය කළද රටේ අවශ්‍යතාවන්ට ඉන් ලබා දෙන්නේ 70%ක විදුලිය ප්‍රමාණයකි. ඉතිරිය 30%ක ප්‍රමාණය ජල විදුලියෙන් හා සූර්ය බලාගාරවලින් ලබාගත යුතුය. මින් පෙර පසුගිය ආසන්න කාලයේ ජල විදුලියෙන් විදුලිය අවශ්‍යතාවෙන් 70%ක ප්‍රමාණයක් ලබා ගත්තද මේ වෙද්දී වර්ෂාව අඩුවීම හා අසාමාන්‍ය ලෙස ඇතැම් ජලාශවල ජලය සිඳී යෑමේ තත්ත්වය මත (දක්වන පරිදි) ජල විදුලි උත්පාදනය 25%ක් දක්වා අඩුවී ඇතැයි කියැවේ.

මන්නාරම් ද්‍රෝණියේ නිරතුරුව හමන සුළං ධාරාවන් හරහා විශාල වශයෙන් සුළං බලය ආධාරයෙන් විදුලිය උත්පාදනය කරන්නට අපට හැකිවූවා නම් එය මේ මොහොතේ වඩාත් ප්‍රයෝජනවත් වන්නට තිබිණි. නමුත් විදුලි ඉන්ජිනේරු මාෆියාව සුළං බලයෙන් හෝ සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කෙරෙන සැලසුම්වලට ඒ හැටි කැමැත්තක් නැත. ඔවුන් බොහෝ දෙනා කියා සිටින්නේම ලෝකයම ගල් අඟුරුවලින් විදුලිය උත්පාදනය කිරීමෙන් ඉවත්ව යමින් තිබෙන මොහොතක අප තව තවත් ගල් අඟුරු බලාගාර ඇති කළ යුතු බවය. තවත් සමහරු කියන්නේ ඩීසල් බලාගාරවලින්ම යා යුතු බවය. මේ බොහෝ දෙනා ඉතා හොඳින් හිරු එළිය වැටෙන රටක් වූ අප රට තුළ මහා පරිමාණයෙන් සූර්ය තාපයෙන් විදුලි උත්පාදනයට කැමැති නැත. සුළං බලාගාරවලින් විදුලිය උත්පාදනය කරනවාට කැමැති නැත.

සමහරු කියන්නේ දහවල් කාලයේ පමණක් සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කර ගත හැකි බවය. එහෙත් එසේ උත්පාදනය කරගත් විදුලිය ගබඩා කර ගැනීමේ ලොව දියුණු ක්‍රමවේද වෙත යන කතා මතු කරන්නේම නැත.

සුළං බලාගාරවලින් ඒ හැටි පලක් නැති බවත් ඉඳ හිට හමන සුළඟින් වැඩක් නැති බවටත් වන "නොකෙරෙන කතාම" කියන්නේ, මේ මාෆියාවේ මහ මොළ කරුවන්ට විදුලි අර්බුද මවා වැඩි මිලට පෞද්ගලික අංශයෙන් විදුලිය ලබාගෙන ගසා කන්නට බැරි නිසාය.

ඇමැතිවරු දෙපළ තරගෙට අදහස් ප්‍රකාශ කර ගත්තද පවතින තත්ත්වය තුළ ජල විදුලිය මේ වන විට උපරිමයෙන් භාවිත කරන බවත් එහෙත් ජලවිදුලි බලාගාර ආශ්‍රිත ජලාශවල ජල මට්ටම් විශාල ලෙස පහත වැටෙමින් තිබෙන බවත් විදුලිබල ඉන්ජිනේරු සංගමය පවසයි. ඒ අනුව ජල විදුලි නිෂ්පාදනය 5% ක් දක්වා අඩුවිය හැකි බවත් එවන් තත්ත්වයක් ඇති වූ විට ඉන්ධන බලාගාර හා ගල් අඟුරු බලාගාර සම්පූර්ණයෙන්ම විදුලිය නිෂ්පාදනය කළද විදුලිය කප්පාදු කිරීමට සිදුවන බවක්ද පැවැසේ.

ඉන්ජිනේරුවන් කියන්නේම 2014න් පසු බලාගාර ඉදිකර නොමැති නිසා ඉදිරියේදී විදුලි බලාගාර තව තවත් ඉදි නොකළහොත් ඉදිරියේදීත් විදුලි අර්බුදයකට මුහුණ දීමට සිදුවන බවයි. තව තවත් ගල් අඟුරු හෝ ඩීසල් බලාගාර ඉදිකිරීම තුළ තෙල් හා ගල් අඟුරු ලබාගත නොහැකි වුවහොත් යළිත් ඩොලර් අහේනියක් වුවහොත් ඇතිවන අනතුර ගැන කිසිවෙක් කතා කරන්නේ නැත.

දැනගන්නට තිබෙන සමීප ආරංචි මාර්ගවලට අනුව මැයි මාසය තෙක් තද වැසි ඇති නොවන නිසා විදුලි අර්බුදය මැයි තෙක්ම ඇදී යෑමට බොහෝ ඉඩකඩ පවතී. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ජනන යන්ත්‍රයක් දැනටමත් නැවතී ඇති අතර ඉතිරි යනන යන්ත්‍ර දෙක පැය විසිහතර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වන බවත් ජනන යන්ත්‍ර අලුත්වැඩියා නොකරම මේ විධියට භාවිතයට ගන්නට යෑම නිසා ඒවාද බිඳ වැටුණහොත් තත්ත්වය තවත් බරපතළ විය හැකි බවක්ද කියැවෙයි.

විදුලිය කප්පාදුව එසේ කෙරෙන තත්ත්වයක් පිළිබඳ බරපතළ කතාබහක් රටතොට ඇතිවෙද්දී දුම්රිය වෘත්තීය සමිති සන්ධානයද අනතුරු ඇඟවීමක් කර තිබේ. ඒ අනුව ඩීසල් නොලැබුණහොත් තවත් දින 4කින් දුම්රියත් කොට උඩ යන තත්ත්වයක් වාර්තා වෙයි. දුම්රිය සාමාන්‍යාධිකාරී කියන්නේ එවැනි ඩීසල් හිඟයක් දුම්රියට නැති බවය. මේ තත්ත්වය මත විදුලිය නැතිව අඳුරේ සිටින්නට වන ජනතාවට රැකියා සඳහා හෝ වෙනත් ගමනාගමන කටයුතු සඳහා දුම්රියද භාවිත කරන්නට නොහැකි වනු ඇත.

අර්බුදය මේ තරම් බරපතළ වීමට බොහෝ දෙනා වගකිව යුතුය. විදුලි ඉන්ජිනේරුවරුන්ගේ මාෆියාවක් ඇත්නම් එය ජනතාව වෙනුවෙන් බිඳ දමා යහපත් පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ජනතාව ඡන්ද බලය පාවිච්චි කොට ජනාධිපතිට හා අගමැතිටත් ආණ්ඩුවක් හා බලයක් ලබාදී ඇත.

ලංකාවට වැටෙන හිරුඑළිය මේ තරම් අපතේ යවන රටක් තවත් නම් තිබෙනවාද යන්න විමසිය යුත්තකි. අප වහා සූර්ය බල සැපයුමකට සූර්ය බල උත්පාදනයකට කවුරු අකුල් හෙළුවත් යා යුතුය. එය වියදම් අඩු නිරතුරු විදුලිය උපද්දවන ප්‍රයෝජනයට ගත හැකි ක්‍රමයකි. අද චීනයේ සූර්ය බල උපාංග නිපදවීම ආරම්භ කිරීමත් සමඟම එය ඉතා ලාභදායක බවට පත්වී ඇත. එනිසා කයිවාරු ගසමින් කාලය කා දමනවාට වඩා කවුරු කවුරුත් මේ අර්බුදය සිහි නුවණින් වටහාගෙන වහ වහා විදුලි අර්බුදයට සාර්ථක ක්‍රියාමාර්ග ගත යුතුය.

■ විජිත කේ. පතිරණ


ආහාර සුරක්ෂිතතාවයත් - අලුත් ආදායම් උත්පාදනයත්
ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනයත් ප්‍රමුඛව
තවත් ප්‍රතිලාභ රැසක් සමගින්...
අයවැයෙන්
වැඩ ලක්ෂයක්
නිල සමාරම්භය
2022 පෙබරවාරි 03 වනදා
උදේ 8.52 ට
රට පුරා හැම ගමකම
මුදල් අමාත්‍යාංශය
රට දැය නංවන තිරසර සංවර්ධනයට උරදෙමින්
අභිමානයෙන්!
NLB
ජාතික ලොතරැයිය
ජාතික ලොතරැයි මණ්ඩලය
ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

# ජනපතිගේ හිත ගිය තරු හතේ වෙඩිම

**කොවිඩ් - 19 වයිරසය පැතිරීම වැළැක්වීම වෙනුවෙන් තුන්වැනි මාත්‍රාව ලෙස බූස්ටර් එන්නත ලබාදීමේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ගයට ජනතාව නැඹුරු නොවීමත් ඇතැම් පිරිස් එම එන්නත ගැන බොරු ප්‍රචාර ගෙන යෑමත් රටට විශාල හානියක් විය හැකි බැවින්, ගමට ගිහින් ජනතාව දැනුවත් කිරීමට මැති ඇමැතිවරුන් ඉදිරිපත් විය යුතු බව පසුගිය කැබිනට් රැස්වීමේදී ජනාධිපතිවරයා ඇමැතිවරුන්ට දැනුම්දී තිබේ. ජනාධිපතිවරයාගේ ඉල්ලීමට ඇමැතිවරු එකඟත්වය පළකොට ඇත.**




■ බෙනට් රූපසිංහ

## වී මිල වැඩි කළත් සහල්වලට සාධාරණ මිලක් පවත්වා ගන්න ජනපති උපදෙස්

රටම මුහුණදී සිටින ගොවීන්ගේ ප්‍රශ්නයත් පොහොර හා වී මිලදී ගැනීමේදී මතුව තිබෙන ගැටලුකාරී තත්ත්වයත් පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා වූ ප්‍රධාන විෂයක් විය. සාකච්ඡාවට මුල පිරුවේ ඇමැති මහින්ද අමරවීරය.

## වෙළෙ ගොයම් මුවින් කැවට ගෙදර මුව හමට තැළීම

## පරණ අවුරුදු දෙක ගියාදෙන් දැන් අලුතින් පටන් ගනිමු මුරුත්තෙට්ටුවේ හිමියෝ වදාරති

## පොහොට්ටුවට විද්ද හොරාට මහින්ද එදා දුන් මංගල තෑග්ග

## ආණ්ඩුව මුහුණ දෙන ප්‍රශ්න ගැන සංවාදයක් සිදු නොවීම ගැන පක්ෂ 11 කනස්සල්ලෙන්

## ගම්පහ කොවිඩ් රැල්ලට වැට බඳී

## "බූස්ටර් එන්නත ගහන්න සමහරු අකැමැතිලු"



## විශේෂ භාණ්ඩ හා සේවා බදු පනතට විරුද්ධව රනිල් නඩු කියයි

## ගාල්ලට ඩඩ්ලි ඇවිල්ලා

## හොරුන්ගෙන් හොරු කම්බ හොරු

## සල්ලි අච්චු ගහන කොම්පැනිය බියගමට ගෙනාවේ රනිල්ලු

## එ.ජා.ප. ප්‍රතිසංවිධානයේදී පියරු බබ්බු පුම්බන්න එපා

## මංගල සභාවෙන් අවසරයි

## කැබිනට් රැස්වීමේ තොරතුරු මාධ්‍යයට ගියාට ඇමැතිට තද වුණේ ඇයි?

## රන්ජන් නිදහස් කර ගැනීමේ සටන අලුත් මුහුණුවරකින්

## 2023දී එජාප ආණ්ඩුවක් ගේන්න ගාල්ලේ වජිර වැඩ

... අපට පොහොට්ටුවේ අයත් ශ්‍රී ලංකා අයත් අපෙන් කැඩී ගිය කොටසුත් අපිට ඕනෑ. ඒ නිසා සියලුදෙනා දිනවන්න නම් අපි ඔක්කොම එකට එකතු කරලා වැටෙන රටත් ජනතාවත් ගොඩගන්න ඕනෑයි වජිර කීවේය.



## අනුරගෙන් 25ක ෂායා කැබිනෙට්ටුවක්

මේ දවස්වල ජාතික ජන බලවේගයේ කොට්ඨාස සභා හදන වැඩසටහන ජයටම සිදුවන බව වාර්තාවේ. ඒ වගේම දිස්ත්‍රික් සමුළුව පවත්වමින් සිටිනවා. ජවිපෙ ආරංචි මාර්ග කියන්නේ පසුගිය කාලයේ ආණ්ඩුවට, යූඇන්පියට වැඩ කළ මෙන්ම සජිත් ළඟට ගිය අයත් ජවිපෙ සමඟ වැඩ කරන්න කැමැත්ත පළ ...

## ශ්‍රීලනිපයට කුඩම්මාගේ සැලකිලි



## නීලාගේ දේහය කටුනායකට

කටුනායක - ඩී.කේ.ජී. කපිල

## පමුණුව සිරිමංගලාරාමයේ 32 වැනි ලේ දන්දීමේ පින්කම පෙබ: 4 වැනිදා

## එයාර්ටෙල් 4G ජාලය වසන්න කිරීමේ සැලසුම හරහා දකුණු පළාතටත් දැන් වැඩිදියුණු කළ අන්තර්ජාල අත්දැකීමක්



# වසරකට මැරෙන හෘද රෝගී දරුවන් 1500කට ජීවිතය දෙන උතුම් මිනිස් වෑයමක්

දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වී තමන්ගේ රාජකාරිය උපරිම ආකාරයෙන් ඉටු කරන ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඉදිකිරීම් අංශයේ නිලධාරීන් දෙස ළමා හෘද රෝග විශේෂඥ වෛද්‍ය දුමින්ද සමරසිංහ මහතා ඇතුළු කණ්ඩායම බලා සිටින්නේ දයාව පිරි හදවතිනි.

ඔවුන් මේ ශ්‍රම දායකත්වය ලබා දෙන්නේ ප්‍රතිකාර සහනය නොමැතිව වසරකදී මියයන දරුවන් 1,500 කගේ පමණ ජීවිත බේරා ගැනීමේ රිජ්වේ ආර්යා ළමා රෝහලේ වෛද්‍ය ප්‍රතිකාර මෙහෙයුමට උදව්වක් ලෙසය.

"ඇත්තටම අපි නාවික හමුදා නිලධාරීන්ට හදවතින්ම ස්තුති කළ යුතුයි. ඔවුන් මේ කරන්නේ සුවිශේෂී සත්කාරයක්. ඒ සත්කාරය මොන වගේ එකක්ද, ඒකේ තිබෙන වටිනාකම ගැන බොහෝ අය දන්නේ නැහැ."

මෙසේ කියමින් අප සමඟ කතාබහට එකතු වූයේ කොළඹ රිජ්වේ ආර්යා ළ මා රෝහලේ හෘද රෝග ඒකකයේ විශේෂඥ වෛද්‍ය දුමින්ද සමරසිංහ මහතාය. ඔහු සඳහන් කරන ආකාරයට මහල් 12කින් සමන්විත මේ නව ළමා හෘද රෝග සහ දැඩි සත්කාර ඒකකය කාලීන අවශ්‍යතාවකි.

"අපේ රටේ වසරකට උපදින දරුවන්ගේ ප්‍රමාණය තුන් ලක්ෂ පනස් දාහක් පමණ වෙනවා. මේ දරුවන්ගෙන් 3,000ක් පමණ උපදින්නේ හෘද ආශ්‍රිත රෝග සහිතවයි. නමුත් අපට මේ දරුවන්ගෙන් බේරාගන්න පුළුවන් වෙන්නේ 900ක් විතර. ඒ විවෘත හදවත් සැත්කම් කරලා. ඊළඟට කැතීටර්කරණ මඟින් සිදුකරන ප්‍රතිකර්ම දරුවන් 400ක් වගේ පිරිසකට ලැබෙනවා.

මෙවැනි තත්ත්වයක් තුළ වසරකට දරුවන් 1,000-1,500 වගේ ප්‍රමාණයක් ඉතා අවාසනාවන්ත විධියට මියයනවා. ඒ නිසි ප්‍රතිකාර ලබා දෙන්න බැරි වීම නිසා.

ඒකට හේතුව තමයි ළමා රෝහලේ දැඩි සත්කාර ඒකකය තුළ තිබෙන ඇඳන් ප්‍රමාණය. ඒ ප්‍රමාණය ඇඳන් 11යි. ඊළඟට තියටර් 2යි.

කොහොම හරි ඉතින් අපි මේ තත්ත්වය අවබෝධ කරගෙන 2013 වසරේ ඉඳලාම ඒ වෙනුවෙන් වෙහෙසුණා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි 'ලිට්ල් හාට්ස්' (Little Hearts) ව්‍යාපෘතිය කරළියට එන්නේ. ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයාගේ විද්‍යායතනය මෙහි ප්‍රධාන වගකීම අරගෙන අපි මහජනතාවගෙන් මුදල් එකතු කරන්න සැලසුම් කළා. ඒ මුදල්වලින් මේ මහල් 10 ගොඩනැඟිල්ල රෝහල් භූමිය තුළ ස්ථාපිත කරන්න සැලසුම් කළා. දැන් ඒ ගොඩනැඟිල්ලේ මූලික සැකිල්ල ඉදිකිරීම් කොට අවසන්.



ළමා හෘද රෝග විශේෂඥ වෛද්‍ය දුමින්ද සමරසිංහ

ඊළඟට තිබෙන්නේ බිත්ති නිමා කොට අවශ්‍ය උපකරණ සවි කිරීමයි. ඒ සඳහාත් අපි මහජනතාවගේ උදවු උපකාර පතනවා."

රිජ්වේ ළමා රෝහල තරම් දරුවන්ට නිසි ප්‍රතිකාර ලබාදෙන එමෙන්ම රෝගී දරුවන්ගේ ජීවිත බේරා ගන්නා තවත් රෝහලක් නැති තරම්ය. මේ නිසාම කාලයක පටන් මේ රෝහල් මාතාවට අපේ රටේ මවුපියවරුන් නිසි ගෞරවය ලබා දුන්නේ හදවතින්මය.

මේ රෝහලේ සේවය කරන රෝහල් කාර්ය මණ්ඩලයේ ස්වභාවය නිතැතින්ම ඇගැයීමට ලක්වී තිබෙන්නේද ඔවුන් රෝගී දරුවන්ගේ ජීවිත බේරා ගැනීමට දරන අප්‍රමාණ වෙහෙස සැලකිල්ලට ගනිමිනි.

"කොහේ කොතැනක රෝගී වුණත් ඒ දරුවන්ව අපේ රෝහල කරා රැගෙන එන්නේ ලොකු විශ්වාසයකින්. ඉතින් එහෙම රැගෙන එන හෘද රෝගී දරුවන්ගෙන් බොහොම සුළු පිරිසක් තමයි රඳවාගෙන ප්‍රතිකාර ලබාදෙන්නේ.

අනෙක මේ රටේ දුගී දුප්පත් මවුපියවරුන්ට පෞද්ගලික රෝහලකට ඇතුළත් කරලා හරි පිටරටකට යවලා හරි ඒ දරුවව සුව කරගන්න පුළුවන් විධියේ ආර්ථික තත්ත්වයක් නැහැනේ" ඉතින් අපේ රෝහලේ පිහිට තමයි ඔවුන් පතන්නේ.

2004 වසර වන තුරු කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ හදවත් සැත්කම් හා ඊට අදාළ කිසිදු ප්‍රතිකාරයක් සිදු කිරීමට තරම් පහසුකම් තිබුණේ නැහැ.

මේ නිසාම එම දරුවන් අන්ත අසරණ තත්ත්වයට පත්වූවේ කිසිදු හවිහරණක් නැතිවය.

කෙසේ හෝ 2005 වසරේදී එවකට සිටි රෝහල් බලධාරීන් රෝහල තුළම තිබූ පැරණි ගොඩනැඟිල්ලක් නවීකරණය කර ගනිමින් එහි හදවත් සැත්කම් කළ හැකි ශල්‍යාගාර දෙකක් ගොඩනැඟුවේය. එහි තිබුණේ ඇඳන් 6කි. අනතුරුව 2007 වසරේදී තවත් ඇඳන් 12ක් සහිතව අධි සත්කාර ඒකකයක් ගොඩනැඟීමටද කටයුතු කර ඇත.

"මම 2004 වසරේදී මේ රෝහලට ආවේ පුහුණු වෛද්‍යවරයකු හැටියටයි. එයින් පසුව මම 2006 අවුරුද්දේ විදෙස්ගත වුණා වැඩිදුරටත් ඉගෙන ගන්න."

කොහොම හරි 2008 අවුරුද්දේ ඉඳලා නැවතත් මම මෙහි සේවයට ආවා. එදා ඉඳලම මම මේ රෝගී දරුවෝ සහ ඔවුන්ගේ මවුපියන් මුහුණ දෙන පීඩාව දැක්කා.

මේ රෝහලේ දැඩි සත්කාර ඒකකයේ තිබෙන ඇඳන් ප්‍රමාණයත් රෝගී වී එන දරුවන්ට මදි. මේ නිසාම නියුමෝනියාව, ඒ වගේම රුධිරයට විසබීජ එක්වීම වගේ තත්ත්වයන් තුළ අවයව ක්‍රියා විරහිත වුණු දරුවෝ පවා දැඩි අසීරුවට පත්වෙනවා නිසි පහසුකම් සහිත ගොඩනැඟිල්ලක් නැතිකමින්.

ඒ වගේම තමයි අලුත උපන් දරුවන්ට ඇතිවන සංකූලතා හා ඇට මිදුලු බද්ධ කිරීමේ වගේ රෝගවලින් පීඩා විඳින දරුවන්ට කරන ප්‍රතිකාර. ඒවත් මේ අලුත් ඒකකය තුළ ක්‍රමවත්ව සිදු කිරීමට සැලසුම් කොට තිබෙනවා."

විශේෂඥ වෛද්‍ය දුමින්ද සමරසිංහ මහතාට මේ අලුත් ඒකකය ගැන අදහස එන්නේ පෙර කී ලෙස කුඩා දරුවන් රෝගී වී අකාලයේ පරව යන සානුකම්පිත කතන්දර විටින් විට ඇසෙන, දකින නිසාය. එහෙත් ඒ සඳහා වැය වන අධික මුදල කිසිදු ආයතනයකට දරා ගත නොහැකිය. මේ නිසාම ඔහු ඒ සිතුවිල්ල යටපත් කරගෙන ඉවසාගෙන සිටියේය.

ඒත් එක්තරා දවසකදී ඔහුට අපූරු පුද්ගලයකු මුණගැසුණේය.

ඒ නිර්මාණශීලී මෘදුකාංග ආයතනයක් පවත්වාගෙන යන, එහි අධ්‍යක්ෂ ධුරය දරන සුසේන රණතුංග මහතාය.

ඔහු රිජ්වේ ආර්යා ළ මා රෝහලට එන්නේ රෝගී වූ තම දරුවාගේ ජීවිතය බේරා ගැනීමට හැකි හොඳම තැන එතැන යැයි සිතූ නිසාය. මේ ඒ පිළිබඳව ඔහු කියන කතාවය.

"මගේ දරුවා ඕස්ට්‍රේලියාවේ උපත ලැබූ දරුවෙක්. ඇත්තටම මට පෞද්ගලික රෝහලකට ගිහින් ඒ අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබාගන්න තිබුණා. නමුත් මම ළමා රෝහලට ආවේ ඒ හදිසියට ඇති හොඳම තැන එතැන කියලා දැනුණු නිසා."

මෙසේ රිජ්වේ රෝහලට ආ සුසේන රණතුංග මහතාට හමුවන්නේ විශේෂඥ වෛද්‍ය දුමින්ද සමරසිංහ මහතාවය. ඔහු රෝහලේදී කළයුතු ප්‍රතිකර්මය ලබාදී ඉක්මනින්ම තම දරුවා වෙනුවෙන් කිරීමට හැකි ශල්‍යකර්මය සඳහා සුදුසු වෛද්‍යවරයෙක් නම් කරන්නේ ළමා රෝහලේ ඒ පහසුකම් නැති නිසාය.

මේ අනුව මම පෞද්ගලික රෝහලකදී ඒ ශල්‍යකර්මය කරගන්නවා. නමුත් තවත් දවසක අපේ රෝහලට මම දරුවන්ගේ අනාගතය වෙනුවෙන් යමක් කරන්න කියලා හිතාගෙන රුපියල් මිලියන 10ක පරිත්‍යාගයක් කරන්න සූදානම් වෙනවා.

මෙන්න මේ අවස්ථාව තමයි අද ලිට්ල් හාට් ව්‍යාපෘතිය දක්වා මේ තරම් දුර ඇවිත් තිබෙන්නේ." සුසේන රණතුංග මහතා කීවේය.

සුසේන රණතුංග මහතා මේ පරිත්‍යාගය කළේ 2013 වසරේදීය. ඒ අනුව විශේෂඥ වෛද්‍ය දුමින්ද සමරසිංහ මහතා ප්‍රමුඛ රෝහල් කාර්ය මණ්ඩලය මේ මුදල උපයෝගී කරගෙන මුලින්ම කළේ ටිෂූ බැංකුවක් එසේත් නැතිනම් මානව කපාට බැංකුවක් ස්ථාපිත කිරීමය.

මේ බැංකුව අපි ස්ථාපිත කළේ රුපියල් මිලියන 70කින්. ඒකට අපිට රොටරි සමාජයෙන් වගේම රජයෙනුත් උදවු කළා.

මේ කපාට බැංකුවේ තිබෙන්නේ මිය ගිය දරුවන්ගෙන් ලබාගත් කපාට. ඒ කපාටවලින් අපිට පුළුවන් රෝගී දරුවන්ගේ ජීවිත බේරාගන්න. ඒ අර පටක හදවත් රෝගී දරුවන්ට බද්ධ කරලා. ඇත්තටම දැන් ඒ යුනිට් එක රෝහල තුළ තිබෙනවා. මේ වෙද්දී දරුවෝ 30කගේ විතර ජීවිත බේරා ගන්නත් අපිට හැකි වී තිබෙනවා.

මේ කපාට බැංකුව මේ ආකාරයට ගොඩනැඟුණු පසු වෛද්‍ය දුමින්ද සමරසිංහ මහතා සහ සුසේන රණතුංග මහතා කතා කළේ ඊළඟට රෝහල තුළ ඉදිකිරීමට බලාපොරොත්තු වන මේ මහල් දහයේ හෘද රෝග ඒකකය ගැනය.



ඒ අනුව ඔවුන් මේ ඉලක්කය සපුරා ගන්නා අන්දම පිළිබඳව සාකච්ඡා වට කීපයක් පැවැත්වීය. ඊට තවත් නිර්මාණශීලී පුද්ගලයකු වූ සුභාෂ් පින්නපොළ මහතාද එකතු විය. ඔහු අපේ වෛද්‍යවරයාගේ හිත මිතුරෙකි.

"මේ විදියට එකතු වුණු සුභාෂ් තමයි අපිට තේමා ගීතයක් හදලා ඒ වගේම නිල ලාංඡනයක් හා නමක් හදලා මේ වැඩේට සම්බන්ධ වුණේ. "ලිට්ල් හාට්" නමත් ඔහුගේ."

කෙසේ හෝ මේ ආකාරයට එකතුවුණු මේ ත්‍රිත්වය ඊළඟට කළේ සෞඛ්‍ය අමාත්‍යාංශ බලධාරීන් හා රජයේ වගකිවයුතු අයව මේ සම්බන්ධව දැනුවත් කිරීමය. ඒ අනුව 2018 බලයේ සිටි ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඊට අවශ්‍ය ඇප උපකාර ක්ෂණිකව ලබා දුන්නේය. නාවික හමුදාව සම්බන්ධ වන්නේද ඒ අනුවය.

"අපි නිසි අවසරයක් අරගෙන පටන් ගත්ත මේ වැඩේට රුපියල් මිලියන 2000ක් වැය වෙන බව අපිට තේරුණා. ඒ නිසාම අපි මූලිකව හිතුවා මේ ව්‍යාපෘතිය රජයට බරක් වෙන බව. ඒ හින්දා තමයි මහජන ආධාර ලබන්නත් අවසරය ලබා ගත්තේ. ඉතින් අද වනතුරු අපිට රුපියල් මිලියන 1400 ක් විතර ලැබී තිබෙනවා.

ඇත්තටම කිව්වොත් මේ මුළු වියදම හොයන්න නම් අපට එක අම්මා තාත්තා කෙනෙකුගෙන් රුපියල් 10,000ක් ලැබුණාම ඇති. ඒ වගේම ඒකකය හැදුණාට පස්සේ අවුරුදු 20ක් කිසිදු අවහිරතාවකින් තොරව ඒක පවත්වාගෙන යන්න පුළුවන්. ඒ වගේම වසරකදී මියයන දරුවන් 1500කගේ ජීවිත බේරාගන්නත් පුළුවන්. ඒ විදිහට අති නවීන පහසුකම් එක්ක තමයි මේ ඒකකය ඉදිවෙන්නේ"

මෙවැනි කටයුත්තකදී මහජන ආධාර ලැබෙන තුරු සියලු වියහියදම් දරන්නට වෙන්නේ ඒ සඳහා එකතුවන ප්‍රධාන කීප දෙනාටය. වෛද්‍ය දුමින්ද සමරසිංහ මහතා පවසන ආකාරයට ඒ සියලු මූලික වියදම් ලක්ෂ ගණනක් ලබා දුන්නේ, තවමත් ලබාදෙන්නේ සුසේන රණතුංග මහතා ප්‍රමුඛ ඔහුට අයත් Creative Software ආයතනයයි.

ඊට පස්සේ අපිට මාධ්‍ය අනුග්‍රහය අවශ්‍ය වුණා. එහිදී බොහෝ දෙනා අපිට උදවු උපකාර කළා. දෙරණ රූපවාහිනී නාළිකාව ඉතා ඉහළින්ම ඒ උදව්ව අපිට කළා. අනිකුත් මාධ්‍ය ආයතනත් එහෙමයි. දැන් අපි මේ වෙනුවෙන් පුළුල් ප්‍රචාරක වැඩකටයුතු අරඹා තිබෙනවා. ඒ අනුව ජනතාවගේ උදවු උපකාරත් ලැබෙමින් පවතිනවා.

ඇත්තටම ජනතාවගේ පුදුම සහයෝගයක් අපිට ලැබුණා. තවත් ලැබෙනවා. ඒත් මුදල්වල අඩුපාඩුවක් තවමත් තිබෙනවා.

ඒ කියන්නේ මිලියන 1400 ක් වගේ අඩුවක් තිබෙනවා. එයිනුත් මිලියන 400ක් අප සතුව තිබෙනවා. ඉතින් 1000 වගේ තමයි අඩු."

මේ වෙද්දී සුසේන් රණතුංග හා සුභාෂ් පින්නපොළගේ සහයෝගයෙන් නිර්මාණය වුණු ප්‍රචාරක දැන්වීම් නිසාම මේ මහල් 12කින් සමන්විත හෘද රෝග ඒකකයේ වැඩකටයුතු සිදුවෙමින් පවතී. ඒ අපේ රටේ දරුවන්ගේ දුක හඳුනන, අගය හඳුනන හිත් පිත් ඇති හෘදයාංගම මිනිසුන්ට පින් සිදු වන්නටය.

ඉතිරි මුදල හා ගොඩනැඟිලි වැඩකටයුතු නිමා කර ගැනීමට දැන් මේ කණ්ඩායම බලාපොරොත්තු වන්නේ වත්මන් ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ කාරුණික අවධානය ලබා ගැනීමටය. ඒ අවධානය නිරන්තරයෙන්ම ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසයය.


ඊට අමතරව ඔබට අපට හෙට උපදින දරුවන් වෙනුවෙන් යම් සත්කාරයක් කළ හැකිය. අපි මේ 'ලිට්ල් හාට්' ව්‍යාපෘතියේ ගිණුම් අංකය හා සම්බන්ධ කර ගත හැකි සියලු විස්තර සඳහන් කරන්නේ ඒ සිතුවිල්ල සිතේ තබාගෙනය.

■ **සමන් ප්‍රියංකර නම්මුනිගේ**

**Little Hearts 79738633**
**ලංකා බැංකුව බොරැල්ල අධිශ්‍රේණි ශාඛාව**
**තොරතුරු දැනගැනීමට හැකි අංකය: 0716441122**




ඉදි වීමට නියමිත නව හෘද රෝග ඒකකය



# ආඩ තාඩ සංවර්ධනේට උමං ඇළ කැපිල්ලෙන් සීගිරි උරුමයත් රටට අහිමි වේද?




දකුණු ආසියාවේ දිගම වාරි උමඟ ලෙස උදම් අනමින් රජය සිදු කරන උතුරු මැද වාරි ඇළ යෝජනා ක්‍රමය උතුරු මැද පළාතේ පාරිසරික හා පුරාවිද්‍යාත්මක උරුමයන්ට හානි කෙරෙන්නක් බවට වාර්තා වේ. දිගම සහ ලොකුම එක කරන්නට අපේ උදවිය කවදත් හපන්නුය.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් මතුව තිබෙන ප්‍රධානතම ගැටලුවක් වන්නේ ඒවා හැම විටම රටේ පවතින නෛතික රාමුවට පිටින් සිදු කිරීමට අදාළ බලධාරීන් ගන්නා උත්සාහයයි. ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී සිදුවිය යුතු ප්‍රමුඛ කාර්යයන් වන පරිසර ඇගැයීම් වාර්තා (E.I.A. Report) ලබාගැනීම, පුරාවිද්‍යාත්මක ඇගැයීම් වාර්තා (A.I.A. Report) ලබාගැනීම, නෛතික වශයෙන් සිදුවිය යුතු නමුත් එය එසේ සිදු නොවේ. ඊනියා සංවර්ධන ව්‍යාපෘති සිදු කෙරෙන්නේ බොහෝවිට ප්‍රාදේශීය දේශපාලන ප්‍රබලයන්ගේ ඕනෑ එපාකම් අනුවය.

උමා ඔය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වෙද්දී ආණ්ඩුව පරිසර ශක්‍යතා වාර්තා කෙරෙහි කිසිදු අවධානයක් යොමු කළේ නැත. එහි ප්‍රතිඵලය වූයේ මධ්‍ය කඳුකරයේ බදුල්ල - බණ්ඩාරවෙල ප්‍රදේශවල භූ ගර්භයට අති විශාල විනාශයක් සිදු වීමය. උමා ඔය උමඟ හිතුවක්කාරී ලෙස කැපීම නිසා මධ්‍යම කඳුකරයේ භූ ගර්භයට සිදුවූ හානියෙහි විපාක අනාගත පරම්පරාවන්ටද විඳීමට සිදුවනු ඇත.

රටට නොගැළපෙන, රටට ඔරොත්තු නොදෙන එවැනි සංවර්ධන ව්‍යාපාර හදිසියේ සිදුකරන පාලකයන්ගේ අරමුණ වන්නේ තමන්ට ලැබෙන ප්‍රතිපාදන සහ වාසි ගැන සැලකිලිමත් වීම පමණය. එක් පැත්තකින් රට විශාල ණය කන්දක හිර වෙන අතර යෝජිත ව්‍යාපෘති මඟින් රටට අත්වන ප්‍රතිලාභ ඉතා සීමිත වීම මෙහි ඇති බරපතළම ඛේදවාචකයයි.

උතුරේ යුද ගැටුම් නිමා වීමෙන් පසුව එවකට පැවති රජය උතුරු මැද අනුරාධපුර හා පුත්තලම යා කෙරෙන මාර්ගයක් විල්පත්තු ජාතික වනෝද්‍යානය මැදින් කපන ලද්දේ ඒ සඳහා අවශ්‍ය පාරිසරික ඇගැයීම් වාර්තා ලබා ගැනීමෙන් තොරවය. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් කටයුතු සිදුකිරීමෙන් තොරවය. පුරාවිද්‍යා ශක්‍යතා වාර්තාවන් ලබා ගැනීමෙන් තොරවය. මේ සම්බන්ධව මාධ්‍ය විමසන කල එවකට සිටි පරිසර ඇමැතිවරයා ප්‍රකාශ කළේ කොටින්ගේ බඩවත දෙපළු කරන්නට මෙම පාර කපන බවය. ඒ වෙද්දී යුද්ධයක් පැවතියේ නැත. විල්පත්තුවට සිදු වූ හානිය ගැන කිසිවකු කතා කළේද නැත.

මේ සම්බන්ධයෙන් වාර්තා වන අලුත්ම පාරිසරික විනාශය උතුරු මැද වාරි ඇළ ව්‍යාපෘතියයි. මොරගහකන්ද කළුගඟ ජලාශයන්හි ජලය උතුරු මැද පළාතේ මහකනදරාව දක්වා ගෙන යෑම පිණිස කිලෝමීටර 94ක ඇළ මාර්ග ඉදිකරමින් පවතී. ඉන් පැන නැඟෙන අතුරු ප්‍රශ්න රාශියක් තිබේ. පළමුවැන්න දේශගුණික තත්ත්වයන්ට අනුරූපව උතුරු මැදට ගෙන යන්නට තරම් ජලය මොරගහකන්දේ තිබෙනවාද යන්නය.

දෙවැන්න නිසි ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි ඇළ මාර්ග පද්ධතියක් වෙනුවෙන් ප්‍රදේශයේ පෞරාණික ස්මාරක හා පාරිසරික පද්ධති බිලිදීමය. රජරටට ජලය ගෙනයෑම පිළිබඳව කිසිදු විවාදයක් නැත. එය අනිවාර්යයෙන් සිදුවිය යුතුය. නමුත් එය සිදුවිය යුත්තේ නිසි භූ විද්‍යාත්මක ඇගයීම්වලින් අනතුරුවය.

පසුගිය යහපාලන ආණ්ඩුව මෙම ව්‍යාපෘති ආරම්භ කරන ලද්දේ එය එවකට ජනාධිපතිවරයාගේ එක්තරා සිහිනයක් ඉටුකර ගැනීම සඳහා කෙරෙන්නක් බව පවසමිනි. සිහිනවලට රටක අතීතය හෝ අනාගතය බිලිදිය නොහැකිය. නමුත් ඉතිහාසය පුරාම සිදුවූයේ බලවතුන්ගේ සිහින සාක්ෂාත් කරගැනීම උදෙසා මෙරට මහපොළොව කීතු කීතුවලට ඉරා දැමීමය. අවසානයේ ඔවුන් සිහින ජය ගනු ඇත. අපට කාන්තාරකරණය වූ දූපතක් ඉතිරි වනු ඇත.

මොරගහකන්ද - කළුගඟ ජලාශයන්හි සම්පූර්ණ ධාරිතාවඅක්කර අඩි 660,000ක් බවත් එය පරාක්‍රම සමුද්‍රයේ ජල ධාරිතාව මෙන් 6 ගුණයක් විශාල බවත් සඳහන් කෙරිණ. නමුත් දැන් ප්‍රකාශ කරන්නේ වෙනත් කතාවකි. මොරගහකන්ද - කළු ගඟ ජලාශවල අතිරික්ත ජලය කිලෝමීටර් 65ක ඇළ මාර්ග ඔස්සේ ගෙනයෑමට අපේක්ෂා කෙරේ. ඉහළ ඇළ හැර ව්‍යාපෘතිය කිලෝමීටර් 26ක උමං මාර්ගවලින් සමන්විතය. වයඹ සංවර්ධන ඇළ කිලෝමීටර් 93කි. කළු ගඟ සිට මොරගහකන්ද දක්වා ඇළ මාර්ගය කිලෝමීටර් 7.5කි.

මහකනදරාව දක්වා ඇළ මාර්ගයේ දිග කිලෝමීටර් 94කි. එහි කිලෝමීටර් 26ක් පොළොව යටින් දිවෙන උමං මාර්ගය. කළු ගඟ සිට මොරගහකන්ද දක්වා ඇළ මාර්ගය කිලෝමීටර් 9කි. ඒ අනුව දැනට ඉදි කර ඇති උමං මාර්ගය කිලෝමීටර 7.85කි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ප්‍රකාශ කරන අන්දමට ඇළ මාර්ගය සැකසීමේදී රජය ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අභය භූමි තුනක් හරහා ඇළ මාර්ගය දිවේ. එහිදී පරිසරයට සහ වන සතුන්ට වන හානිය පිළිබඳව තක්සේරුවක් කර ඇති බවක් දැන ගන්නට නැත. අනිවාර්යයෙන් සිදුවිය හැකි වන විනාශය ගැන බලධාරීන් කතා කරන්නේද නැත. ඔවුන් මාධ්‍යයට ප්‍රකාශ කරන්නේ ඒ සඳහා පියවර ගෙන ඇති බව පමණය.

මින්නේරිය ජාතික වනෝද්‍යානය, හුරුළුවැව සංරක්ෂිත වනාන්තරය, මින්නේරිය ජාතික වනෝද්‍යානය, හැරුණු විට කළුගඟ රක්ෂිතය, බෝවතැන්න රක්ෂිතය, වෑමැඩිල්ල රක්ෂිතය, නාලන්දා රක්ෂිතය සහ ගිරිතලේ, මින්නේරිය රක්ෂිත සෘජුවම මෙම ඇළ මාර්ගයට ඇතුළත්ය.

දැනට රජය උපදෙස් දී තිබෙන්නේ උතුරු මැද පළාත් මහ ඇළ වාරිමාර්ගයේ ඉදිකිරීම් 2025දී අවසන් කිරීමටය. ශ්‍රී ලංකා රජයේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතියේ උමං මාර්ග සඳහා වැය කෙරෙන මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 224කි.

මෙම ඇළ මාර්ග සහ උමං මාර්ග ඉදිවීම නිසා සීගිරිය පුරාවිද්‍යා රක්ෂිත භූමියටද හානි වීමේ අනතුර තිබේ. සීගිරිය රක්ෂිත භූමිය පුරා සියවස් ගණනාවක පුරාවිද්‍යාත්මක නටබුන් විසිර පවතින අතර වසර දහස් ගණනක් ඈතට දිවෙන ප්‍රාග් ඓතිහාසික ජනාවාස පැතිර පවතී.

ඉනාමළුව උප සංස්කෘතිය පිළිබඳව අධ්‍යයනයන් තවමත් පවතින්නේ මුල් අදියරයේය. ඉබ්බන්කටුව ආදි මානව ජනාවාසය ඇතුළු පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ප්‍රදේශ තවමත් සම්පූර්ණයෙන් නිසි අධ්‍යයනයන්ට ලක් නොවී මෙම භූමියේ පවතී. එවැනි භූමියක උමං ඇළ මාර්ග සඳහා අතපෙවීම බරපතළ ප්‍රශ්නයකි.

"එකක් කඩතොලු මකාගන්නට ගොසින් මට වූ කාරිය, දහක් කඩතොලු තනා දුන්නැයිඉඳුරුවේ ආචාරියා" යනුවෙන් ජනවහරේ කියමනක් තිබේ. සියල්ල අවසානයේ ජලය ගලා නො බසින ඇළ මාර්ග සහිත කාන්තාරකරණය වූ දූපතක් ජාතියට උරුම වූවොත් බලධාරීන් දෙන පිළිතුර කුමක් දැයි අපි නොදනිමු.

■ **උදේනි සමන් කුමාර**

## 2021 ඉතිහාසගත...

අභියෝග රැසක් මධ්‍යයේ වුවද මෙරට අපනයන ආදායම 23%කින් වර්ධනය වී ඇතැයි වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන පැවැසීය.

මෙරට අපනයන ඉතිහාසයේ පළමු වතාවට 2021 වර්ෂයේ සමස්ත භාණ්ඩ අපනයනය ඇමෙරිකානු ඩොලර් බිලියන 12 ඉක්මවා යමින් ඇමෙරිකානු ඩොලර් බිලියන 12.5ක ආදායමක් ලැබීමට සමත් වූ බවද අමාත්‍යවරයා කීය.

2020 වර්ෂයට සාපේක්ෂව ඇමෙරිකානු ඩොලර් මිලියන 2,780ක වැඩි වීමක් සහිතව 2021 වර්ෂයේදී මුළු වෙළෙඳ භාණ්ඩ අපනයනය 24.17%ක් දක්වා වර්ධනය කරගැනීමට මෙරට අපනයන ක්ෂේත්‍රය සමත් වූ බවද හෙතෙම සඳහන් කළේය.

ඉකුත් වර්ෂයේ මාස 8ක් තුළ මාසික අපනයන ආදායම ඩොලර් බිලියනයේ සීමාව පසු කළ බවද හෙතෙම කීය.

රට වසා තැබීම තුළ වුවද අපනයන ක්ෂේත්‍රයට අයත් සියලුම පාර්ශ්වයන් කඩිනම් එන්නත්කරණයට කිරීම, සියලු ආයතනයන් තුළ නිසි සෞඛ්‍යාරක්ෂක ක්‍රමවේද භාවිත කරමින් නිෂ්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු සැලසීමත් නිසා අනෙකුත් රටවලට සාපේක්ෂව ඉතා විශිෂ්ට ක්‍රමවේදයක් ඔස්සේ අපනයන ආදායම් උපයා ගැනීමට හැකි වූ බවද ඇමැතිවරයා පැවැසීය.

වසර 1930න් පසුව සමස්ත ලෝකයේම ආර්ථිකය කඩා වැටී ඇති කාල සීමාවක වුවද, මෙරට අපනයන ක්ෂේත්‍රය මෙවැනි වර්ධන වේගයක් අත්පත් කරගැනීම මෙරට ආර්ථිකයට ශක්තියක් සපයන බවද හෙතෙම තවදුරටත් කීය.

## රාජ්‍ය අනුග්‍රහයෙන්...

රාජ්‍ය නිලධාරීන්ගේ හා දේශපාලකයන්ගේ සහාය ඇතිව සිදුවන මහා පරිමාණ වැලි ජාවාරම්වලින් මහවැලි ගඟ වේගයෙන් විනාශමුඛයට යමින් ඇතැයි පරිසරවේදීහු චෝදනා කරති.

ප්‍රාදේශීය ලේකම්වරුන් මෙන්ම භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය ජාතික පාරිසරික පනත නොතකා ඉවක් බවක් නොමැතිව වැලි කැණීම් බලපත්‍ර නිකුත් කිරීමෙන් මෙම තත්ත්වය නිර්මාණය වී ඇතැයි ඔවුහු පවසති.

ඒ අනුව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාෆිනගර් ප්‍රදේශයේ මහවැලි ගඟේ පිහිටි ඩෙල්ටාවක වැලි කැපීමට මේ දිනවල මහා පරිමාණයෙන් බලපත්‍ර නිකුත් කෙරෙමින් ඇතැයි පරිසර යුක්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ උපදේශක හේමන්ත විතානගේ මහතා පැවැසීය.

රාජ්‍ය අනුග්‍රහය ඇතිව සිදුවන මෙම දරුණු විනාශය සාෆිනගර් පමණක් නොව මනම්පිටිය, මඩංතෙට්ටි, නීලපොල වැනි ස්ථානවලද දරුණු ලෙස සිදුවන බවත් දේශපාලනඥයන්ගේ අනුමැති ලිපි මත බලපත්‍ර නිකුත් කරන බවත් හෙතෙම සඳහන් කළේය.

ජාතික පාරිසරික පනත තුට්ටුවකටවත් නොතකා සිදුකෙරෙන මෙම බලපත්‍ර දිනකට සිය ගණනක් බැගින් නිකුත් වන බව පෙන්වා දුන් විතානගේ මහතා, එසේ නිකුත් කරන බලපත්‍ර පවා මහා පරිමාණයෙන් වැලි ඉවත් කර ගැනීම සඳහා නිකුත් කෙරෙන බවත් කියා සිටියේය.

මේ පිළිබඳව පරිසරවේදීන් කරන පැමිණිලි හා මාධ්‍ය මඟින් කරන හෙළිදරව්වලින් පසු කුඩා පරිමාණයෙන් වැලි කණින අයගේ බලපත්‍ර අහෝසි කරන බවත් ඒ වෙනුවට මහා පරිමාණ ජාවාරම්කරුවන්ට තවදුරටත් බලපත්‍ර දෙන බවත් හෙතෙම පෙන්වා දුන්නේය.

දකුණු පළාතේ පදිංචිකරුවකුට මසකට වැලි කියුබ් පන්දහසක් ඉවත් කර ගැනීමට අවසර ඇතිව බලපත්‍රයක් නිකුත් කර ඇති බවත්, ඔහු මේ වනවිට සාෆිනගර්හි මහා පරිමාණ යන්ත්‍ර සූත්‍ර යොදාගෙන කැණීම් සිදුකරන බවත් එහි කළ සංචාරයකින් පසු පරිසරවේදියෙක් පෙන්වා දුන්නේය.

මිනිත්තුවකදී වැලි විශාල ප්‍රමාණයක් කැපිය හැකි බකට් ලෝඩර් නමැති යන්ත්‍රයක් යොදාගෙන ඔහු වැලි කැණීම් කරන බවත් යන්ත්‍රයෙන් කණින වැලි බෙල්ට් එකක් හරහා ලොරිවලට පැටවෙන බවත් එම පරිසරවේදියා වැඩිදුරටත් 'මව්බිම'ට සඳහන් කළේය.

## වතිකානය...

ලංකාවේ කතෝලික ජනයාට යුක්තිය ඉටුවීමේ පමාව ගැන පාප්වහන්සේ ප්‍රමුඛ වතිකානු පරිපාලනය සිය විශේෂ අවධානය යොමුකර ඇතැයි විශ්වසනීය ආරංචි මාර්ග සඳහන් කරයි.

පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය හා බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානයේ බෝම්බ සිද්ධිය ඇතුළු සිදුවීම් ගැන සිදුකෙරෙන දේශීය අපරාධ විමර්ශන යාන්ත්‍රණය ගැන කතෝලික සමාජයෙන් කෙරුණු විධිමත් දැනුම්දීම් අනුව මෙම විශේෂ අවධානය යොමු වී ඇතැයි කතෝලික සභාවේ නිලධාරියෙක් 'මව්බිම'ට පැවැසීය.

ඒ අනුව පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරය ඇතුළු සිදුවීම් ගැන ස්වාධීනව වෙනම තොරතුරු විමර්ශනයකට අවශ්‍ය පුළුල් සහයෝගයක් වතිකානු රාජ්‍යයෙන් ලැබෙන්නේ යැයි එම නිලධාරියා කීය.

මීට අදාළව මෙරට කතෝලික සමාජයේ ගිහි සහ පැවිදි ක්‍රියාකාරීන් කිහිපදෙනකුම වතිකානු පරිපාලනය හා සන්නිවේදනයක නිරත වී යැයිද එම නිලධාරියා පැවැසීය.

2019 අප්‍රේල් 21 වැනිදා ලංකාවේ කතෝලික පල්ලි රැසකට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වූයේ වතිකානුවේදී චාරිත්‍රානුකූල පාස්කු ඉරිදා විශේෂ දේව මෙහෙය අතරේය.

එහිදී ශාන්ත පීතර චතුරස්‍රයට එක් වූ ජනතාව අමතමින් ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ ශ්‍රී ලංකාවේ කතෝලිකයන් ඉලක්ක කර එල්ල වූ ප්‍රහාර හෙළා දකිනු ලැබුවේ කෲර ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් ලෙස හඳුන්වමිනි.

පාස්කු දින ශෝකයට සහ වේදනාවට පත් කිතුනු බැතිමතුන් සමීපයෙන් තමා සිටිනා බව ෆ්‍රැන්සිස් පාප් වහන්සේ ඉන් පසුවද අවධාරණය කළහ.

මේ අතර බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානයේ බෝම්බ සිද්ධියේ පොලිස් අපරාධ විමර්ශනයේදී නාටකයක් රඟදක්වන බවට මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරුතුමෝ පසුගිය දිනෙක ආණ්ඩුවට චෝදනා කළහ.

කාදිනල්තුමන් මෙම අදහස පළ කළේ පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණය ඉටු කිරීම සඳහා වන ජාත්‍යන්තර සංසදය සංවිධානය කළ සූම් ඔස්සේ කළ සම්මන්ත්‍රණයක දීය.

සත්‍ය හෙළිදරව් කරගන්නා තෙක් ආණ්ඩුවට එරෙහිව සටන් කරන්නේ යැයි කී උන්වහන්සේ ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් නොනැවතී සබඳතා පවත්වන සියලු බලවත් රටවල සහාය වුව ලබාගැනීමට තමා සූදානම් යැයිද අවධාරණය කළහ.

පාස්කු ඉරු දින ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටුකර ගැනීමේදී තමා හා එක්ව සටන් කරන්නන් තිදෙනකුට එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය නුදුරේදීම ලැබීමට නියමිත යැයිද උන්වහන්සේ එහිදී ප්‍රකාශ කළ අතර ඉන් පසුව එම සංවිධානය සමඟ කෙළින්ම ගනුදෙනු කිරීමේ හැකියාව තමන්ට ලැබෙන්නේ යැයිද පැවැසූහ.

## රාජපක්ෂලාට...

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය වෙනුවට සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතු යැයි යන්න තම පක්ෂයේ මතය බව දෙමළ ප්‍රගතිශීලී සන්ධානයේ නායක මනෝ ගනේෂන් මහතා පවසයි.

මන්ත්‍රීවරයා මෙසේ සඳහන් කරන්නේ එම සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වත්මන් ආණ්ඩුවට කිසිවක්ම කරගත නොහැකි පසුබිමක එම සංශෝධනය ඉදිරිපත් කර ඇති බවයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ලංකා ආණ්ඩුව ගත් කාලය ඉකුත්ව ගොස් ඇති බව පෙන්වා දෙන මනෝ ගනේෂන් මන්ත්‍රීවරයා වත්මන් ආණ්ඩුව මෙම පනත සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත්තේ ආණ්ඩුවට වෙනත් විකල්පයක් නොමැති නිසා බවයි.

මෙම පනත ඉවත් නොකිරීම පිළිබඳව රාජපක්ෂ ආණ්ඩුවට පමණක් දොස් නොපැවරිය යුතු බවද පැවැති අනෙකුත් ආණ්ඩුද මෙම පනත ඉවත් කිරීමට කටයුතු නොකළ බවටද ඔහු චෝදනා කළේය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතින් බොහෝ සේ පීඩාවට පත් වනුයේ දෙමළ හා මුස්ලිම් ජනතාව බව පෙන්වා දුන් ඒ මහතා එසේ තිබියදීත් එම ජනතාව නියෝජනය කරනු ලබන මහජන නියෝජිතයන්ගේ ඇතැමෙක් එම පනතට සහයෝගය ලබාදෙමින් සිටින බවට චෝදනා කළේය.

ඔහු වැඩිදුරටත් අදහස් දක්වමින් පැවැසුවේ මෙරට ආණ්ඩු තම ස්ථාවරයන්ගෙන් මඳක් හෝ වෙනස් වනුයේ බාහිර බලවේග හෝ ජාත්‍යන්තර බලපෑම් මත පමණක් බවයි.

වසර 43කට පසුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීමට පියවර ගත් බව විදේශ කටයුතු අමාත්‍ය ජී.එල්. පීරිස් මහතා පසුගියදා රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව දැනුවත් කරමින් ප්‍රකාශ කර තිබේ.

# ආහාර පිසීමේදී රස වැඩි කරගැනීමට කැන්ගන් ජලය භාවිතා කළ හැක

### විශ්මිත වතුරක් 9වන කොටස

**Kangen Water ™**

[illegible]

පසුගිය සතියේ අප ඉදිරිපත් කළ ලිපියේ ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණ යන්ත්‍රයක ඇති සුවිශේෂී හැකියාවන් පිළිබඳව තවදුරටත් පැහැදිලි කරමිනුයි අද ලිපිය ඇරඹෙන්නේ.

හෘද නාලිකාවල අවහිරතාවලට අමතරව මොළයට සම්බන්ධ රුධිර නාලිකා තුළ ඇති වන අවහිරතා හඳුනාගැනීම් සහ ප්‍රතිකාර ලබාදීමට, වකුගඩු, අග්න්‍යාශය, පෙනහලු ඇතුළු සියළු පද්ධති තුළ, සිදුවන අවහිරතා අකර්මන්‍ය වීම් වලට පාදක වන ''හේතුවට'' ඒවෙලේම ප්‍රතිකාර කිරීමත් මෙම යන්ත්‍රය මගින් කළ හැකි වෙයි.

ඇසේ සුද ඇති වීම, කර්ණ ආබාධ, සන්ධි වේදනාව, කැක්කුම්, ස්නායු ගත රෝග ඇතුළු විශාල රෝග ප්‍රමාණයකට ඒ මොහොතේම කරන සුව කිරීමේ විශ්මිත ප්‍රතිකාර ලබා සුවපත් වූ විශාල පිරිසක් අප සමග කථා බහ කර තමන් සුවපත් වූ ආකාරය පිළිබඳ තොරතුරු ලබා දී ඇති බව ද පැවසිය යුතුය. මේ සඳහන් කළේ ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණ සහ ප්‍රතිකාරක යන්ත්‍රය මගින් කළ හැකි කාර්යයන් පිළිබඳ කෙටි හැඳින්වීමකි.

අප පෙර ලිපි කිහිපයක සඳහන් කළ කැන්ගන් ජලයේ ඇති විවිධ ප්‍රභේද මගින් කරන කාර්යය වලදී මුළුතැන්ගෙයි කටයුතු සඳහා ආහාර වර්ග පිරිසිදු කරගැනීම පිළිබඳ තවදුරටත් පැහැදිලි කරන ලෙස බොහෝ දෙනා කරන ඉල්ලීම් අනුව දැනගත යුතු වැදගත් කරුණු කාරණා කිහිපයක් මෙසේ සඳහන් කරන්නෙමු.

කොළ පැහැති එළවළු වර්ග පී.එච්. 8.5, 9.0 හෝ 9.5 කැන්ගන් ජලයේ බහා විනාඩි කිහිපයක් තැබූ විට ඒවා ඉතා දීප්තිමත් වී කොළ පැහැය ආරක්ෂා වන අතර නැවුම් බවද රසය ද වැඩි වේ. පැස්ටා, සහල් හෝ ධාන්‍ය වර්ග සඳහා කැන්ගන් යන්ත්‍රය මගින් සාදනු ලබන බියුටි වෝටර් හෙවත් රූපලාවන්‍ය ජලය (පී.එච්. 4 - 6) භාවිතා කිරීමෙන් ඒවා ඉතා ඉක්මණින් පිස ගැනීමට හැකිවන අතර රසවත් හා මෘදු ගතියකින් ද යුක්ත වේ. තෙලින් බැදීම සඳහා යොදාගනු ලබන දැවටුම් මිශ්‍රණ එම රූපවලාවන්‍ය ජලයෙන් (පී.එච්. 4 - 6) සාදා ගැනීමෙන් රසවත්ව (ක්‍රිස්පි ගතිය හොඳින් තිබෙන) සහ ඉක්මණින් පිළියල කරගැනීම, කල්තබා ගැනීම සහ තෙල් ගතිය අඩු කර ගැනීමේ හැකියාව ද පවතියි.

බිත්තර තම්බන විටදී කැන්ගන් යන්ත්‍රය මගින් සාදනු ලබන රූපලාවන්‍ය ජලය පාවිච්චි කිරීමෙන් බිත්තර පිපිරී ඉරිතලා තිබුණත් එළියට කාන්දු නොවී හොඳින් තැම්බෙන අතර ඉතා පහසුවෙන් කටුව ඉවත් කරගැනීමට ද හැකි වෙයි. එළවළු වර්ග ශීතකරණයේ තැබීමට පෙර රූපලාවන්‍ය ජලය ඉසීමෙන් ඒවායේ වර්ණය හා ගුණය නොනැසී පවතියි. වියළි ගතියෙන් ද තොර වෙයි.

මස් සහ මාළු වර්ග මෙන්ම එළවළු වර්ග ද කැන්ගන් යන්ත්‍රය මගින් සාදනු ලබන 11.5 කැන්ගන් ජලයේ විනාඩි 2-3 බහා තබා ආපසු ගත් විට ඒවායේ ඇති විෂබීජ වෛරස බැක්ටීරියා මෙන්ම කෘමිනාශක හා කෘෂිනාශක ද ඉවත් වී එහි ඇති තිත්ත රසද නැති වී යයි. මස් මාළු වල ඇති පිළීරස 2.5 අධි ආම්ලික ජලයේ විනාඩි 2-3 බහා තබා ආපසු ගත් විට නැතිව යයි. නැවුම් සහ ප්‍රණීතව සකසා ගත හැකි වෙයි.

කැන්ගන් ජල ප්‍රභේද භාවිතා කර පිසින ලද කෑම අනුභව කරන්නන් ආහාරවල ඇති ප්‍රණීත රස පිළිබඳ විමසීම අනිවාර්යයෙන්ම සිදුවන්නකි. 9.5 කැන්ගන් ජලයෙන් තේ හෝ කෝපි සෑදූ විට නළ ජලයෙන් සාදාගත් තේ කෝපි වලට වඩා ඉතා උසස් ගුණාත්මක මෙන්ම නියම කෝපි රසයත් නියම තේ රසයත් ලබාගැනීමට හැකි වේ. කැන්ගන් ජලය මෙරටට හඳුන්වා දුන් වෛද්‍ය ගුණරත්න මහතා මේ අදහස් පැහැදිලි කළේ ආහාර පිසීමේදී කැන්ගන් ජලය භාවිතා කිරීමෙන් සිදුවන වාසි මොනවාදැයි අප කළ විමසීමේදීය.

මෙතැන් සිට ඔබ කියවන්නේ අගනුවර ප්‍රසිද්ධ ආරෝග්‍ය ශාලාවක සේවය කරන එක්තරා වෛද්‍ය වරයෙකු කැන්ගන් ජලය සහ ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණ යන්ත්‍රය මගින් තම මව සුවපත් කරගත් ආකාරයයි. (අදාල වෛද්‍යවරයාගේ අනන්‍යතාවය හෙළි කිරීමට නොහැකි බව කරුණාවෙන් සලකන්න.)

''මම වෛද්‍යවරයෙකු ලෙස සේවය කරන්නේ වසර 22 ක කාලයක සිටයි. ලෙඩ රෝග සුවකිරීම සඳහා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කිරීම, යාග හෝම, ඇදහිලි වැනි දේ කිරීම තුළින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි යැයි මම නම් විශ්වාස කරන්නේ නැහැ. එහෙත් ආයුර්වේදය, දේශීය වෙදකම තුළින් රෝග සුවපත් නොවනවායයි කීමට තරම් මම සාහසික වන්නේ නැහැ. යම් යම් රෝග සුවපත් කරගැනීමට එවැනි ප්‍රතිකාර ඉතා හොඳයි.

ලොවම පිළිගත් වෘත්තියක් ලෙස බටහිර වෛද්‍ය වෘත්තිය හඳුන්වන්න පුළුවන්. බොහෝ රෝග වලට ප්‍රතිකාර කිරීම සඳහා බටහිර වෛද්‍ය විද්‍යාවට හැකියාව තියනවා. එහෙත් සමහර රෝග වලට ප්‍රතිකාර කරන ක්‍රම සහ බෙහෙත් නිසා වෙනත් අතුරු ප්‍රතිඵල ලැබීමටද හැකියාව නැතුවා නොවේ.

මම මෙහෙම කියන්නේ මගේ අම්මාව සුවපත් කරගන්න කැන්ගන් ජල ප්‍රතිකාරය තෝරා ගත්තේ ඇයි කියන ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් දෙන්නයි. මගේ අම්මාට යම් යම් අසනීප තිබුණා. මම ඇයට ප්‍රතිකාර කර ඇය සුවපත් කළා. එහෙත් දැනට මාස කිහිපයකට පෙර ඇයගේ උගුර ආශ්‍රිතව යම් රෝගී තත්ත්වයක් හටගනිමින් තිබුණා. ආහාර ගිලීමට යම් අපහසුවක් ඇති වී, උගුරු ඇතුළත තද රතු පැහැ වී, ඒ ප්‍රදේශයේ ඉදිමීම් වැනි ලක්ෂණ ඇති වීම නිසා මම ඇයව වහාම පරීක්ෂණ කිහිපයකට යොමු කළා. එම ප්‍රදේශයේ පටක වෙනම පරීක්ෂණය කළා.

අවාසනාවකට මගේ අම්මාගේ උගුර ප්‍රදේශයේ පිළිකා සෛල හටගනිමිනුයි තිබුණේ. මේ සඳහා ප්‍රතිකාර ලබා දීමට මට හැකියාව තිබුණා. එහෙත් එම ඖෂධ මගින් යම් යම් අතුරු ප්‍රතිඵල ලැබීමේ ඉඩකඩක් පවතින බවත් මම දැනසිටියා. අභ්‍යන්තර මෙන්ම බාහිරව එවැනි දේ සිදුවිය හැකියි. කොණ්ඩය යාම, සමහරවිට සමේ සංකූලතා හෝ අනිවාර්ය අභ්‍යන්තර සංකූලතා හටගැනීම වැනි දේවල්. මගේ අම්මාගේ වයස අවු. 71 ක්. එනිසා මේ ගැන දෙපාරක් හිතන්න වුණා.

මේ වන විට මම කැන්ගන් ජලය පිළිබඳ පුවත්පත් කිහිපයක්ම කියවා තිබුණා. අම්මාගේ රෝගී තත්වය තවම උත්සන්න වී නොමැති නිසා මට හිතුණා කැන්ගන් ප්‍රතිකාරය සහ ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණයට ඇයව යොමු කර බැලීමට. වෛද්‍ය ගුණරත්න මහතාට දුරකථන ඇමතුමක් දී දිනයක් වේලාවක් ලබා ගෙන අම්මා සමග මාතර ගොස් වෛද්‍ය ගුණරත්න මහතා මුණගැසුණා. මම වෛද්‍යවරයෙක් බව ඒ මහතාට පැවසුවේ නැහැ. ඒවාගේම අම්මාගේ ප්‍රධාන රෝගය පිළිබඳවත් මුලින්ම පැවසුවේ නැහැ. අදාළ ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණය ගැන හොඳින් නිරීක්ෂණය කළා.

ඇත්තටම එය සාර්ථක පරීක්ෂණයක් බව මට වැටහුණා. අම්මාගේ රෝගය පිළිබඳව සත්‍ය තොරතුරු එම පරීක්ෂණයේදී පැහැදිලිවම මට කියා දුන්නා. පසුව ඇසේ තිබූ පෙනීමේ අඩුපාඩුවකට ද එවෙලේම ප්‍රතිකාර කළා. පිළිකා තත්ත්වය තවත් සුවකිරීම සඳහා කැන්ගන් ජලය සති 3ක් පමණ කාලයක් පානය කර නැවත පැමිණෙන ලෙසත් අපට පැවසුවා. සතියක පමණ කාලයක් බත්තරමුල්ලේ තැනකින් කැන්ගන් වතුර අම්මාට ගෙනල්ලා දුන්නා. ඊටපසු කැන්ගන් යන්ත්‍රයක් ඒ මහතාගෙන් ලබාගෙන මගේ ගෙදර සවිකර අම්මාටත් අපටත් එම ජලය පමණක් පානය කිරීමට යොදාගත්තා.

**ඉතිරි කොටස ලබන සතියේ.**

**0777 362 860 යන දුරකථන අංකය ඇමතීමෙන් වෛද්‍ය එල්. ගුණරත්න මහතා සම්බන්ධ කරගත හැක. (සවස 7.00 ත් 9.00 ත් අතර ඇමතීම වඩාත් පහසු වේ.)**

**සැකසුම - අමරසිංහ මාලගේ**







ඔබට මුදල් හදිසියක්ද? නැත්නම් ඔබේ වටිනා රන් භාණ්ඩ සින්න වෙන්න යනවාද?

F.A.Ads

ඕනෑම බැංකුවක උකස් තබා ඇති රන් භාණ්ඩ ගණුදෙනුවක් සඳහා

පවුමට රු. 33,000/- ක් ම වැඩිපුර


ශත 70 ක අඩුම පොලියට ලබා ගන්න

ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න

විශේෂ සහන රැසක් සමගින්

නැවත බේරා ගැනීමේදී පහසු ගෙවීමේ ක්‍රමයට Loan එකකුත්

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | වැල්ලවත්ත | 0710 870 686 |
| මොරටුව | 0766 227 059 | කළුතර | 0776 167 149 |
| මීගමුව | 0766 227 056 | ගම්පහ | 0779 230 549 |
| වෙන්නප්පුව | 0710 869 378 | හලාවත | 0779 256 191 |
| ගාල්ල | 0705 979 274 | මාතර | 0705 979 237 |
| කුරුණෑගල | 0766 227 061 | ගම්පොළ | 0710 870 735 |
| දිගන | 0778 156 738 | නාවලපිටිය | 0710 870 706 |
| තලවකැලේ | 0710 871 009 | හැටන් | 0778 790 372 |
| මාතලේ | 0702 539 389 | කෑගල්ල | 0703 583 363 |
| බේරුවල | 0772 999 934 | පූඩළුඔය | 0777 683 889 |
| මතුගම | 0772 206 413 | රාගල | 0710 870 703 |
| වව්නියාව | 0740 920 313 | උඩප්පුව | 0771 201 851 |
| මොණරාගල | 0771 201 852 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බදුල්ල | 0771 201 863 | පුත්තලම | 0771 201 861 |
| කොටහේන | 0702 539 382 | මහියංගනය | 0771 201 862 |
| කල්පිටිය | 0761 605 803 | මස්කෙලිය | 0760 909 822 |
| කටුගස්තොට | 0779 476 206 | පානදුර | 0776 157 119 |
| නාළල | 0763 226 230 | | |




භාවිතය අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය

මධ්‍යම පරිසර අධිකාරිය
පරිසර අමාත්‍යාංශය

තාත්තාගේ මරණයේ කම්පාව දියණිය මාධ්‍යයට කියයි




# කදුරුගස්ආර සිරකරුගේ අබිරහස් මරණයට එරෙහිව ජේලර් මාෆියාවේ රෙදි ගලවන දියණිය

**පොලිසිය හා බන්ධනාගාරය තුළ සිදුවන විවිධ අක්‍රමිකතා නිසා එම ආයතනවලට එල්ල වන මහජන අප්‍රසාදය ඉමහත්ය. මෙවන් නොයකුත් දූෂිත ක්‍රියා හේතුවෙන් මෙම ආයතන තුළ වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ද සුළුපටු නැත. මෙවැනි ක්‍රියා හේතුවෙන් 2021 වසර තුළ පමණක් බන්ධනාගාර නිලධාරීන් 53කගේ සේවය අත්හිටුවා ඇති බවත්, තවත් නිලධාරීන් 18 දෙනකු රිමාන්ඩ් බන්ධනාගාරගත කර ඇති බවත් පසුගියදා මාධ්‍යයද අනාවරණය කර තිබිණි.**

මෙවන් වාතාවරණයක් තිබියදී බන්ධනාගාරයක් තුළ සිදු නොවිය යුතු නොමනා ක්‍රියාවක් පිළිබඳව පසුගියදා සමාජ මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය වාර්තා කළේ මුළු බන්ධනාගාර දෙපාර්තමේන්තුවටම කළු පැල්ලමක් එක් කරමිනි.

මෙවර බන්ධනාගාර දෙපාර්තමේන්තුවට එල්ල කෙරෙන චෝදනාව සුළුපටු නැත. චෝදනා එල්ල කරන පාර්ශ්වය ඒ බව සඳහන් කරන්නේ සාක්ෂිද සමඟ වීම විශේෂ ත්වයකි. මේ වන විට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතාගේ උපදෙස් මත බන්ධනාගාර බුද්ධි සහකාර අධිකාරිවරයකු විසින් එල්ල වී ඇති චෝදනා සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක්ද සිදු කෙරෙන අතර ඇඹිලිපිටිය මූලස්ථාන පොලිසියට යොමු කර ඇති පැමිණිල්ලක් සම්බන්ධයෙන් පොලිස් විමර්ශනයක්ද අරඹා තිබේ.

කදුරුගස්ආර එළිමහන් වැඩ කඳවුරේදී සැකකටයුතු ලෙස රැඳවියකු මිය යෑමත් එම රැඳවියාගේ දියණියගෙන් වැඩ කඳවුරේ නිලධාරීන් අල්ලස් ලබාගැනීමත්, ඇයට අයුතු යෝජනා කිරීමත් සම්බන්ධයෙන් මෙම විමර්ශන ඇරැඹී තිබේ.

ලලිත් චමින්ද හෙට්ටිගේ දියණියන් තිදෙනකුගේ පියෙකි. එම්.ජී. සෝමලතා ඔහුගේ බිරියයි. ගල් කැඩීම, පොල් කැඩීම ආදී කුලී වැඩ කරමින් බිරිය හා දරුවන් රැක බලාගත් චමින්ද මාතර කනංකේ කන්දවත්ත ප්‍රදේශයේ පදිංචිව සිටි අයෙකි. දිලානි මංජුලා චමින්දගේ වැඩිමහල් දියණිය වූ අතර ඇය විවාහක යුවතියකි. දිලානිට බාල සොහොයුරකු හා සොහොයුරියක් වෙයි.

නැති බැරිකමින් අගහිඟකමින් දරු පවුල නඩත්තු කළ ලලිත් චමින්ද සුරා සූදුවෙන්ද තොර අයෙකි. කෙසේ වෙතත් රුපියල් දසදහසක් සොරකම් කිරීමේ චෝදනාවකට ලලිත් චමින්දට එරෙහිව පොලිසිය ඔහු අත්අඩංගුවට ගෙන නඩුවක්ද ගොනු කරන්නට විය. ඒ ඉකුත් 2010 වසරේදීය. දිගින් දිගටම නඩුව අධිකරණයේ විභාග කෙරිණි. අවසානයේ එහි තීන්දුව ප්‍රකාශයට පත්කෙරුණේ ලලිත් චමින්දට වසර තුනක බරපතළ වැඩ ඇතිව දඬුවමක්ද නියම කරමිනි. ඒ 2021 මාර්තු මස 8 වැනිදාය.

දඬුවම ලැබූ ඔහු අඟුණකොළපැලැස්සේ බන්ධනාගාරයේ රඳවා ගැනුණු අතර කාලයකට පසු ඔහු කදුරුගස්ආර එළිමහන් වැඩ කඳවුරට මාරුකරන ලදී. ඒ වන විටත් වයස අවුරුදු 49ක් වූ ලලිත් චමින්දට වැඩ කඳවුරේදී නියම කෙරෙන කාර්යයන් කිරීම එතරම් පහසු නොවිණි. ඔහුට ඒ බව කියන්නට කිසිවකුද නොවීය. කොරෝනා වසංගතය ව්‍යාප්ත වීම හේතුවෙන් ලලිත් චමින්දගේ බිරිය හා දරුවන්ටද ඔහු දැකගත නොහැකි විණි.

වැඩිමහල් දියණිය දිලානි මංජුලා සිය පියාට දැක්වූයේ දැඩි සෙනෙහසකි. පියා දැක බලාගෙන ඔහුගේ සුවදුක් විමසීමට ඇය තුළ ඇතිව තිබුණේත් දැඩි ආශාවකි. එහෙත් කොරෝනා වසංගතය ඊට බාධාවක් ගෙනදුණි.

ඒ සම්බන්ධයෙන් දිලානි මංජුලා මාධ්‍ය හමුවේ පවසා තිබුණේ මෙවැන්නකි.

"ඔය අතරේ නොවැම්බර් මාසේ මට තාත්ත කෝල් එකක් දුන්නා. ඒ බන්ධනාගාරයේ නිලධාරියකුගේ ෆෝන් එකකින්. "පුතේ දැන් මාව බලන්න දෙනවා. මාව බලන්න එන්න පුතේ" කියලා තාත්තා මට කිව්වා. පස්සේ මම මහත්තයත් දරුවෝ දෙන්නත්, අම්මත් එක්ක තාත්තා බලන්න වැඩ කඳවුරට ගියා."

"තාත්තා හොඳට හිටියා ඇස්වල කඳුළු පුරෝගෙන මගේ ගාවට ඇවිත් මාව බදාගෙන තාත්තා මට කතා කළා. තාත්තා කිව්වා එතැන වැඩ ටිකක් කරදරයි කැත්තේ උදැල්ලේ වැඩ තමයි තියෙන්නේ පුතේ කියලා.

ඊට දවස් හතර පහකට පස්සේ බන්ධනාගාරයේ නිලධාරීන්ගේ ජංගම දුරකථනවලින් තාත්තා මට කෝල් කළා. මම හොඳින් ඉන්නවා කියලත් කිව්වා. එහෙම දවස් හතරකට පහකට සැරයක් මට කතා කළා... ඒ ඇමතුම් තාත්තා දුන්නේ පුතේ මේකට කෝල් එකක් ගන්න කියලා. ඉන් පස්සේ මම තමා ඒ ෆෝන්වලට කෝල් ගත්තේ. නමුත් ඒ නිලධාරීන්ගේ දුරකථනවලට මම රීලෝඩ් එකක් දාන්න ඕන. මම මගේ ෆෝන් එකෙන් ඔන්ලයින් හරහා රීලෝඩ් දානවා. දාපු හැම මැසේජ් එකක්ම මගේ ෆෝන් එකේ තියෙනවා.

ඊට පස්සේ මම දෙසැම්බර් 2 වැනිදා තාත්තා බලන්න ගියා. ඒ වෙලාවේ තාත්තා මට කිව්වා මෙහෙ ඉන්නවා සර් කෙනෙක් එයාට සල්ලි කීයක් හරි දෙනව නම් මට වැඩ කරදර කරන එක නතර කරනවා. මට මෙතැන හොඳට ඉන්න දෙනවා කියලා. එතකොට මම කිව්වා අනේ ලොකු දෙයක් තාත්තේ මොකක් හරි කරලා සල්ලි හොයලා දෙන්න පුළුවන්නේ. ඔයාට නිදහසේ ඉන්න තියෙනවා නම්..."

මෙලෙස පියා ගැන සොයා බලමින් සිටි ඇය තවත් වරෙක සිය පියා බලන්නට වැඩ කඳවුරට ගියාය. ඒ ගිය වසරේ දෙසැම්බර් 27 වැනිදාය. නව වසර උදාවීමටත් ඇත්තේ දින දෙක තුනක් බැවින් ඇය එවර පියා බලන්නට ගියේ ඔහුට අවශ්‍ය කෑම බීමද රැගෙනය. එදින පියා ඇයට බන්ධනාගාර නිලධාරියෙක් පෙන්වා ඇත. ඒ ඔහුට කඳවුරේදී උදවු දෙන නිලධාරියකු බව කියමින්ය.

"ඒ සර් මට කිව්වා මම ඔයාගේ තාත්තට වැඩ දෙන්නේ නැහැ. තාත්තා නිකම් තියෙනවා කියලා. ඒ පාර මම ඒ සර්ගෙන් ඇහැව්වා සර් මොනවද බලාපොරොත්තු වෙන්නේ කියලා. ඒ පාර සර් කිව්වා මම ඔයාගෙන් ලොකු දෙයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට රුපියල් 5,000ක් දෙන්න කියලා කිව්වා. තාත්තා එතැන හොඳින් ඉඳීවි කියන බලාපොරොත්තුවෙන් මම ඒ මනුස්සයට රුපියල් 5000ක් දුන්නා.

රුපියල් 5000 ගත්තට පස්සේ බන්ධනාගාර සිර ඇඳුමෙන්ම තාත්තාගේ ෆොටෝ එකක් ගන්නත් ඒ සර් මට අවස්ථාව දුන්නා. ඒකත් මගේ ෆෝන් එකේ තියෙනවා.

5,000 දුන්නට පස්සේ තාත්තාට වැඩ දෙන්නේ නැහැ කියලා තාත්තා හොඳින් ඉන්නවා කියලා වීඩියෝ කෝල් අරන් පෙන්නන්නම් කියලා ඔයා බය වෙන්න එපා ඔයා අපිට ගෙවනව නම් අපි තාත්තට කරදරයක් නොකර මෙහ ඉන්න දෙන්නම් කියලත් කිව්වා.

මම ගෙදර ආවට පස්සේ වීඩියෝ කෝල්වලින් තාත්තාව පෙන්නුවා. ඒවල ස්ක්‍රීන් ෂොට් මා ළඟ තියෙනවා. ඉන් පස්සේ දිගටම තාත්තව මට පෙන්නුවා. තාත්තා හොඳින් ඉන්නවා. හැබැයි මේවට අපිට ගෙවන්න ඕන කියලත් කිව්වා. මම හිඟාකාලා හරි ඉල්ලන ගාණක් දෙන්නම් මගේ තාත්තා හොඳින් තියන්න කියලා මම කිව්වා.

මට බන්ධනාගාර නිලධාරීන් 5 දෙනෙක් ජංගම දුරකථන පහකින් කෝල් ගත්තා. ඒවට මම සල්ලි යැව්වා. ජනවාරි 9 වැනිදා නිලධාරියෙක් මට කතා කරලා තාත්තාට ෆෝන් එක දුන්නා. තාත්තා කිව්වා දැන් මට කරදර නැහැ කියලා. පස්සේ ඒ නිලධාරියා මට කිව්වා මම රෑ වෙලා ගන්නම් කියලා. එයාට රෑවෙලා ගන්න අවශ්‍යතාවක් නැහැ. මම කසාද බැඳලා මට දරුවෝ දෙන්නෙක් ඉන්නවා. මට රෑට රෑට කෝල් ආවොත් මගේ පවුල් ජීවිතේට ප්‍රශ්නයක් වෙයි කියලා. මම ඒක බන්ධනාගාරයේ තාත්තට උදවු කරන ..... මහත්තයාට කිව්වා. මම මට කතා කරන නිලධාරීන්ගේ නොම්බර ටිකත් ඒ මහත්තයට දුන්න. ඒ මහත්තයව විශ්වාස කරලා."

ජනවාරි 10 වැනිදා දහවල් ලලිත් චමින්ද බන්ධනාගාර නිලධාරියකුගේ ජංගම දුරකථනයකින් සිය දියණියට කතා කොට රාත්‍රියේ ඇමතුමක් දෙන්නට උත්සාහ කළ සිද්ධිය ගැන විමසා ඇත. ඒ තරහින්ය.

## අයුතු යෝජනා කරනවා

## සැරින් සැරේ සල්ලි ඉල්ලනවා

## ෆෝන් රීලෝඩ් දා ගන්නවා

## සල්ලිවලට නීතිය නවනවා

"තාත්තේ ඔයා ප්‍රශ්න ඇති කරගන්න එපා. ඔයා තව ටික දවසකින් එළියට එනවනේ. ඔයා ගෙදර එන්න ආශාවෙන්නේ ඉන්නේ. ප්‍රශ්න ඇති කරගන්නේ නැතිව ඔය ටිකත් ඉන්න..."

දිලානි පියාගේ සිත සනසමින් පවසා තිබුණාය.

"විසි අටදාහක් තාත්තට දඩ ගෙවන්න තිබුණා. ඒ 28,000ත් ගෙවන්න එපා. ඒ මාස දෙකත් ඉඳලා එන්නම් කියලා තාත්තා කිව්වා. එදා.... මහත්තයා මට කතා කරලා කිව්වා "ඔයා මට රුපියල් 1500ක් දාන්න මට හදිසියක් තියෙනවා" කියලා. එයාගේ එකවුන්ට් නොම්බරේ මට වට්ස්අප් කළා. මගේ ඒ වෙලාවේ ඩේටා තිබුණේ නැති නිසා මට සල්ලි දාන්න බැරි වුණා.

දහවැනිදා රෑ මම අම්මත් එක්ක ෆෝන් එකෙන් කතා කරකර ඉන්න කොට තාත්තා මට කෝල් එකක් දුන්නා. මම ෆෝන් එකට කොන්ෆරන්ස් දැම්මා. තාත්තා රහසින් කතා කළේ එයා කියන මුකුත් මට ඇහුණේ නැහැ. මට තේරුණේ නැහැ. තාත්තා කෑවද කියලා ඇහැව්වම බතලයි මසුයි කෑව විතරක් කියනවා ඇහුණා. ඇයි තාත්තේ රහසින් කතා කරන්නේ කිව්වම එයා කෙඳිරුවා. එයා මොන මොනවා හරි දෙයක් කාටත් නෑහෙන්න කිව්වා. ඒත් මට තේරුණේ නැහැ. මම ඇහැව්වා ඇයි ඇයි කියලා. ඔයාට මාව බලන්න ආයෙත් එන්න වෙන්නේ නැහැ කියලා තාත්තා කිව්වා. ඇයි තාත්තේ එහෙම කියන්නේ මම 20 වැනිදා තාත්තා බලන්න... ඒත් එක්කම ෆෝන් එක කට් වුණා. මම හිතුවා මගේ ෆෝන් එකේ සල්ලි ඉවර වෙලා කියලා."

ඇය පවසන පරිදි 13 වැනිදා සවස ඇගේ නිවෙසට ගමේ පදිංචි බන්ධනාගාර නිලධාරියකු පැමිණ පවසා ඇත්තේ එළිමහන් වැඩ කඳවුරේ රැඳී සිටි ලලිත් චමින්ද ඉන් පැනගොස් ඇති බවය. එහෙත් ඇය ඒ කතාව විශ්වාස කර නැත. ඇය වහා කදුරුගස්ආර වැඩ කඳවුරේ දන්නා කියන නිලධාරීන් සියල්ලටම දුරකථන ඇමතුම් දුන්නාය. ඒත් ඒ එක ඇමතුමකටවත් ප්‍රතිචාර ලැබී නැත. පසුව එක් උසස් නිලධාරියකු තමාට මෙසේ පැවසූ බව ඇය කියන්නීය.

"තාත්තා මගේ යටතේ තමයි වැඩ කර කර හිටියේ. ඒ ඉන්න ගමන් එයා එක පාරට උදැල්ල කරට අරන් පැනලා ගියා කියලා ඒ මහත්තයා මට කිව්වා. මම ඇහැව්වා ඇයි සර් එතකොට තාත්තව හෙව්වේ නැද්ද කියලා. ඒක මහ වනාන්තරයක් සත්තුන්ට කඳන් දාලා තියෙන්නේ. තුවක්කු බැඳලා තියෙනවා, ඒ නිසා හෙව්වේ නැහැ කිව්වා.

පස්සේ 14 වැනිදා උදේ ආයෙත් මම ඇහැව්වා තාත්තා ඉන්නවාද කියලා. තාත්තා නැහැ කියලා කිව්වා. පස්සේ මම ...... මහත්තයට වට්ස්අප් එකෙන් මැසේජ් එකක් දැම්මා සර් මගේ තාත්තා පැනල යන කෙනෙක් නෙමේ. මගේ තාත්තට මොකද වුණේ කියලා දැනගන්න මම දැන්ම ඔහේට එනවා කියලා. මෙච්චර දවසක් කතා නොකරපු මහත්තයා මට කෝල් එකක් අරන් කිව්වා ඔයාගේ තාත්තව හය වෙන කොට අපි ඇල්ලුවා මෙහෙන් පැනලා යද්දී කියලා.

රෑ නවයට විතර කලින් කතා කරපු මහත්තයට ආයෙත් මම කතා කරලා ඇහැව්වා තාත්තා කෝ කියලා. එතකොටත් එයා කිව්වේ තාත්තා නැහැ කියලා. එතකොට මම කිව්වා තාත්තට මොකද වුණේ බලන්න මම එනවා කියලා. එතකොට ඒ මහත්තයා කිව්වා පැනලා යන්න ගිහින් කට්ටියක් අල්ලගෙන හිරකරගෙන හිටියා. එයාව දැන් අපි එක්කගෙන ආවා කියලා. එහෙනම් මම එනවා තාත්තව බලන්න කිව්වම ඒ මහත්තයා කිව්වා ඔයා ආවට තාත්තා බලන්න දෙන්නේ නැහැ. මාසයක් යනකම් අපි එයාව ෂෙල් එකකට දානවා. පස්සේ තමයි පෙන්නන්නේ කියලා. මාසයක් යනකම් බලන්න දෙන්නේ නැහැ කිව්ව නිසා මම තාත්තව බලන්න ගියේ නැහැ.

ඉන් පස්සේ තමයි නංගි මට කතා කරලා කිව්වේ කනංකේ පොලිසියෙන් ඇවිත් තාත්තා මැරිලා කියලා කිව්වා කියලා. මම කනංකේ පොලිසියට ගියා. එයාලා කිසි දෙයක් දන්නේ නැහැ. පහුවැනිදා උදේ මම ඇඹිලිපිටිය ඉස්පිරිතාලෙට ගියා මගේ තාත්තව බල්ලෙක් වගේ මරලා දාලා තියෙනවා මගේ ඇස් දෙකෙන්ම දැක්කා.

මම ඉන් පස්සේ වැඩ කඳවුරටත් ගියා ගේට්ටු ඇරලා දාලා තිබුණේ. මම මහත්වරුන්ගෙන් ඇහැව්වා තාත්තට මොකද වුණේ කියලා. අපිට කරන්න දෙයක් නැහැ. තාත්තා පැනලා ගියා. ගමේ මිනිස්සු තාත්තට ගහලා තිබුණා කියලා ඒ මහත්තයා කිව්වා."

තාත්තා කොච්චි කඩන්න යැව්වා එතකොට තමයි පැනලා ගියේ කියලා තව මහත්තයෙක් කිව්වා. කට්ටියම කිව්වා ඔයාගේ තාත්තා පැනලා දිව්වා. කැලේට අපිට යන්න බැහැ. ඒ නිසා හෙව්වේ නැහැ කියලා. එයාලා එක එක බොරු කියලා මේක වසන් කරන්න හැදුවා.

පස්සේ මට එක මහත්තයෙක් කිව්වා ඔයාගේ තාත්තා හොඳ එකෙක් නෙවේ. ඇතුළට කුඩු ගංජා, සිගරැට්, බීඩි එන ඒවා තාත්තා සේරම පාවලා දීලා ලොකු මහත්තයට කියලා කිව්වා. ඇත්තටම මූ මැරුවත් මදි. මාත් එක්ක තරහ වෙන්න එපා. මුගේ අතක් පයක් කඩලා ඉතුරු කරන්න ඕන එකෙක් නෙවේ. ඔයාගෙන් සල්ලි ගත්ත ඒවත් මූ කියලා කිව්වා.

"මගේ තාත්තා අසාධාරණයට කැමැති නැහැ. මගේ තාත්තා ගහලා මරලා දාලා. තාත්තාගේ ඇඟ නිල්වෙලා. තාත්තාගේ යටිපතුල්වල ලේ වැක්කෙරෙනවා මම දැක්කා.

මගේ තාත්තා අහිංසක මනුස්සයෙක්. රුපියල් හැටකට පොල් ගහකට නැගලා දවසට රුපියල් 600ක් හම්බ කරන්න පොල් ගස් 10කට නගින මනුස්සයෙක්. අපි තුන්දෙනා ජීවත් කරන්න මගේ තාත්තා අනන්ත අප්‍රමාණ දුක් වින්දා. තාත්තාගේ අත්වල එක දාරයක්වත් නැහැ. කරගැට විතරයි තියෙන්නේ. ගස් නැගලා කකුල්වල පතුරු ගිහින් තිබුණේ. එහෙම අහිංසක මිනිසෙක් මගේ තාත්තා. එහෙම තාත්තව බල්ලෙක් වගේ මරලා දාලා ඉන්න හැටි මගේ ඇස් දෙකෙන් දැක්කා. මගේ තාත්තට සාධාරණයක් කරන්න. තාත්තාට මේ දේ කරපු අයට දඬුවම් දෙන්න." ඇය මාධ්‍ය හමුවේ හඬා වැටෙමින් ඉල්ලා සිටියාය. ඇගේ සංවේදී කතාව සමාජ මාධ්‍ය ජාලවල මෙන්ම මුද්‍රිත මාධ්‍යවලද ප්‍රචාරය වීමත් සමඟ මුළු රටම මින් කැලඹිණි. ඒ සමඟම ඊට ප්‍රතිචාර දක්වමින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා කීවේ ලලිත් චමින්දගේ දියණිය මාධ්‍ය හමුවේ පවසා ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කිරීම සඳහා බන්ධනාගාර බුද්ධි සහකාර අධිකාරිවරයකු යටතේ පූර්ණ විමර්ශනයක් ඇරැඹී බවයි.

බන්ධනාගාර නිලධාරීන් විසින් රැඳවියාට දුරකථන ඇමැතුම් ලබාදීම, රැඳවියාගේ ඥාතීන්ගෙන් මුදල් ලබාගැනීම, රැඳවියා සිරකරු ඇඳුමෙන් සිටින ඡායාරූප සමාජයට මුදාහැරීම, මුදල් රැගෙන රැඳවියා වැඩ බිමෙන් නිදහස් කිරීම වැනි අක්‍රමිකතා රැසක් රැඳවියාගේ දියණියක් විසින් අනාවරණය කිරීම නිසා මේ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදු කිරීම මෙම විමර්ශනයේ අරමුණ බව කොමසාරිස් ජනරාල්වරයා පැවැසුවේය. එහෙත් රැඳවියාගේ දියණිය බන්ධනාගාර නිලධාරීන්ගේ අයථා ක්‍රියා මාධ්‍යයට හෙළි කරන්නේ දුරකථන රීලෝඩ්, ගිණුම්වලට දැමූ මුදල්, ජම්පර ඇඳ සිටින රැඳවියාගේද පින්තූර හා සාක්කිද සමඟය. ඒ නිසා විමර්ශන පවත්වන කණ්ඩායමේ මූලික අරමුණ සාධාරණ, අපක්ෂපාතී විමර්ශනයක් නම් ලලිත් චමින්දගේ දියණිය සතුව ඇති අදාළ සාක්කි මුලින්ම ඇගෙන් ලබාගත යුතුව ඇත. සිද්ධිය සම්බන්ධයෙන් මේ වන විටත් කදුරුගස්ආර එළිමහන් වැඩ කඳවුරේ නිලධාරීන් තිදෙනකුගේ සේවය අත්හිටුවා ඇති බව බන්ධනාගාර දෙපාර්තමේන්තුව කීවේය. පරීක්ෂණවලදී හෙළිදරව් වී ඇති කරුණු කාරණාවලට අනුව මෙම සිදුවීම සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් සිදුකිරීම අරමුණු කොට ගෙන මෙම නිලධාරීන්ගේ වැඩ තහනම සිදුකර ඇතැයි බන්ධනාගාර දෙපාර්තමේන්තුව කියයි.

කෙසේ වෙතත් ලලිත් චමින්ද රැඳවියාගේ මරණය සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් පරීක්ෂණයක්ද පවත්වා ඇති අතර පශ්චාත් මරණ පරීක්ෂණයේදී ලබාදී ඇත්තේ විවෘත තීන්දුවකි. රැඳවියාගේ සිරුරේ කොටස්ද මරණයට හේතුව සොයා ගැනීමේ අරමුණින් රජයේ රස පරීක්ෂකවරයා වෙත යොමු කර ඇතැයි වාර්තා වේ.

ඉකුත් 25 වැනිදා ලලිත් චමින්ද හෙට්ටිගේ රැඳවියාගේ මරණය සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් පරීක්ෂණය හෙවත් මූලික සාක්කි විමසීම ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේදී පැවැත්විණි. එහිදී මියගිය අයගේ දියණිය වන දිලානි මංජුලා හා ඇගේ මව එම්.ජී. සෝමලතා යන අය ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් ලක්මිණි විදානගමගේ මහත්මිය ඉදිරියේ සාක්කි දෙමින් පවසා සිටියේ ලලිත් චමින්දගේ මරණය සැක සහිත බවය. එහිදීද ලලිත් චමින්දගේ දියණිය එදිනද මාධ්‍ය හමුවේ පවසා සිටියේ තම පියාට නිදහස් වීමට මාස තුනක් පමණක් තිබියදී ඔහුට බන්ධනාගාරයෙන් පැන යෑමට අවශ්‍ය නැති බවත් තම පියාට පහරදී ඝාතනය කර ඇති බවත්ය.

කෙසේ වෙතත් බන්ධනාගාර නිලධාරීන්ගෙන් රැඳවියන්ගේ ඥාතීන්ට අයුතු බලපෑම්, අයුතු යෝජනා සහ මුදල් ඉල්ලීම් වැනි දේ සිදුවේ නම් එවැනි දේ පිළිබඳ බලධාරීන් දැනුවත් කිරීමට සෑම බන්ධනාගාරයකටම දුරකථන අංක ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කර ඇතත් බොහෝ රැඳවියන්ගේ ඥාතීන් බන්ධනාගාර නිලධාරීන්ගෙන් අදාළ රැඳවියාට වරප්‍රසාද ලබාගැනීම සඳහා මුදල් ලබාදීම් සිදුකර මෙවන් විනාශයක් සිදුවූ විට පමණක් ඒ සම්බන්ධයෙන් මැසිවිලි නගන බවද බන්ධනාගාර දෙපාර්තමේන්තුව කියයි.

කෙසේ වෙතත් ලලිත් චමින්ද හෙට්ටිගේ ගේ මරණය කෙසේ සිදුවීද යන්න තවමත් හෙළි වී නැත.

ඒ සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විමර්ශනයක් මෙන්ම පොලිසියේ විමර්ශනයක්ද සිදුවෙමින් පවතී. රැඳවියා මියයෑම සම්බන්ධයෙන් පරස්පර අදහස් ඉදිරිපත් වී ඇති බවත් ඒ සම්බන්ධයෙන්ද අඟුණුකොළ පැලැස්ස බන්ධනාගාර අධිකාරිවරයා විසින්ද පරීක්ෂණයක් ආරම්භ කර තිබේ. එමෙන්ම මෙහිදී මනුෂ්‍ය ඝාතනයක් සිදුවී ඇත්නම් පොලිසියද ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා සූදානමින් සිටී. එතෙක් ලලිත් චමින්දට සිදුවූයේ කුමක්ද යන්න අබිරහසකි. ඒ අබිරහස මෙම විමර්ශන හා රස පරීක්ෂක වාර්තා තුළින් යථා කාලයේදී විසඳෙනු ඇතැයි කාගේත් බලාපොරොත්තුව වේ. ඉකුත්දා පැවැති සාක්කි විමසීමේදී සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටු සභාපති නීතිඥ සේනක පෙරේරා හා නීතිඥ ප්‍රබෝධ රත්නායක යන මහත්වරු පැමිණිල්ල මෙහෙය වූ අතර මීළඟ සාක්කි විභාගය පෙබරවාරි පළමුවැනිදා දක්වා කල් තැබිණි.

මේ අතර බන්ධනාගාරවල දූෂණ හා විෂමාචාර වැළැක්වීම සඳහා නව බළකායක් හඳුන්වාදී ඇත. මෙය ශ්‍රී ලංකා බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බළකාය හෙවත් 'ස්පීට් ෆෝස්' යනුවෙන් හඳුන්වයි. මෙම බළකායට සේවා මුක්ත භටයන් 500 දෙනකු බඳවාගැනීමට නියමිත බවද වාර්තා වේ. එමඟින් හෝ බන්ධනාගාරය තුළ සිදුවන දූෂණ හා අක්‍රමිකතා පාලනය වනු ඇතැයි බලධාරීන්ගේ අපේක්ෂාවයි.

■ කීර්ති මෙන්ඩිස්

● ඡායා- උඩවලව සුරේන්ද්‍රගමගේ ඇඹිලිපිටිය රූපසේන පත්තුව

# කෝටි 760ක් කාපු දුම්රිය එන්ජින් සුදු අලි 10

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව දේශීය ආර්ථිකයේ ප්‍රබල සාධකයක් බව බලයට පත්වන සෑම රජයක්ම නොතකා හැරීමේ විපාකය වී ඇත්තේ එම දෙපාර්තමේන්තුව වාර්ෂිකව ලබන රුපියල් කෝටි 7000ක් පමණ වූ අති විශාල මූල්‍ය කන්දරාව මෙරට බදු ගෙවන අහිංසක ජනතාවගේ කර මත පැටවී තිබීමත් මේ සා විශාල පාඩුවක් ලැබීමට මූලික හේතුව දශක දෙක තුනක් තිස්සේ එහි පවතින දූෂණ, වංචා බව දුම්රිය වෘත්තීය සමිති දීර්ඝ කාලයක් තිස්සේ පෙන්වා දුන්හ. පාලකයන් අඳ ගොළු බිහිරන් සේ මුනිවත රැකීම ජනතාවගේ කරුමයක් බව නොකියා බැරිය.

සුදු අධිරාජ්‍යවාදීන් මේ රට සූරා කෑවා යැයි අද ඇතැමුන් චෝදනා එල්ල කළද මේ රට සූරාකන්නේ දේශපාලකයන් හා නිලධාරි පෙළැන්තිය බව ඔප්පු වී හමාරය. එහෙත් සුදු අධිරාජ්‍යවාදීන් රටේ හතරදිග්භාගයට ප්‍රවාහන පහසුකම් සලසමින් දුම්රිය සේවයක් දායාද නොකරන්න අදත් අපට ඉන්ධන, ආහාර, ගොවි නිෂ්පාදන මෙන්ම මගී ප්‍රවාහනය කරන්නට සිදුවන්නේ දැඩි තදබදයක් පවතින මහාමාර්ග උපයෝගී කරගෙනය. එනිසා පූරුවේ පිනකට හෝ අප ලද දුම්රිය සේවය තව තවත් කාබාසිනියා කොට එය විනාශ කරන්නට උත්සාහ දරනු විනා එය රැකගෙන රටේ ආර්ථිකයට සවියක් කර ගන්නට පාලකයන් කල්පනා කරන වගක් පේන තෙක් මානයක හෝ දකින්නට නැත. දුම්රිය දෙපාර්තමේන්තුවේ ස්වර්ණමය යුගය සේ සැලකෙන ඩී. බී. රම්පාල දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාගෙන් පසුව දුම්රියට මෙම අවාසනාවන්ත, කලදසාව එළැඹි බව දුම්රිය වෘත්තීය සමිති බහුතරයකගේ මෙන්ම පොදු ජනතාවගේ මතය වෙයි. දහහත් දහසක් පමණ වන දුම්රිය සේවකයන් තම වගකීම් නිසි ලෙස ඉටු කරමින් දුම්රිය සේවාව මේ අයුරින් හෝ ආරක්ෂා කර නොගන්නට තුල්හිරිය, පූගොඩ, වේයන්ගොඩ පැවැති පේෂ කර්මාන්තයට අත්වූ ඉරණම දුම්රිය සේවයටද අත්වී හමාරය.

දුම්රිය සේවයෙන් ගසා කන්නට ඇති මාර්ග අතරෙන් ප්‍රබලම මාර්ගයක් වන්නේ දුම්රිය සේවයට එන්ජින් සහ මැදිරි මිලදී ගැනීමය. චන්ද්‍රිකා යුගයේ දුම්රිය දෙපාර්තමේන්තුවට ප්‍රංශයෙන් දුම්රිය එන්ජින් 10ක් මිලට ගැනීමට සූදානම් වූ අවස්ථාවේ එය මෙරට දුම්රිය මාර්ගවලට මෙන්ම කාලගුණික තත්ත්වයන්ටද නොගැළපෙන නිසා ඒවා මිලදී ගැනීම් නොකරන ලෙස දුම්රිය තාක්ෂණික කමිටුව නිර්දේශ කළේය. එහෙත් එම නිර්දේශ නොතකා පාලකයන් තම අභිමථාර්ථයන් ඉටුකර ගැනීමට දුම්රිය එන්ජිමක් රුපියල් කෝටි 2 බැගින් මිලදී ගත්තේය. මෙම දුම්රිය එන්ජින් 10 වසරක් ගත වීමට පෙර ලෙඩ දෙන්නට පටන් ගත්තේය. ඒවා අලුත්වැඩියාවට අවශ්‍ය කොටස් නොමැති නිසා දුම්රිය එන්ජින් අටකින් ගලවාගත් කොටස් එකතු කර අද වන විට දුම්රිය දෙකක් ධාවනයට යොදවා තිබේ. කොට උඩ ඇති ප්‍රංශ එන්ජින් අටෙන් අවශ්‍ය අමතර කොටස් ලබාගෙන ඉතිරි එන්ජින් යුගලය ධාවනය කරවීමට දුම්රිය යාන්ත්‍රික අංශයේ සේවකයන්ට සිදුව ඇත. මහජන මුදල් රුපියල් කෝටි 176ක් මීට දශක දෙකකට පමණ පෙර පාලකයන් ගසා කන්නට පටන් ගත්තේ එසේය. ඉන්පසුව බලයට පත් රජය චීනයෙන් දුම්රිය මැදිරි 100ක් මිලට ගත්තේය. විවිධ හේතු නිසා ඒ දුම්රිය මැදිරි ගාල් කිරීමට ඉඩක් නොමැතිව මරදාන හා දෙමටගොඩ අතර දුම්රිය මාර්ගවල නවතා තිබෙන අයුරු දැකිය හැකිය. ඉන්පසු චීනයෙන් ආනයනය කළ බලවේග කට්ටල දුම්රිය 10ක්ද වසරක් ගත වන්නට පෙර ඒවායේ ජෙනරේටර් අබලන් වීම නිසා මාලිගාවත්ත හා දෙමටගොඩ අංගණවල දිරාපත් වෙමින් පවතී.

යහපාලන රජය යටතේ නිමල් සිරිපාල ද සිල්වා මහතා ප්‍රවාහන අමාත්‍යවරයාව සිටි අවධියේ දුම්රිය දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 760 බැගින් M 11 වර්ගයේ මිලදී ගත් දුම්රිය එන්ජින් 10 මෙරටට ගෙනා අලුත්ම සුදු අලි දසදෙනා වෙයි. සාමාන්‍යයෙන් මෙරට දුම්රිය මාර්ගවලට මෙන්ම ධාවන වේගයන්ට ගැළපෙන දුම්රිය එන්ජිමක උපරිම බර ලෙස සැලකෙන්නේ ටොන් 70-80 ක්වූ දුම්රිය එන්ජින් බව ඉන්ජිනේරු මතය වෙයි. එසේ වුවද M 11 දුම්රිය එන්ජිමක බර ටොන් 120කි. එනිසා එම එන්ජින් දුම්රිය මාර්ගවලට මෙන්ම දුම්රිය පාලම්වලටද ඔරොත්තු නොදෙයි. ඉන්දියාවෙන් මිලදී ගත් මෙම දුම්රිය එන්ජින් ඉන්දියාවේ ධාවනයට යොදන්නේ කාලයෙන් දින 2-3ක් ගත වන කිලෝ මීටර් 3,000-4,000ක් පමණ දුර ගමන් සඳහා යැයි දුම්රිය වෘත්තීය සමිති පෙන්වා දෙයි. බරෙන් වැඩිවාක් මෙන්ම එම එන්ජිමක දිග අඩි 72ක් වන නිසා මෙරට දුම්රිය මාර්ගවල හැසිරවීමද අපහසුය. රුපියල් මිලියන 7,600ක් මහජන මුදල් වැය කර මිලදී ගත් එම එන්ජින් මහනුවර හා උඩරට මාර්ගයේද මුහුදුබඩ දුම්රිය මාර්ගයේද ධාවනයට යෙදීම අපහසුය.

මේ නිසා 2019 සිට මේ දක්වා ධාවනයට යොදා ඇත්තේ දුම්රිය එන්ජින් 3ක් පමණි. ඉන් එන්ජින් 2ක් යාල්දේවි දුම්රියටද (කොළඹ - කොටුව කන්කසන්තුරය) ඉතිරි එන්ජිම පොල්ගහවෙල - කොටුව කාර්යාල දුම්රියටද යොදා තිබේ. මෙම දුම්රිය එන්ජින් ධාවනයට යොදා මාස 3ක් ගතවීමට මත්තෙන් එක් එන්ජිමක් මරදාන දුම්රියපොළ අසලදී පීලි පැනීමෙන් දුම්රිය මාර්ගයට බරපතළ හානි සිදුවූ අතර එය පිළිගත කිරීමට දින 3කට අධික කාලයක් ගතවූයේ එය හැසිරවීමට ඇති දුෂ්කරතා හේතුවෙන් බව දුම්රිය සේවකයෝ පවසති. දිවයිනේ ඕනෑම දුම්රිය මාර්ගයක දුම්රියක් පීලි පැනීමකට ලක් වූවොත් උපරිම වශයෙන් පැය 24ක කාලයක් තුළ එය පිළිගත කිරීමට අපේ දුම්රිය සේවකයෝ සමත් වුවද ඉන්දියානු M 11 සුදු අලියාට එය වලංගු නැත. මෙම එන්ජිම අවස්ථා කිහිපයකදීම දුම්රිය මාර්ගයට බරපතළ හානි සිදුකරමින් පීලි පැනීමට ලක්වූ අතර ආසන්නම පීලි පැනීම වාර්තා වූයේ පසුගිය දෙසැම්බර් 31දා මඩකළපුව මාර්ගයේ කලාවැව දුම්රිය ස්ථානය ආසන්නයේදීය. එය පිළිගත කිරීමට දින 3ක් ගතවීම නිසා එතෙක් මඩකළපුව දක්වා ධාවනය කෙරෙන මීනගයා නගරාන්තර දුම්රිය ඇතුළු ත්‍රිකුණාමලය දක්වා ධාවනය කෙරෙන දුම්රියන්ද අවලංගු කිරීමට සිදුවිය.

මේ අපේ දුම්රිය දෙපාර්තමේන්තුව පසුබිම් කරගෙන ඇතැම් දේශපාලකයන් හා පාලකයන් සිදු කරන ජාතික අපරාධවලින් අංශු මාත්‍රයක් පමණි. රේල් පීලි ඇතුළු යකඩ අලෙවිය, දුම්රියෙන් හොරට ප්‍රවාහනය කර දේශපාලකයන්ගේ ආශීර්වාද මත සිදු කරන මහා පරිමාණ වැලි ජාවාරම්, දුම්රිය ආපන ශාලා ඇතුළු වටිනා දේපොළ බදු දීම - විකිණීම ඇතුළු වංචා දූෂණ බොහෝය. ඒ පිළිබඳවද අප මාධ්‍ය මඟින් මීට පෙර අනන්තවත් පෙන්වා දී ඇතත් අඳ ගොළු බිහිරි පාලකයන් ඒවාට අවධානය යොමු කළ බවක් පෙනෙන්නට නොමැති වීම කනගාටුවට කරුණකි. මෙවැනි පාලකයන් පිළිබඳ තීරණයක් ගැනීමට ජනතාවට කාලය උදාවී ඇත යන්න අපගේ විශ්වාසයයි.

■ උපතිස්ස පෙරේරා












මව්බිම CEYLON TODAY www.ceylontoday.lk

MARKETING EXECUTIVES

Advertising

Ceylon Newspapers (Pvt) Limited is the publisher of both Ceylon Today and Mawbima Newspapers.

To strengthen our team, we are looking for enthusiastic, self-motivated and committed individuals to join our Advertising team immediately.


Requirements:

- Minimum of 2 years of experience in the field of Sales/Marketing.
- Experience in Sales at a Media Institute or those who have worked in Client servicing section in a reputed Advertising Agency would be a definite advantage.
- Excellent communication skills in both Sinhala & English languages.
- Excellent PR & Selling skills.
- Sound educational background.
- Be a computer literate.
- School leavers who have a flair for Sale/Marketing can also apply

The successful candidates will have the opportunity to work in an exciting, competitive and dynamic environment with good prospects.

Please forward your CV to careers@ceylonnewspapers.lk; giving names/contact details of two non- related referees and also mentioning the position applied for to reach us within 14 days.

General Manager - HR Legal
Ceylon Newspapers (Pvt) Ltd
101, Rosmead Place, Colombo 07.
Telephone: +94 117 566 566
Fax: +94 117 566 555

# "71 කැරැල්ල දෙනියාය" ග්‍රන්ථය දොරට වැඩුම අද ගම්පහදී



සිරිමෙවන් චන්ද්‍රසේකරගේ 71 කැරැල්ල දෙනියාය ග්‍රන්ථය දොරට වැඩීම අද ජනවාරි 30 ඉරිදා පෙරවරු 10.00ට ගම්පහ තරුණ බෞද්ධ සංගම් ශාලාවේදී සිදු කෙරේ.

සිරිමෙවන් චන්ද්‍රසේකර 1971 කැරැල්ලේ දෙනියාය ප්‍රදේශයේ ඉදිරි පෙළ ක්‍රියාකාරිකයකුව සිට ලැබූ සජීවී අත්දැකීම් පාදක කරගනිමින් ඔහු විසින් මෙම ග්‍රන්ථය ලියා තිබේ. 71 ජනතා නැගිටීමේදී ලංකාවේ දකුණු පළාතේ සිදු වූ ක්‍රියාකාරකම් නිවැරදිව එළිදැක්වෙන ප්‍රථම අවස්ථාව ලෙස ද මෙය සැලකිය හැකිය.

# ජෙෆ්රි බාවාගේ දුර්ලභ නිර්මාණ ප්‍රදර්ශනයක්



ලෝක ප්‍රකට ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පී ජෙෆ්රි බාවාගේ නිර්මාණ ප්‍රදර්ශනයක් පෙබරවාරි 1 දින සිට අප්‍රේල් 3 දක්වා කොළඹ - 2, පාර්ක් ස්ට්‍රීට් මෙව්ස්හි ද ස්ටේබ්ලෙස්හිදී පැවැත්වේ. (Colombo - 2, park Street mews, the stables) දිනපතා පෙරවරු 11.00 සිට සවස 7.00 දක්වා විවෘත මෙම ප්‍රදර්ශනය ඉංග්‍රීසි සිංහල සහ දෙමළ භාෂාවලින් ඉදිරිපත් කෙරේ.

ජෙෆ්රි බාවාගේ නිර්මාණ එකතුවෙන් ඔහුගේ ලේඛනාගාරය ලබාගන්නා ලද ප්‍රදර්ශනය ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන ප්‍රථම අවස්ථාව මෙය වන්නේය. මෙයට ප්‍රථම ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, බ්‍රසීලය, සිංගප්පූරුව සහ ජර්මනිය යන රටවල පමණක් මෙම ප්‍රදර්ශනය පවත්වා තිබේ. ජෙෆ්රි බාවා අරමුදල විසින් පවත්වන මෙම ප්‍රදර්ශනය එහි භාරකරු ෂයාරි ද සිල්වා විසින් මෙහෙයවනු ලබයි.

ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර කලාකරුවන් සම්බන්ධ කරමින් කොළඹදී පැවැත්වෙන සුවිශේෂී ප්‍රදර්ශන මාලාවක ආරම්භය ලෙස මෙය සැලකේ. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ කලා සංවිධාන 6ක් මඟින් සංවිධානය කරන සෑම ප්‍රදර්ශන ව්‍යාපෘතියක්ම දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අනිවාර්යයෙන්ම නැරඹිය යුතු උසස් මට්ටමක පවතින බව සංවිධායකයෝ පවසති.

# ජීවිතයක් යදිමි



උසස් පෙළ හදාරන දරුවන්ට ගිණුම්කරණ විෂය උගන්වන එල්. ගජසිංහ මහතාට හදිසියේම වකුගඩුවක් බද්ධ කළ යුතුව ඇතැයි වෛද්‍යවරු නිර්දේශ කොට ඇත. දැනට මහනුවර, මාවිල්මඩ මහා විද්‍යාලයේ ගුරු නිවෙසේ පදිංචිව සිටින ඔහු වසර 23ක් අඛණ්ඩව ගුරු සේවයේ නිරත වී සිටියි.

දෙදරු පියකු වූ ඔහුගේ දරුවන් මේ වෙද්දිත් අධ්‍යාපනය හදාරන වයසේ පසුවෙයි. ගජසිංහ මහතාගේ රුධිර කාණ්ඩය බී පොසිටිව්ය. **B - Positive** පරිත්‍යාගශීලී කෙනකු සිටී නම් 0718103208 දුරකථන අංකයට අමතන්න. එවැනි කෙනකු වෙනුවෙන් ප්‍රති උපකාරයක් කිරීමටද ගජසිංහ ගුරු මහතා සූදානමින් සිටියි.

## දිනුම් අදින ලද දිනය 2022.01.27 බ්‍රහස්පතින්දා නිල ප්‍රතිඵල
www.nlb.lk NLB

**මහජන සම්පත**
දිනුම් වාරය : 4660
දිනා ඇති මුළු මුදල රු. 10,500,280.00
ජයග්‍රාහී අක්ෂරය: J
ජයග්‍රාහී අංක: 1 3 8 8 3 8
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 34,353,970.00

**ගොවි සෙත**
දිනුම් වාරය 2955
දිනා ඇති මුළු මුදල රු. 5,046,720.00
ඉංග්‍රීසි අක්ෂරය: C
ජයග්‍රාහී අංක: 44 58 64 79
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 60,805,373.20

**Mega POWER මෙගා පවර් කෝටි 10**
දිනුම් වාරය 1008
දිනා ඇති මුළු මුදල රු. 14,049,180.00
මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 193,976,246.00
රු.10,000,000.00
රු.10,000,000.00
මෙගා වාසනා අංකය 06324
ඉංග්‍රීසි අකුර: U
සුපිරි අංකය: 10
ජයග්‍රාහී අංක: 38 41 53 78

**ධන නිධානය**
දිනුම් වාරය 690
දිනා ඇති මුළු මුදල රු. 2,999,600.00
ඉංග්‍රීසි අක්ෂරය: B
ජයග්‍රාහී අංක: 06 44 74 76
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 94,421,865.60

**හඳහන**
දිනුම් වාරය 01
දිනා ඇති මුළු මුදල රු. 43,363,431.60
ලග්නය: වෘෂභ
ජයග්‍රාහී අංක: 05 08 11 20
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 2,500,000.00

**සෙවණ** අතට ගෙවල් - අතට මුදල්
දිනුම් වාරය 351
දිනා ඇති මුළු මුදල රු.2,373,400.00
ඉංග්‍රීසි අක්ෂරය: B
ජයග්‍රාහී අංක: 39 70 71 92
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 14,249,738.40

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01. දු.ක.: 011-4607000, 011 - 4607001 - 2 ෆැක්ස් : 011-4669475


Macktiles LANKA

රැකියා ඇබෑර්තු

**පෑස්සුම්කරුවන් (Welders) සහ වෑද්දුම්කරුවන් (Millwright/ Fitters) (Mechanical Technicians)**

පෑස්සුම් හා වෑද්දුම් ක්ෂේත්‍රයේ NVQ 4 මට්ටමේ සුදුසුකම් සහිත කාර්මික ශිල්පීන් හට රැකියා ඇබෑර්තු ඇත. අයදුම් කරන ඔබගේ අත්දැකීම් මත ඉහළ වැටුප් හා ආකර්ෂණීය දීමනා.

**විදුලි කාර්මිකයින් (Electrical Technicians)**

විදුලි කාර්මික ක්ෂේත්‍රයේ NVQ 4 මට්ටමේ සුදුසුකම් සහිත කාර්මික ශිල්පීන් හට රැකියා ඇබෑර්තු ඇත. අයදුම් කරන ඔබගේ අත්දැකීම් මත ඉහළ වැටුප් හා ආකර්ෂණීය දීමනා.

**ෆෝක් යන්ත්‍ර ක්‍රියාකරුවන් (Fork Lift Operator) සහ බර යන්ත්‍ර ක්‍රියාකරුවන් (Wheel Loader Operator)**

සුදුසුකම් සහිත ෆෝක් යන්ත්‍ර ක්‍රියාකරුවන් සහ බර යන්ත්‍ර ක්‍රියාකරුවන් හට රැකියා ඇබෑර්තු ඇත. අයදුම්කරන ඔබගේ අත්දැකීම් (අවම වසරක අත්දැකීම්) මත ඉහළ වැටුප් හා ආකර්ෂණීය දීමනා.

**සාමාන්‍ය සේවක (Production Worker)**

අවුරුදු 18 ට වැඩි ආධුනික හෝ කර්මාන්තශාලාවල සේවය කර අත්දැකීම් ඇති අයවලුන් සඳහා රැකියා ඇබෑර්තු ඇත.

ඔබගේ සුදුසුකම් වල අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා සත්‍යය පිටපත් සමග පහත ලිපිනය වෙත සතියේ දිනවල සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණෙන්න.

මැක්සන්ස් ටයිල්ස් ලංකා පුද්ගලික සමාගම
නො. 265, අටළුගම පාර, රද්දෙගොඩ, පරගස්තොට, බණ්ඩාරගම.

විමසීම්:
(WhatsApp / Calls): 071 494 0857 / 071 387 9702 / 034 307 0383
Email: careers@macktiles.com



# ළාබාල කෙල්ලක් තුන් කොන් පෙමක් සහ ජීවිත දෙකක් වැනසූ ඛේදවාචකයක්

තරුණ වියේදීම ජීවිත විනාශ කරගත් ඉමේෂ් අද හිරගෙදරය. මධුසංඛ මෙලොව හැර ගොස්ය. ඔවුන් දෙදෙනාටම ආදරය පිදූ වින්ධ්‍යාට අවසානයේ සිදුවූයේ යළි පරිවාසයට යන්නටය. ඒ ඇය තවමත් ළාබාල වියේ සිටීමත් නිසි රැකවරණයක් ඇයට නොලැබීමත් නිසාය.

**ළාබාල වියේදීම ප්‍රේමයෙන් මුසපත් වන ඇතැම් යොවුන් පෙම්වතුන්ගේ ජීවිත බොහෝ දුරට නිමා වන්නේ මහ ඛේදවාචකවලිනි.**

ආදරය යන අකුරු හතරේ අරුතවත් නොදත් මෙම ළාබාල පෙම්වතුන්ගේ ජීවිත ඉබාගාතේ යන්නේ ඔවුන්වත් නොදැනය. සමාජය ගැන හරි හැටි අවබෝධයක් නැති ඔවුහු අවසානයේ සිය ජීවිත පිළිබඳ පසුතැවිලි වෙති. මේ නිසා අත්වන ප්‍රතිඵල ඉතා භයානකය. ආදරයත් රාගයත් පටලවා ගන්නා මෙවැන්නන් තුරුණු වියේදීම සිය ජීවිත අකාලයේ අහිමි කරගැනීම ඇත්තෙන්ම කනගාටුවට කරුණකි.

කඩවත පොලිස් වසමෙන් ඉකුත්දා ඇසුණු මේ කතාවද එවැන්නකි. මෙය ඇත්තෙන්ම තුන්කොන් ආදරයක ප්‍රතිඵලයකි. සිද්ධිය වාර්තා වන්නේ කඩවත පොලිසියට නුදුරුව පවත්වාගෙන යන බෝඩිං කාමරයක් තුළිනි.

කඩවත පොලිසිය පවසන අන්දමට සිද්ධිය වී ඇත්තේ මීට දින අටකට කලියෙනි.

ඒ ඉකුත් 22 වැනිදාය. වේලාව උදෑසන 7.15ට පමණ ඇත. රාගම රෝහලේ පොලිස් මුරපොළෙන් කඩවත පොලිස් ස්ථානය වෙත කරන ලද දැනුම්දීමකි. ඉන් කියැවුණේ ගෙලට එල්ල කළ තියුණු පහරකින් බරපතළ තුවාල ලබා අලුයම් කාලයේ රාගම රෝහලට ඇතුළත් කළ තරුණයකු ඊට සුළු වේලාවකට පසුව මියගිය බවය.

තවදුරටත් තොරතුරු විමසීමේදී රෝහල් පොලිසිය කීවේ බරපතළ තුවාල ලැබූ එම තරුණයා අසල්වාසීන් විසින් 1990 ගිලන් රථයක් මඟින් රෝහලට ඇතුළු කළ බවය. එමෙන්ම සිද්ධියෙන් මියගොස් ඇත්තේ කඩවත, ගෝනහේන පදිංචි රාජු මධුසංඛ නමැති විසි හැවිරිදි අයකු බවද රෝහල් පොලිසිය කඩවත පොලිසිය දැනුවත් කරමින් කියන්නට විය.

ඒ වන විට සිද්ධිය සම්බන්ධයෙන් සිද්ධිය ඇති වූ නිවෙසේ හිමිකරු එරංග නමැත්තාද පොලිසියට පැමිණිල්ලක් යොදා තිබිණි.

රෝහල් පොලිසියේ දැනුම්දීම මත කඩවත පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මොහාන් ද සිල්වා මහතා දැනුවත් කිරීමෙන් අනතුරුව සිද්ධිය පිළිබඳ විමර්ශන අපරාධ විමර්ශන අංශය භාර ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නිරෝෂන් ප්‍රනාන්දු ඇතුළු කණ්ඩායම වෙත භාර කෙරිණි.

එම විමර්ශනවලට අනුව රාජු මධුසංඛ නමැත්තාගේ ගෙලට වීදුරු කටුවකින් ඇන ඔහු මරා දැමීම සම්බන්ධයෙන් සැකපිට මියගිය අයගේම ඥාති සහෝදරයකු අත්අඩංගුවට ගැනීමට පොලිස් පරීක්ෂක නිරෝෂන් ඇතුළු කණ්ඩායමට හැකිවිණි.

"මම හිතුවේ නැහැ සර්... එයා මැරෙයි කියලා. සර්ලා කිව්වට පස්සේ තමයි මම එයා මැරිලා කියලා දැනගත්තේ අනේ ..සර්...."

අත්අඩංගුවට ගත් සැකකාර ඉමේෂ් නමැත්තා පොලිසිය ඉදිරියේ එසේ පැවසුවේ සිය ඥාති සහෝදරයාගේ බෙල්ලට ඇනීම සඳහා උපයෝගී කරගත් වීදුරු කටුවද අපරාධය සිදුවූ ස්ථානයට ගොස් අහුලා නිලධාරීන් අතට ලබා දෙමින්ය.

"හරි දැන් අපිට කියපන්කෝ මොකක්ද වුණේ? ඇයි උඹ ඌව වීදුරු කටුවෙන් ඇනලා මැරුවේ කියලා"

පොලිස් පරීක්ෂක නිරෝෂන් සැකකාර ඉමේෂ්ගෙන් විමසන්නට විය. තුන්කොන් ප්‍රේමයේ සුලමුල හෙළි වන්නේ ඉන් පසුවය. මොවුන් අතර ඇති වූ ප්‍රේමයට මැදි වී සිටියේ පහළොස් හැවිරිදි දැරියකි.

පොලිසිය පවසන අන්දමට සිද්ධිය පෙළ ගැසෙන්නේ මෙසේය.

වින්ධ්‍යා, කඩවත ඉහළ බියන්විල පදිංචිකාරියකි. සහෝදරයෙක් හා සහෝදරියන් දෙදෙනකු ඇයට සිටින්නීය. කඩවත ප්‍රදේශයේම මහා විද්‍යාලයකින් සිප්සතර හැදෑරූ වින්ධ්‍යා දහය වසර දක්වා එම විද්‍යාලයෙන් ඉගෙනුම ලැබුවාය.

කෙසේ වෙතත් ඇගේ මවුපියන් ජීවත්වන්නේ වෙනමය. පියා මව හැරදා සිටී. ඒ නිසා ඇය හැදී වැඩුණේ මිත්තණිය ළඟය. මේ අතරතුර ඇය තරුණයකුට පෙම් බැන්දාය. ඒ රාජු මධුසංඛය. දෙදෙනා ප්‍රේමයෙන් වෙළී සිටියද ඇය ළාබාල යුවතියක් වූවාය. දෙදෙනාගේ ප්‍රේමය ඇරැඹී ඇත්තේ මීට වසර තුනකට පෙරය. 2019 වසරේදීය.

කෙසේ වෙතත් වින්ධ්‍යා හිතුවක්කාර චරිතයක් ඇත්තියක වූවාය. ඇති වූ ආරවුලක් මත මව කළ පහරදීමක් නිසා ඇය ගෙදරින් පැන ගියාය. ඊට හේතුව වූයේද ඇය හා මධුසංඛ අතර ඇති වූ සිදුවීමක් මවගේ කනට වැකීමය. අවසානයේ ඇය මිතුරියකගේ මවකගේ නිවෙසක නතර වූවාය. ඒ අත්තම්මාද ඇය භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසාය.

ඒ වන විට ළාබාල වියේ පසුවීම නිසා අධිකරණය ඇය මීගමුව ප්‍රදේශයේ පරිවාස ආයතනයකට භාර කළේය.

කෙසේ වෙතත් මෙලෙස පරිවාස ගත කිරීම නිසා ඇයට මධුසංඛ සමඟ ප්‍රේම සබඳකම දිගටම පවත්වාගෙන යෑමට නොහැකි විය. ඒ නිසා ඇය පරිවාසය තුළ සිටියේ සිත් තැවුලෙන්ය. එලෙස දිගටම පරිවාසයේ කාලය ගත කිරීමට නොහැකි වූ තැන ඇය පරිවාසයෙන් පැන්නාය.

පරිවාසයෙන් පැනගත් ඇය කෙළින්ම පැමිණියේ මිතුරියගේ මවගේ නිවෙසටය. වින්ධ්‍යා මිතුරියගේ මව අමතන්නේ නැන්දේ කියාය. වින්ධ්‍යා පරිවාසයෙන් පැන ඒම ගැන නැන්දාද මහත් අපහසුතාවට පත්වූවාය. ඇය මේ බව වහා පොලිසියට දන්වා සිටියාය. පොලිසිය වින්ධ්‍යා යළි කුදලාගෙන ගොස් නැවතත් පරිවාසයට දැම්මේය.

මේ වන විට මධුසංඛත් ඇයත් අතර තිබූ ප්‍රේමයද නතර වී කාලයක් ද ගත වී ගොසිනි. එහෙත් දෙදෙනා අතර තිබූ ප්‍රේමය වියැකී ගොස් තිබුණේ නැත. වින්ධ්‍යාට මධුසංඛ දැකගන්නට හෝ ඔහු ගැන තොරතුරක් නොවූ තැන ඇය කල්පනා කළේ නැවතත් පරිවාසයෙන් පැන යෑමටය. මධුසංඛටද ඇය ගැන තොරතුරක් දැන ගන්නට නොහැකි වූයේ ඇය මීගමුව ප්‍රදේශයේ පරිවාසයක නතර කර තිබීම නිසාය.

අවසානයේ කෙසේ හෝ ඇය පරිවාසයෙන් නැවතත් පැන ගත්තාය. එහෙත් ඇයට මධුසංඛ මුණ ගැසුණේ නැත. ඒ වෙනුවට ඇයට හමුවූයේ මධුසංඛගේම ඥාති සහෝදරයකු වන ඉමේෂ්ය. ඉමේෂ්ට වයස අවුරුදු 19කි. දෙදෙනා ඥාති සහෝදරියන්ගේ පුතුන්ය. මධුසංඛගෙන් මිදුණු ඇය ඉමේෂ් සමඟ ප්‍රේම සබඳතාවකට මුල පිරුවාය. අවසානයේ ඇය ඉමේෂ් සමඟ තැන්තැන්වල රැඳුණාය. පැරැණි පෙම්වතා අමතක කළ ඇය අලුත් පෙම්වතා සමඟ ප්‍රේමයෙන් වෙළුණාය.

කාලය මෙසේ ගෙවී ගියේය.

"එයා මට කිව්වා යන්න තැනක් නැහැ කියලා. පස්සේ මම එයාව ගෙදරත් එක්කරගෙන ගියා. ගෙදර ඉන්න බැරි නිසා එයාව තවත් යාළුවකුගේ ගෙදර නතර කළා. එහිදි ඇතිවුණු සිත් අමනාපයකින් පස්සේ මම එයාව කඩවත ඇන්ඩෲ පාරේ බෝඩිම් ගෙදරක නතර කළා. බෝඩිමේ අයිති කෙනා මම පොඩිකාලේ ඉඳලම හඳුනනවා. එයා ඒ නිසා බෝඩිම දෙන්න කැමැති වුණා. මාසයකට රුපියල් 5000ක් ගෙවන්න පොරොන්දු වුණා.

"එදා 19 වැනිදා මම එයත් එක්ක එදා රෑ බෝඩිමේ හිටියා. පසුවැනිදා උදේ මම රස්සාවට ගියා. මම වැඩ කළේ වැලිපැන්න පැත්තේ. රස්සාවට ගිය නිසා මට කෙල්ලව බලන්න යන්න බැරි වුණා."

ඉමේෂ් අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා ඉදිරියේ සිදුවූ දේ එසේ කියන්නට විය. ඉමේෂ් හා වින්ධ්‍යාද කුඩා කාලයේ සිට දැන හඳුනන අය වූහ.

විසිවැනිදා ඉමේෂ් සිටියේ වැලිපැන්නේ වැඩපළේය. වින්ධ්‍යා කඩවත බෝඩිමේය.

"ඒයි සංගීතයක් තියෙනවා අපි යනවා උඹත් එනවද" ඉකුත් 21 වැනිදා මිතුරියක් ඇගෙන් විමසුවාය. ඇයද ඊට කැමැත්තක් දැක්වූවාය.

"කොහෙද තියෙන්නේ"

"ගනේමුල්ලේ"

ඇය ඒ සම්බන්ධයෙන් සිය අලුත් පෙම්වතා වූ ඉමේෂ්ටද කීවාය.

"මමත් යන්නද සංගීතේ බලන්න"

"කොහෙද තියෙන්නේ"

"ගනේමුල්ලේ ග්‍රවුන්ඩ් එකේ"

"කාත් එක්කද යන්නේ"

"මෙහේ දෙතුන් දෙනෙක්ම යනවා"

"හරි එහෙනම් පරිස්සමින් ගිහින් එන්න" ඉමේෂ්ගෙන්ද අවසර ගත් වින්ධ්‍යා, මිතුරියන් දෙතුන්දෙනකු සමඟ ගනේමුල්ලට ගියේ සංගීතය බලන්නටය. ගනේමුල්ල, ගල්හේන ක්‍රීඩාපිටියේ සංගීතය ජයටම පැවතිණි.

කෙසේ වෙතත් වින්ධ්‍යාගේ ගමන ගැන ඉමේෂ්ට එතරම් සතුටක් දැනුණේ නැත. ඇය සංගීතය බලන්න ගියේ කා සමඟද යන්න දැන ගැනීමට ඔහුට අවශ්‍ය විය. එනිසාම ඔහු වරෙක ඇයට සිය ජංගම දුරකථනයෙන් වීඩියෝ ඇමතුමක්ද ගත්තේය.

"මම එකපාරක් වීඩියෝ කෝල් එකක් ගද්දී එයා ආන්සර් කළා. මම දැක්කා එයත් එක්ක තව කට්ටිය ඉන්නවා. ඒ නිසා මට සැකයකුත් ආවා. ඉන් පස්සේ මම එයාට දිගටම කෝල් ගත්තා. ඒ එකකටවත් එයා ආන්සර් කළේ නැහැ. එස්.එම්.එස්. ගත්තා ඒවා බලලා තිබුණා. ඒත් මට උත්තර දැම්මේ නැහැ. මට එයාගේ ලොකු වෙනසක් පෙනුණා."

" බැරිම තැන මගේ යාළුවෙක් ඉන්නවා සජිත් කියලා. එයාට කෝල් කළා. එයාගෙන් මම ඇහැව්වා කොහේද ඉන්නේ කියලා. සජිත් කිව්වා සංගීතේ බලන්න ආවා කියලා. මම ඒ පාර එයාට කිව්වා වින්ධ්‍යාත් කට්ටියක් එක්ක සංගීතේ බලන්න ඇවිත් තියෙනවා. උඹ පොඩ්ඩක් බලපන් ඒකි කාත් එක්කද ඉන්නේ කියලා"

ඉමේෂ් සිය මිතුරා වූ සජිත්ට එලෙස කීවේ සිතේ වූ සැකයද නිසාමය.

එහෙත් මේ වන විට ඉමේෂ් නොදත් දෙයක් සංගීතයේ සිදුවීමෙන් තිබිණි. ඒ කලක් වින්ධ්‍යාට පෙම් බැඳි මධුසංඛ නැවත ඇයට මුණ ගැසීමය. මධුසංඛද සංගීතේ බලන්නට පැමිණ සිටියේය. එහෙත් සංගීතේදි තම පරණ පෙම්වතිය හමුවෙතැයි ඔහු හීනෙකින්වත් සිතන්නට නැත. ඒත් එය අහම්බෙන් සිදුවිණි.

සජිත් සිය මිතුරා වූ ඉමේෂ්ට දුරකථන ඇමතුමක් දුන්නේ ඔය අතරය.

"මචං වින්ධ්‍යා කොල්ලෙක් එක්ක ග්‍රවුන්ඩ් එකේ නටනවා"

සජිත්ගේ පිළිතුරෙන් ඉමේෂ්ට උන්හිටි තැන් අමතක විය. ඔහු ඇමතුම් සිය ගණනක් ගත්තද ඒ කිසිවකටත් වින්ධ්‍යා පිළිතුරු දුන්නේ නැත. ඉමේෂ්ගේ 'මල' හොඳටම පැන තිබිණි. ඔහුට සිය පෙම්වතිය ගැන ඇති වූයේ තරහකි.

රස්සාව අතහැර දමා ඒ මොහොතේම සංගීතය පැවැති ස්ථානයට යන්නට ඔහු තීරණය කළේය.

"මම වැලිපැන්නේ ඉඳලා බස් එකකින් කඩවතට ආවා සර්"

"එතකොට වෙලාව කීයට විතරද" ස්ථානාධිපතිවරයා ඔහුගෙන් ප්‍රශ්න කළේය.

"පාන්දර තුනට කිට්ටුයි සර්. දෙකයි පනහට විතර මගේ හිතේ.

"ඉන් පස්සේ මොකද වුණේ"

"මම ගියා සර් ගනේමුල්ලට. ගල්හේනේ සංගීතේ තිබුණු තැනටත් මම ගියා. එතකොට සංගීතේ ඉවර වෙලා ග්‍රවුන්ඩ් එකේ කවුරුත් නැහැ"

"පස්සේ මම ඒකිව හොයාගෙන ඇන්ඩෲ ලේන් එකේ බෝඩිමට ගියා. බෝඩිමේ දොර වහලා තිබුණේ. ඒක වීදුරු දාපු ලී දොරක්. මම බෝඩිම ළඟ වාඩිවුණා. මට ඇහුණා වින්ධ්‍යා තව කාත් එක්කද කතා කරනවා. හිනා වෙනවා."

"ඊට පස්සේ මම මගේ ෆෝන් එකේ ටෝච් එකේ ලයිට් එක ඔන් කරලා වීදුරුව පැත්තට ගැහැව්වා. එතකොට මට ඇහුණා වින්ධ්‍යා කියනවා අයියා ඇවිල්ලා වගේ කියලා. ඒත් එක්කම මම දොරේ තියෙන වීදුරුවකට පයින් ගහලා දොරේ වීදුරුව කඩලා කාමරය ඇතුළට ගියා. වීදුරු කටු කාමරේ ඇතුළට වැටුණා. එතකොට තමයි මම දැක්කේ වින්ධ්‍යායි තව කොල්ලෙකුයි ඇඳුම් නැතිව කාමරේ ඉන්නවා. ඒ කොල්ලා මම හඳුනනවා" ඉමේෂ් එසේ කියමින් බිම බලා ගත්තේය.

"කවුද ඌ"

"එයා මධුසංඛ සර්. මගේම ඥාති සහෝදරයා"

"දෙන්නම ඇඳුම් නැතිවද හිටියේ"

"ඔව් සර්"

"ඉන්පස්සේ උඹ මොනවද කළේ"

"මොනවා කරන්නද. මම සහෝදරයා කියලා බැලුවේ නැහැ. ඌට ගැහැව්වා. ඌ මාව තල්ලු කළා. මම වීදුරු කටුගොඩ උඩ වැටුණා"

"ඉන්පස්සේ"

"පස්සේ මම බිම වැටිලා තිබුණු වීදුරු කෑල්ලකුත් අතට අරන් තමයි නැඟිටලා උගේ බෙල්ලට ඇන්නේ"

ඉමේෂ් පොලිස් නිලධාරීන් ඉදිරියේ කියාගෙන ගියේය.

"ඉන් පස්සේ කට්ටිය පිරුණා. බෝඩිමේ අයිතිකාරයා ඇවිත් ඉක්මනට වාහනේ අරන් වරෙන් කිව්වා. මම පාරට දිව්වා. මගේ පස්සේ වින්ධ්‍යාත් ආවා. මම ඒකි දිහා බැලුවේ නැහැ. මම පාර දිගේ දුවගෙන ඇවිත් ත්‍රීවීලර් එකක නැඟලා අපේ ගෙදරට ආවා. එතකොට තමයි සර්ලා ඇවිත් මාව අල්ලගත්තේ"

"එතකොට කෝ ඌට ඇනපු වීදුරු කෑල්ල"

"ඒක එතන ඇති සර්. ඒකේ ලේ තිබුණා මම දැක්කා"

පොලිසිය සැකකාර ඉමේෂ්ගේ දෑතට මාංචු දමා ඉන් අනතුරුව ඔහුගේ ප්‍රකාශයක්ද ලබාගත්තේය.

"මම වැරැද්ද පිළිගන්නවා සර්"

"ඒක උසාවිය බලාගනීවි"

පොලිසිය පවසන්නේ සැකකරු සමඟ ප්‍රේම සබඳතාවක් පැවැත්වූ ළාබාල තරුණිය මරණකරු සමඟද ඇසුරක් පවත්වා එම පුද්ගලයා සමඟ කුලී කාමරයේ රැඳී සිටීම දැක ඇති වූ හදිසි කෝපය මත මෙම ඝාතනය සිදුකර ඇති බවය.

ඒ කෙසේ වෙතත් සිද්ධිය ඇත්තක් දැයි තහවුරු කරගැනීම සඳහා පොලිසියට වින්ධ්‍යාගෙන්ද ප්‍රකාශයක් ලබා ගැනීමට අවශ්‍ය විය. ඒ ඇගේ ආදරය තරුණ පෙම්වතුන් දෙදෙනකුට බෙදීයෑම නිසා මෙවැන්නක් සිදුවී ඇත්දැයි දැනගැනීම සඳහාය. ඒ බව විමසා පොලිසිය ඇගෙන්ද ප්‍රකාශයක් සටහන් කර ගත්තේය.

"2019 අවුරුද්දේ මම මධුසංඛත් එක්ක ප්‍රේම සම්බන්ධයක් පැවැත්වූවා. පස්සේ මම මීගමුව, බෝලවලාන ළමා නිවාසයට පරිවාස සඳහා යොමුකරලා තිබුණා. ඒත් මම හොර රහසේම පැනලා ආවා. මාව ආයෙත් භාර දුන්නා. ඒත් මම ආයෙමත් පැනලා ආවා"

"21 වැනිදා කඩවත තිබුණා සංගීත සන්දර්ශනයක්. එදා මධුසංඛත් ඇවිත් මාත් එක්ක කතා කළා. පරිවාසයට ගියාට පස්සේ එදා තමයි මට එයාව හම්බවුණේ. ඊට පස්සේ කෝල් එකක් ගන්න කියලා මගෙන් ෆෝන් එක ඉල්ලුවා. මම ෆෝන් එක දුන්නා. පස්සේ මම සංගීතේ බලලා ඉවර වෙලා නතරවෙලා ඉන්න බෝඩිමට ගියා. බෝඩිමට ගියාට පස්සේ මගේ හෑන්ඩ් ෆෝන් එකට මධුසංඛගෙන් කෝල් එකක් ආවා. මම බෝඩිම ගාවට ආවා මට ඔයත් එක්ක පොඩ්ඩක් කතා කරන්න ඕන කියලා මධුසංඛ මට කිව්වා. පස්සේ එයා බෝඩිම ඇතුළට ආවා."

"විනාඩි 15ක් විතර අපි කතා කර කර ඉන්න කොට ඉමේෂ් ආවා බෝඩිමට. එයා බෝඩිමේ දොර කඩාගෙන ආවා. ඉමේෂ් මධුසංඛට තුන්පාරක් ගැහැව්වා. ඉමේෂ් අතේ වීදුරු කට්ටක් තිබුණා. එයා මධුසංඛට ගහන කොට මම එළියට ආවා. මම දොර ගාවට වෙලා බලාගෙන හිටියා. වීදුරු කටුවේ ලේ තියෙනවා දැක්කා. මම අඬ අඬයි හිටියේ. ඉමේෂ් මගේ දැන් පෙම්වතා. එයා දුර වැඩකට ගිහින් හිටියේ. මට බෝඩිම හොයලා දුන්නෙත් ඉමේෂ් තමයි. මම බෝඩිමට ඇවිත් දවස් දෙකයි."

ඇය පොලිසියට ප්‍රකාශයක් දෙමින් කියා සිටියාය. තුන්කොන් ප්‍රේමයක නිමාව එසේ සටහන් විය. තරුණ වියේදීම ජීවිත විනාශ කරගත් ඉමේෂ් අද හිරගෙදරය. මධුසංඛ මෙලොව හැර ගොස්ය. ඔවුන් දෙදෙනාටම ආදරය පිදූ වින්ධ්‍යාට අවසානයේ සිදුවූයේ යළි පරිවාසයට යන්නටය. ඒ ඇය තවමත් ළාබාල වියේ සිටීමත් නිසි රැකවරණයක් ඇයට නොලැබීමත් නිසාය.

කැලණිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රොහාන් ඩයස් මහතාගේ උපදෙස් මත කඩවත පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මොහාන් ද සිල්වා මහතාගේ අධීක්ෂණයෙන් අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නිරෝෂන් ප්‍රනාන්දු ප්‍රමුඛ සැරයන් පණ්ඩිතරත්න (18899) හා කොස්තාපල්වරුන් වන අසේල (76914). ලැනරෝල් (40423), ජයවික්‍රම (94038) හා කාන්තා කොස්තාපල් චලනි (12250) යන නිලධාරීහු මෙම විමර්ශනයට එක්ව සිටියහ.

**පොලිස් පරීක්ෂණ ඇසුරෙන් ලිපිය සකස් විය. වින්ධ්‍යා යනු මනඃකල්පිත නමක්ය.**



කැලණිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි
**රොහාන් ඩයස්**



කඩවත පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක
**මොහාන් ද සිල්වා**



අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක
**නිරෝෂන් ප්‍රනාන්දු**

■ **කීර්ති මෙන්ඩිස්**

● ඡායාරූප - කැලණිය-කුසුම් එස්. හැන්නදි

කොළඹ 07, රොස්මිඩ් පෙදෙසේ, අංක 101 හි පිහිටි සීමාසහිත සිලෝන් නිව්ස්පේපර්ස් පෞද්ගලික සමාගම විසින් ජා ඇල, මිනුවන්ගොඩ පාරේ, 302/1/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.

02 කොටස

# දුටුගැමුණු කුමරු බෝධි වන්දනාවට නිතිපතා පැමිණි

# පුසුල්පිටිය මහ වෙහෙර





නාරංපනාවේ සුධම්ම හිමි





## එළාරගෙන් ලැබුණු පේරැස් මුද්ද

## ජයශංඛය විහාරය දෙසට හැරුණු හැටි

**දැනුවත් භාවයකින් යුතුව ඉතිහාසය කරා පියනැඟිය යුතුමය. පුසුල්පිටිය රජමහා විහාරය සහ දුටුගැමුණු රජු සබැඳි කතා ගොන්න දිගේලි කිරීමට අප නැවත වරක් නාරම්පනාවේ සුධම්ම හිමියන්ට ආරාධනා කර සිටිමු.**

"විහාරස්ථානයට ප්‍රවිෂ්ට වීමට ඇති යකා බැඳි පඩිපෙළින් අලි ඇතුන් ගමන් කරවීම තහනම් කරලා සෙල් ලිපියකින් ඒ බව දන්වා සිටිනවා. එකල රදලයන් විසින් බුදුන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය පැවැත්වූ භූමියෙන් ලබාගත් දඹරන්වලින් නියමිත පිළිමය නිදන් කළාට පසු නිර්මාණය කරපු පස්ලෝහ පිළිමය 1980 දශකයේ මුල් භාගයේදී නිදන් සොරුන් විසින් සොරකම් කරනු ලැබුවා. මෙම විහාරස්ථානය හත් වතාවකට වැඩිය නිදන් සොරුන්ගේ ග්‍රහණයට නතුව තිබෙනවා. දුටුගැමුණු කුමාරයා සිය පියා වුණු කාවන්තිස්ස රජු සමඟ අමනාප වූ අවස්ථාවක විහාරමහා දේවිය සිය මාමා සහ නැන්දා වන ගිරිඅබා සහ සෝමාදේවියගේ රැකවරණයට කුමාරයාව පත් කරනු ලබනවා. පසුකාලීනව සෝමාදේවිය වෙනුවෙන් කාවන්තිස්ස රජු විසින් තැනවූ සෑය සෝමාවතිය නම් වුණා. ඊට ප්‍රථම ගිරිඅබා ප්‍රාදේශීය පාලකයෙක් ලෙස මලය රට පාලනය කර තිබෙනවා. ඊට පසුවයි වර්තමාන අල්ලෙයි කන්තලෙයි ප්‍රදේශය මුල් කරගෙන ජනාවාස පිහිටුවාගෙන තිබෙන්නේ. ඉතිහාස කතාකරුට අනුව ගිරිඅබා, සෝමාවතිය මුල් කරගත් රාජධානිය ගොඩනගා ගෙන තිබෙන්නේ මහවැලි ගඟ ඔස්සේ දකුණු දෙසට ගමන් කරමින්. එවිට අපට අනුමාන කළ හැකි දුටුගැමුණු කුමාරයා සිය ආරක්ෂාව පතා ප්‍රථමව පැමිණ ඇත්තේ සෝමපුරයට බව. සෝමපුරය පාලනය කළ ගිරිඅබා සහ සෝමාදේවිය තමන්ගේ රැකවරණය යටතේ දුටුගැමුණු කුමාරයා සිටින අදහස කාවන්තිස්ස රජුට ඇතිවීමට ප්‍රථම කුමාරයාගේ දැඩි ආරක්ෂාව මුල්කරගෙන මලය රටට කුමාරයා පිටත් කර හැරියා යැයි උපකල්පනය කළ හැකියි. එවකට මෙම පුසුල්පිටිය විහාරස්ථානයේ නායකත්වය තැනූ භික්ෂූන් වහන්සේ තමයි කුමාරයාගේ භාරකරු වන්නේ. මහවැලි ගඟ දිග යම් අමුත්තෙක් පැමිණ දෙහරු කඩුල්ලෙන් මලය රටට ඇතුළු වුණොත් ඒ බව මුලින්ම දැන ගන්නේ මෙම පුසුල්පිටිය රජමහා විහාරය. දේහ ලක්ෂණ පමණක් පරීක්ෂා කරන නායක හිමියන් කුමාරයාගෙන් කිසිවක් නොවිමසා ප්‍රදේශයේ එවකට සිටි මහ ගමරාලට කුමාරයාව පෝෂණය කිරීමේ වගකීම පවරනු ලබනවා. ඉතිහාස කතාකරුට සහ මුඛ පරම්පරාවට අනුව අවුරුදු 18 වන තෙක් කුමාරයාගේ ආරක්ෂාව භාරව කටයුතු කර තිබෙන්නේ මෙම විහාරස්ථානය. රජ කුමාරයකු විසින් සම්පූර්ණ කළ යුතු සියලු ශාස්ත්‍ර කුමාරයා ප්‍රගුණ කර තිබෙන්නේ මෙම විහාරස්ථානය තුළදී. නායක ස්වාමීන් වහන්සේ එළාර රජු පිළිබඳ නිවැරදි තොරතුරු කුමාරයා විසින්ම සොයා ගත යුතුයි යන අදහස මුල් කරගෙන මල්වතු ඔය දිගේ ගැමුණු කුමාරයාව අනුරාධපුර රාජධානියට පිටත් කර හරිනවා. ජනප්‍රවාදයේ ඒ ගමන සඳහන් වන්නේ කුමාරයාට අලකොළ මාළුවයි, හාල්මැස්සන් සමඟ කොත්මලේ බතක් මතින් බත් මුලක් බැඳ දී අනුරාධපුරය කරා පිටත් කර හැරිය බව. එළාර රජුගේ යුද උපක්‍රම පිළිබඳ නිවැරැදි අදහසක් ඇති කර ගත්ත ගැමුණු කුමාරයා පසුව ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනාමාන කළ බවත් කියැවෙනවා. තවත් ජනප්‍රවාදයකට අනුව දුටුගැමුණු කුමාරයා අනුරාධපුර ගමනේ ගමන් මහන්සිය ගසක උඩ අත්තකට වී නිවාගන්නා අතරතුර එළාර රජු මුව දඩයමේ පැමිණ තිබෙනවා. එළාර රජුගේ මානම වී තිබී ඇත්තේ ගැබ්බර මුවදෙනක්. දඩයක්කරුවකු නම් ගැබ්බර සතුන් දඩයම් නොකළ යුතු බවත් එලෙස කරනු ලබන්නේ දඩ වැද්දන් බව පවසා දුටුගැමුණු කුමාරයා එළාර රජුට පරිභව කළ බවයි පැවැසෙන්නේ. ඉතිහාසයේ ප්‍රථමවරට එළාර යනු ශිෂ්ට පුද්ගලයකු ලෙස හඳුන්වන්නේ මෙම සිදුවීමේදී ඔහු ක්‍රියාකළ ආකාරය පිළිබඳ. දුටුගැමුණු රජුගේ කර්කශ වාග් ප්‍රහාරය පිළිගත් එළාර රජු තමන්ගේ පේරැස් මුද්ද ගලවා එය ගැමුණු කුමාරයාට ලබාදී තිබෙනවා. එළාර රජුගේ පේරැස් මුද්ද අනුරාධපුර රාජධානිය තුළ පිහිටි බලකොටු මාර අරගල්වලට පෙන්වා තම මාලිගාවට පැමිණෙන ලෙස එළාර රජු ගැමුණු කුමාරයාට ආරාධනා කර තිබෙනවා. එවකට අනුරාධපුර නගර සීමාව තුළ තිබූ එකම සිංහල නිවෙස තුළ රාත්‍රිය ගත කළ කුමාරයා එළාර රජුව මුණනොගැසී නැවත වරක් මලය රටට පැමිණ තිබෙනවා. එලෙස පැමිණි කුමාරයා කුසුල්පිටිය රජමහා විහාරයේ නායක හිමියන්ට එළාර රජුගේ පේරැස් මුද්ද පිළිගැන්වූ බවයි කියැවෙන්නේ. එලෙස පිළිගන්වා දුටුගැමුණු කුමාරයා සී සෑම සඳහා නායක හිමියන්ගෙන් අවසර ඉල්ලා සිට තිබෙනවා.

කුමාරයාට සී සෑම සඳහා මී හරකුන් සොයා ගත නොහැකිව තිබෙන්නේ කුමාරයා ගොපල්ලෙක් ලෙස හිද්දලයා නමින් හඳුන්වනු ලැබූ පුද්ගලයකු යටතේ සේවය කළ නිසා. මී හරකුන් නොලැබීම මුල් කරගෙන ගැමුණු කුමාරයා ගොපලු දෙවියන්ගේ කෙවිට ගෙන කැලයේ සිටි කුළු හරකුන් ලවා කෙත ඇස්වැද්දූ බව පැවැසෙනවා. ඒ වන විට කුමාරයා හිද්දලයාගේ දියණිය රන්මැණිකා සරණකොට ගෙන හමාරයි. පුසුල්පිටිය රජමහා විහාරස්ථානයේ මිහිඳු හිමියන්ගේ මූලිකත්වයෙන් රෝපණය කරන ලද ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දෙතිස් මහා බෝධීන් වහන්සේලා අතරින් 19 වැනි බෝධීන් වහන්සේ දිනපතා වන්දනාමාන කරන්නට ගැමුණු කුමරු හුරු වී සිටිනවා. බෝධීන් වහන්සේ වන්දනාමාන කරන කුමරු අධිෂ්ඨාන කර තිබෙන්නේ සම්බුද්ධ ශාසනය රැකබලාගෙන රට එක්සේසත් කරන්නට තමන්ට ශක්තිය ධෛර්යය ලැබේවා කියා. නැවත වරක් අනුරාධපුර රාජධානියේ යුදමය ශක්තිය සොයා බලන්නට කුමරු අනුරාධපුරය බලා ගමන් ගත් අවස්ථාවක වර්තමාන ගැටඹේ "දියකපන දිය තොටේදී" කුමාරයා අධිෂ්ඨාන කර තිබෙනවා තමන්ගේ ප්‍රාර්ථනාව සර්වප්‍රකාරයෙන් සාර්ථක වනවා නම් එදින දිවා ආහාරයට රැගෙන ආ බත් පතේ ඇති හාල්මැස්සන් සහ අලකොළ දියට දැමූ විට හාල්මැස්සා පණ ගසා අලකොළ පැළවේවා කියා. ඒ අනුව එලෙස සිදු වූ බව ජනප්‍රවාදයේ පැවැසෙනවා. ඊට අමතරව කුමාරයා අතේ වූ කෙවිට මඩේ ගැසූ විට ඒ කෙවිට නැවත වරක් පැළවේවා කියාත් අධිෂ්ඨාන කර තිබෙනවා. එයත් ඒ ආකාරයෙන්ම සිදුවූ බව ජනප්‍රවාදය පවසා සිටිනවා. ඒ අනුව තමයි වර්තමානයේදීත් දියකැපුම් තොටක් ලෙස "ගැටඹ" භාවිත කරනු ලබන්නේ. පසුගිය සතියේ සඳහන් කළ බෝධීන් වහන්සේ ආසන්නයේ ඇති හාස්කම් සහිත දියකඩිත්තෙන් තමයි ගැමුණු කුමාරයා ස්නානය කර තිබෙන්නේ. ගැහැනු උදවිය ඒ දිය කඩිත්ත භාවිත කළොත් අද වුණත් එහි දිය සිඳී යනවා. සේවා මුර තුනක් ඉටු කළ පසුවයි දිය කඩිත්ත වරක් සක්‍රිය වන්නේ. කුමාරයාගේ ආරක්ෂාවට සිටි සුරනිමල යෝධයා දියකඩිත්ත හරහා විශාල ගල් පෙති තබා දිය පහර හරස් කොට පතහක් සකසා පීල්ලකින් ජලය ලබාගත හැකි ආකාරයට මෙම දිය කඩිත්ත කුමාරයාගේ ප්‍රයෝජනයට සකස් කළ බව කියැවෙනවා.

කෙත් අස්වැද්දීමත් කුමාරයා දිගින් දිගටම සිදු කර තිබෙනවා. එක් දිනක් කුමාරයා සිහිනයක් දකිනවා. ඒ සිහිනයේ පලාපල විමසන්නේ කොත්මලේ පුන්නා නැකැත්කරුගෙන්. කොත්මලේ ගණිතයාගේ පළමු පරම්පරාව නියෝජනය කළ පුන්නා නැකැත්කරු පවසා සිටින්නේ සිහිනයේ පලාපලවලට අනුව අද සිට දින 7ක් ඇතුළත කුමාරයා රජ වන බවයි. එවිට කුමාරයා පුන්නා නැකැත්කරුගෙන් විමසා සිටිනවා කුමන ස්ථානයකදී රාජ්‍යත්වයට පත්වන්නේ කියා. නැකැත්කරු පවසා සිටිනවා පුසුල්පිටිය රජ මහා විහාර භූමියේදී කුමරු රාජ්‍යත්වයට පත්වනවා කියා. ඒ අවස්ථාවේදී කුමාරයා පුන්නා නැකැත්කරුට නියෝග කරනවා දින 7ක් ගෙවෙන තුරු තමන් රජ කුමාරයා යැයි කිසිවකුට නොපැවැසිය යුතු බව. දින 7 සම්පූර්ණ වන දිනයේ කඩොල් ඇතු සමඟ පෙරහරේ පැමිණි නැකැත්කරු ජයසංඛය කරකවා ඇතහැරි විට කුමාරයා සිටින දිශාව පෙන්වමින් ජයසංඛය පුසුල්පිටිය රජ මහා විහාරය දෙසට හැරී තිබෙනවා. ජයසංඛය කරකවපු ස්ථානය අදටත් හඳුන්වන්නේ සංඛගල ලෙස. කඩොල් ඇතුට කුමාරයාගේ පුසුඹ හුරු නිසා කුමාරයා සොයාගෙන එන කඩොල් ඇතු කුමාරයාට නමස්කාර කළ බව කියැවෙනවා. ඉන් පසුව තමයි රාජ්‍යත්වයේ ලාංඡනය වන මඟුල් කඩුව කුමරු අතට පත් කර තිබෙන්නේ. දියකඩිත්තෙන් ස්නානය කරන කුමාරයා ගැමි වස්ත්‍ර ගලවා දමා රාජ ආභරණවලින් සැරසී මෙම විහාරස්ථානයේ සිට රැස්ව සිටි පිරිස ඇමැතූ බවයි කියැවෙන්නේ. ඉන් පසුව තමයි කුමාරයා මාගම රාජධානියේ දෙමටමල් විහාරයට ගොස් ඇත්තේ.

■ **කතාව : ප්‍රභාත් අත්තනායක**

**පින්තූර: රුක්ගහවිල ඒ. දේවේන්ද්‍ර**

**ලබන සතියට දන්ත ධාතූන් වහන්සේ හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය පිළිබඳ අතීත මූලාශ්‍ර පුසුල්පිටිය රජමහා විහාරය සමඟ එකමඟ යනයුරු කියවමු.**




## පඬුවස්නුවර - බෝධිමුල්ල පරපුරේ විස්මිත හෙළ වෙදකමෙන් රෝගීන් සුවපත්කරන

# එම්.එම්. පේමරත්න වෙද මහතා

**පඬුවස්නුවර - බෝධිමුල්ල විශ්මිත වෙද පරපුරේ වර්තමාන පුරුක වන එම්.එම්. පේමරත්න වෙද මහතා තම වෙද පරම්පරාවේ දැනුමෙන් හා පරම්පරාවට අයත් වටිනා ඖෂධ වට්ටෝරු ඇතුළත් පුස්කොළ පොත් පරිශීලනය කර ලබාගත් දැනුමෙන් රෝගීන් දහස් ගණනක් සුවපත් කළ විශේෂඥ වෛද්‍යවරයෙකි. කොන්දේ අමාරු, වකුගඩු රෝග, ආතරයිටීස්, දියවැඩියාව, හදවත් රෝග** ඇතුළු රෝග රාශියකට වෙදකම් කරන එම්.එම්. පේමරත්න වෙද මහතා අද දින ඔබ වෙත ගෙන එන්නේ කොඳුඇට පෙළ ආශ්‍රිත රෝග සම්බන්ධවයි.

ශරීරයේ බර දරා ගැනීමට පමණක් නොව මොළය හා අනෙකුත් අවයව අතර සන්නිවේදන කාර්යය සඳහා උපකාරී වන ඉතා වැදගත් අවයවයක් ලෙස වෛද්‍ය විද්‍යාවේ කොඳුඇට පෙළ සැලකෙනවා. කොඳුඇට පෙළ එහෙම නැත්නම් කශේරුකාව හැදිලා තියෙන්නේ කොඳුඇට විසි හතරකින් හාවෙලා. කොඳුඇට පෙළ මැදින් ඇති සිදුරක් හරහා සුසුම්නාව කියන තන්තු මිටියක් ගමන් කරනවා. ශරීරයේ කොටස්වලට සන්නිවේදනය සැපයෙන්නේ එම ස්නායුවලින්. කොඳුඇට පෙළ (කශේරුකාව) ශක්තිමත්ව තබා ගැනීමට ඒ අවට මාංශපේශී මෙන්ම කොඳුඇට අතර ඇති තැටි ශක්තිමත්ව තබා ගන්න ඕනෑ. හිස කෙළින් තබා ගන්න කශේරුකාවේ (කොඳුඇට පෙළ) බෙල්ල ආශ්‍රිතව නැම්මක් තියෙනවා. ඒ වගේම ශරීරයේ කඳ කෙළින් තබාගැනීමට කශේරුකාවේ පහල කොටසේ නැම්මක් තිබෙනවා. මේ කොටස ඉතා ඉක්මනින් ගෙවෙනවා. ඒ ගෙවීම නිසා කොඳු ඇට එකිනෙක වැදීමෙන් වේදනා හටගන්නවා. මේ හේතුවෙන් විවිධ ආබාධ ඇතිවෙන්න පුළුවන්. මේ කොඳුඇට ගෙවීම නිසා නහර ගණනාවක් තෙරපීමට ලක්වෙනවා. ඒ නිසයි විවිධ රෝගාබාධ ඇති වෙන්නේ. මේ තත්ත්වය නිසා ස්නායුවලට යම්කිසි පීඩනයක් එල්ල වුණොත් ඒවා අකර්මණ්‍ය වෙන්න පුළුවන්. කොඳුඇට පෙළ අස්ථාවර වෙලා නම් ඒවා එකිනෙක ගැටී බිඳෙන්නත් පුළුවන්. අසාමාන්‍ය විධියට එකිනෙක මත ලිස්සා යන්නටත් පුළුවන්. වයසට යද්දී බොහෝ විට මේ තත්ත්වය ඇතිවෙනවා. කුදුවීම් වයසට යන අයට බලපාන්නේ මේ නිසයි. කොඳුඇට පෙළ ගෙවීම නිසා ඇතිවන වේදනාව හටගන්නේ ක්‍රමක්‍රමයෙන්. මෙය දීර්ඝ කාලයක් පවතින්න පුළුවන්. ඒ වගේම ශරීරයේ සමබරතාවත් නැතිවී යනවා. ඇතැම් මාංසපේශී ඇකිලෙන්න පටන් ගන්නවා. සමහර විට කොඳුඇට එකිනෙක මත ලිස්සා යෑම නිසා එම ඇටපෙළ මැදින් ඇති ස්නායු තන්තු මිටිය ඇදීමට ලක්වෙන්න පුළුවන්. මේ තත්ත්වය ශරීරයට දැඩි වේදනාවක් ගෙන දෙනවා. ඒ විතරක් නෙවෙයි අවයවවල ක්‍රියාකාරීත්වයද අඩපණ වෙනවා.

අපේ පාරම්පරික වෙදකමේ කොන්දේ අමාරු සනීප කරන්නේ බොහෝ විට ඖෂධීය තෙලකින්. ඒවට විශේෂිත තෙල් වර්ග තියෙනවා. කොඳුඇට පෙළ ආශ්‍රිත මාංසපේශී, කොඳු ඇට අතර ඇති තැටි ජෙලටින් ශක්තිමත් කරන්න වගේම ගෙවී යෑමෙන් පවතින ඇට යථා තත්ත්වයට ගන්න පුළුවන් ඖෂධ හා තෙල් වර්ග පාරම්පරික වෛද්‍ය විද්‍යාවේ තිබෙනවා. අසාධ්‍ය ලෙඩෙක් වුණත් ඉක්මනින් සනීප කරන්න පුළුවන් තෙල් වර්ග තිබෙනවා. රෝගය තත්ත්වය අනුවයි ඒවා පාවිච්චි කරන්නේ" යැයි පේමරත්න වෙද මහතා පැවැසීය.

0766726478 යන දුරකථනයට කතා කර මා හමුවිය හැකි දිනයක් ලබාගත හැකිය. මම එහෙම කිව්වේ පඬුවස්නුවර ප්‍රතිකාර මධ්‍යස්ථානයේ පමණක් නොව ලංකාව පුරා මම වෛද්‍ය සායන පවත්වන නිසයි.

**වෙද මහතා, අයුර්වේද වෛද්‍යවරු මණ්ඩලයක් සමඟ මෙහෙයවන වැඩසටහන**

**පුරාණ පුස්කොළ පොත්වල තිබෙන රහස් බෙහෙත් වට්ටෝරු මගින්**

- බයිපාස් සැත්කම්වලින් තොරව හදවත් රෝග සුව කළ හැකියි
- දියවැඩියාව සම්පූර්ණයෙන් සුව කළ හැකියි
- කාටත් නොකියා වදදෙන ලෙඩේ අර්සස් සුව කරන්න පුළුවන්
- අපස්මාරය, වලිප්පුව, මීමැස්මොරය එක ඔසුවකින් සුව කළ හැකිය
- රුධිර පෙරන යන්ත්‍ර, ඔපරේසන් ඕනෑ නෑ වකුගඩු රෝගය සුව කළ හැකියි
- ඕනෑම කොන්දෙ අමාරුවක් සුව කරන පුරාණ තෙල් අප සතුයි
- මරණය පෙනිපෙනී සිටින පිළිකා රෝගීන්ට ජීවය ලබාදී තිබෙනවා

## සෑම ඉරිදා, සඳුදා දිනකම පඬුවස්නුවරදී ප්‍රතිකාර කෙරේ

**ආතරයිටීස්, කොන්දේ අමාරු, සන්ධි රෝග සඳහා තෙල්ගා සම්බාහනය කිරීම පහසු මිලකට හෙට්ටිපොළදී සියලු සර්වාංග රෝග සඳහා ප්‍රතිකාර කෙරේ**

| දිනය | ජනවාරි - 2022 | පෙබරවාරි - 2022 |
|---|---|---|
| ජාඇළ නිවන්දම දීපදුත්තාරාම විහාරය | 29 - උදේ 08 - 12 | |
| බඩල්ගම, ලිහිණියාගම පන්සල | 29 - සවස 02 - 04 | |
| කැකිරාව බෝධිරාජාරාමය | - | 02 - උදේ 10 - 12 |
| තඹුත්තේගම මුසල්පිටිය බෝධිරාජාරාමය | | 02 - සවස 02 - 04 |
| දඹුල්ල ඉනාමළුව පන්සල | | 02 - උදේ 07 - 09 |
| කොළඹ බොරැල්ල, රාජගිරිය ශ්‍රී ජයවර්ධනාරාමය | | 22 - උදේ 08 සිට |
| හොරණ පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරය - ගලේ පන්සල | | 04 - උදේ 08 - 12 |
| පානදුර ධම්මානන්ද මාවත, ශ්‍රී විජය සහන පදනම, වලාන | | 04 - සවස 02 - 04 |
| රත්නපුර බෞද්ධ මන්දිරය බණ්ඩාරනායක මාවත ෂෙඩ් එක ලඟ | | 10 - උදේ 08 - 12 |
| අවිස්සාවේල්ල සුදර්මාරාම පිරිවෙන | | 10 - සවස 02 - 04 |
| ගිරාඳුරුකෝට්ටේ බස් නැවතුම්පොළ ඉදිරිපිට (රත්නායක මහතාගේ නිවස) | | 17 - උදේ 08 - 12 |
| පොළොන්නරුව බෝධිරුක්කාරාමය සෝමවතිය පාර ගාමන්ට් එක අසල | | 18 - උදේ 08 -12 |
| අනුරාධපුරය නිවන්තක චේතිය රජමහා විහාරය | | 15 - උදේ 08 සිට |

පඬුවස්නුවර මාලිගාව අසල කෝන්ගහමුල ප්‍රතිකාර මධ්‍යස්ථානය
සෑම ඉරිදා / සඳුදා දිනකට උදේ 9 සිට 4 දක්වා ප්‍රතිකාර කරනු ලැබේ

හඟුරන්කෙත ධර්මෝදය මහ පිරිවෙන විහාරස්ථානය පුර පසළොස්වක පෝය දිනවල උදේ 9 සිට දහවල් 12 දක්වා

**බෙහෙත් ගැනීමට මෙගා බෝතල් 2ක් හා කුප්පි 2ක් රැගෙන එන්න**

**සුව නොවන රෝගීන් සඳහා අභිසංහිධාන යන්ත්‍රය ලබාගත හැක**

පඬුවස්නුවර වෙද මැඳුරේදී ප්‍රතිකාර සිදුකරන දින - ඉරිදා සහ සඳුදා දිනවල උදේ 9 සිට සවස 04 දක්වා අනෙකුත් දින වල දුරකතන ඇමතුමක් දී පැමිණෙන්න

**සුවනි පඬුවස්නුවර වෙද මැඳුර ප්‍රතිකාර මධ්‍යස්ථානය**

කොටඹපිටිය මාලිගාව ඉදිරිපිට කෝන්ගහමුල බෙදෙත් ශාලාව

**0766 726 478/ 0701445094/0372050640**





# තරබාරු බවින් මිදීමට 100% සාර්ථක මඟ...

**අධික තරබාරුව** නැතහොත් ස්ථූලතාවය වර්තමානය වන විට ලෝකයේ බොහෝ දෙනෙක් මුහුණ පා ඇති ගැටලුවකි. ශරීරයේ අධික ලෙස මේදය තැන්පත් වීම නිසා ශරීරයේ බර ඉහළ යාම මෙම තත්ත්වයට මූලික ම හේතුවයි. මෙම අවාසනාවන්ත සිදුවීම හමුවේ බොහෝවිට කාන්තාව බොහෝ සෙයින් අපහසුතාවයට පත් වී ඇති බව හැඟී ගිය ද, වර්තමානය වන විට ස්ත්‍රී පුරුෂ යන දෙපාර්ශවය ම දැඩි ලෙස කායිකවත් මානසිකවත් පීඩා විඳින බව පෙනෙයි. එම නිසා මෙම තත්ත්වයෙන් මිදීමට අනවශ්‍ය පරිදි ආහාර පාලනය කිරීම, වෙළෙඳපොළේ ඇති විවිධ ඖෂධ හා ආලේපන භාවිත කිරීම මෙන්ම ව්‍යායාම්වල නිරත වීම සුලබව දකින්නට ලැබෙන ක්‍රමයන්ය. මේ සියල්ලෙන් එහා ගිය විද්‍යාත්මක ක්‍රමවේදයක් පිළිබඳ එනම්,

**ආහාර පාලනය, ඖෂධ පාලනය හා ව්‍යායාම්වලින් තොරව සිරුරේ බර අඩු කරන ප්‍රෙෂර් පොයින්ට් ක්‍රමවේදය පිළිබඳ ඔබ දැනුවත් ද?**



ආසිරි සෙන්ට්‍රල් රෝහලේ, Slim & Healthy අංශ ප්‍රධානී, ආචාර්ය වෛද්‍ය, **රසික යමසිංහ**




**Pressure Point ක්‍රමවේදයේ ඇති සුවිශේෂත්වය**

- **No Diets** - ආහාර පාලනයක් නැත.
- **No Exercises** - ව්‍යායාම හෝ උපකරණ භාවිතයක් නැත.
- **No Medicine** - බෙහෙත් අනවශ්‍යයයි.
- **No Side Effects** - කිසිඳු අතුරු ආබාධයක් නොමැත.

වර්තමානයේ ලොව පුරා වසංගතයක් සේ පැතිර යන බෝ නොවන රෝග රැසකට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ අධික තරබාරුවයි. එසේ හෙයින් ඔබේ බඩ ඉදිරියට නෙරා තිබේ නම් බෝ නොවන රෝග අත ළඟ බව ද මතක තබා ගන්න. කිසිදු අතුරු ආබාධයකින් තොරව මාස කීපයකදී සිරුරේ බර හා ඉදිරියට නෙරා ඇති බඩ අඩු කර ගැනීමට කොළඹ, ආසිරි සෙන්ට්‍රල් රෝහලේ Slim & Healthy වැඩසටහනට ඔබත් අදම එක්වී සිහින් හැඩැති සුන්දර සිරුරක් ලබාගන්න. මෙය සියයට සියයක් විද්‍යාත්මක ක්‍රමවේදයකි.

ASIRI CENTRAL HOSPITAL LIVE MORE

Asiri - Hotline - 077 32 37 738 071 77 77 655


WhatsApp Health line - 071 55 55 655

Slim & Healthy



සුව අරණ Herbal හෙළ වෙදකම ඔබ ළඟටම Wellness & Medicare Center

## ඉපැරණි විස්මිත හෙළ වෙදකම දැන් කොළඹ දී...



අප අතරින් ගිලිහී යන ඈත අතීතයේ සිට පැවත එන පාරම්පරික හෙළ වෙදකමින් විස්කම් පාමින් රෝග නිවාරණය සඳහා ඇප කැප වූ දිවයිනේ විසිරී පැතිරී සිටින කීර්තිමත් හෙළ පරම්පරාවලට අයත් සුප්‍රසිද්ධ වෙදදුරන්ගේ පාරම්පරික රහස් බෙහෙත් වට්ටෝරු මගින් සිදු කරනු ලබන සුවිශේෂී ප්‍රතිකාර අපගේ මෙම මධ්‍යස්ථානයේදී දැන් ඔබට ලබා ගත හැකිය.

**ඔබේ හිසේ සිට දෙපතුළ තෙක් හට ගන්නා සියලුම රෝග නිවාරණය ට නොවරදින සුවය දැන් සුව අරණෙන්...**

රසායනාගාර පහසුකම් ද ඔබට අප මධ්‍යස්ථානයෙන් ලබා ගත හැක.

**දියවැඩියාව, හෘද රෝග (බයිපාස් ශල්‍යකර්ම නොමැතිව) චර්ම රෝග සහ ස්ත්‍රී/ පුරුෂ ලිංගික රෝග** සඳහා විශේෂ සායන පැවැත්වේ.

**දුරකථන : 07 55 46 56 56** | **නො. 6/ඒ, 4 වන පටුමග, ශාන්තිපුර, තලවතුගොඩ**

# මේක පොහොට්ටුවෙයි ශ්‍රීලනිපයෙයි ප්‍රශ්නයක් නෙවෙයි

# මේක පොහොට්ටුවයි සියලුම පක්ෂ අතරයි තිබෙන ප්‍රශ්නයක්

## පරිසර අමාත්‍ය මහින්ද අමරවීර



**කාලය ගතවුණා විතරයි ආණ්ඩුව කරපු දෙයක් නම් නෑ කියලයි මිනිස්සු කියන්නෙ?**

මේ ආණ්ඩුවට වසර දෙකක් ගත වෙලා අවසන්. අපි පාර්ලිමේන්තුවට ගිහිල්ලත් දැන් වසරකුත් මාස 6කුත් ගත වෙලා. ගතවුණු කාලය තුළ ආණ්ඩුවට ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන්න සිදු වුණා. කොහොම වුණත් ආපසු හැරී බලන විට අඩුපාඩු රාශියක් සිදුව තිබෙනවා. ඒවා සමාලෝචනයක් කරලා අඩුපාඩු පිළිගෙන නිවැරදි මාවතකට අවතීර්ණ විය යුතු කාලය එළැඹිලා තිබෙනවා කියලා මම සිතනවා.

> **රටින් ගෙනත් කන්න දීලා ආහාර ප්‍රශ්නෙ විසඳන්න බැහැ**

**ආණ්ඩුව අඩුපාඩුකම් පිළිගන්න සූදානම්ද?**

මෙහෙමයි, ආණ්ඩුව කෙරෙහි ජනතාවගෙ තිබෙන විශ්වාසය ගිලිහිලා ගියාට පසුව අපි මොනවා කළත් තේරුමක් නැහැ. අඩුපාඩුකම්, අතපසුවීම් පිළිඅරන් නැවතත් ජනතා විශ්වාසය දිනාගන්න ඕනා. ජනතාව වෙනුවෙන් කැපවෙලා නිවැරදි මාවතකට අවතීර්ණ වෙනවා නම් ආණ්ඩුවට තවමත් කාලය තිබෙනවා. ප්‍රධානම දේ තමයි ජනතාවට හැඟෙන්න ඕනා මේක අපේ ආණ්ඩුව කියලා. එහෙම නැත්නම් වැඩක් නෑ. ජනාධිපතිතුමා ගැන ජනතාවට තවමත් විශ්වාසයක් තිබෙනවා එතුමා හොරෙක් නෙවෙයි කියලා. එතුමාගෙ වාහන භාවිතය ගැන, සේවක සහ නිල නිවෙස් භාවිතය ගැන තවමත් ජනතාව අතර පැහැදීමක් තිබෙනවා. ඒ වගකීම අනෙක් අයටත් ඒ ආකාරයටම තිබෙන බව ඒ අයත් තේරුම් ගන්න ඕනා.

**ආණ්ඩුවේ අඩුපාඩු පෙන්වලා දෙන්න ගිහින් තිබෙන ඇමැතිකම් නැතිවෙයි කියලා බය නැද්ද?**

අපි අඩුපාඩු පෙන්වන්නෙ පෞද්ගලික කාරණා අරමුණු කරන් නෙවෙයිනෙ. මේ කතා කරන එකක්වත් අපි කාගෙවත් පෞද්ගලික ප්‍රශ්න නෙවෙයි. අපිට අවශ්‍ය ආණ්ඩුව හරි පාරකට අවතීර්ණ කරන්න. ඒ වෙනුවෙන් අපි ආණ්ඩු අභ්‍යන්තරයෙත් කතා කරනවා එළියෙත් කතා කරනවා. එහෙම කරන්නෙ නැවත රනිල් ගෙනෙන්නවත් සජිත් ගෙනෙන්නවත් නෙවෙයි. අසාර්ථක නායකයෝ බලයට ගේන්න අපිට වුවමනාවක් නැහැ. මේ ආණ්ඩුව පත්කරන්න ජනාධිපතිතුමා බලයට ගෙනෙන්න මහන්සි වුණු පක්ෂයක් සහ කණ්ඩායමක් විධියට අපිට යුතුකමක් තිබෙනවා ජනතාවට ආණ්ඩුව ගැන තිබෙන ප්‍රශ්න පෙන්වලා දෙන්න. ඒවා වැරදියට දකින අයත් ඉන්නවා. විරුද්ධව කතා කරන අයත් ඉන්නවා. නමුත් අපි ඒ කතාවලින් සැලෙන්නෙ නෑ. අපි දිගටම අපේ යුතුකම ඉටුකරනවා.

**ඇත්තටම එළියේ කතා කරන එක, විවේචන කරන එක සාමූහික වගකීම් කඩ කිරීමක්ද?**

වසර ගණනාවක් කැබිනට් මණ්ඩලයේ ඉන්නවා, දේශපාලන ක්ෂේත්‍රයේ ඉන්නවා. ඒ නිසා අපි මැනවින් දන්නවා සාමූහික වගකීම් ගැන. කැබිනට් මණ්ඩලයේදී ගන්න තීන්දු සම්බන්ධයෙන් සාමූහික වගකීම අපිට තිබෙනවා. නමුත් ආණ්ඩුව පැත්තෙන් වරදක් වෙද්දි සාමූහික වගකීම් කඩවෙනවා කියලා හිතාගෙන කට පියාගෙන ඉන්නත් අපි සූදානම් නැහැ. ඒවා ඇතුළෙත් කතා කරන්න ඕනා එළියෙත් කතා කරන්න ඕනා. ඇතුළෙ කතා නොකරම ඉඳලා එළියෙ විතරක්ම කතා කරනවා නම් තමයි වැරදි.

**ආණ්ඩු හිතවාදී 69 ලක්ෂය තවමත් ආණ්ඩුව එක්ක ඉන්නවා කියලා ඔබ සිතනවාද?**

ගම්වලට නොයන, ජනතාව අතරට නොයන, කඩපොළකට නොයන කෙනෙක්ට එහෙම සිතාගන්න පුළුවන්. මොකද ඇත්ත නොදකින නිසා. මම සතිඅන්තයට ගමට යන කෙනෙක්. කඩපොළට යන කෙනෙක්. ගම්වල නගරවල කරක්ගහන කෙනෙක්. ඒ නිසා මට කියන්න පුළුවන්කමක් නෑ. 69 ලක්ෂයක් තවම ආණ්ඩුව එක්ක ඉන්නවා කියලා. ඒ අයගෙන් බොහෝදෙනෙක් කතා කරන්නෙ ආණ්ඩුව ගැන අප්‍රසාදයෙන්. ඒක අපි අවංකව පිළිගන්න වෙනවා.

> **මම කාබනික වගාව කරපු කෙනෙක්. ඒක කරන්න බැරි දෙයක් නෙවෙයි**

**එතකොට ආණ්ඩුවට සහයෝගය දුන්න ශ්‍රීලනිප පාක්ෂිකයෝ?**

දිස්ත්‍රික් සම්මේලනවලදී. බල මණ්ඩලවලදී අපිට ශ්‍රීලනිප පාක්ෂිකයෝ මුණගැසෙනවා. ඔවුන්ගෙන් අපිට චෝදනා රැසක් නැඟෙනවා. ආණ්ඩුව ගැන තිබෙන ප්‍රශ්න ඔවුන් අපිට කියනවා.

**ජනාධිපතිවරයාගේ රාජාසන කතාව මේ මොහොතේ තිබෙන ප්‍රශ්න ගැන අවධානය යොමු නොකරපු අසාර්ථක කතාවක් කියලා විපක්ෂය කියනවා?**

එතුමගෙ කතාවෙන් ඉදිරිපත් කළේ දිගුකාලීන වැඩපිළිවෙළක් වෙන්න පුළුවන්. නමුත් මේ මොහොතේ තිබෙන ප්‍රශ්නවලටත් විසඳුම් ඒ කතාවේ තිබුණා. පරිසර ප්‍රශ්නය ගැන සිතලා එතුමා කිව්වා මින් ඉදිරියට ගෙන්වනවා නම් ගෙන්වන්නෙ ඉලෙක්ට්‍රික් වාහන කියලා. ඒ වගේම පුනර්ජනනීය බලශක්තිය ගැනත් එතුමා කතා කළා. ඒවා හොඳයි. කතාවකින් සේරම කරන්න බෑනෙ. කතාවකින් කිව්වත් කමක් නෑ සියලුම දේවල් ප්‍රායෝගිකව වෙනවානම්. නමුත් අපිට එතුමගෙ කතාව ගැන කිසිදු ප්‍රශ්නයක් නෑ. වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම තමයි අවශ්‍යම දෙය.

**ඉලෙක්ට්‍රික් කාර් ගෙන්වන්න ඉතින් විදුලිය තිබෙන්නත් ඕනනෙ ඇමැතිතුමා. විදුලිබල අර්බුදයක් අස්සෙ මොන ඉලෙක්ට්‍රික් කාර්ද? අනික ඕවා අද හෙට කරන්න පුළුවන්ද?**

ඒකනේ මම කිව්වෙ. කතාවකින් කරන්න පුළුවන් දෙයක් නෑනෙ. බොරුවට කතා කරලා ඕනනම් නොකර ඉන්නත් පුළුවන්නෙ. කතාවෙ කෙටිකාලීන විසඳුම් ගැන සඳහන් නොවුණාට මේ මොහොතේ තිබෙන ප්‍රශ්නවලටත් විසඳුම් දීගෙන යනවනෙ. ගෑස් ප්‍රශ්නය, ගුරු වැටුප් ප්‍රශ්නය, ඉන්ධන ප්‍රශ්නය මේවට දැන් යම් යම් විසඳුම් ලබාදෙනවනෙ. පැය 6/7ක කතාවක් කළේ නෑනේ සේරම දේවල් මෙහෙම කරනවා කියලා කියන්න. රටකට ඕනා දීර්ඝකාලීන දැක්මක්. බඩු මිල ගැනයි අරවා මේවා ගැනයි කතා කරලා ප්‍රශ්න විසඳන්න බෑනෙ. බඩු මිල අඩු කරන්න කරපු සියල්ල අසාර්ථක වුණානෙ. ගැසට් ගැහුවා. ඒත් සාර්ථක වුණේ නැහැනෙ. ඒවට නෙවෙයි ඇත්තටම මහන්සි වෙන්න අවශ්‍ය. මිනිස්සුන්ගෙ ආර්ථිකය ශක්තිමත් කරන්නයි මහන්සි වෙන්න ඕනා. ගෙදරට එන ආදායම වැඩි වෙනවා නම් බඩු මිල ටිකක් වැඩි වුණාට කමක් නෑ.

**රටේ ඩොලරුත් නැහැ. රුපියලුත් නෑ. කොහොමද ආදායම් වැඩි වෙන්නෙ?**

දැනට මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කොට තිබෙනවා. විශේෂඥයෝ කියනවා රටේ ආහාර හිඟයක් එනවා කියලා. ඒකට විසඳුම් අඩංගු යෝජනාවලියක් මම ලබාදුන්නා. ඒ සම්බන්ධයෙන් ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරලා දැන් වැඩපිළිවෙළකට ප්‍රවේශ වෙලා තිබෙනවා. මුදල් ඇමැතිතුමාගෙ කතාවෙත් කිව්වා ගෙවතු වගාව, පුරන් කුඹුරු අස්වැද්දීම ගැන මුදල් ප්‍රතිපාදන වෙන් කළා. මම කියන්නෙ හැමෝම එකතුවෙලා මේක සාර්ථක කරගත්තොත් හොඳ ප්‍රතිඵල ගන්න පුළුවන්.

**රාජ්‍ය නිලධාරීන් පත්කරනවා, ඉවත් කරනවා. නිවැරදි තේරීමක්**

> **ආණ්ඩුවේ කොටස්කාරයෝ විධියට වැඩ කරන්න ශ්‍රීලනිප අයටත් ඉඩ දෙන්න**

> **විදුලිය නැති වුණොත් ජලයත් නැතිවෙනවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ**

**කරන්න ජනාධිපතිවරයාට හැකියාවක් නැද්ද?**

බොහොමයක් කාරණා අමාත්‍යාංශවලින් සිදුවෙන දේවල්නෙ. නිලධාරීන් වෙනස් කරලම ප්‍රශ්න විසඳගන්න බැහැ. අනෙක් පැත්තෙන් ගත්තම වැඩ කරන්න බැරි නිලධාරීන් තියාගන්නත් බෑ. නමුත් එහෙමයි කියලා දවසින් දවස නිලධාරීන් මාරු කරන එක හොඳයි කියලා මම කියන්නෙත් නෑ.

**ඔබත් ප්‍රකාශ කළා අමාත්‍යාංශවලට අයත් ආයතනවල ඉන්න අකාර්යක්ෂම නිලධාරීන්ව ඉවත් කරන්න ඕන කියලා. ඉවත් කරලා සුදුසු පත් කිරීම් කර කර ඉද්දි කාලෙත් ඉගිල්ලිලා තිබෙයි නේද?**

අවසානයෙ අමාත්‍යවරයාටනේ වගකීම භාරගන්න වෙන්නෙ කොහෙන් ගියත්. වරදක් වුණොත් ඒක යන්නෙ වෙන කාටවත් නෙවෙයි ඇමැතිවරයාට. අමාත්‍යවරයාට පුළුවන් වෙන්න ඕනා නිවැරදි නිලධාරීන්ව පත්කරගන්න. එහෙම නැතිව වෙනත් කණ්ඩායම්වලින් පත්කරලා එව්වම ඇමැතිවරුන්ටත් ඇඟ බේරගන්න පුළුවන් මම දන්නෙ නෑ පත්කළේ මම නෙවෙයි කියලා. ඒ නිසා ඕනම අමාත්‍යවරයෙක්ට බලය ලබාදිය යුතුයි නිලධාරීන් පත්කර ගැනීමට. එහෙම වුණාම නිලධාරීන් වරදක් කළත් ඇමැතිලාට මඟහරින්න බෑ.

**ජනාධිපතිතුමා එකක් කියනවා. ඇමැතිලා තව එකක් කියනවා. අමාත්‍යාංශ ලේකම්වරු සහ නිලධාරි යාන්ත්‍රණය වෙනම කතාවක් කියනවා. යහපාලනේට ගොනා - මීමා ආණ්ඩුව කියපු මේ ආණ්ඩුවේ කෝ ඒකමතික බවක්, ඒකාත්මික වීමක්?**

මේ වගේ දේවල් වෙන්න ප්‍රධානම දේ තමයි පක්ෂ නායක රැස්වීම් නොපැවැත්වීම. ඒක වුණානම් මේ තිබෙන අභ්‍යන්තර ගැටලු රාශියක් විසඳගන්න තිබුණා. එහෙම කරනවා නම් ඒක ආණ්ඩුවක් විධියට හොඳ තත්ත්වයක්. ආණ්ඩුවේ ප්‍රශ්න එළියෙ කතා නොකර ඇතුළේ කතා කරන්න ඕනා කියන දේ අපි පිළිගන්නවා. නමුත් එහෙම කතා කරන්න ලැබෙන්නෙ නෑනෙ. ඉදිරියට මේ තත්ත්වයන් වෙනස් වෙයි කියලා අපි සිතනවා. දැනටමත් පක්ෂ නායක රැස්වීමක් ගැන කතා කරන්න පටන් අරන් තිබෙනවා. ඉදිරියේදී අපිට ඒ අවස්ථාව ලැබෙයි. මම විශ්වාස කරන්නෙ රටේ තිබෙන තත්ත්වය ගැන, ආර්ථික අර්බුදය ගැන මිනිස්සුන්ට කරුණු දැක්වීමේ අවශ්‍යතාවක් තිබෙනවා. අපි මේවා මිනිස්සුන්ට වහන් ඉඳලා වැඩකුත් නෑ වහන් ඉන්න අවශ්‍යතාවකුත් නෑ.

> **බලයට එන්න උදවු ගත්තා නම් අපේ මන්ත්‍රීවරුන්ටත් සලකන්න ඕනෑ**

> **ජනතා විශ්වාසය ගිලිහුණාට පස්සේ මොනවා කළත් වැඩක් නැහැ. ජනාධිපතිතුමා හොරෙක් නෙවෙයි කියලා ජනතාව දන්නවා**

ජනතාවට වැටහෙන්න ඕනා ආණ්ඩුව අවංකයි කියලා. ඒක වැටහුණොත් විතරයි ජනතාව ඕන දෙයක් ඉවසන් ඉන්නෙ.

**කවුද මේ ඇත්ත ජනතාවට කියන්න අවශ්‍ය. ජනාධිපතිවරයද? අගමැතිවරයද? ඇමැතිවරුද?**

ඒ ඒ වගකීම් දරන අය ඇත්ත කියන්න ඕනා. මගේ අමාත්‍යාංශයේ ප්‍රශ්නයක් තිබෙනවා නම් මම කියන්න ඕනා. අනෙක් කාරණය ආණ්ඩුව වෙනුවෙන් කරුණු කියන අය පිළිබඳව ජනතාවගේ විශ්වාසයක් තිබෙන්නත් ඕනා. කතා කිරීම අඩු වුණොත් ඒකෙන් නරක ප්‍රතිඵල එන්න පුළුවන්.

**ජනාධිපතිවරයා ඇමැතිවරු මුණ ගැසෙන්නෙ නෑ. කාටවත් ඇහුම්කන් දෙන්නෙ නෑ ආදී වශයෙන් චෝදනා ගණනාවක් නැඟුණා. ඒ සම්බන්ධයෙන් ඔබට තිබෙන අත්දැකීම කුමක්ද?**

මට නම් ජනාධිපතිතුමාව මුණගැසෙන්න කිසිදු බාධාවක් ඇතිවෙලා නෑ. මම මේක බොරුවට කියන එකක් නෙවෙයි අවංකවමයි කියන්නෙ. ඕනෑම වෙලාවක හමුවෙන්න හැකියාවක් තිබුණා වගේම දුරකථනයෙනුත් කතා කරන්න අවස්ථාව ලැබුණා. අනෙක් අයට කොහොම බලපෑවත් මට නම් ඒ කතාව ඒ තරම් අදාළ වෙන්නෙ නෑ. ඇතැම් අවස්ථාවල කැබිනට් එක ඉවර වුණාම පිටිපස්සෙන් ගිහිල්ල එතුමව නතර කරන් කතා කරලත් තිබෙනවා. කිසිම අවසරයක් නැතිවත්.

**එතකොට බහුතරයක් ඇමැතිවරු මන්ත්‍රීවරු කියන්නෙ බොරු?**

මම දන්නෙ නෑ. මොකද මට කියන්න බෑනෙ ඔවුන් කියන්නෙ ඇත්තද?

> **විමල්, වාසු, ගම්මන්පිල අපි සේරම එකතු වුණාම 30ට වැඩියි**

බොරුද? කියලා. මම කිව්වෙ මගේ අත්දැකීම ගැන. මට එවැනි බාධාවන් ඇතිවෙලා නෑ. මම අපේ පක්ෂ කණ්ඩායම් රැස්වීම්වල පවා මේක කියලා තිබෙනවා.

**ඒ කියන්නෙ ජනාධිපතිවරයා මහින්ද අමරවීරට කැමැතියි?**

ඒක කියන්න මම දන්නෙ නෑ. මම අවංකවම කිව්වෙ මට ප්‍රශ්නයක් ඇති වෙලා නෑ කියලයි. මට කවදාවත් හමුවෙන්න අවස්ථාවක් ලැබිලා නැත්නම් බාධා ආවා නම් මම ඒකත් අවංකවම කියනවා.

**විදුලිබල ඇමැති එක කතාවක් කියනවා. බලශක්ති ඇමැති තව කතාවක් කියනවා. අවසානෙ මිනිස්සුන්ට විදුලියත් නෑ තෙලුත් නෑ?**

මේ තත්ත්වයන් මෙහෙම තිබිය යුතු නෑ. විවිධ ප්‍රකාශයන් කිරීමෙන් ප්‍රශ්න විසඳෙන්නෙ නෑ. පරස්පර කතා කියන්නෙ නැතිව එක මතයකට ඇවිත් කතා කරන්න ඕනා. එක වෙලාවකට කියනවා ලයිට් කපන්නෙ නෑ කියලා තව වෙලාවකට කියනවා කපනවා කියලා. මිනිස්සු තමයි පීඩාවට පත්වෙන්නෙ.

> **රනිල්, සජිත් වගේ අසාර්ථක නායකයෝ බලයට ගේන්න අපිට වුවමනාවක් නැහැ**

සංචාරක කර්මාන්තයත් ටිකක් ඉදිරියට ඇවිත් තිබෙන වෙලාවක විදුලිය නොකපා යෑමේ වගකීම රජයට පැවරෙනවා. ඒ නිසා ආණ්ඩුවත් ප්‍රතිපත්තිමය තීන්දුවක් අරන් තිබෙනවා මොන තත්ත්වයක් යටතේවත් විදුලිය කපන්නෙ නෑ කියලා.

> **69 ලක්ෂයෙන් බහුතරයක් ඉන්නේ ආණ්ඩුව ගැන අප්‍රසාදයෙන්**

**දිගටම විදුලි කප්පාදුවක් වුණොත් ජලය නැතිවීම වගේ ප්‍රශ්න ගණනාවක් වැල නොකැඩී එන්න පුළුවන් නේද?**

අනිවාර්යයෙන්ම. විදුලිය නැතිවුණොත් ජලය නැතිවෙනවා. ඒ ගැන කිසිම සැකයක් නෑ. ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන්න වෙනවා. ඒ නිසා අඛණ්ඩව විදුලිය ලබා දෙන්න රජය උත්සාහ දරන්න ඕනා.

**මෙතරම් දවසක් ආණ්ඩුව කළේ කියපු දේවල්ම නෙවෙයිනෙ ඇමැතිතුමා. ඒ නිසා විදුලිය නොකපා ඉඳීවි කියලා කොහොමද විශ්වාස කරන්නෙ?**

මම කිව්වෙ කැබිනට් මණ්ඩලයේදී කතා කරලා එකඟ වුණු දේ සම්බන්ධයෙන්. කෙසේ හෝ මැදිහත් වෙලා විදුලිය මොන තත්ත්වය යටතේ හෝ ලබාදෙන්න තමයි තීරණයකට ආවෙ.

**පොහොර ප්‍රශ්නෙ නිසා අස්වනු හිඟ වෙලා. ගොවියෝ උද්ඝෝෂණ කරනවා. රටේ බඩු නැතිවුණොත් පිටරටින් හරි ගෙනැල්ලා කන්න**

> **නිලධාරීන් වෙනස් කරලා ප්‍රශ්න විසඳන්නත් බැහැ. වැඩ බැරි අය තියාගෙනත් බැහැ**

**දෙන්නම් කියලා මේ ගැටලු විසඳන්න පුළුවන්ද?**

අපිට අවශ්‍ය ආහාර ටික රට තුළම නිෂ්පාදනය කරගන්න ඕනා. ප්‍රමුඛත්වය දෙන්න ඕනා ආහාර සුරක්ෂිතතාවට. ඒ අතරතුර කාබනික වැඩපිළිවෙළත් ක්‍රමානුකූලව කරන් යෑමට බාධාවක් නෑ. වන්දි දෙන්න අවශ්‍යයි. මම කැබිනට් මණ්ඩලයේදීත් කිව්වෙ විශාල වන්දියක් දෙන්න අවශ්‍යයි කියලා. නමුත් ඒකෙන්ම ප්‍රශ්න විසඳෙන්නෙ නෑ. රටින් ගෙනත් කන්න දෙන එක නෙවෙයි මේ ප්‍රශ්නෙට විසඳුම. ගොවීන් පාරේ තියලා මේ ප්‍රශ්න විසඳන්නත් බෑ. එකම විසඳුම ඔවුන්ව නැවත ගොවිබිම් වෙත යැවීම. ඒකෙ වගකීම අපි හැමෝටම තිබෙනවා. අපි මේ ගැන කරුණු ඉදිරිපත් කොට තිබෙනවා. මම කාබනික වගාව කරපු කෙනෙක්. මේක කරන්න බැරි දෙයක් නෙවෙයි. මම කෘෂිකර්ම ඇමැති කාලෙ වැඩිම වී අස්වැන්නක් අරගෙන දුන්නා. ඒ තත්ත්වය ඉදිරියට ගෙනයෑමයි අවශ්‍යතාව. අවාසනාවට ඒක සිදුවුණේ නෑ. මම පුරන් කුඹුරු වගා කරවලා අස්වනුත් අරන් දුන්නා. දැන් තිබුණු කුඹුරුත් පුරන් වෙන මට්ටමට ඇවිල්ලා.

> **ආණ්ඩුව පැත්තෙන් වරදක් වෙද්දි සාමූහික වගකීම් කඩවෙනවා කියලා හිතාගෙන කට පියන් ඉන්න අපි සූදානම් නැහැ**

**ගෑස් සංයුතිය වෙනස් කළා, තෙල් සංයුතියත් වෙනස් කළා කියලා චෝදනා නැඟුණා. දැන් සිමෙන්තිවලත් ප්‍රමිතිය බලන්නෙ නෑ කියලා ආණ්ඩුවට චෝදනා නැඟෙනවා?**

මේවාට බලපාන ප්‍රධාන ප්‍රශ්නය තමයි විදෙස් සංචිත හිඟවීම. මේවා සේරම පිටරටින්නෙ ගේන්නෙ. එවිට ඩොලර් නැතිකම බලපානවා. අපේ විදේශ සංචිත ශක්තිමත් වෙලා ආර්ථිකය හොඳට තිබුණා නම් මෙවැනි ප්‍රශ්න ඇත්තටම ඇතිවෙන්නෙ නෑ. ඒ අඩුපාඩුව නිසා ඇතිවුණු අර්බුද තමයි මෙයාකාරයට මතුවෙන්නෙ.

> **ජනාධිපතිතුමාව මුණගැහෙන්න මට නම් කිසිම බාධාවක් වෙලා නැහැ**

**පොහොට්ටුව සහ ශ්‍රීලනිප විරසකය ඔඩුදුවනවා මිසක් සමනය වෙන පාටක් නෑ නේද?**

මේ තත්ත්වය සමනය කරගන්න ප්‍රධාන පක්ෂයට වගකීමක් තිබෙනවා. පොහොට්ටුවයි, ශ්‍රීලනිපයයි අතර ප්‍රශ්නයක් නෙවෙයි මෙතැන තිබෙන්නෙ. මෙතැන තිබෙන්නේ පොහොට්ටුව සහ සියලුම පක්ෂ අතර තිබෙන ප්‍රශ්නයක්. මතකනේ මීට පෙර ගොඩක් දෙනෙක්ට යන්න කිව්වා. විමල්ලට, වාසුලට, ගම්මන්පිලලට යන්න කියලා කොච්චර කියෙව්වද? ඔවුන්ගෙ කණ්ඩායම්වල මන්ත්‍රීවරු 16/17 පමණ ඉන්නවා. ඔක්කොම අපි 30ට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. මේ හැමෝටම පල නොකියා පලා බෙදන එකයි පොහොට්ටුව කරන්නෙ. අපි වෙන වෙන පක්ෂ. අපිට අයිතියක් තිබෙනවා අපේ මත ප්‍රකාශ කිරීමට. අපි වරදක් පෙන්නුවාම වරද දිහා බලනවා මිසක් අපි දිහා බලලා වැඩක් නෑ.

**ජනාධිපතිවරණයට පෙර ශ්‍රීලනිප සහ පොහොට්ටුවේ නායකයන් අතර සාකච්ඡාවක් සිදුවෙලා ගිවිසුම් ප්‍රකාරව එකඟතා ටිකකට ආවනේ?**

ඔව්.

**ඒ කිසිදු පොරොන්දුවක්, එකඟ වුණු කිසි දෙයක් මේ වන තෙක් සිද්ධ වෙලා නෑ නේද?**

ඔව්. එවැනි දේවල් ගණනාවක් තිබෙනවා ඉටු නොවුණු. අපේ අය කතා කරන්නෙත් එව්වා ගැනනේ.

> **නිලධාරීන් පත් කිරීමේ බලය ඇමැතිවරුන්ට ලබාදිය යුතුයි**

**ඇමැතිකම් දෙනවිටත් දුන්නෙ නොදී බැරිකමට වගේ නේද?**

එහෙම ප්‍රශ්න තිබෙනවා. ඒවා ඉතින් රහස් නෙවෙයිනෙ.

**පරිසර ඇමැති වුණු ඔබට දුන්නේ ආයතන දෙකයි. මීට පෙර සිටි පරිසර ඇමැතිලාට ආයතන කිහිපයක්ම තිබුණා?**

මම කිව්වෙ ඒකයි මේවා රහස් නෙවෙයි. තනතුරු බෙදී යෑම සිටම ගැටලු ගණනාවක්ම තිබෙනවා. නමුත් අපි මේ කතා කරන්නෙ අපේ තනතුරු ඉලක්ක කරගෙන නෙවෙයි. ඊට වඩා එහා ගිය කාරණා ගැනයි අපි කතා කරන්නෙ. රට ගැන තීන්දු තීරණ ගන්න විට අපි කියන දේවල්වලටත් ඇහුම්කන් දෙන්න කියලයි අපි කියන්නෙ.

**ශ්‍රීලනිප ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට සහ පාක්ෂිකයන්ටත් කුඩම්මගෙ සැලකිලි. ඔබලත් මේ ආණ්ඩුවේ පාර්ශ්වකරුවන්නෙ?**

ඒක තමයි ප්‍රශ්නෙ. අපි නිරන්තරයෙන් කතා කළේ අපි ගැන නෙවෙයි. ගෝඨාභය ජනාධිපතිතුමාට ක්‍රියාකාරීව ඡන්දය ලබා දුන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු එක්දහස් ගණනක් ඉන්නවා. එපමණක් නෙවෙයි ගම්වල සක්‍රීයව වැඩ කරපු පාක්ෂිකයොත් ඉන්නවා. ඒ

> **පක්ෂ නායක රැස්වීම් පැවැත්වුවා නම් ගැටලු රාශියක් විසඳගන්න තිබුණා**

අයව නොසලකා හරින්නෙ ඇයි කියන එක තමයි අපෙත් ප්‍රධාන ප්‍රශ්නය. අපි හතරදෙනෙක්ගෙ ගැටලු විසඳගෙන පැත්තකට වෙන්න අපිට වුවමනා නෑ. අපි පෞද්ගලිකව කිසිදෙයක් ඉල්ලන්නෙ නෑනෙ. අපි සියලුම ඉල්ලීම් ඉල්ලන්නෙ පක්ෂය වෙනුවෙන්. අපි ඉල්ලන්නෙ අපේ පාක්ෂිකයන්ටත් අපේ මන්ත්‍රීවරුන්ටත් අනෙක් අය හා සමානව සලකන්න කියලයි. බලයට එන්න උදවු ගත්තා නම් අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ටත් සලකන්න ඕනා. සලකන්න කියන්නෙ පෞද්ගලිකව නෙවෙයි. පඩි නඩි, වාහන පර්මිට් වගේ වරප්‍රසාද නෙවෙයි ඉල්ලන්නෙ. ආණ්ඩුවේ කොටස්කාර මන්ත්‍රීවරු විධියට වැඩ කරන්න ශ්‍රීලනිප අයටත් ඉඩදෙන්න කියලයි අපි කියන්නෙ.

**මේ වනවිට වාමවාදී සහ ප්‍රගතිශීලී පක්ෂ ගණනාවක් සමඟ ශ්‍රීලනිප සාකච්ඡා පවත්වමින් යනවා කියලා ආරංචියි. එළියට බැහැලා අලුත් බල කඳවුරක් හදන්නද සූදානම?**

කොහොම වුණත් රනිල් වික්‍රමසිංහ හෝ සජිත් ප්‍රේමදාස වැනි අය ශක්තිමත් කරන වැඩපිළිවෙළකට අපි යන්නෙ නෑ. ඒක අපි වගකීමෙන් කියනවා. මම තමයි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා. සන්ධානය ශක්තිමත් කරන්න අපි වැඩ කටයුතු කරනවා. සෙසු පක්ෂ සමඟ සාකච්ඡා කරලා ඔවුන්ගේ අදහසුත් අපි ගන්නවා. ඒ අය සමඟ යම් යම් එකඟතාවන්වලට ඇවිත් තිබෙනවා. ඉදිරියටත් ඒ වැඩකටයුතු සිදුවෙනවා.

■ අරුණි මල්ලවආරච්චි

C M Y K

# 1982 එජාපයේ ප්‍රේමදාස - උපාලි අභ්‍යන්තර ගැටුම




# උපාලි විජයවර්ධන අතුරුදන් වෙන්න කලින් දේශපාලන ගේම් ගැන විජේවීර කියයි

**මෙහි ඉදිරිපත් කරන ලිපි රෝහණ විජේවීර විසින් 1981 - 82 වකවානුවේ ලියන ලද ඒවාය. ඊට ඇතුළත් වන්නේ එම වකවානුවේ පැවැති දේශපාලන පසුබිමට අයත් කරුණු කාරණාය. 80 දශකයේ යූ.ඇන්.පී.යේ බලය අල්ලා ගැනීම උදෙසා ආර්. ප්‍රේමදාස සහ උපාලි විජයවර්ධන අතර ඇතිවූ අභ්‍යන්තර අරගලය පිළිබඳව රෝහණ විජේවීර මෙම ලිපිය ලියා තිබෙන්නේ 1982 ජනවාරි මාසයේදීය. 1983 පෙබරවාරි 13දා උපාලි විජයවර්ධන අතුරුදන් විය.**

ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ ඇවැස්ස බාල මස්සිනා වන උපාලි විජයවර්ධන සක්‍රිය දේශපාලන ලෝකයට එන බව පවසා තිබේ. උපාලි විජේවර්ධන මෙරට සිටින ප්‍රකට බහුජාතික සමාගම් හිමිකරුවෙකි. පළමු පෙළේ රේස් බුකීකාරයෙකි. මේ වන වනවිට ඔහු විශාල පත්තර කොම්පැනියකද හිමිකරුවකු වී සිටී.

මේ මාසයේ සිට දේශපාලනයට එනවා යැයි පැවසීමෙන් උපාලි විජේවර්ධන අදහස් කරන්නේ කුමක්ද? ඔහු මීට කලින් දේශපාලනයේ යෙදී සිටියේ නැද්ද? 1960 මාර්තු මැතිවරණයේදී පිලිප් ගුණවර්ධනගේ මහජන එක්සත් පෙරමුණෙන් උපාලි කැලණිය ආසනයට නාමයෝජනා ලබා ගත්තේය. නමුත් ඔහු සිය මස්සිනා වන ජේ.ආර් සමඟ තරගයට ඉදිරිපත් වූයේ නැත.

එසේ වුවද ඔහු පසුගිය දශක කිහිපය මුළුල්ලේම දේශපාලනයට හවුල් වී සිටි බව රහසක් නොවේ. "රිවිරැස" පුවත්පතේ පළවූ ලිපියකින් මිගාර කියා තිබුණේ පසුගිය මහ මැතිවරණයේදී ඔහු යූ.එන්.පී. ජයග්‍රහණයට විශාල වශයෙන් මුදල් වියදම් කළ බවය. යූ.එන්.පී.ය මෙවර ජේ.ආර්ගේ නායකත්වයෙන් බලයට පත් වූ පසුව උපාලි විජයවර්ධනගේ ජාවාරම්වලට වඩා හොඳ කලදසාවක් ලැබිණි.

වඩා හොඳ යැයි කී නමුත් ඊට කලින් පැවැති ශ්‍රී ලංකා, කොමියුනිස්ට්, සමසමාජ, තුන් හවුල් ආණ්ඩුව යටතේද ඔහුගේ ජාවාරම්වලට තිබුණේ නරක කලදසාවක් නොවේ. එකල කර්මාන්ත ඇමැති ටී.බී. සුබසිංහගේ දියණිය සමඟ ළඟ ඇසුරක සිටි ඔහු තම කර්මාන්ත ව්‍යාපාරවලට ඊනියා සමාජවාදී කර්මාන්ත ඇමැතිගේ අනුග්‍රහය ලබා ගත්තේය.

අනිකුත් කර්මාන්තකරුවන්ට නැති රාජ්‍ය අනුග්‍රහයක් ඔහුට හිමි විය. ඒ කාලයේ ඔහු එවකට අගමැතිව සිටි සිරිමා බණ්ඩාරනායකගේ මලණුවන් වූ සීවලී රත්වත්තේගේ දියණිය ලක්මිණි සමඟ විවාහ විය. මේ විවාහයෙන් ඔහු එවකට විරුද්ධ පක්ෂ නායක ජේ. ආර්ගේ මස්සිනා වීමට අමතරව අගමැතිනි සිරිමාගේ සමීප ඥාති පුත්‍රයා වීමටද සමත් විය. එමගින් උපාලි විජයවර්ධන ධනපති පක්ෂ දෙකේ නායකත්වය අරා වැජඹෙන පවුල් දෙකේ මැද පුරුක බවට පත්වූයේය.

මේ තත්ත්වය යටතේ ඔහුගේ ව්‍යාපාරවලට, ජාවාරම්වලට, පසුගිය ආණ්ඩුව කාලයේ තිබුණේ ඉතා හොඳ කලදසාවකි. සුළු ඉඩම් හිමියන්ට තම අක්කර 50 රැක ගන්නට තිබූ බාධා උපාලිගේ අක්කර දහස් ගණන රැක ගැනීමට තිබුණේ නැත. තවත් අතකින් රජයේ ප්‍රබල තනතුරුද ඔහුට පුදනු ලැබීය. මහ කොළඹ ආර්ථික කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට ඔහුව පත්කළේය. එහි තවත් අධ්‍යක්ෂවරයකු බවට යූ.එන්.පී. ආණ්ඩුව විසින් පත් කරන ලද්දේ සිරිමාගේ මල්ලී වූද උපාලිගේ මාමණ්ඩිය වූද සීවලී රත්වත්තේය. යූ.එන්.පී ආණ්ඩුව යටතේ ඔහුගේ ජාවාරම් දසඅත පැතිරෙන්නට වූයේ මෙසේය.

රජය එයාර් සිලෝන් ගුවන් සමාගම විසිරුවා හරින ලදී. රටේ අභ්‍යන්තර ගුවන් ගමන් උපාලි විජයවර්ධනගේ උපාලි ගුවන් සමාගමට ලබා දෙන ලදී. දැන් ඔහු ඔහුගේ දේශපාලන අභිමතාර්ථයන් ඉටු කරගැනීම සඳහා රුපියල් දස ලක්ෂ ගණන් යොදවා උපාලි පුවත්පත් සමාගම ආරම්භ කර ඇත. එමෙන්ම ඔහුගේ ව්‍යාපාරවලින් බදු නොගෙවා සිටීමට සියලු වරප්‍රසාද ඔහුට ලැබී තිබේ. මේ සියල්ලම යූ.එන්.පී. ආණ්ඩුවෙන් උපාලි විජයවර්ධනට ලැබුණු අනුග්‍රහයන්ය.

යූ.ඇන්.පී.ය මෙවර බලයට ආ විගසම උපාලි විජයවර්ධන දේශපාලනයට පිවිසෙන්නට උත්සාහ දැරූ බව නොරහසකි. ජේ. ආර්. ජනාධිපති වීම සඳහා බටහිර කොළඹ ආසනයෙන් ඉල්ලා අස් වූ විට උපාලි එම අසුනට නාමයෝජනා ඉල්ලූ බවද එකල ප්‍රකට විය. ඉන්පසුව කඹුරුපිටිය අසුන හිස් වූ විටත්, බද්දේගම අසුන හිස් වූ විටත්, කලවාන අසුන හිස් වූ විටත් ඔහු පාර්ලිමේන්තුවට ඒමට උත්සාහ කළ බව පැහැදිලිව පෙනෙන්නට තිබිණි.

මේ කිසිදු ප්‍රයත්නයක් හරි නොගියේ යූ.එන්.පී.ය තුළින්ම ඔහුට එරෙහිව මතුවූ විරුද්ධත්වය නිසාය.

මේ කාලය තුළ ඔහු කීප වතාවක්ම විදේශීය සඟරාවලට ප්‍රකාශ කර තිබුණේ තමාගේ අභිලාෂය පළමුව මුදල් ඇමැති වී පසුව ජනාධිපති වීම බවය.

උපාලි විජයවර්ධනම පවසන ආකාරයට ඔහු සිය ඇමැති මණ්ඩලයට ඇතුළු කර ගැනීමට ඔහුගේ මස්සිනා වන ජේ.ආර්. ජයවර්ධන ඉතා කැමැත්තෙන් බලාසිටී. එසේ ඇමැතිකමක් ගන්නවා නම් ඔහු කැමැතිම මුදල් ඇමැතිකම ලබා ගැනීමටය. මෙන්න මේ තත්ත්වය යටතේ දැනට සිටින මුදල් ඇමැතිවරයාත්, ඊළඟට ජනාධිපති වීමට බලා සිටින අගමැති ප්‍රේමදාස සමඟත් ඔහුට ගැටෙන්නට සිදුවීම ස්වාභාවිකය.

යූ.ඇන්.පී.ය තුළ ජයවර්ධන - විජයවර්ධන පවුලේ ආධිපත්‍යය අඛණ්ඩව පවත්වාගෙන යෑමට ක්‍රියා කිරීමේදී එයට විරුද්ධ කණ්ඩායම මෙහෙයවන එහි නියෝජ්‍ය නායකයා වන අගමැති ප්‍රේමදාසගේ දැඩි විරෝධයට මුහුණදීමට ඔහුට ස්වාභාවිකවම සිදුවනු ඇත.

මෙම සටනින් උපාලි දිනුවොත් යූ.එන්.පී.ය දෙකඩ වනු ඇත. උපාලි පැරදුණොත් ඔහු විසින් තවත් අලුත් ධනපති දේශපාලන පක්ෂයක් මුලපුරන්නට ඉඩ තිබේ. රුක්මන් සේනානායක ජේ.ආර්. සමඟ සටනින් පැරදී නව දේශපාලන පක්ෂයකට ඩඩ්ලි පෙරමුණ නමින් මුලපුරන ලද නමුත් අලුත් පක්ෂය සාර්ථකව ආරම්භ කර ගත නොහැකිව ඔහු නිහඬ වූ අයුරු කවුරුත් දනී. එහෙත් රුක්මන්ට කළ නොහැකි වූ දේ උපාලිට කළ හැකිද? උපාලි විසින් අලුත් ධනපති පාන්තික පක්ෂයක් හෝ ප්‍රේමදාස විසින් අලුත් ධනපති පාන්තික පක්ෂයක් හෝ ගොඩනැඟීම රඳා පවතින්නේ යූ.එන්.පී.යේ බල අරගලයේදී දිනන්නේ කවුද, පරදින්නෙ කවුද යන පැනය උඩය. පරදින පිල නව පක්ෂයක් ගොඩනැඟීම සඳහා උත්සාහ දරනු ඇත.

> **"මෙතෙක් මේ රට පාලනය කළ පවුල් කිහිපයකට එම පවුල්වල ආධිපත්‍ය පවත්වා ගෙන යෑමට උපකාරී වූ බලවේගවලින්ම තර්ජන එල්ල වී ඇත. පවුලේ පොදු යහපත තකා සිය පැරණි මතභේද අමතක කර දමා අලුත් තර්ජනයන්ට මුහුණදීමට එකතුවීමටත්, එක්සත් වී බලයේ සිටීමටත් ඔවුන්ට උත්සාහ දැරිය නොහැකිද? ඒ අනුව එජාප - ශ්‍රීලනිප පක්ෂ දෙකම දේශපාලන අනාථයන් බවට පත්වුවහොත් දෙගොල්ලන් එකතුවීමට වඩාත් ඉඩකඩ තිබෙන බව පැහැදිලිය."**

නමුත් හදිසි අහඹු සිදුවීම් විසින් දාම් පෙත මුළුමනින්ම අවුල් වී යෑමට ඇති ඉඩ අපට බැහැර කළ නොහැකිය. බලය සඳහා වන අරගලය දේශපාලනික සීමාවන්ගෙන් ඔබ්බට කවර ස්වරූපයක් ගනී දැයි නිශ්චිත අනාවැකි පළ කළ නොහැකිය.

මේ දිනවල යූ.එන්.පී.යේ නියෝජ්‍ය නායක අගමැති ප්‍රේමදාස රෝගාතුර වී ප්‍රතිකාර ගැනීම සඳහා ඇමෙරිකාවට ගොස් සිටී. ඔහුගේ රෝගය පිළිබඳවත් එහි ස්වභාවය පිළිබඳවත් රටේ නොයකුත් කට කතා පැතිර පවතී. ඒ පිළිබඳව සත්‍යය අපි තවමත් හරි හැටි නොදනිමු.

පාර්ලිමේන්තුව තුළත්, යූ.එන්.පී.ය තුළත් බල සම්පන්නව සිටින ප්‍රේමදාස පිල ප්‍රේමදාස අගමැතිවරයාගේ රෝගාතුර වීමත්, ඒ සමඟම උපාලි විජයවර්ධන දේශපාලනයට සක්‍රියව පිවිසීමත් සමඟ වෙනසකට, ක්ෂයවීමකට පාත්‍ර වේ දැයි කීමට තවමත් කල් වැඩිය.

කෙසේ වුවද මේ වනවිට යූ.එන්.පී.ය තුළ ආර්. ප්‍රේමදාස - උපාලි විජයවර්ධන අතර අභ්‍යන්තර අරගලය වඩාත් උණුසුම් වී තිබේ. එය යූ.එන්.පී.ය බිඳී යෑමකට තල්ලු වේද වෙනත් දිශානතියක් කරා යොමු වේද යන්න ගැන අවධානයෙන් සිටීම වැදගත් ය. මේ පිල් දෙකට ජාත්‍යන්තර අනුග්‍රහයද ඇති බව දේශපාලන විචාරකයන්ගේ මතයයි. මෙයින් ජයවර්ධන, විජයවර්ධන පාර්ශ්වය ඇමෙරිකාවේ අනුග්‍රහය ලබන අතර නියෝජ්‍ය නායක, අගමැති ආර්. ප්‍රේමදාසගේ පිල බටහිර ජර්මනියේ අනුග්‍රහය ලබන බව කියැවේ.

මේ තත්ත්වය යටතේ යූ.ඇන්.පී.ය තුළ බල අරගලයේ ස්වභාවය තේරුම් ගත හැකිය. අරගලය දැන් ඇරඹී තිබේ. කෙරීගෙන යයි. එහි අවසාන ප්‍රතිඵලය වනු ඇත්තේ කුමන පිල දිනුවත් පරදින පිලෙන් අලුත් ධනපති පන්ති පක්ෂයකි. මේ අනුව ඉක්මනින් ලංකාවේ ධනපති පක්ෂ ගණන හතරක් වීමටද ඉඩ තිබේ. ඇතැම්විට යූ.එන්.පී. නායකත්වයට පත් වීමට නොහැකි වුවහොත් උපාලි විජයවර්ධන තම නැන්දණිය වන සිරිමා බණ්ඩාරනායක සමඟ එකතු වේද යන පැනයද නොසලකා හැරිය නොහැකිය.

ශ්‍රීලනිපයටද මැතිවරණයට යෑමට නායකයෙක් නැත. හිටපු අගමැතිනි සිරිමා බණ්ඩාරනායකගේ ප්‍රජා අයිතීන් අහිමි කර තිබේ. ඊළඟට ඔවුන් අතර සිටි ප්‍රබලයා වූ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකගේද ප්‍රජා අයිතිවාසිකම් අහිමි වී ඇත. ඉලංගරත්න නියෝජ්‍ය නායකයා වුවත් කාගේ නායකත්වයෙන් මැතිවරණ කරනවා දැයි තවම සිරිමා කියන්නේ නැත.

උපාලි විජයවර්ධන ජේ.ආර් සමඟ හා අනුර සමඟ මෙන්ම සිරිමා සමඟද ගජමිතුරුය. ඔවුහු නෑයෝය. යාළුවෝය. එකම පන්තියේය. එකම අත්තේ වහන එකම වර්ගයේ කුරුල්ලෝය. සිරිමා පිල මැතිවරණයට නායකයෙක් නැති පක්ෂයක් හා උපාලි පක්ෂයක් නැති නායකයෙක් බවට පත්වුවහොත් ඇතිවිය හැකි ප්‍රතිඵලය පැහැදිලිය.


අනෙක් අතට මෙතෙක් මේ රට පාලනය කළ පවුල් කිහිපයකට එම පවුල්වල ආධිපත්‍යය පවත්වා ගෙන යෑමට උපකාරී වූ බලවේගවලින්ම තර්ජන එල්ල වී ඇත. පවුලේ පොදු යහපත තකා සිය පැරණි මතභේද අමතක කර දමා අලුත් තර්ජනයන්ට මුහුණදීමට එකතුවීමටත්, එක්සත් වී බලයේ සිටීමටත් ඔවුන්ට උත්සාහ දැරිය නොහැකිද? ඒ අනුව එජාප - ශ්‍රීලනිප පක්ෂ දෙකම දේශපාලන අනාථයන් බවට පත්වුවහොත් දෙගොල්ලන් එකතුවීමට වඩාත් ඉඩකඩ තිබෙන බව පැහැදිලිය.

කෙසේ වෙතත් උපාලි විජයවර්ධනගෙන් lanka guardian සඟරාව කළ සම්මුඛ සාකච්ඡාවකදී තමා ගරු කරන දේශපාලකයා කවුද කියා විමසූ විට ඔහු පවසා ඇත්තේ එස්. ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක බවය. දැනට යූ.එන්.පී කාරයකු වන උපාලි පිළිගන්නේ, ගරු කරන්නේ යූ.එන්.පී නායකයන් නොව ශ්‍රීලනිප නායකයාය.

මෙසේ වූයේ උපාලිත්, බණ්ඩාරනායකත් අතර ඇතැයි කියන පොදු සමානකම් නිසාද? එම සමානකම් මෙසේය. බණ්ඩාරනායක මෙන්ම උපාලිද මහා වතු හිමියෙකි. දෙදෙනාම අධිරාජ්‍යවාදීන්ට තදින් බැඳී සිටී. දෙදෙනාම ලොකුම පවුල්වලින් පැමිණි අයයි. දෙදෙනාම යූ.එන්.පී කාරයෝය. දෙදෙනාම තමන්ගේ වයසින් හරි අඩකට වඩා අඩු එනම් තමන්ට වඩා වසර 20කටත් වඩා අඩු වයස් ළාබාල තරුණියන් දෙදෙනෙක් සමඟ විවාහ වී සිටී. දෙදෙනාම මෙසේ විවාහ වූයේ රත්වත්තේලා දෙදෙනෙක් සමඟය. දෙදෙනාටම ඔස්කා වයිල්ඩ්ගේ නම ඈඳා පාර්ලිමේන්තුවේදී විරුද්ධවාදීන් කතා කියා තිබේ. නැතිනම් එම ප්‍රකාශය තුළ ඇත්තේ දේශපාලන රහසක් පමණක්ද.

මේ කුමක් වුවත් ධනපති පන්තිය පක්ෂ කොපමණ ගණනක් පිහිටුවූවත් ඒවා අතර හරයෙන් වෙනසක් නැත. ඒ හැම එකක්ම බංකොලොත් ධනපති ක්‍රමය පවත්වාගෙන යෑමට දිවුරා පොරොන්දු දී සිටී. හැබැයි එක්සත් ජාතික පක්ෂයට මුහුණ දෙනවාට වඩා බිඳුණු ධනපති පක්ෂ ගණනාවකට මුහුණදීමට සැබෑ වමට සිදුවන්නේ නම් එය නරකක් නොව ඉතා හොඳ දෙයකි.

■ උදේනි සමන් කුමාර



## කෝටි 12 කප්රුක

දිනුම් වාරය: 813 | වර්ණය: තැඹිලි
දිනය: 2022.01.27 | බ්‍රහස්පතින්දා

ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක

I 21 (සුපිරි අංකය) 09 45 50 51

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 සමඟ ඉංග්‍රීසි අක්ෂරය සහ සුපිරි අංකය | - | 207,489,397/- | - |
| අංක 4 සහ ඉංග්‍රීසි අක්ෂරය | - | 10,000,000/- | - |
| අංක 4 සහ සුපිරි අංකය | - | 5,000,000/- | - |
| ඕනෑම අංක 4 කට | - | 1,000,000/- | - |
| අංක 3 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 07 | 100,000/- | 700,000/- |
| ඕනෑම අංක 3 කට | 95 | 2,000/- | 190,000/- |
| අංක 2 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 217 | 1,000/- | 217,000/- |
| ඕනෑම අංක 2 කට | 5,523 | 100/- | 552,300/- |
| අංක 1 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 3,467 | 100/- | 346,700/- |
| ඕනෑම අංක 1 කට | 86,169 | 20/- | 1,723,380/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 15,078 | 20/- | 301,560/- |

දිනා ඇති මුළු මුදල රු. 4,030,940/-

මීළඟ සුපිරි ජයමල්ල රු. 207,782,143/-

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
ප්‍රතිඵල සඳහා වෙබ් අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47
දුක: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>KK යොදා 1919 ට යොමු කරන්න.
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න.

## සුපර් බෝල් (SUPER BALL)

දිනුම් වාරය 1637
දිනය 2022.01.27
වර්ණය කොළ
දවස බ්‍රහස්පතින්දා

ජයග්‍රාහී අක්ෂරය සහ අංක

W 02 17 21 42

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් ගණන | ත්‍යාග මුදල (රු.) | මුළු ත්‍යාග මුදල (රු.) |
|---|---|---|---|
| අංක 4 සමඟ ඉංග්‍රීසි අකෂරයට | - | 56,374,134.40 | - |
| අංක 4 කට | - | 1,000,000/- | - |
| ඕනෑම අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකෂරයට | 3 | 100,000/- | 300,000/- |
| ඕනෑම අංක 3 කට | 80 | 2,000/- | 160,000/- |
| ඕනෑම අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකෂරයට | 174 | 1,000/- | 174,000/- |
| ඕනෑම අංක 2 කට | 4,401 | 100/- | 440,100/- |
| ඕනෑම අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකෂරයට | 2,759 | 40/- | 110,360/- |
| ඕනෑම අංක 1 කට | 69,568 | 20/- | 1,391,360/- |
| ඉංග්‍රීසි අකෂරයට | 12,070 | 20/- | 241,400/- |
| මුළු ගණන | 89,055 | | 2,817,220/- |

දිනා ඇති මුළු මුදල රු. 2,817,220/-

ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.
ප්‍රතිඵල සඳහා වෙබ් අඩවිය: www.dlb.lk
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>SB යොදා 1919 ට යොමු කරන්න.
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න.

## ලග්න වාසනාව

දිනය : 2022-01-27
දිනුම් වාරය : 3349 | වර්ණය : දුඹුරු
සුපිරි ජයමල්ල රු. 2,636,906.60

දිනුම් අංක: 03 38 52 57 — මිථුන

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 ක් සහ ලග්නය | - | 2,636,906/- | - |
| අංක 4 ක් | 1 | 500,000/- | 500,000/- |
| අංක 3 ක් සහ ලග්නය | 37 | 10,000/- | 370,000/- |
| අංක 3 ක් | 373 | 1,000/- | 373,000/- |
| අංක 2 ක් සහ ලග්නය | 1,443 | 200/- | 288,600/- |
| අංක 2 ක් | 16,075 | 100/- | 1,607,500/- |
| අංක 1 ක් සහ ලග්නය | 18,067 | 60/- | 1,084,020/- |
| එක් අංකයට | 199,891 | 20/- | 3,997,820/- |
| ලග්නයට | 62,579 | 20/- | 1,251,580/- |
| මුළු එකතුව | 298,466 | | 9,472,520/- |

දිනා ඇති මුළු මුදල රු. 9,472,520/-

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් වලංගුවේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත. යුනියන් පෙදෙස, කොළඹ 2,
ක්ෂණික ඇමතුම් : 011 4 824 824
ප්‍රතිඵල ක්ෂණික ඇමතුම : 011 2 333 778
ස්වයංක්‍රීය තොරතුරු අංකය : 011 4 825 825

## ශනිදා (Shanida)

දිනය: 2022.01.27
දිනුම් වාරය: 3798
රතු
බ්‍රහස්පතින්දා

ජයග්‍රාහී අංක: 22 24 52 73 — ඉංග්‍රීසි අක්ෂරය: Q

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| ජය අංක 04 සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | - | 49,595,441.40 | - |
| ජය අංක 04ට | - | 1,000,000/- | - |
| ජය අංක 03ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 7 | 100,000/- | 700,000/- |
| ජය අංක 03කට | 96 | 2,000/- | 192,000/- |
| ජය අංක 02ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 189 | 1,000/- | 189,000/- |
| ජය අංක 02කට | 5,462 | 100/- | 546,200/- |
| ජය අංක 01ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 3,443 | 100/- | 344,300/- |
| ජය අංක 01කට | 85,779 | 20/- | 1,715,580/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 14,561 | 20/- | 291,220/- |

දිනා ඇති මුළු මුදල රු. 3,978,300/-

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02. දුරකථන: 0112 333 546-47
ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>SF යොදා 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න

## අද කෝටිපති (ADA KOTIPATHI) — කෝටි 5 ඇරඹෙන සුපිරි ජයමල්ල

බ්‍රහස්පතින්දා
දිනුම් වාරය: 1463
වර්ණය: තද නිල්
දිනය: 2022.01.27

ජයග්‍රාහී අංක: 13 21 36 71 — ඉංග්‍රීසි අක්ෂරය: U

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 සහ ඉංග්‍රීසි අකෂරය | - | 53,284,010/- | - |
| ඕනෑම අංක 4කට | - | 1,000,000/- | - |
| අංක 3ක් සහ ඉංග්‍රීසි අකෂරය | 2 | 100,000/- | 200,000/- |
| ඕනෑම අංක 3කට | 115 | 2,000/- | 230,000/- |
| අංක 2ක් සහ ඉංග්‍රීසි අකෂරය | 240 | 1,000/- | 240,000/- |
| ඕනෑම අංක 2කට | 6,023 | 100/- | 602,300/- |
| අංක 1ක් සහ ඉංග්‍රීසි අකෂරය | 3,774 | 100/- | 377,400/- |
| ඕනෑම අංක 1කට | 93,956 | 20/- | 1,879,120/- |
| ඉංග්‍රීසි අකෂරයට | 16,408 | 20/- | 328,160/- |

දිනා ඇති මුළු මුදල රු. 3,856,980/-

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න

## සංවර්ධන වාසනාව

දිනුම් වාරය : 480
පාට : නිල්
දිනය : 2022-01-27

ඉංග්‍රීසි අක්ෂරය: G — ජයග්‍රාහී අංක: 16 10 17 — දෛව අංකය: 6

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| ජය අංක 3 සමඟ දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | - | 11,438,924/- | - |
| ජය අංක 3 සමඟ දෛව අංකයට | - | 500,000/- | - |
| ජය අංක 3 සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | - | 100,000/- | - |
| ජය අංක 3ට | 5 | 50,000/- | 250,000/- |
| ජය අංක 2ක් සමඟ දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | 7 | 10,000/- | 70,000/- |
| ජය අංක 2ක් සමඟ දෛව අංකයට | 114 | 500/- | 57,000/- |
| ජය අංක 2ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 30 | 500/- | 15,000/- |
| ජය අංක 1ක් සමඟ දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | 137 | 200/- | 27,400/- |
| ජය අංක 1ක් සමඟ දෛව අංකයට | 3,369 | 100/- | 336,900/- |
| ජය අංක 2කට | 801 | 100/- | 80,100/- |
| ජය අංක 1ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 1,058 | 100/- | 105,800/- |
| දෛව අංකයට | 24,145 | 20/- | 482,900/- |
| ජය අංක 1කට | 26,805 | 20/- | 536,100/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 8,727 | 20/- | 174,540/- |
| එකතුව | 65,198 | | 2,135,740/- |

මීළඟ සුපිරි ජයමල්ල රු. 13,061,356/-

2022 ජනවාරි මස 29 වෙනි සෙනසුරාදා මීළඟ දිනුම් ඇදීමට වලංගු වන්නේ රතු පැහැති ටිකට් පත්‍රය. ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් වලංගුවේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත. යුනියන් පෙදෙස, කොළඹ 2,
දුරකථන: 011 2 333 546-47 ක්ෂණික ඇමතුම්: 0114 824 824
ප්‍රතිඵල ක්ෂණික ඇමතුම: 011 2 333 778
ස්වයංක්‍රීය තොරතුරු අංකය: 011 4 825 825

# බැසිල් කරන වැඩවලින් රාජපක්ෂලාට ළඟදීම ගෙදර යන්න වේවි

**සමගි ගොවි බලවේගයේ ජාතික සංවිධායක සජබ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී**

**නලින් බණ්ඩාර**



**සමගි ජන බලවේගයේ මේ වසරේ අලුත්ම සැලැස්ම මොකක්ද?**

විපක්ෂයෙ ප්‍රධානම බලවේගය විදිහට සමගි ජන බලවේගය දැන් පෙන්නුම් කරමින් ඉන්නෙ ඕනෑම වෙලාවක ආණ්ඩුව අරගෙන කරන්න පුළුවන් පක්ෂයක් විදිහට සජබ හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන්ම අද ගොවි ජනතාවගේ ප්‍රශ්නය දැවෙන ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. මේ ආණ්ඩුවට ගොවියාගේ ප්‍රශ්නයට උත්තරයක් නැහැ කියලා සමස්ත ජනතාවම දන්නවා. ගොවියගෙ ප්‍රශ්න හින්දා රටේ ආර්ථිකය කඩා වැටීමට හේතු වී තිබෙනවා. ගොවි ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටින්නට විවිධ පක්ෂ ඉදිරිපත් වී ඉන්නවා. හැබැයි සමගි ජන බලවේගය අරගලය විතරක් නෙමෙයි ගොවියා වෙනුවෙන් වැඩපිළිවෙළක් තියෙන පක්ෂයක් කියලා අපි 29 වැනිදා පොළොන්නරුවේදී සමගි ගොවිජන ප්‍රකාශනය එළිදක්වමින් රටට පණිවුඩයක් දෙනවා. ඒ නිසා අපි වැඩපිළිවෙළ ක් තියෙන පක්ෂයක්. සංවිධානාත්මක පක්ෂයක්. දක්ෂ කණ්ඩායමක් ඉන්න රටක් කරවිය හැකි පක්ෂයක් ලෙස අපි නොයෙක් ක්ෂේත්‍රවලදී ඉදිරියේදී පෙන්නුම් කරනවා.

**නමුත් සජබ මන්ත්‍රීන් කිහිපයක් අතර අසමඟියක් වර්ධනය වී තිබෙන බව පෙනෙන්න තිබෙනවා?**

එහෙම අසමඟියක් නෑ. අඩු වැඩි

## අපිට ඕනෑම වෙලාවක ආණ්ඩුව අරගෙන කරන්න පුළුවන්

වශයෙන් මන්ත්‍රීවරුන් ක්‍රියාකාරීත්වය දෙනවා. සියලුදෙනාටම පක්ෂය වගකීම් දීලා තියෙනවා. එහෙම ගැටලුවක් පක්ෂය තුළ නෑ.

**ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශන කතාවේදී සමගි ජන බලවේගය යම් වර්ජනය කිරීමක් තිබුණා. නමුත් සජිත් ප්‍රේමදාස මහතා එය වර්ජනය කළේ නැහැ. ඔහුගේ මේ මතය පිළි නොගන්න මන්ත්‍රීවරු පිරිසක් සභාවෙ නොසිටි බව ඔබ පිළිගන්නවද?**

කණ්ඩායම් රැස්වීමේ ගත් තීන්දුවක් වශයෙන් තමයි රාජාසන කතාවට සවන් දෙන්න සජබ තීන්දු කළේ. අපි රාජාසන කතාව සංවිධානාත්මක වර්ජනයක් කළේ නෑ. නමුත් බොහෝ දෙනෙක් පාර්ලිමේන්තුවට පැමිණෙනවා අඩුයි. මමත් පොඩි කාලයයි පාර්ලිමේන්තුවෙ හිටියේ මට එදින රාජකාරියක් තිබූ නිසා. ඒ අනුව සියලුදෙනාම එකතුවෙලා තමයි රාජාසන කතාවට සහභාගිවෙලා පසුගියදා විවාදයේදී ඒ කතාවට ප්‍රතිචාර දැක්වූයේ.

**නමුත් තේ පැන් සංග්‍රහය වර්ජනය කළා නේද?**

ඔව්.

**තේ පැන් සංග්‍රහය වර්ජනය කළාට ඔබලාගේ මන්ත්‍රීවරයෙක් වන කුමාර වෙල්ගම තේ පැන් සංග්‍රහයට සහභාගි වූ අයුරු අපි දුටුවා?**

කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා සජබෙන් ඡන්දය ඉල්ලුවත් එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායමක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. නමුත් 100%ක් සජබෙ අය තේ පැන් සංග්‍රහයට ගියෙ නෑ. සජබෙත් සන්ධානගත වූ අය ඉන්නවා. අපෙන් ගැලවිලා ගිය මුස්ලිම් මන්ත්‍රීවරු අපේ පක්ෂයෙ නෙවේ. අපෙන් ගැලවිලා ගිය ඩයනා ගමගේ අපේ පක්ෂයෙ නෙවේ. අපි සම්බන්ධ කරගත්ත අපේ ජනබල පක්ෂය. ඒ වගේම කුමාර වෙල්ගම මන්ත්‍රීවරයා ශ්‍රීලනිපයෙ කණ්ඩායමකුත් එක්ක අපේ

## අවුරුදු 2ක් දික් කරන්න නෙමෙයි අවුරුදු 2ක් කොට කළ යුතුයි

පක්ෂයට සම්බන්ධ වුණේ. 100%ක් සජබ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සජිත් ප්‍රේමදාස මහතා එක්ක එක මතයක එක ප්‍රතිපත්තියක ඉන්නවා.

**ඔබලා කුමන පක්ෂයක් නියෝජනය කළත් පොදුවේ විපක්ෂය හැටියට ජනතාව ඔබලා භාරගන්නෙ. එවැනි තත්ත්වයක විවිධ මතවල සිටීම, ආණ්ඩුවට හිතවත්කම් පෑම වැනි කාරණා පොදුවේ අවාසිසහගතයි නේද?**

කුමාර වෙල්ගම මහත්තයා ආණ්ඩුව එක්ක තේ බොන්න ගිය එක මම බරපතළ කාරණයක් විදිහට දකින්නෙ නෑ. සමහර විට එතුමා අපේ කණ්ඩායම් රැස්වීමට ඇවිත් නැතිව එතුමාට ඒ පණිවුඩය සන්නිවේදනය නොවුණු ප්‍රශ්නයක්ද දන්නෙ නෑ වුණේ.

**මන්ත්‍රිනි ඩයනා ගමගේ පාර්ලිමේන්තුවේදී යෝජනාවක් කළා කොවිඩ් නිසා ගෙවුණු වසර දෙක ජනාධිපතිවරයාට හා ආණ්ඩුවට ලබාදියයුතු බව. මේ යෝජනාව ඇය විසින් ඉදිරිපත් කිරීම ඔබ කොහොමද දකින්නෙ?**

මම කියන්නෙ ඉතිරි අවුරුදු දෙකත් මේ ආණ්ඩුවම කළ යුතුද කියලා ජනමත විචාරණයක් තැබිය යුතුයි කියලා. ඩයනා ගමගේ මහත්මිය පාර්ලිමේන්තුවේ

## රාජපක්ෂ පවුලට ආර්ථික කෙරුවාව හරියන්නේ නෑ

යෝජනා කරන්න තිබ්බෙ තව අවුරුදු දෙකක් ආණ්ඩුව දික් කළ යුතුයි කියලා නෙවේ තව අවුරුදු දෙකක් මේ ආණ්ඩුවම සිටිය යුතුද කියලා ජනමත විචාරණයක් කළ යුතුයි කියලා. ඩයනා ගමගේ මන්ත්‍රීවරියට ආයෙ පාර්ලිමේන්තුවට එන්න බැරි හින්දා වෙන්න ඇති ඒවගේ මනෝ මූලික දේවල් හිතන්නෙ. නමුත් රටේ ජනතාව පැහැදිලිවම බලාපොරොත්තු වෙන්නෙ ගෝඨාභය රාජපක්ෂ මහත්තයගෙ ඉදිරි අවුරුදු දෙක කොයි වෙලේ ඉවර වෙයිද කියලා. ඒ නිසා අවුරුදු දෙකතුන බලා ඉන්න බෑ. ඒ හින්දා ගෝඨාභය මහත්තයා තවත් මේ ජනාධිපතිකමට සුදුසුද කියලා උරගා බලන්න ජනමත විචාරණයක් තැබිය යුතුයි. ජනතාව කිව්වොත් ඒ අවුරුදු දෙක දෙන්න කියලා, එහෙම නම් දෙන්න. ජනතාව කිව්වොත් දෙන්න එපා කියලා ඉතිරි අවුරුදු දෙක භාරදීලා ගෙදර යන්න.

**ඔබට විශ්වාසද ජනමත විචාරණයකින් 69 ලක්ෂයක් වූ ජනතාවගෙන් බහුතරයක් මේ ආණ්ඩුව ප්‍රතික්ෂේප කරයි කියලා?**

කිසි ප්‍රශ්නයක් නෑ. ජනතාවගේ මතය බලන්නයි අපිට ඕනේ. ජනතාව දෙනවද නැද්ද කියලා ඊට පස්සෙ බලාගන්න පුළුවන්. ජනමතවිචාරණයක් තැබුවොත් ඔය 69 ලක්ෂයෙන් ලක්ෂ 6ක් හෝ ලක්ෂ 9ක් ඉතිරි වෙලා ඇති. මං කියන්නෙ නෑ ඉතිරි අපේ ගොඩට වැටිලා කියලා. හැබැයි ලක්ෂ හැටක්ම නම් කලකිරිලා ඉන්නේ කියලා අපිට විශ්වාසයි.

**එක්සත් ජාතික පක්ෂය ප්‍රධාන වශයෙන් පසුගියදා ගාල්ලෙන් සිය උද්ඝෝෂණ පටන් ගත්තා. එජාපය යම් පිම්මක් පනින්න ලෑස්ති බව පෙන්නුම් කළා. ඔබ මේ ගැන කොහොමද දකින්නේ?**

ඒක හොඳයි. ඔය එක්සත් ජාතික පක්ෂයට දෙතුන් සියයක්. එකතු කරල උද්ඝෝෂණයක් කරගන්න පුළුවන් ශක්තියක් තිබීම ගැන සතුටුයි. වැදගත් වෙන්නේ ඔය කවුරු කවුරුත් ආණ්ඩුවට විරුද්ධව සටන් කිරීම මිස ආණ්ඩුවට යටින් ඩීල් ගහන එක හෝ ආණ්ඩුව රකින්නේ නැතිව විපක්ෂයේ කාර්යභාරය සියලුදෙනා එකතු වෙලා කරනවා නම් ඉතා හොඳයි. නමුත් අපි දන්නවා ඔය වජිර අබේවර්ධන මහත්තයා වගේ අය. ඒ අය හොඳ නම්බර් එකේ ඩීල්කාරයෝ.

**වජිර අබේවර්ධන මහතා ගාල්ලේදී ප්‍රකාශ කළා නිශ්ශංක සේනාධිපති**

## මොළේ තියෙන ඕන කෙනෙක් කියන්නේ IMF යන්න කියලා

**ප්‍රේමදාස මහතා ඔබ අපේක්ෂා කරන ආකාරයට ඔබලාට නායකත්වය දීම සඳහා අද හොඳ තැනක සිටිනවා කියලා ඔබට විශ්වාසද?**

මෙහෙමයි, මම කියන්නේ නෑ 100%ක් සජිත් ප්‍රේමදාස මහතා සම්පූර්ණයි, අංග සම්පූර්ණයි කියලා. හැබැයි වර්තමාන දේශපාලනඥයන් අතර සජිත් ප්‍රේමදාස කියන්නෙ වසර ගණනාවක දේශපාලන අත්දැකීම් තිබෙන පුද්ගලයෙක්. එතුමා විපක්ෂ නායකවරයා විදිහට වර්තමානයේ කටයුතු කරමින් ඉන්නවා. එතුමාට වසර 30ක විතර ජනතාවගෙන් ලැබූ පන්නරය තිබෙනවා. ඒ නිසා මං හිතන්නේ එතුමා මේ රටේ නායකත්වයට, රට කරවීමට හැකි නායකයෙක් කියලා මට විශ්වාසයි.

**ඔහු කරන ඇතැම් ප්‍රකාශ පක්ෂයට අවාසි සහගත වන තැන් තිබෙනවා නේද?**

සජිත් ප්‍රේමදාස කියන්නේ සමහර නායකයො වගේ හැංගිලා ඉන්න නායකයෙක් නෙමෙයි. සමහර නායකයෝ කතා කරන්නෙ නෑ. සමහර නායකයෝ කවුරු හරි ලියලා දුන්න දෙයක් කියවන එක විතරයි කරන්නේ. අපි දන්නවනෙ ජනාධිපතිතුමා එදා ජාතිය අමතුවේ ටෙලිප්‍රොම්ටරය බලාගෙන. සජිත් ප්‍රේමදාස එහෙම කෙනෙක් නෙමේ. පැය 24ම ජනතාව සමඟ සිටිනවා. රටේ විවිධ ස්ථානවල ජනතාව අමතනවා. වැඩිපුර කතා කරනවා. වැඩිපුර වැඩත් කරනවා. එහෙම කතා කරනකොට විරුද්ධවාදීන් එතුමගෙ කතාවෙ කොටසක්, සම්පූර්ණ පින්තූරයකින් තොරව සංස්කරණය කරලා දානවා. විකෘති කරල දානවා. මේ ළඟදීත් එවැනි විකෘති කිරීමක් කර එතුමා මොකක්ද ඒකාධිපති වාදයක් ගැන කිව්වා කියලා පෙන්නුවා. ඒවා සම්පූර්ණ විකෘති කිරීම් විතරයි. සජිත් ප්‍රේමදාස මහතාට වෙන පහර ගහන්න දේවල් නෑ. එතුමා මිනී මැරුවා කියන්න බෑ. මිනිස්සු අතුරුදන් කළා කියන්න බෑ. විදේශ සංචාර ගිහින් රටේ ඩොලර් වියදම් කළා කියන්න බෑ. මෙතුමාට කියන්න පුළුවන් ටික තමයි ඔය කතා කෑල්ලක් අල්ලගෙන ඇඳුමක් හරි සපත්තුවක හරි ප්‍රශ්නයක් එහෙම නැත්නම් සංගීත භාණ්ඩයක් වාදනය කරන එකක් ක්‍රිකට් ගහන්න ගිය එකක් අල්ලාගන්න එක.

**සාමාන්‍ය මතයක් තිබෙනවා හරියට දේශපාලනය කරන දේශපාලනඥයා අනිසි විදිහට මුදල් උපයලා නෑ කියලා. සජිත් ප්‍රේමදාස මහතා 'හුස්මක්' ඇතුළු වැඩසටහන් කිහිපයක් යටතේ ජනතාවට මූල්‍යමය ප්‍රතිපාදන සලසනවා. ජනතාවට ප්‍රශ්නයක් තියෙනවා සජිත්ට කොහෙන්ද මෙච්චර සල්ලි කියලා?**

සජිත් ප්‍රේමදාස මහතා එක පැත්තකින් අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැටුපෙන් කොටසක් ඒ වැඩ කටයුතුවලට යොදා ගන්නවා. ඒ වගේම අපි දන්නවා අපේ දෙස් විදෙස් පරිත්‍යාගශීලීන් ඉන්නවා. ඔවුන්ගේ පරිත්‍යාග ලැබෙනවා. එතුමා දන්න ව්‍යාපාරිකයන් ඉන්නවා. දේශපාලන නායකයන් සාමාන්‍යයෙන් ව්‍යාපාරිකයෙක් ආවහම තමන්ගේ සාක්කුවට ඒ මුදල් කඩා වඩා ගන්නවා.

නමුත් සජිත් ප්‍රේමදාස මහතා යම් කෙනෙක් උදවු කරන්න ඉදිරිපත් වෙනවා නම් ජනතාවට තමයි ඒවා වියදම් කරන්නෙ.

**අගමැති මහින්ද රාජපක්ෂගේ ගිණුමෙන් උදිත් ලොකුබණ්ඩාර කෝටි ගණනක් ඇදලා තියෙනවා. දේශපාලනඥයො කොහොමද මෙතරම් මුදල් උපයන්නෙ?**

අපේ නෝනගේ ගිණුමෙන් රුපියල් එකොළොස්දාහක් කැපිලා වටේටම කෝල් කරනවා. ඊමේල් දානවා. අපි අපේ වැටුප වැටුණද කියලා මාසෙ අන්තිමට බලන් ඉන්නවා. ඒ නිසා මටත් තියෙන පුදුමෙ රුපියල් කෝටි හතරක් විතර අවුරුදු හයක් තිස්සෙ හොරකම් කරනකම් රාජපක්ෂ මහත්තයට නොදැනුණේ අර මහමුහුදෙන් පොල් ලෙල්ලක් ගියා වගේ. එතුමට ඒක නොදැනුණාට සමස්ත දේශපාලනඥයො එහෙම නෑ. ප්‍රශ්නෙ තියෙන්නෙ ලොකුබණ්ඩාර මහත්තයා හොරකම් කරපු එක නෙවේ. අවුරුදු හයක් තිස්සෙ හොරකම් කරපු එක මහින්ද මහත්තයට නොදැනුණු එක. හිතාගන්න පුළුවන් තරම.

**ඔබ හිතනවද සජබෙ ඉන්න ඔක්කොම හරි පිරිසුදු දේශපාලනඥයො කියලා?**

මට කියන්න පුළුවන් අද සජිත් ප්‍රේමදාස නියෝජනය කරන සජබෙ දේශපාලනඥයො මඩ ගාගෙන නැති, හොරකම් නොකරපු, දූෂණ චෝදනා නැති පිරිසක් කියලා. සජබෙන් එළියට එනකොට යම් යම් චෝදනා තිබ්බ අය තෝරලා බේරලා තමයි අපි සම්බන්ධ කරගත්තෙ. අපිට 100%ක්ම ගැරන්ටි කරන්න බෑ. ප්‍රශ්න තියෙන අයත් ඉන්න පුළුවන්. හැබැයි අධිකරණවල නඩු තියෙන චූදිතයො අපි ළඟ නෑ. නමුත් මට වගකීමෙන් කියන්න පුළුවන් 95%ක්ම සජබෙ ඉන්නෙ පිරිසුදු කණ්ඩායමක්.

**ඡන්දෙ කිට්ටු කර හෝ රනිල් වික්‍රමසිංහ මහතා නියෝජනය වන රවි කරුණානායක,**

## කබ්රාල් පුළුවන්නම් ඩොලරුත් අච්චු ගහවි

**එවකට ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට ලක්ෂ 5 බැගින් ඡන්දයට මුදල් දුන්න කියලා?**

මං දන්න තරමින් අපිට නම් සල්ලි දීල නෑ. වජිර අබේවර්ධන මහත්තයා යූ.එන්.පී. මන්ත්‍රීවරුන්ට සල්ලි දෙනවා කියලා සල්ලි අරන් එතුමගෙ සාක්කුවට දාගත්තද දන්නෑ. ඒ වගේ බඩු ඉන්නවා.

**රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ නව දේශපාලන ක්‍රියාකාරීත්වය ගැන ඔබට මොකද හිතෙන්නෙ?**

රනිල් වික්‍රමසිංහ මහත්මයා ගැන මට නම් තියෙන්නෙ දුකක්. එතුමා නිවැරදි තීන්දු තීරණ ගත්තා නම් එතුමා හරියට දේශපාලනය කළා නම් එතුමාට ලොකු වැඩක් කරන්න තිබුණා. නමුත් රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ කාලේ දැන් ඉවරයි.

**වික්‍රමසිංහ මහතා මුණ ගැහෙන්න පසුගිය දවස්වල සජබ මන්ත්‍රීවරු කිහිපයක් ගියා කියන කතාව සත්‍යයක් නේද?**

ඒ ගැන මම දන්නේ නෑ. හැබැයි රනිල්

## වජිර කියන්නේ නොම්මර එකේ ඩීල්කාරයෙක්

වික්‍රමසිංහ මහතා මුණ ගැහෙන්න ගියා කියලා ලොකු ප්‍රශ්නයකුත් නෑ. මොකද එතුමා අපේ හිටපු විපක්ෂ නායකයා.

**රනිල් වික්‍රමසිංහ මහතා හෝ සමගි ජන බලවේගය කියල කිව්වට ඔය සියලුදෙනාගේ ඔළු ගෙඩි ටික එකයි. පාර්ලිමේන්තු පුටු වෙනස් වුණත් හැබැයි මේ ඔක්කොම නැවත එකතු වීමේ ශක්‍යතාවක් තිබෙනවා නේද?**

අපිට එකතු වෙන එක ප්‍රශ්නයක් නැහැ. නමුත් කවුරු කවුරුත් අඩු තැනින් වැඩි තැනට එකතු වෙනවා මිස වැඩි තැනින් අඩු තැනට එකතු වෙන්නේ නෑ.

**සමගි ජන බලවේගයේ නායක සජිත්**

**වජිර අබේවර්ධන වැනි එජාප සාමාජිකයන් ඔබලාට එක්වීමට තීන්දු කළොත් කුමක්ද ගන්න තීරණය?**

අපි පක්ෂයක් ලෙස දැන් බොහෝ සංවිධානාත්මකව ශක්තිමත්ව සමගි ජන බලවේගය ගොඩනඟමින් ඉන්නවා. අනාගතයේදී අපේ පක්ෂයට යම් පුද්ගලයෙක් එක් වන්නේ නම් එය කිරලා මැනලා තීරණය කරනවා. පක්ෂ එක්ක අපි සන්ධානගත වෙනවා නම් පක්ෂයෙ අරයා එක්ක එන්න එපා, මෙයා එක්ක එන්න එපා කියලා කොන්දේසි දාන්න අපිට බෑ. නමුත් අපිට එක් වෙන පිරිස ගැන අපිට වගකීමක් දරන්න පුළුවන්.

## රනිල්ගේ කාලේ දැන් ඉවරයි

පක්ෂයක් එක්ක සන්ධානගත වෙනවා නම් එහි නායකයො හා ප්‍රධානියො ගැන බොහොම හොඳින් හොයා බලනවා.

**ජවිපෙ සමඟ එක්ව කටයුතු කිරීමක් ගැන ඔබේ පළාතේ සහෝදර ඇමැතිවරයෙක් වන දයාසිරි ජයසේකර විටෙක පැවසුවා. ඔබලාට එවැනි ඉලක්කයක් තියෙනවද?**

ජවිපෙටත් ඉලක්කයක් තියෙනවා. සජබෙටත් ඉලක්කයක් තියෙනවා. අපි දෙගොල්ලම නියෝජනය කරන්නෙ විපක්ෂය. ජවිපෙ හා එකඟ වෙන්න පුළුවන් තැන්වල අපි එකඟ වෙන්න පුළුවන්. එකඟ නොවෙන තැනුත් තියෙනවා. නමුත් මේ කවුරුත් තමන්ගේ දේශපාලන ව්‍යාපාරය ශක්තිමත් කරන්න තමයි බලාපොරොත්තු වෙන්නෙ. අපි විපක්ෂයේ පක්ෂ එක්ක එකට වැඩ කරන්න ලෑස්තියි. ඒක අපේ ඉලක්කයට බාධාවක් කරගන්නෙ නෑ. නමුත් කිසිසේත්ම සජබ තියෙන ඒ ශක්තිය පාවාදෙන සන්ධානවලට කිසිසේත්ම යන්නෙ නෑ.

**ගෑස් පිපිරුම් තවම සම්පූර්ණයෙන් සමනය වෙලා නෑ. මේකට ඇත්තටම දේශපාලනය සම්බන්ධයි කියලා ඔබ හිතනවද?**

අපිට නොයෙක් සැක සංකා තියෙනවා. එකක් තමයි ඩොලර් ප්‍රශ්නය එක්ක ගෑස් භාවිතය අඩු කරන්න කළ දෙයක්ද කියලා සැකයි. ලිට්රෝ සහ ගෑස් කියන සමාගම් දෙක තියෙනවා. සමහර සමාගම් පුම්බාගන්න ඕනෑ. සමහර සමාගම් මිලදී ගන්න වුවමනා වැනි අභ්‍යන්තර ගනුදෙනු තියෙනවා. ඒ වගේම අපිට තව තොරතුරක් ලැබිලා තියෙනවා අලුත් ගෑස් සමාගමක් රජයේ ප්‍රබලයන් සම්බන්ධව නිර්මාණය කිරීමට යන කතිකාව. ඒ ගෑස්

## ජනපති ගොවියන්ගෙන් සමාව ඉල්ලිය යුතුයි

සමාගමට වෙළෙඳපොළට පිවිසෙන්න අවශ්‍ය මංපෙත් විවර කිරීමක්ද කියලා සැක සහිතයි.

**ඩොලර් ප්‍රශ්නයද මීට මුලික?**

ඒක වෙන්නත් පුළුවන්. ගෑස් භාවිතාව අඩු කළාම ඒකට විසඳුමක්නෙ. ආණ්ඩුව ඒ වගේ පටු විදිහටනෙ හිතන්නෙ. ළිං මැඩි ආර්ථිකයක්නෙ ක්‍රියාත්මක කරන්නෙ.

**2020දී එළවළු හා පලතුරු ගෙන්වන්න ඩොලර් මිලියන 374කුත් 2021 ඩොලර් මිලියන 415කුත් රජය වියදම් කර තිබෙනවා. මේ වගේ දේවල් ගෙන්වන්න ඩොලර් තියෙනවා නම් ඉන්ධන වගේ අත්‍යවශ්‍ය දෙයක් ගෙන්වන්න ඩොලර් නැතිවෙන්නෙ කොහොමද?**

මේ ආණ්ඩුවෙ ආර්ථික කළමනාකරණයෙ තියෙන දුර්වලකම් අපි නිතරම කතා කරනවා. දැන් සහලුත් ඩොලර් වියදම් කරලනෙ ගෙන්වන්නෙ. මේගොල්ලන්ගෙ සමහර තීරණ දකුණු අත කරන එක වම් අත දන්නෙ නෑ. ඔළුව කරන එක කඳ දන්නෙ නෑ. මේ වගේ ප්‍රශ්න තියෙනවා.

**විදුලි අර්බුදය පිටුපස කුමන්ත්‍රණයක් තිබෙනවා කියලා විවිධ පාර්ශ්ව චෝදනා කරනවා. ඇත්ත ප්‍රශ්නය බලාගාර නොහැදීම හා නඩත්තු නොකිරීමද නැත්නම් ඩොලර් ප්‍රශ්නයමද?**

විදුලි අර්බුදයෙ ප්‍රශ්න කිහිපයක් තියෙනවා. වර්තමානයේ නම් මේ අර්බුදයට ප්‍රධාන හේතුව අප සතුව තිබෙන දැවිතෙල් බලාගාරවලට අවශ්‍ය සැපයුම් ප්‍රශ්නය. ඒකට ඩොලර් අර්බුදය තියෙනවා. අනෙක් එක නොරොච්චෝලේ බලාගාරයට අවශ්‍ය ගල් අඟුරු සැපයුම්. ඒකටත් ඩොලර් බලපාලා තියෙනවා. ඊට අමතරව අපේ ජනන සැලැස්මවල තිබුණු සමහර කාරණා දේශපාලනඥයන් විසින් කුරුටු ගාලා තියෙනවා. මං යහපාලන ආණ්ඩුවට කරන චෝදනාවක් තමයි යහපාලන ආණ්ඩුව සාම්පූර් බලාගාරයේ මෙගාවොට් 500 හදන ව්‍යාපෘතිය නතර කිරීම ගැන. ඒවගේම මේ ආණ්ඩුවත් නැවත ගල් අඟුරු බලාගාර හදන්නෙ නෑ කියන තීන්දුවෙ ඉන්නෙ. මගෙ මතය තමයි තව අපිට එක ගල් අඟුරු බලාගාරයක් හෝ දෙකක් තිබුණා නම් හොඳයි කියලා. මොකද අපිට සුනිත්‍ය බලශක්තිය ඒ කියන්නෙ සුළං හා සූර්ය බලශක්තිය මතම යැපෙන්න බෑ. ඒවට යෑමට තරම් ලොකු තාක්ෂණයක් අපිට තවම නෑ. අපිට අඛණ්ඩව විදුලිය ලබාදීමට ජලවිදුලි බලාගාරවලට අමතරව ගල් අඟුරු බලාගාර යම් ප්‍රමාණයක් තිබිය යුතුයි.

**විදුලි අර්බුදයේදී විෂය භාර ඇමැතිවරුන් දෙදෙනා එකිනෙකට පරස්පර කතා කියනවා. ඔවුන්ගේ අඬෝනා ජනතාවට අහන්න වෙලා. ගම්මන්පිල ඇමැතිවරයා කියනවා පයින් ගියොත් විදුලිය කප්පාදු නොකර සිටිය හැකි බව?**

ඔව්. ඉතින් ගම්මන්පිල මහත්තයටත් අද වෙලා තියෙන්නෙ "ගෙදර ගියොත් තෝ නසී. මඟ හිටියොත් අඹු නසී" වගේ දෙයක්. ආණ්ඩුවෙන් එළියට බහින්නත් බෑ. ආණ්ඩුව ඇතුළෙ ඉන්නත් බෑ. ඒ නිසා ගම්මන්පිල මහත්තයා කියන කතා නම් අද මිනිස්සු විශ්වාස කරන්නෙ නෑ. නමුත් මෙතන ඇත්ත හේතුව ආණ්ඩුවේ අසාර්ථක ආර්ථික කළමනාකරණය.

**ඔබලා විදුලි අර්බුදය ගැන බරපතළ චෝදනා නඟනවා. නමුත් මීට නිසි විසඳුමක් අවශ්‍යයි. මොකක්ද ඔබලා යෝජනා කරන විසඳුම? එක්කො ඩොලර් ණයක් ගන්න ඕනෑ?**

අපේ රජය කාලෙ එල්.එන්.ජී. බලාගාරය ටෙන්ඩර් කළා. නමුත් ඒකෙ නඩුවක් නිසා ඒක ප්‍රමාද වුණා. කඩිනමින්ම ඒ තාප විදුලි බලාගාරයේ කටයුතු නිම කිරීම ඉතා වැදගත්. ඒ වගේම අපිට අඛණ්ඩව විදුලිය සපයන්න නම් දැන් අප සතුව තියෙන නොරොච්චෝලේ බලාගාරයට අඛණ්ඩව ගල් අඟුරු සැපයීම කළයුතුයි. ඒවගේම කෙරවළපිටිය, කැලණිතිස්ස ඇතුළු බලාගාර ගණනක් තියෙනවා. ඒවට අඛණ්ඩව දැවිතෙල් ලබාදීමේ හැකියාවක් තියෙනවා. ඊට අමතරව අපේ ජනන සැලැස්ම අනුව බලාගාර කඩිනමින් සැකසිය යුතුයි. වර්තමානයේ තියෙන ප්‍රශ්නය මේ තියෙන බලාගාර ප්‍රමාණවත් නෑ. අපි අද විදුලිය කපනවා නම් කපන්නෙ බලාගාර මදි හින්දා නෙවේ බලාගාරවලට අවශ්‍ය ඉන්ධන ටික හෝ ගල් අඟුරු ටික නොලැබීම.

**මේ ප්‍රශ්නවලට දිගින් දිගටම රට පාලනය කළ සෑම ආණ්ඩුවක්ම වගකිවයුතුයි නේද?**

ඔයා බලන්න 1994 ඉඳලා අවුරුදු 28න් අවුරුදු 21ක් පාලනය කළේ වත්මන් පාලන කණ්ඩායම. එතකොට අවුරුදු හයයි මාස කිහිපයක් තමයි අපි පාලනය කළේ. මේ තැනට අපේ රට ගෙනාවෙ 1977 පටන් ගත් දැවැන්ත ආර්ථික වර්ධනය 1994න් පස්සෙ ගියෙ එක තැන පල්වෙවී. ඒ නිසා අපිට ඇඟිල්ල දික් කරලා හරියන්නෙ නෑ. මේ ඩොලර් හිඟය දෙස බැලුවම දකුණු ආසියාවෙ කිසිම රටක ඩොලර් සංචිත අඩුවෙලා නෑ. 2019 නොවැම්බර් 2021 නොවැම්බර් වෙද්දී පාකිස්තානයේ ඩොලර් සංචිත 48%කිනුත් ඉන්දියාවේ, බංග්ලාදේශයේ 37%කිනුත් මාලදිවයින, නේපාලය, භූතානය සියයට විසි ගණනකිනුත් යුද්ධයක් තිබුණු ඇෆ්ගනිස්තානයේ 14%කිනුත් වැඩිවෙලා තියෙනවා. අපේ ඩොලර් සංචිත 79%කින් අඩුවෙලා අවුරුදු දෙකක් තුළ. එහෙනම් කොවිඩ් ද බලපෑවෙ. මම මේ කතා කළේ යුරෝපයෙ හෝ ආසියාවෙ රටවල් ගැන නෙවේ දකුණු ආසියාවේ රටවල් ගැන. මේ පාලකයන්ගෙ ප්‍රශ්නයක් තියෙනවා.

**ආණ්ඩුව දිගටම මුදල් අච්චු ගහනවා. ඉන් උද්ධමනය ඉහළ යනවා. ගොවීන්ට වන්දි දෙන්න කියලා ආයෙ මුදල් අච්චු ගහනවා. ආර්ථිකය කොතැනින් නවතියිද?**

මේ ආණ්ඩුව ඩොලර් අච්චු ගහන්න පුළුවන් නම් ඩොලර් අච්චු ගහනවා. වෙලාවට ඩොලර් අච්චු ගහන්න බෑ. නිවාඩ් කබ්රාල් මහත්තයා කිව්වා ඩොලර් අච්චු ගැහුවට ප්‍රශ්නයක් නෑ කියලා. හැබැයි අද වෙනකොට රටේ උද්ධමනය වැඩිවීම අතින් 14 වැනි ස්ථානයේ ඉන්නෙ. ආහාර උද්ධමනය අතින් ලෝකේ 10 වැනි තැනටද කොහෙද ඇවිත්. මේ මුදල් අච්චු ගැසීම් වැරදි ආර්ථික ප්‍රතිපත්ති තුළ මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ. මේ රාජපක්ෂ පවුලට ආර්ථික කෙරුවාව හරියන්නෙ නෑ. ලෝකෙ මූල්‍ය ආයතන මේ ආණ්ඩුව පිළිගන්නෙ නෑ.

**යම් අවස්ථාවක ඔබ කියූ ආකාරයට ජනමත විචාරණයකින් හෝ ආණ්ඩු බලය ඔබලාගෙ පැත්තට කැරකී ආවොත් මේ අර්බුදවලින් ගොඩ එන්න කෙටිකාලීන සැලසුම් තියෙනවද?**

ප්‍රේමදාස මහතාගේ නායකත්වයෙන් අපේ ආර්ථික ප්‍රතිපත්ති, තීන්දු තීරණ ගන්නෙ අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා, ඉරාන් වික්‍රමරත්න, කබීර්

## අගමැතිගේ ගිණුමෙන් කෝටි ගාණක් ගියා කියන්නේ මහ මුහුදෙන් පොල් ලෙල්ලක් ගියා වගේ

හෂීම් මහත්වරුන්. වැදගත්ම දේ අපිට සිදුවෙනවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යෑම. රාජපක්ෂලා අපේ රටේ ණයවලින් 74%ක් වාණිජ ණය ගන්න තැනට පත් කළා. 2005න් පස්සෙ තමයි මේ වාණිජ ණය සෙල්ලම පටන් ගත්තෙ. මේවා අපිට ලෝකෙට ගිහිල්ලා, මූල්‍ය ආයතනවලට ගිහිල්ලා යම් කිසි විදිහට අපිට ණය ප්‍රතිව්‍යුහගත කරගෙන යම් සහන ගන්න වෙනවා. ඩොලර් හිඟය සමස්ත ජනතාවටම බලපානවා.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිය පසු අපට වන බලපෑම්වලට කොහොමද මුහුණ දෙන්නෙ?**

අපි ඕනෑ තරම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය අරන් තියෙනවා. සහන අරන් තියෙනවා. ආර්. ප්‍රේමදාස මහතා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහින් ජන සවිය ලබාදෙන්නත් අනුමැතිය ගත්තා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ආණ්ඩුව බය මූල්‍ය විනයක් නැති හින්දා සහ ආණ්ඩුවෙ තියෙන්නෙ පවුල් පාලනය.

**රනිල් - සජිත් දෙදෙනාගෙම අදහස් සමානයි නේද? දෙපැත්තට වෙලා චෝදනා කරගත්තට?**

රනිල් - සජිත් විතරක් නෙවේ මොළේ තියෙන ඕනෑ කෙනෙක් කියන්නෙ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න කියලා. ආණ්ඩුවෙ ගොඩක් අයත් කියනවා මේකට යා යුතු බව.

**කෘෂිකර්ම ඇමැති ප්‍රමුඛ ආණ්ඩුව කිව්වා වගා හානියක් වුණොත් අනිවාර්යයෙන් වන්දි ගෙවන බව, එසේ වන්දි ගෙවන්න වගා හානිය තක්සේරු කරන්න පුළුවන්ද?**

තක්සේරු කරනවා නම් කරන්න පුළුවන්. අපේ නිලධාරීන් ඉන්නවා. ප්‍රශ්නෙ තියෙන්නෙ මේ කියන තක්සේරුවට මේ කියන වන්දිය ප්‍රමාණවත්ද කියන එක. මේගොල්ලො කියන්නෙ වගා හානිය අනුව අපිට අහිමි වන වී කිලෝවට රුපියල් 25ක් දෙනවා කියලා. ගොවියා එක පැත්තකින් විශාල ආයෝජනයක් කරනවා. ඒ ආයෝජන මත මේ අස්වැන්න ලැබුණා නම් අද වී කිලෝව කිරන්නෙ රුපියල් 80ට 90ට. ඒ වෙනුවට රුපියල් 25ක් දෙනවා. වී ගොවිතැන විතරක් නෙවේ හැම කෘෂිකර්ම ක්ෂේත්‍රයක්ම හානිවෙලා ඉවරයි.

**ගොවීන් වෙනුවෙන් ඔබ ආණ්ඩුවෙන් ඉල්ලන්නෙ මොකක්ද?**

ජනාධිපති මුලින්ම කළයුත්තේ ගොවියගෙන් සමාව ඉල්ලීම. තමන්ගෙ වරද ජනාධිපතිගෙ කතාවෙන්වත් පිළිගත්තෙ නෑනෙ. තවම හරිත

## ආණ්ඩුවේ දකුණු අත කරන දේ වම් අත දන්නේ නෑ

කෘෂිකර්මය ගැන කියනවා. දෙවැනි කාරණය මහ කන්නයට බැරි වුණු එකේ යල කන්නයට වත් පොහොර ටික දෙන්න. පොහොර මෙට්‍රික් ටොන් ලක්ෂයක් වත් ඕනෑ යල කන්නයට. දැනට ආනයනය කරන්න පුළුවන් දහයෙන් එකයි. මේ අර්බුද එක්ක වල්නාශක, දිලීරනාශක ගෙන්වන ප්‍රශ්නය තියෙනවා. පොහොර ගෙන්වන්න ආණ්ඩුව අනිවාර්යයෙන් මැදිහත් විය යුතුයි.

**මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ රාජ්‍ය සේවකයාට රුපියල් 5,000 දීමනාවක් දුන්නා. මැතිවරණ කිට්ටු වෙලා තව දීමනා වැඩිකළොත් ජනතා මතයත් වෙනස් විය හැකියි නේද?**

අපේ රටේ මිනිස්සු ආණ්ඩුව නිසා ඇති තරම් බැටකෑවා. කොටින්ම කිව්වොත් කොළඹ හතේ කෝටිපතියටත් ගෑස් ටැංකිය ගන්න බැරිව පෝලිමේ ඉන්න වෙලා. රුපියල් 5,000ක් දීලා ආණ්ඩුවට ගොඩ එන්න බෑ. ඒ සහනය දෙද්දිත් 80%කට බර පැටවෙනවා. මුදල් ඇමැති කියනවානෙ රුපියල් බිලියන 229 කොහෙන්ද දෙන්නෙ. අය-වැයෙන් මුදල් වෙන්කරලත් නෑ. කෘෂිකර්ම ඇමැති තව රුපියල් බිලියන 40ක් ගැන කතා කරනවා. කොහෙන්ද සල්ලි, මං දන්නෙ නෑ මේ විදිහට සල්ලි අච්චු ගහලා නම් බැසිල් රාජපක්ෂ මහත්තයා මේ ආණ්ඩුව කරන්නෙ කියලා බැසිල් මහත්තයලට නොදැනීම ජනතාව පාරට බැහැලා රාජපක්ෂලා ගෙදර යවයි.

■ **සංවාදය - අනුරාධා හේරත්**

ඕනෑම දිරච්ච හාලක් දිස්නෙ ගහන්න හදනවා

ගිනි ගණන්වලට විකුණා මඩියත් තර කර ගන්නවා

වී කිලෝ දෙකහමාරකින් හැදුවායි කියා බොරුත් කියනවා





දේශීය සහල්ය කියා ඔබ අප වෙළෙඳපොළේදී මිලට ගන්නා සියල්ල මෙරට නිපදවන සහල්මද යන්න විමසන්නට වන තරමට මෙම සහල් මාෆියාව බලවත්ය.

"ඊයෙත් අපි නාඩු කිලෝවක් ගෙනාව වැඩි ගාණට. ඒවා හරි අමුතුයි. අපට හිතුණෙ හරිම අලුත් සහලක් වගෙයි. වෙනසක් හොයා ගන්න බැහැ. නමුත් පස්සෙයි අපට තේරුම් ගියේ. තොරතුරු ලැබුණා මේ සහල් ලංකාවේ නොවෙයි පිටරටින් ගෙනත් ලංකාවේ හාල් කියලා වැඩි ගාණට විකුණනවා කියලා. කඩකාරයො බොහොමයක් මේක දන්නවා. සමහරුන් දන්නේ නැහැ. වෙනස හොයා ගන්නත් බැහැ."

වෙළෙඳපොළේ සහල් මාෆියාවේ තවත් එක් ජවනිකාවක් පිළිබඳව පාරිභෝගිකයකු අපට කීවේ එවැනි කතාවෙකි. එසේනම් මොනවද මේ සහල? මොකක්ද මේ මාෆියාව? ඒ ගැන සොයන්නට 'මව්බිම' අපි රට පුරා පීරුවේ ඇති තතු හැබැහින්ම දැනගන්නටය.

අපට ලැබුණු තොරතුරුවලට අනුව මේ සහල් මාෆියාව ක්‍රියාත්මකව තිබෙන්නේ පසුගියදා සහල් ආනයනයට ඕනෑම අයකුට අවසරය ලබාදීමත් සමඟය. මහා පරිමාණ සහල් මෝල් හිමියන් දෙදෙනකු මීට සම්බන්ධ බවත් කියැවේ. එය සිදුවන්නේ කෙසේද? ජනතාව රවටන්නේ කෙසේද? පාරිභෝගිකයන් වෙනුවෙන් එය දැක්විය යුතුමය.

"මේ කෙරුවාව ඉතා හොඳින්, සිතා මතා පාරිභෝගිකයා රවටනා ගමන් තමන්ගේ මඩිය තර කර ගන්න කරන ගසාකෑමක්. සහල් පිටරටින් ගෙන්වන්න මේ වෙලාවෙ පුළුවන්කාරකමක් තියෙන්නේ බලවත් අයකුට පමණයි. ඒ අය අඩු මිලට පිටරටවලින් හාල් ගෙන්වනවා. ඒ ගෙනත් මෝල් ඇතුළෙදී මේවා හොඳින් සකස් කරනවා. ඒ කියන්නේ පොලිෂ් කරනවා කියලයි. එහෙම කළාම පරණ හාල් වුණත් හොයාගන්න බෑ. අමුතු දිස්නයක් තියෙනවා. ඕනෑම මිනිහෙක් රැවටෙනවා."

මේ කටයුත්ත හොඳින් සිදුවන බව දන්නා මෝල් ආශ්‍රිතව නම හෙළි කිරීමට අකැමැති වූ සේවකයෙක් අපට කීවේ එවැනි කතාවකි.

දැනගන්නට තිබෙන තොරතුරුවලට අනුව ඇතැම් සහල් මෝල්හිමියන් මුදල් යොදවා ව්‍යාජ සහල් ආනයනකරුවන් මඟින් සහල් ගෙන්වා ගන්නා අතර මේ වන විටත් එසේ ගෙන්වූ සහල් කන්ටේනර් 30ක් පමණ තිබෙන බවත් සැලවේ. ඒවා වරායෙන් පිටතටද මුදාගෙන තිබේ.

මාධ්‍ය වෙත අදහස් දක්වමින් ජාතික ගොවිජන සම්මේලනයේ සභාපති අනුරාධ තෙන්නකෝන් මහතාද මේ පිළිබඳව කරුණු දැක්වීමක් සිදුකර තිබේ.

සහල් වෙළෙඳපොළේ තොරතුරු දන්න වෙළෙන්දන් කියන්නේ මෙවැනි කතාවකි.

"මේවා නිකං මිනිසුන්ට කරන්න බැහැනේ. ඒකට බලයක් තියෙන මිනිස්සුම තමයි බහින්නෙ. මේගොල්ලෝ හාල් කොහෙන් හරි සල්ලි විසි කරලා ගෙන්නනවා. එහෙම කරලා තම තමන්ගේ තැන්වල රහසිගතව ඒ හාල් පොලිෂ් කරනවා. පාරිභෝගිකයාට නොදැනෙන්න, විශ්වාසය ඇතිවන විදිහට තම තමන්ගේ වෙළෙඳ නාමය සහිත උරවල දාලා ලංකාවේ වී වලින් හදා ගත්ත හාල් වගේ විකුණනවා. ඒකත් ඒ අය තීරණය කරන මිල ගණන්වලට. මේවා ගොඩක් අය දන්න දේවල්. ඇස් කන් නැති ගානට වෙන්න දීලා බලාගෙන ඉන්නවා. මිනිස්සු මේවා දන්නේ නෑනේ. අතේ මිටේ නැති වුණත් කනකර තියලා හරි ළමයින්ට කන්න දෙන්න ඕනනෙ. ඉතිං හුල්ල හුල්ල වැඩි මිලට හරි හාල් ගන්නවා. හැබැයි ඒ සමහර හාල් ලංකාවේ නෙවෙයි. හැබැයි හාල් ගෝණියේ නම තියෙන්නේ ලංකාවේ හාල් කියලයි."

මෙම ජවනිකාවේ ඇති තවත් කොටසක් නම් ඇතැම් හාල් මෝල් හිමියන් රඟ දක්වන නාට්‍යයට අනුව ඔවුන් මේ සහල් මිලදී ගන්නවා යැයි කියන්නේ ගොවීන් ළඟටම ගොස් රුපියල් 90කටය. නැතිනම් ඊට ආසන්න මිලකටය. රු. 90ට ගත්ත එකා රු. 90ටම හාල් දෙන්නේ නැත. ඒ අනුව මිල හදන්නේ ඔවුන්ගේ අභිමතයටම අනුවය. ගොවීන්ගෙන් වී මිලට ගන්නවා යැයි කියන මේ උන්දැලා එම නාටකය සාධාරණීයකරණය කරවන්නට හාල් කිලෝවක් සකස් කිරීම වෙනුවෙන් වී කිලෝ එකයි හයක් වැයවන බවත් කියති.

මේ සියල්ල නිර්මාණය වූයේ ආණ්ඩුව හිතුවක්කාර විදිහට කාබනික පොහොර යොදාගෙන හදිසියේම කෘෂි විප්ලවයක් කරන්නට යෑම නිසාවෙන් බව ගම්මට්ටමේ සිටින ගොවියාටම තේරී අවසන්ය. ලෝකයේ එවැනි දෑ සිදුකර අත්දැකීම් තිබෙන මිනිසුන් මඟ හැර කාගෙන් උපදෙස් ගෙන මෙහෙවි තීන්දු ගත්තා දැයි ජනතාව ප්‍රශ්න කරන තරමට සහල් අර්බුදය ඔඩුදුවා අවසන්ය.

කාබනික පොහොරත්, රසායනික පොහොරත් මුසු වුණ ක්‍රමවේදයක් ඔස්සේ ගොස් එයට ගැළපෙන ක්‍රමයක් වඩාත් වාසිදායක ලෙස හදාගන්නවා වෙනුවට මෙවැනි හිතුවක්කාර තීන්දු නිසා ගොවිතැන් බත් කළ ගොවියා අන්ත අසරණව ඇත. වෙළෙඳපොළෙන් දේශීය සහල් අස්වැන්න අඩු වෙද්දී රටින් සහල් ගෙන එන යෝජනාව සම්මත වී ඇත. මේ නිසා ගොවියාත් නැත්තටම නැති වී පාරිභෝගිකයාත් දෙස් දෙවොල් තබන තැනට අසරණ වී අවසන්ය. සහල් හිඟය නිසා සහල් ගෙන්වන්නට තල්ලු කළ බලවේග කවුරුන්දැයි හෙළි නොවෙතත් මෙය ඉල්ලාගෙන හදාගත් එකක් බැව් කාටත් තේරුම් ගොස් අවසන්ය.

එදත්, අදත් මේ මාෆියාවෙන් හොඳ හැටි හම්බ කර ගන්නා මෝල් හිමියන්ට සහල් ආනයනය කරන්න අවසර ලැබුණේ යැයි කීම තුළ මතුව ඇත්තේ හංගලා ගහන ගැහිල්ලකට අවස්ථාවක්ය. ඒ අනුව කොහේ හෝ රටක දිරච්ච හාලක් අඩු මිලට ගෙනැවිත් ඒවා පොලිෂ් කර ලොකු ගාණකට අපේ රටේම හදපු සහල් යැයි කියා විකුණන්නට පාර කපා ඇත. එම සහල් ආනයනයට මේ කියන මහ පරිමාණ ජාවාරම්කාරයන්ට ඩොලර්ද හිඟයක් නැති බව පෙනෙයි.

මේ අනුව මිලදී සකසමින් සහල් කිලෝවක් නිපදවන්නට රුපියල් 145ක් හෝ 150ක් දැරීමෙන් පසු නාඩු කිලෝවක් වෙළෙඳපොළට මිල කරන්නේ රු. 175ක් හෝ රු. 180ක් වැනි මිලකටය. කතාවේ හැටියට එය සාධාරණීයකරණය කරන්නේ එහෙමය. "හරි අමාරුවෙන් තමයි ඔය තරමටවත් හාල් ටික දෙන්නේ" වැනි කතා හරිම දුක්බර සේය.

මේ කූට හැසිරවීම හා මාෆියාව හොඳින් දන්නා බලධරයෝ බොහෝය. ඇතැමුන් ජනතා නියෝජිතයන්ය. ඇතැමුන් ඥාති මිත්‍රාදීන්ය. බලය ඇත්තෝය. කෙරුමෝය. මේ දේ මෙසේ සිදුවීම වළක්වන්නට උත්සාහ නොකර ඔහේ බලා සිටින්නෝ බොහෝය. කවුරු කවුරුත් දෑස් පියාගෙන සිටිද්දී පාරිභෝගිකයෝ හුල්ල හුල්ලා මහමඟය. කඩපිල්වලය. උන්ගේ පසුම්බියට විදින උන්දැලා යහතින්ය.

■ සුලක්ඛන ජයවර්ධන

# අම්මා එක්ක වෛර බැඳගත්ත දුවගේ සිතට වධ දුන් රහස?



මවුපියන් හා දරුවන් අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවකි. එය එසේ කීවාට වයසින් වැඩෙත්ම ඔවුන් ලබන අත්දැකීම් හා ඇසුර මත එම බැඳීම් පලුදු විය හැකිය. බිඳී යෑම්, සිත් රිදීම්, අත්හැර දැමීම්, බැන වැදීම්, ප්‍රතික්ෂේප කිරීම් ඇති වන්නට පුළුවන.

"මගේ දුවට වයස අවුරුදු 14යි. දැන් එයාගෙ හැසිරීම හරිම වෙනස්. නිතරම කේන්තියෙන් පුපුරනවා. පාසල් වැඩවලට තිබුණු උනන්දුවත් අඩු වෙලා. මාත් එක්ක තමයි වැඩියෙන්ම කේන්ති ගන්නෙ. මේ දරුවා හැසිරෙන්න හදන්නෙ තරුණ වැඩිහිටි කෙල්ලක් වගේ. අඳින්න පලඳින්න උත්සාහ කරන්නේ හරිම විලාසිතාවලට. වයසට නොගැළපෙන විදිහට තමයි හිතන්නෙ... මැදිවියේ ගුරුවරියක් ඇගේ දියණිය ගැන කියූ කතාවය.

මේ දියණිය සජිනිය. ඇයට බාල තවත් සොහොයුරෙකි. ඇගේ පියා පෞද්ගලික අංශයේ කර්මාන්තශාලාවක සේවය කරයි. පියා හා සොහොයුරා සමඟ ඈ ඉතා සුහදය. නමුත් මව නොරුස්සයි. නිතර කේන්ති ගනියි. එයට හේතුව සජිනිටද නොතේරෙයි. මව සජිනිට දැඩිව ආදරය කරයි. අවශ්‍ය සියලු දේ ඉටුකර දුන්නද සජිනි ඇය ප්‍රතික්ෂේප කරයි.

බැලූ බැල්මට ඈ හැඳ පැලඳ සිටින්නේ හොඳ තරුණියක සේය. ඇය තොල් සායමින් හා නිය ආලේපනයෙන් ඇගේ රුවට සුන්දරත්වයක් එක් කරගෙනද තිබේ. ඈ මනෝ චිකිත්සකවරයා හමුවට පැමිණියේ ඇගේ අම්මාත් සමඟමය. ඔහු ඉතා ආදරයෙන් සජිනිගේ වතගොත ඇය සමඟ කතාබහ කිරීමට උත්සාහ කළේ ගැටලුවට පිළියම් සොයා ගැනීමටය. පාසලේදී පළමු, දෙවැනි වසරවලදී ඉතා උනන්දුවෙන් වැඩ කටයුතු කළද තුන්වැනි පන්තියේ සිට එම උද්‍යොගය අඩපණ වූ බව අම්මා පවසන්නීය. එතැන් සිට ටිකින් ටික මව කෙරෙහි දැඩි වෛරයක්, කෝපයක් ඇති වී ඇත. මව පවසන සෑම දෙයකම වරදක් දකින ඇය ඒවා ප්‍රතික්ෂේප කරයි. මව තමාට බොහෝ ආදරය කරන නිසා කිසි දින වරදක් සිදු නොකරන බවත් ඇය දනී.

එහි අහුමුලු දිගහරින ලද්දේ ඇගේ මව විසිනි. සජිනිගේ පියා හදිසි අනතුරකට ලක් වූ එක්තරා කාලයක එම වැඩපළේම සිටි අවිවාහක වැඩිමහලු පුද්ගලයකු නිතර නිවසට පැමිණ ඇත්තේ සජිනිගේ පියාගේ අවශ්‍යතාවන් සොයා බැලීමටය. මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර වැඩිමහලු අහිංසක පෙනුමැති පුද්ගලයකු නිසාත් අසරණ අවස්ථාවේ උදවු ලබාදෙන නිසාත් කෙටි දිනකින්ම පවුලේ අයකු තරමට ඔහු ළං විය. දරු දෙදෙනාටම ඔහු ඉතා ආදරය කළේය. දෙන්නා දෙමහල්ලන්ට ඔහු පිළිබඳව කිසිදු සැකයක් ඇති වූයේද නැත. එහෙත් යම්කිසි අවස්ථාවකදී සජිනිට ඔහුගෙන් යම් අකටයුත්තක් සිදු විණි. සජිනි අම්මාට ඒ පිළිබඳව පැවසුවද ඇය ඒ අවස්ථාවේ හැටියට එය එතරම් බැරෑරුම් දෙයක් සේ නොසලකා තිබිණි. පියාගේ තත්ත්වය හා අවට සමාජයෙන් ඇතිවිය හැකි බලපෑම අවම කර ගැනීම සඳහා ඇය දියණියට අවවාද කොට තිබුණේ එම සිදුවීම කාටවත් නොපවසන ලෙසය. නමුත් එම පුද්ගලයාට නැවත නොපැමිණෙන ලෙස මව විසින් තරයේ අවවාද කෙරිණි. එයින් පසු කිසිදාක ඔහු යළි පැමිණියේ නම් නැත.

සජිනිගේ මනස වෙනස් වීමට බලපා තිබුණේ එම සිදුවීමය. එහෙත් සජිනි මවගෙන් බලාපොරොත්තු වූයේ ඊට වඩා වෙනස් ආකාරයේ වෙනස් ප්‍රතිචාරයකි. අම්මා උගත් කාන්තාවකි. ඒ නිසාම ඇය ක්‍රියා කොට තිබුණේ එම අවස්ථාවට අනුවය. එහෙත් කුඩා සජිනි එය තේරුම් ගැනීමට තරම් මුහුකුරා ගිය බුද්ධියකින් යුක්ත නොවූවාය.



මේජර් සුසන්ත ද සිල්වා

ඒ නිසාම ඇගේ මනස යම් පසුබෑමකට ලක්ව අම්මා කෙරෙහි අර විධියේ විරෝධයක් ගොඩනඟාගෙන තිබිණ. ඒ සිදුවීම වූ කාලයේදීම ඇය යම් මානසික උපදේශනයක් හරහා පුනරුත්ථාපනයට ලක්වූයේ නම් වර්තමාන තත්ත්වය ඇතිවීමට ඉඩ නොතිබිණි. දියණියගේ සිතෙහි මව කෙරෙහි ඇති වූ නොරිස්සුම පසු කලෙක කෝපයක් බවට පත්ව තිබිණි. අර පුද්ගලයාගේ වැරැදි ක්‍රියාව හරහා ලැබූ අත්දැකීම ළමා සිතේ පැලපදියම් වූයේ අසුබවාදී විධියටය.




"දරුවකු යම් අවස්ථාවකදී සුළු හෝ අපයෝජනයකට ලක් වුවහොත් ඒ සඳහා සුදුසු පුනරුත්ථාපනයක්, උපදේශනයක් නොලදහොත් දරුවාගේ මනස තුළ ඇතිවන පීඩනය මේ ආකාරයෙන් පිටවිය හැකිය. දරුවකු බොහෝවිට අපයෝජනයට ලක්වන්නේ පවුලට ඉතා සමීප අයගෙනි. එසේ හැසිරෙනු ලබන බොහෝ වැඩිහිටියන්ගේ තත්ත්වයද ඉතා අභාග්‍යසම්පන්න වේ. බොහෝවිට ඔවුන්ද කුඩා කල අපයෝජනයන්ට ලක්වූ අයයි. එසේ නැතහොත් යම් මානසික අක්‍රමිතාවන්ට හෝ ලිංගික අපගමන චර්යාවලින් පෙළෙන රෝගීන්. සත්‍ය වශයෙන්ම මෙම වැඩිහිටියන් පුනරුත්ථාපනය කළ යුතුයි."

මේ අයුරින් තත්ත්වය පැහැදිලි කළේ මනෝ චිකිත්සක මේජර් සුසන්ත ද සිල්වාය. ඔහු යුද හමුදාව තුළ කාලයක් තිස්සේ යුද සමයෙන් පසුවත් මනෝ උපදේශනයේ හා ධනාත්මක දේශනවල යෙදෙන පළපුරුදු මනෝ චිකිත්සකවරයෙකි. සජිනිට පමණක් නොව ඇගේ මවටද මනෝ විද්‍යාත්මක උපදෙස් ඔහුගෙන් ලැබිණි. සජිනි සඳහා විශේෂිත වූ මනෝ ප්‍රතිකාර සැසි කිහිපයක් පවත්වන ලදී. ක්‍රමයෙන් දියණිය යථා තත්ත්වයට පත් වූහ. ඇය තරුණ වයසට ගැළපෙන ආකාරයට හැසිරෙමින් තම මව සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් අධ්‍යාපනයෙහි යෙදෙයි. 0727307581 දුරකථන අංකයෙන් ඔබට මේජර් සුසන්ත ද සිල්වා සමඟ සම්බන්ධ විය හැකිය.

■ සවනි ශේෂාධි









# ආරක්ෂක නිලධාරී ඇබෑර්තු

කොළඹ ප්‍රමුඛ පෙලේ සමූහ ව්‍යාපාරයක් වන අප ආයතනයේ ආරක්ෂක සේවය පුළුල් කිරීම සඳහා දිවයිනේ සියලුම ප්‍රදේශ වලින් වයස අවු. 60ට අඩු පුද්ගලයින් වහාම බඳවාගනු ලැබේ.

දීමනා සහිත අවම මාසික වැටුප රු.40,000/- ඉක්මවනු ඇත.
ඊට අමතරව නවාතැන් පහසුකම්, නිල ඇඳුම්, රක්ෂණ ප්‍රතිලාභ, පැමිණීමේ දිරි දීමනා, සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් සාමාජිකත්වය හා ආරක්ෂක සේවාවන්ට අදාළ වෙනත් වරප්‍රසාද හිමිවේ.

අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, ජීවදත්ත තොරතුරු හා අයැදුම් පත්‍රය සමඟ
සතියේ දින වල
සම්මුඛ පරීක්ෂණ සඳහා පෙ.ව. 9.00 ප.ව. 04.00 අතර
ආරක්ෂක කළමණාකරු හමුවන්න.

APOGEE
ඇපජී සිකියුරිටි පුද්. සමාගම,
99/6, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07.
දුරකථන: 0777 350 035


C M Y K

### දියතරිප්පු කණ්ණාඩිවල අරුමය

### ඉන්දියාවේ වීදුරු ගල්වලට වඩා වටිනා දෙයක්

## බුවනෙකබා රජුට සෙල් ලිපි කියවන්න

# තිරුවාණා ගල්වලින් උපැස් හදපු පරපුර



ගාන ලද පළිඟු ගල් (වැඩ අවසන් වෙමින් පවතින)

අතීතයේ විසූ අපගේ මුතුන් මිත්තන් වැලි මිරිකා වතුර ගත් පිරිසක් යැයි ජනප්‍රවාදයේ සඳහන් වේ. එසේ ඔවුන් හඳුන්වන්නට ඇත්තේ ඔවුන් සතුවූ සුරු විරුකම් මෙන්ම නිර්මාණශීලිත්වය නිසා විය යුතුය. වර්තමානයේද ඒ බව සනාථ වන සාධක බොහෝමයක් ජීවමාන ලෙස දැකිය හැකිය.

වරෙක කටුවෙන් හා මිටියෙන් ගල් තලාවක සඳකඩපහණක් අඳින ඔවුන් තවත් අවස්ථාවක මහා ගිරිකුළක ජීවමානවත් වූ බුදුරුවක් නිර්මාණය කරන්නේය. එවන් වූ පරපුරකින් පැවැත එන අපූරු මිනිසකු සොයා 'මව්බිම' අපි පසුගිය දිනක මහනුවර, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 'කිරිවවුල' කහඹේ නම් ග්‍රාමයට පිවිසුණෙමු.

නමින් සී. ජී. ගුණසෝම වන මේ සාම්ප්‍රදායික කර්මාන්තකරුවා තිරුවාණා ගල් වීදුරු බවට පත් කිරීමේ දක්ෂයෙකි. දිවයිනේ කිසිදු තැනක නොමැති, ගුණසෝම පරපුරට පමණක් උරුම මේ කර්මාන්තය දියතරිප්පු කණ්ණාඩි කර්මාන්තයයි. ඔවුන් පවසන්නේ ලෝකයේ මෙවැනි කර්මාන්තයක් නැතැයි යන්නය.

ගම්පොළ රාජධානි සමයේ රජ කළ හතර වැනි බුවනෙකබාහු රජතුමන් විසින් ගුණසෝම මහතාගේ මී මුත්තන්ට මේ කර්මාන්තය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදී ඇත. අතීතයේ ගඩලාදෙණිය, ඇම්බැක්ක, ලංකාතිලක ප්‍රදේශවල සංචාරය සඳහා පැමිණි රජතුමාට සෙල් ලිපි කියවීමට අපහසු බැවින් අතීතයේ සිටි ගුණසෝම පරපුරේ ඇත්තකු රජතුමාට දියතරිප්පු උපැස් යුවළක් තනාදී තිබේ.

"බුවනෙකබාහු රජතුමාට කණ්ණාඩිය හදලා දුන්නේ අපේ මුත්තා කෙනෙක්. පස්සේ රජතුමා අපේ පරම්පරාවට මේ




කර්මාන්තය සන්නසකින්ම පැවරුවා. ඒ විතරක් නෙවේ, එතුමා අපිට ගම්වරයක්ද ලබා දුන්නා. ප්‍රමාණය අද කාලේ විදිහට අක්කර 16ක් විතර."

**බුවනෙක බාහු සිවුවැනි මහ රජ දවස**
**කිරුළක අගමිනක් සාදා දී හිසට**
**සිරිලක පවතින්නට අප පරපුර**
**වෙතෙස**
**හසුනක ලියාදුණි සිළුමිණි තම සතොස**

ලෙස එම සන්නසේ ගුණසෝම පරපුරට 'සිළුමිණි' නාමය ලබාදී ඇතැයි ගුණසෝම මහතා අප සමඟින් පැවැසීය. එදා සිට අද දක්වා දියතරිප්පු ඇස් කණ්ණාඩි කර්මාන්තයේ යෙදෙන්නේ ගුණසෝම පුරපුරෙන් පැවැත එන ඇත්තන් පමණයි. එය පිළිමතලාව, කිරිවවුලට ආවේණික වූවක් ලෙස කියැවේ.

ලෝක ඉතිහාසය දෙස බැලීමේදී ඇස් කණ්ණාඩි හෙවත් උපැස් යුවළේ ඉතිහාසය 13 වැනි සියවස දක්වා දිවයන්නකි. ඉතාලි ජාතිකයකු මේ කර්මාන්තයේ පුරෝගාමියකු වූ අතර පසුකාලීනව බෙන්ජමින් මාටින් නමැත්තා අංගසම්පූර්ණ, උපැස් යුවළක් නිෂ්පාදනය කළ බව කියැවේ. කණ්ණාඩි රාමු සඳහා ලී, ලෙදර් රාමු, ඇතැම් විට සත්ත්ව අං යොදා ගත් බව සඳහන් වේ.

"අපි කණ්ණාඩි වීදුරුවට ගන්නේ පළිඟු ගල්. මේවා හුඟක් අමාරුයි දැන්



කණ්ණාඩි නිෂ්පාදනය සඳහා භාවිත කරන උපකරණ

සොයා ගන්න. මැණික් පතල්වලින් තමයි. අඩි දෙසීය, තුන්සීය ගැඹුරෙන් තමයි හම්බවෙන්නේ."

සී. ජී. ගුණසෝම මහතා දියතරිප්පු කණ්ණාඩි පරපුරේ අට වැනි පුරුකයි. ගුණසෝම මහතාට මේ ශිල්පය දී ඇත්තේ ඒ මහතාගේ පියා වන සියදෝරිස් හාමි ශිල්පියාය.

"මම මේ කර්මාන්තය ඉගෙනගන්න පටන් ගත්තේ වයස අවුරුදු පහේදී විතර. මගේ සීයලා, තාත්තලා වැඩ කරන විදිහ බලා ඉඳලා. තාත්තාගෙන් ඉගෙනගත්තේ වැරදි වුණහම ටොකු කාලා. අද මගේ දරුවෝ දෙන්නටත් මේ කර්මාන්තය මම උගන්වමින් ඉන්නවා."

1962 වර්ෂයේ පිළිමතලාව, කිරිවවුල ගුණසෝම මහතාගේ නිවෙසේ දියතරිප්පු කණ්ණාඩි නිෂ්පාදන කර්මාන්තශාලාවක් පවත්වාගෙන



සී. ජී. ගුණසෝම මහතා

ගිය බව ගුණසෝම මහතා පැවැසීය. එවකට 37 දෙනකු පමණ මේ කර්මාන්තශාලාවේ සේවය කර ඇති අතර එවකට කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මඟින් එම ශිල්පීන් සඳහා වැටුප්ද ගෙවූ බව ඔහු පවසයි. ඒ මහතාගේ පියා මියගිය පසු කර්මාන්තශාලාව අභාවයට පත්වූ බවද ගුණසෝම මහතා අප සමඟින් කීය.

දියතරිප්පු ඇස් කණ්ණාඩි නිෂ්පාදන ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බව අපට නිරීක්ෂණය වූ කරුණකි. අද වනවිට කණ්ණාඩියට අවශ්‍ය වීදුරුව නිෂ්පාදනය කරනු ලබන පළිඟු ගල් විශේෂයද සපයා ගැනීම දුෂ්කර වී ඇත.

"මේවා අපි ලබා ගත්තේ මැණික් පතල්වලින්ම තමයි. අඩි 200-300



වගේ ගැඹුරු තැන්වල තමයි මේ ගල් හම්බවෙන්නේ. රත්නපුර, ඇහැළියගොඩ වැනි පැතිවලින් තමයි මේවා ගේන්න වෙන්නේ. අපි ගත්තේ කිලෝ ගාණට. අද වන විට කිලෝවක මිල රුපියල් දහදාහකට ආසන්නයි."

මෙලෙස ගෙන එනු ලබන පළිඟු ගල් කපා සුමට කිරීම ඉතා සංකීර්ණ මෙන්ම ඉවසීමෙන් කළ යුතු කාර්යයකි. අතේ හුරුවත් නිරන්තර අවධානයත් මෙහිදී අත්‍යවශ්‍ය වේ.

"අපි හදන කණ්ණාඩිය ජීවිතයටම එකයි. ඇස් පරීක්ෂාවක් අවශ්‍ය නැහැ. ඒ ඒ වයස් ප්‍රමාණයට අනුව තමයි අපි කණ්ණාඩිය හදන්නේ. ඒක අපි පළපුරුද්දෙන්ම අප කරන දෙයක්. තිස් ඇඳිරිය, හතළිස් හැඳිරිය, හැට ඇඳිරිය සඳහා කණ්ණාඩි හදනවා. ඒවා දාලා බලලා ගන්න පුළුවන්. දුර පෙනීම අඩු, ළඟ පෙනීම නැති, මේ දෙකම දුර්වල අයට අපිට කණ්ණාඩි හදලා දෙන්න පුළුවන්."

ස්වාභාවිකව පිහිටි ඛනිජ වර්ගයක් වන පළිඟු ගලෙන් නිර්මාණය වන දියතරිප්පු කණ්ණාඩිය ස්වභාවයෙන්ම එහි ඖෂධීය ගුණය මෙන්ම පාරිභෝගිකයාට සෞඛ්‍ය ගැටලු ඇති නොකරන බවට නිෂ්පාදකයන් සහතික කරයි.

"මේ කණ්ණාඩි පාවිච්චි කිරීමෙන් හිසේ කැක්කුම්, ඇස් දැවිල්ල, ඇස්වලින් කඳුළු ඒම වැනි ඒවා සිදුවෙන්නේ නැහැ. ඇසේ සුද එන්නෙත් නැහැ කියලා කියන්න පුළුවන්. ස්වභාවයෙන්ම සීතල ගුණයක් මේ වීදුරුවල තිබීමත් නිසා ඇස් වගේම නාසය වේළෙන්නේ නැහැ." යැයි ගුණසෝම මහතා 'මව්බිම'ට පැවැසීය.

ගුණසෝම මහතා සතුව පවතින කණ්ණාඩි නිෂ්පාදන උපකරණ බොහොමයක් සාම්ප්‍රදායික උපකරණ වේ. ඒ ඒ වයස් සීමාවන් සඳහා වීදුරුව සුමට කිරීම් කරනු ලබන්නේ කපා ගන්නා ලද පළිඟු වීදුරු කැබැල්ල සියුම් ලෙස පිරිමැදීමෙනි. මේ සඳහා යොදා ගනු ලබන්නේ ඔහුගේ මුත්තණුවන් පවා භාවිත කළ රිදී තිරුවාණා ගල් විශේෂයයි. එසේ සකස් කරගත් පළිඟු වීදුරුව සුදුසු කණ්ණාඩි රාමුවක සවි කරනු ලබයි.

"කණ්ණාඩි රාමුව අපි පිටින් ගන්නවා. ප්ලාස්ටික් මිශ්‍ර රාමු තමයි යොදා ගන්නේ. සාමාන්‍යයෙන් කණ්ණාඩියක් සම්පූර්ණයෙන් හදලා ඉවර කරන්න සතියක් විතර යනවා. ඕඩර් අනුව තමයි අපි කණ්ණාඩි හදන්නේ."

දියතරිප්පු කණ්ණාඩි නිෂ්පාදනයට අමතරව ගුණසෝම මහතා චූඩාමාණික්‍ය නිර්මාණය මෙන්ම පළිඟු ආශ්‍රිත ආභරණ නිෂ්පාදනයද සිදුකරනු ලබයි. ඔහු අප සමඟින් වැඩිදුරටත් කියා සිටියේ, මේ වන විට සෙසු සාම්ප්‍රදායික කර්මාන්ත මෙන්ම මේ කර්මාන්තයද අභාවයට යමින් පවතින බවයි. ඒ සඳහා හේතු රැසක් බලපා ඇතැයිද ඒ මහතා අප සමඟින් පැවැසීය.

වර්ෂ 1800 ගණන්වල ඇරැඹි දියතරිප්පු කණ්ණාඩි කර්මාන්තයේ යෙදෙන්නේ ගුණසෝම පරම්පරාව පමණි. කෙසේ වුවද මේ කර්මාන්තයේ අනාගතය වෙනුවෙන් කණ්ණාඩි තාක්ෂණය මතු පරපුරට දායාද කිරීමට ගුණසෝම මහතා සූදානම්ය.

"මේ කර්මාන්තය උගන්වන්න මම කැමැතියි. නමුත් මේ කර්මාන්තයට දැන් පරපුරේ තියෙන උනන්දුව අඩුයි. අපේ ගම් පළාතේ තරුණ අය වුණත් ගාමන්ට් එකකට යනවා, එහෙම නැත්නම් ත්‍රීවීල් එළවනවා. මට රජයෙන් උදව්වක් ලැබෙනවා නම් මේ කර්මාන්තය උගන්වන්න පුළුවන්. විමල් වීරවංශ ඇමැතිතුමා මේ කර්මාන්තය දියුණු කරගන්න මට උදවු කළා. වැඩපළ හදා ගන්න වගේම මැෂින් ගන්නත් උදවු කළා. අලෙවියටත් උදවු කරන්නම් කීවා."

දියතරිප්පු කණ්ණාඩි කර්මාන්තයට අවශ්‍ය පළිඟු ගල් සොයා ගැනීම දුෂ්කර වීමත් ඒවාවල මිල අධික වීමත් මේ පාරම්පරික කර්මාන්තකරුවා මුහුණ දී තිබෙන ප්‍රධානම ගැටලුවකි. පසුගිය වසර කිහිපය තුළ රට මුහුණ දුන් අර්බුද හේතුවෙන් වෙළෙඳපළද බිඳවැටී ඇතැයි ඒ මහතා පවසයි.

"අද වෙන කොට ඉන්දියාවෙන් වීදුරු ගල් ගෙන්වනවා. මේවා පළිඟු තරම් හයිය නැහැ. නමුත් ඒවායින් නිෂ්පාදනය කරන භාණ්ඩ මිල අඩුයි. හැබැයි පැවැත්මක් නැහැ. අපි හදන චූඩාමාණික්‍ය මේවාට වඩා ශක්තිය වැඩියි. නමුත් වීදුරුගල්වලින් හදන ඒවාට වැඩිය මිල වැඩියි. අපිට මිල අඩුවට දෙන්න විදිහක් නැහැ. මේ පිළිබඳ අවධානය යොමු කරලා මම වගේම පාරම්පරික කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලබා ගැනීම වගේම භාණ්ඩ විකුණා ගැනීමට ක්‍රමයක් හදලා දෙන්න පුළුවන් නම් වටිනවා."

අප කුඩා දිවයිනක් වුවද ලොවම මවිත කරපු කලා සම්ප්‍රදායක්, සංස්කෘතියක් මෙන්ම කර්මාන්ත තාක්ෂණයක් ඇති රටකි. නමුත් කනගාටුවට කරුණ වන්නේ කුමක් හෝ අවාසනාවකට ඒවා සඳහා නිසි ඇගැයීමක් නොලැබීමයි. මේ පාරම්පරික ශිල්පීන් තමන්ගේ ගැටලු තමන්ම විසඳා ගැනීමට වෙර දරනවා විනා උද්ඝෝෂණ, උපවාස කරන පිරිසක් නොවේ. ඒ ඔවුන්ගේ පරපුරේ අභිමානයයි.

අප සතුව ඇති මෙවැනි පාරම්පරික කර්මාන්ත සක්‍රිය ලෙස යළි පණ ගැන්වීම රටේ ආර්ථිකයට විශාල ශක්තියක් බව පැහැදිලිය. එසේම කර්මාන්තයේ අනාගතය පිළිබඳ පසුතැවෙන මෙම ශිල්පීන්ට අනාගත පරපුරක් නිර්මාණය කිරීම වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහයක් ලැබෙන්නේ නම් එය ලබාදීම මේ උතුම් මිනිසුන් දෙවරක් නොසිතන බව නම් පැහැදිලියි.

ඒ සඳහා අවස්ථාව උදාවනතුරු හෝ නැකතක් එනතුරු සිටිය යුතු නැත. මන්ද මේ බොහෝ පාරම්පරික ශිල්පීන් සිය ජීවිතයේ සැඳෑ සමය ගෙවමින් සිටින අය වීමය. කළ හැකි අවස්ථාවේ කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

නැතහොත් සිදුවන්නේ අශ්වයා පැන ගියාට පසු ඉස්තාලය වැසුවා වැනි දෙයමය.

■ කෝකිල සමීර



# පහන් වට

පහන් වැට සටහන

**රතඹලා හිනැහෙන, රාස්සිගෙ අව් කිරණ ගැන, සොඳුරු “කෙවිලිය”, ක ගැන, කිරි සිහිනයක තවරා, “පිං පළ” කරමින්, මල්දම් ගොතා ලියන කවි පද බැඳුම් මුතු මාලයක මුතු ලෙසින් මගෙ මේසය මත තබා අමුණා ගත හැකිවිය.**
**රසයෙන් යුතු කවිකමද තිබුණු අද ඔබ වෙනුවෙන් තෝරපු කවි කිහිපයක් තිළිණ කරමි මෙසේ..**

සංස්කාරක
සජිත් රෝහිත ලියනගේ
101. රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07

## පොද වැස්සේ තෙමීගෙන රාස්සිගේ අව් කිරණ

රතඹලා හිනැහිලා
ගෙමිදුලක වුවන මත
පේවිලා බඹරු එයි
කොපුල් තල සිප ගන්න
රැය පුරා හිනැහිලා
කඩුපුලක් නිදිබරව
හුළඟට අතවනන
බට පැළලි අස්සෙන්
පොද වැස්සෙ තෙමීගෙන
හනිකට පය තබන
රාස්සිගේ අව් කිරණ
සයනයක උඩු කුරුව නිදන
නුඹෙ වුවන මත
චලිත සිතුවමක් වී
ඇහැරෙන්න නොම දී
ඉසිඹුවක දී
දහවල
සඳක්
සිඹිමි

■ **වජිර කුමාරසිංහ**
**පේඩිපොල**



## කිරි සිහිනය

තරුවක් වැටුණා අහසම පාළුයි
කියා හඬන්නත් අවසර නෑ
කිසිදා නොපිපුණ කිරි සිහිනෙක නුඹ
අප්පච්චි කිව්වා

සුමුදු කම්බුල් මීන නිල් ඇස්
දැවටෙනා මුදු මී තෙපුල් වැල්
පපුතුරහි හොවමින් රකින්නට
බලා උන්නත් මා

සුදු දුවේ හිත කොනිත්තා ඇසී පියේ
රහසින් හෙළන්නත් බැරි කඳුළු හංගා
මැදියමේ මා කනට කොඳුරා
අප්පච්චි කිව්වා

මවු ඇකේ හිස තබා නැළැවෙන
පිය සෙනේ ළඟ දෑස් දල්වන
අකීකරු ආදරය පුබුදන සුදු දුවේ
මා සිහිනයේ දකිනා

කිරි සිනා මල් සුවඳ අතරින්
සියපතක් සේ
නුඹ එතැයි
මම
මඟ බලා උන්නා

■ **සහන් උඩවත්ත**
**ඉංගිරිය**



## සැකය

වපුරන තරමට
අස්වැන්න නොලබන
මිල ටෙන්ඩර්
ලංසු වෙන්දේසි
ඈවර දෑවර
තුන් ඈවර
නොපෙනෙන
මුල් දලු කොළ මල්
රිකිලි සැඟවුණු
ඇද පලුදු
පුස් බැඳි
හිස් බීජයකි,
ක්ෂණිකව
පුපුරණ

■ **කීර්ති කපුවත්ත**
**රිදීගම**

## කෙවිලිය

මිහිරි සරින්
ගයන්නී
ස්වාමියාට
නැතත්
නිවෙස්නයක්
කුලියටවත්

■ **අජිත් ලියනගේ**

## ඇයට ලියූ කවි

නුඹ හට ලියන මුත් මම කවි හැමදාමත්
කියවා නැති නොවෙද එහි රස වැකි වුවත්
ඒවා දුක් බරයි රස කරමින් ලීවත්
නුඹ නොකියවන කවි ලියනව මම තාමත්

හැම දවසකම නුඹ වෙනුවෙන් ලියන කවී
පොත් මේසයේ එක පිට එක එකතු වෙවී
පන්හිඳ තුඩ ගලන විට දුක කඳුළු වෙවී
පපුවේ ගින්දරට යාවිද කොළය දැවී

මේ කවි දුටුවොතින් නුඹ යම් කිසි දාක
වැලපෙනු ඇතිය සිතුවිලි බර වී ශෝක
ඉන්නට නොවේ නුඹ සමඟින් එක ගේක
පෙම් කෙරුමටයි කවි ලිව්වේ ලෙස නේක

■ **කලාභූෂණ ගාමිණී ලිවේරා**
**මුන්දලම**

## පිං පළ

සුරවිමන් වැනි කාර් පෝලිම
ගමේ රැස්වීමක්ද මන්දා
අපොයි ඔව් මේ අපේ ඇමැතිනෙ
සෙව්ලි තහඩුවකට
වැඳ වැටෙන දුප්පත්කම
මේ ගති අපට ආවේ
රජ කාලයේ සිට වෙන්න ඇති

■ **විනි වරුසප්පෙරුම**

## මල් දම්

හැඩපලු ගෙතුන කෙස් කලඹ මුදා හැර
බස්ගාල අයිනේ වාඩිවී සිටින්නී
ගොමස්කඩ වස්තරේ මත
විසුරුවාගෙන
කහට බැඳි නිය අඟින් අල්ලා
සුදෝසුදු මල්මාල
ගොතන්නී
අත ගා බලන මල් පෙත්ත
මුදු මෙලෙක හදවතට දැනිලා
මා දෙස බලාගෙන
ඈ සිනාසෙන්නී
ඔබ මොබ සරණ
ළඳුන් මුහුලස සරසන්න
එක මලක් වත් රැගෙන
හැඩපලු අතර රඳවන්න
නොසිතුණේ ඇයි
කියන් මට ළඳුනි

■ **පියසීලි විජේනායක**

## පොහොර

බත- සරි කරන්නට මුළු රට වැසියනට
ගත - සිත වෙහෙසුවේ ගොවියා සියලු විට
සෙත- සැලසුණා ඔහුගෙන් රට - දැයට සෙට
නැත - හවුහරණයක් අද ගොවි පිරිස හට

පුරන් - වුණොත් හැම බිම් අඟලක් නෑර
මියෙන් - නට වේවි කුස ගින්නෙන් මාර
කරන් - නට වහා ගොවිතැන් සරු සාර
ඉරෙන් - හඳෙන් හරි ගෙනදෙනු මැන පෝර

■ **කැකිරිහේන අජිත් කදුරුවාන**

## මංගල පෝරුවට

පුන් කලසක දිලුණ
පහන් එළියට පෙනුණු
ගියා මඟ අප නුහුරු
ඔබ සුළැඟිලෙහි එතුණු

මෙතෙක් දුර ආ මඟට
ඔබ විරුවෙකි මෙමට
විඳ අනෙක දුක් ගැහැට
කඳුළු නොම දී නෙතට

ආදරය මගෙ හිතේ
කඳුළු කැට ඔබ නෙතේ
තවම දුව ඔබ අතේ
නොහැර අත තාත්තේ

■ **මාලක පතිරත්න**
**ලේවැල්ල - මහනුවර**

---

# මව්බිම නෙළුම්විල

ගුණසිංහ හෙට්ටිආරච්චි

**නෙළුම් සුවඳය. එහෙත් පිපෙන්නේ මඩෙහිය. සත්පුරුෂයන්ද එබඳුය. සමාජය නමැති මඩෙන් මතුවන ඔවුහු මිනිස්කම නමැති සුවඳින් ලෝකය සුවඳවත් කරන්නෝය.**
**නෙළුම්විල සැකසෙන්නේ එබඳු උතුම් මිනිසුන් පිළිබඳ සත්‍ය කතාවලිනි. මෙය ඔබට විවෘතය, තැපැල් මඟින් ඔබ එවන කතා ප්‍රතිනිර්මාණය වී එහි පළවනු ඇත. ඔබ කැමැති නම් පමණක් ඔබේ නම, ගම පළවනු ඇත. ඔබට අවශ්‍ය නම් ඔබේ අනන්‍යතාව සඟවා සිටිය හැකිය. එහෙත් ඔබ එවන ආවරණ ලිපියේ ඔබේ නම, ගම, දුරකථන අංකය ලියා එවිය යුතුය.**

**ලිපිනය -**
**'මව්බිම' නෙළුම්විල**
**ඉරිදා මව්බිම කර්තෘ මණ්ඩලය**
**අංක 101, රොස්මිඩ් පෙදෙස**
**කොළඹ 07.**

## මලෙන් උපන් වාසනාව

අනුරාධපුරයේ, ගල්කඩවල පාරම්පරික පදිංචිකරුවකු වූ ඔහු සිවු දරු පවුල ජීවත් කරවූයේ වැව්වලින් මල් කඩා පූජා නගරයේ මල් කඩවලට විකිණීමෙනි.

හුළං පිරවූ ටයර් ටියුබයකට බර දී හීතල වැව් දියේ පාන්දරින්ම පිහිනා යන මිනිසා ඔහු බව වැව් අවට කවුරුත් පාහේ දැන සිටියහ.

එසේ නෙළා ගත් මල් තොගය ගෙන යෑමට ඔහුට පා පාපැදියක්වත් නොවීය. ඔහුට පිහිට වූයේ පරණ අබලන් යතුරුපැදියක් තිබූ මිතුරකු හෝ දෙන්නෙකි.

ග්‍රීෂ්ම කාලයේ වැව් එක යායට මලින් පිරී තිබුණද වැහි කාලයේ නම් ඒවා හිඟ විය. එවිට ඔහුට මල් එකතු කර ගැනීම පිණිස වැසිද නොතකා දුර බැහැර වැව්වලට යෑමට සිදුවිය. එසේ ගොස් පවා හොයා ගැනුණු ගතමනාව පවුලේ නඩත්තුවට මදි වූයෙන් හිඟ පාඩුව පියවා ගන්නට ඔහු මසුන් අල්ලා උන් වැලක හෝ දෙකක අමුණා වික්කේය.

නෙළා ගත් මල් රැගෙන ඔහු දිනපතාම රුවන්වැලි සෑය, ශ්‍රී මහා බෝධිය, සමාධි පිළිමය ආදිය අසල මල් කඩවලට ගියද ඉන් මලක් පුදන්නටවත් ඔහුට නිස්කාන්සුවක් නොවීය.

දවසක්දා ඔහු මොකක්දෝ වැඩකට අනුරපුරයේ අලුත් බස් නැවතුම්පොළට ගියේය.

“ඔබේ වාසනාව උරගා බලන්න මෙවර මුදල් තෑග්ග කෝටි පහයි.! ඒ කෝටි පහේ වාසනාවන්තයා ඔබ විය හැකියි. එන්න වාසනාව උරගා බලන්න!.” ලොතරැයි කවුළුවකින් මොරදීමක් ඇසිණි.

ඔහු හැරී බැලුවේය. මිනිස්සු ලොතරැයි මිලදී ගනු ඔහු දුටුවේය. ඔහුද නිකමට මෙන් එකක් මිලදී ගත්තේය.

සිදුවූයේ පුදුමයකි.

පසුදා මුළු රටෙන්ම වාසනාවන්තයා වී තිබුණේ ඔහුය. කෝටි පහේ තෑග්ග ඔහුට ඇදී තිබිණි.

උපන්දා සිට දුක් විඳි තමාට මේසා මහත් වාසනාවක් පෑදුනේ කවර පිනක් පලදී දැයි ඔහුට සිතා ගැනීමට බැරිවිය. වන්දනාවේ ආ දස දහස් ගණන් ජනයාට වසර ගණනක් තිස්සේ මල් සැපයූ පින තමාට පල දෙන්නට ඇතැයි ඔහුට සිතිණ.

බිරියද, දරු පැටවුන් දෙදෙනාද කැටුව කොළඹ ගිය ඔහු ජයග්‍රාහී මුදල් ත්‍යාගය ලබාගෙන බැංකු ගත කළේය.

පැල්පත වෙනුවට හොඳ ගෙයක් තනා ගැනීමට හැකිය, දරුවන් දෙදෙනාට හොඳින් ඉගැන්වීමට හැකිය යන සතුට සිය බිරියගේ මුහුණේ ඇඳී ඇති අපූරුව ඔහු දුටුවේය.

වෙනදා මැස්සන් ඉහිරෙමින් තිබූ ඔහුගේ පැල්පත හිටි හැටියේ නෑ සිය හිත මිතුරන්ගෙන් පිරී ගියේය. අවවාද අනුශාසනා කරන්නෝද ඒ අතරින් බිහිවූහ.

දෙමහල් නව නිවෙසකට අත්තිවාරම් කැපෙද්දී සැප වෑන් රියක් මිලදී ගත් ඔහු ගෙදර අයත් නෑදෑ හිත මිතුරනුත් නංවාගෙන විනෝද සවාරියේ ගියේය. සවාරිය එකකින් දෙකකින් නැවතුණේ නැත.

අලුත් අලුත් යාළුවෝද ඔහු වටා සැරිසරන්නට වූහ.

හැම රැයකම ඔහුගේ පැල්පතට යහළුවෝ හතර පස්දෙනා එකතු වූහ. ඔවුහු මධුවිතින් මත්වූහ. මැදියම් රැය පසුවීත් ඔහුගේ පැල්පතින් සාද සිනා හඬ නැඟිණ.

දිනපතාම තම පැල්පතට එන මිතුරන්ට සංග්‍රහ කිරීමට එහි ඉඩකඩ නැති බැවින් ඔහු ඔවුන් කැඳවාගෙන නගරයට යන්නට පුරුදු වූයේය. නගරයට ගිය පසු නගරයේ අලුත් මිතුරෝද ඇතිවූහ. පරණ මිතුරන් හැලි හැලී අලුත් මිතුරෝ බෝ වූහ.

නගරයට වී විනෝද වූ ඔහු මහ රෑ ජාමේ ගෙදර එන විට බිරියත් දරුවෝත් නින්දට වැටී සිටියහ. බිරියද තම සැමියා පාලනය කිරීමට නොගොස් ඔහු කරන සියල්ල ඉවසා සිටියාය.

දෙමහල් නිවෙස ඉදිවූයේ ඉබි ගමනිනි.

ඔහුගේ බැංකු ගිණුම චංචල වීමට වැඩි කාලයක් නොගියේ. සල්ලිවලට සිදුවූයේ කුමක්දැයි හිතා ගැනීමටත් ඔහුට අවස්ථාව නොදීම ගිණුම හිස්විය.

මුදල් හිඟ වුවද ඒ වනවිටත් හුරු වී සිටි සෙල්ලක්කාර දිවියෙන් බේරීමට ඔහුට නොහැකි විය. වෑන් රිය විකිණිණි. දෙමහල් නිවෙසේ වැඩ නතර විය.

ඔහු බංකොලොත් වී ඇති බව දැනගත් අලුත් මිතුරෝ වැඩි දෙනා ඔහු හැර ගියහ.

සමහරු කෙසේ හෝ මුදල් සෙවිය යුතු බවට ඔහු පෙලඹූහ.

ඔහු පොලිසියට අසු වූයේ ගංජා වගයක් සමඟය. ඇප පිට නිදහස්ව ආ ඔහු ඊළඟට කොටු වූයේ හෙරොයින් සමඟය. එතැන් පටන් ඔහුට හිරබත් කෑමට සිදුවිය.

දහදිය මහන්සියෙන් දරු පවුල ජීවත් කළ ඔහුට, මුදලේ අගය හොඳින්ම හඳුනාගෙන සිටි ඔහුට මේ සිදුවූයේ කුමක්ද? මහා ධන නිධානයක් හමුවේ ඔහුගේ සකල ආත්මයම අන්ධ වීද? ධනය හිමි කර ගැනීමට මෙන්ම එය පාලනය කර ගැනීමටද වාසනාව තිබිය යුතුද?

***අනුරාධපුර, උපාලි ආනන්ද කරුණාදස මහතා විසින් යොමු කරන ලද ලිපියක් ඇසුරිනි.***

***(අනුරපුර හිටපු මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක, පුත්තලම සහකාර පොලිස් අධිකාරී සංජීව මහතාට, අනුරපුර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ලක්මාල් විජේරත්න යන මහත්වරුන්ට ස්තුතිය පළවේ.)***

---

# f බුකිය

■ **සංස්කරණය - සචිනි ශේෂාධි**
















































බණ්ඩාරගම පිහිටි ආයතනයක් සඳහා නුපුහුණු සේවකයන් අවශ්‍යයි.
වයස 18-40 අතර
අ.පො.ස සා.පෙළ/අ.පො.ස උ.පෙළ සමත්
ආහාර නවාතැන් නොමිලේ, ඉහළ වැටුප්
0775893750

මාස 8න් A/L
Online / Physical Class 2022 / 2023
වාණිජ්‍ය Econ/ BS/ Accounting
කලා සිංහල/ BC /Econ/ Logic Political/Media
Individual Groups
077-8687305
0777-191630

මාසික ඉංග්‍රීසි පාඨමාලාව
203 කණ්ඩායම
ආරම්භය - 2022 පෙබ. 04
පාඨමාලා ගාස්තුව රු.28,000/=
අවශ්‍ය අයට නවාතැන් නොමිලේ.
බුද්ධදාස හේවගේ
(MA Colombo university)
071-6834510
204 කණ්ඩායම - 2022 මාර්තු 05

ඔබ සිහිනෙන් දකින සිහින නිවස භෞතික යථාර්ථයක් බවට පත්කිරීම අපගේ මෙහෙවරයි.
ගමගේ කනස්ට්‍රක්ෂන්ස්
අතුරුගිරිය
ආරම්භයේදී අත්තිකාරම් මුදල අවශ්‍ය නැත
0775 82 89 45 / 0704 22 18 18

හම්බන්තොට පිහිටි
රුහුණු ෆාම්ස්
පුද්ගලික සමාගමට අයත්
කුකුළු ගොවිපළේ සේවය සඳහා නැවතී සේවය කිරීමට සේවකයන් බඳවාගනු ලැබේ
විමසීම්: 070-3437969, 047-5678260
047-5678270

පුත්තලම ප්‍රසිද්ධ කැබ් සර්විස් ආයතනයකට සියලුම වර්ගයේ වාහන කුලියට/බද්දට අවශ්‍යයි.
Premio, Axio, Allion, Aqua, Prius, KDH, Wagon R, Hillux Cab, Montero, Navara Cab, Vezel, Alto Jeep
072 - 468 44 33

උගස් රන් භාණ්ඩ
උගසට තබා සින්න වීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කල ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලකට මිලදී ගනු ලැබේ.
රන් පවුම 128,000
077 124 96 58

හර්නියා
රෝගීන් සඳහා ශල්‍යකර්මවලින් තොරව ඖෂධීය ප්‍රතිකාර
ප්‍රවීණ වෛද්‍යවරයෙක්ගෙන්
සෙත් රෝහල
හෝමාගම
0112748808, 0113031717, 0714282721

උකස් රන් භාණ්ඩ
බේරාදී වැඩිම මිලට මිලදී ගනු ලැබේ.
බොරු නැත
රජයේ ලියාපදිංචි ආයතනයකි.
කැරට් 22, 21, 20, 18,14, 09.
077 28 49 889

වායු රයිෆල්
AIR RIFLE
W. තෝමස් සහ පුත්‍රයෝ - කඩවත
ක්ෂණික ඇමතුම - 0777-319250
විමසීම - 011 2972608 / 011 4361961
011 4968626 / 011 5737777

උගස් රත්තරං
සින්නවීමට යන රං භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කළ ආයතනයට පැමිණ බේරාදී පොරොන්දු වූ මිලටම මිලදී ගනු ලැබේ.
පවුම - 125,000
076 33 42 114

වනපවන නිෂ්පාදන
පුරුෂ ජීව බල තෛලය
ලිංගික දුබලතා සඳහා මහඟු තෛලයකි
071 36 25 785
30ml 1100/=
385/1/A., Jaya Mavatha, Polpithimukalana, Kandana

උක්වත්තගෙ ගැස්ට්‍රයිටිස් (අම්ල/පිත්ත) සඳහා ප්‍රත්‍යක්ෂ දේශීය ඖෂධ
රු. 500/-
අමතන්න 034 2255 209 / 034 22 07 744
ukwattahelaosu@yahoo.com

උකස් රන් භාණ්ඩ
බේරාදී වැඩිම මිලට මිලදී ගනු ලැබේ.
බොරු නැත
රජයේ ලියාපදිංචි ආයතනයකි.
කැරට් 22, 21, 20, 18,14, 09.
077 28 49 889

පුරුෂ වර්ධන තෛලය
පුරුෂයින්ගේ සියලුම ලිංගික දුබලතා සඳහා විශිෂ්ට තෛලයකි.
30 ml රු.1315/-
ලලිත දේවී තෛලය
සිද්ධාර්ථ ආයුර්වේද මධ්‍යස්ථානය 071 2 019 811 / 077 3 464 688

හර්නියා
රෝගීන් සඳහා ශල්‍යකර්මවලින් තොරව ඖෂධීය ප්‍රතිකාර
ප්‍රවීණ වෛද්‍යවරයෙක්ගෙන්
සක්‍යා රෝහල, 678 වල්ගම, මාතර
0412244933, 0412244833, 0715159500, 0718819500, 0789097570

අම්ල පිත්ත සුවය
ගාස්තුව රු.1000/-
දේශීය වෛද්‍ය මෛත්‍රීරත්න වෙද මහතා
0715 696 189

සුව අරණ Herbal
ඉපැරණි විස්මිත හෙළ වෙදකම දැන් කොළඹ දී...
වේලාවක් වෙන් කරවා ගැනීමට අමතන්න. 07 55 46 56 56

කල්ගත වූ කොන්දේ වේදනා හා දණහිස් වේදනා ඇතුළු සියලුම වාත රෝග හා සන්ධි රෝග සඳහා දේශීය ප්‍රතිකාර
පාරම්පරික වෛද්‍ය සෞභාග්‍ය කරුණානායක
දු.ක. 037 4383832

(උස සෙ.මී. 6 පළල සෙ.මී. 8)
දැන්වීමක් රු.4000/=
(සියලු බදු සහිතව)
ඔබගේ ප්‍රදේශයේ සිටම දැන්වීමක් පළ කරගැනීමට
ළඟම ඇති පුවත්පත් නියෝජිතට බාරදෙන්න. නැතිනම්....
ළඟම ඇති කොමර්ෂල් බැංකුවට පැමිණ මුදල් ගෙවන ලදුපතේ
ගිණුම් හිමියාගේ නම : සිලෝන් නිව්ස්පේපර්ස් ප්‍රයිවේට් ලිමිටඩ්
ගිණුම් අංකය : 1145005775
ශාඛාව : වෝඩ් ප්ලේස් ශාඛාව
ඔබගේ නම : ......
ජා.හැ. අංකය : ......
සඳහන් කර අදාළ මුදල ගෙවා
ලදුපත 0117 566 569 අංකයට ෆැක්ස් කරන්න.
සියලු විමසීම්
0765 282 432
0117 566 572
ඊ මේල් mawbima.ads@gmail.com

ශරීර හා පුරුෂ ශක්තිය වර්ධනයට
වැල්පෙනෙල කැප්සියුල්
Naturelle Welpenela
0711 517 097
දුරකථන/ෆැක්ස්: 0112 517447
Online Orders: www.myherbals.lk

අති ප්‍රබල වශී ගුරුකම්
Tel :- 076 - 4025539
ශ්‍රී නාගසිංහ ගුරු

තැපැල් මාර්ගික ගුහ අපල ශාන්ති කර්ම පාඨමාලාව
සම්පූර්ණ මුදල - 6000/= කොටස් දෙකකින්.
0710520915, 0774502252
ජ්‍යොතිෂවේදී නාමල් තිලකසිරි
සිංහරාජ පාර, වැද්දාගල, ඊ/ කලවාන

වශීගුරුකමකට අපගේ සහන අයකිරීම 4000 යි
සහන පියස, වේයන්ගොඩ
077-0450079

අති ප්‍රබල වශී ගුරුකම් !
බෝධිපාල රත්තිලක
0812387837,071-7256867

වශී ලොවම බලගතු කොණ්ඩදෙණියේ ගුරුකම්
0772-591778

ප්‍රබල වශීගුරුකම්
074-1714615

අඳුන බැලීම
අමතන්න - 0777-282575

මව්බිම BOX ads
ඔබගේ ප්‍රදේශයේ සිට ඔබේ දැන්වීම පළකරවා ගැනීමට
0765 282 432

කොළඹ 07, රොස්මිඩ් පෙදෙසේ, අංක 101 හි පිහිටි සීමාසහිත සිලෝන් නිව්ස්පේපර්ස් පෞද්ගලික සමාගම විසින් ජා ඇල, මීනුවන්ගොඩ පාරේ, 302/1/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.